තෙකරිඩුව

2015
ස්වර්ණ පුස්තක
සම්මානය:
විශිෂ්ටතම නවකතාව

ape pusthakalaya telegram
group aka wenuweni
https://t.me/apepusthakalaya

සදීපා

බටුවන්ගල රාහුල හිමි

ද.ග.හරිඳු කෝසල බණ්ඩාර

රන්කරඬුව

(නවකතාව)

ape pusthakalaya telegram
group aka wenuweni
https://t.me/apepusthakalaya

කතුවර හිමියන්ගේ වෙනත් කෘති

කෙටිකතා
- උපන් ලපය (රාජ්‍ය සම්මාන 2003)
- රතු උකුස්සෝ

නවකතා
- හරස් පාර
- ප්‍රහාණි (රාජ්‍ය සම්මාන 2005)
- පන්සලේ කතාවක්
- රන්පාට චිත්‍රයක් අතින් ගත් මහල්ලා
- බොරතෙල් (විද්‍යෝදය සම්මාන, ගොඩගේ සම්මාන, ස්වර්ණ පුස්තක නිර්දේශිත 2009)
- නයිගලින් උපන් පුත්‍රයෝ (රාජ්‍ය සම්මාන 2012)

කවි
- නෙලුම් විල
- අඩසිය කවි ගත

වෙනත්
- ගෙදරට බණ
- අපල සඳහා බෝධිපූජා
- පොහොය දොළහ
- තුන් සූත්‍රය සහිත සෙත්පිරිත්
- සරල අරුත් සහිත සිරිත් මල්දම

රන්කරඬුව

(නවකතාව)

බටුවන්ගල රාහුල හිමි

සී/ස සදීප ප්‍රකාශකයෝ
SADEEPA PUBLISHERS (PVT) LTD

පිළිගැන්වීම

මගේ උපසම්පදාවේදී සංඝසභාවට මා ඉදිරිපත් කළ 'ඇත්සදෙස' නම් වූ කවි පොත දැක මාගේ නිර්මාණ කාර්යයන් ගැන බෙහෙවින් ළෙන්ගතුව උපදෙස් දුන්නේත් එම අමුද්‍රිත සන්දේශ කාව්‍යය අගය කළේත් ඔබ වහන්සේය. පළමු කෘතිය වූ 'උපන් ලපය' කෙටිකතා සංග්‍රහය මුද්‍රණයෙන් එළිදක්වන්නට මා පෙලඹවූ කීපදෙනා අතර ඔබ වහන්සේ මූලිකයෙකි. මා සමඟ බෙල්ලන පිරිවෙනේ එකට අකුරු කළ පන්තියේ මිතුරාද ඔබ වහන්සේය. මා ස්කොට්ලන්තයට ගිය අවස්ථාවේ සියලු ඇප උපස්ථාන කරමින් මා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට හඳුන්වා දෙමින් මට ස්කොට්ලන්තයේ සංස්කෘතික ජීවිතය ගැන අත්දැකීම් ලබා දුන්නේ ඔබ වහන්සේය. බොහෝ ළෙන්ගතුව මගේ නිර්මාණ කර්යයන්ට උපදෙස් දෙමින් මා දිරිමත් කරන්නා වූ ඔබ වහන්සේ කෙරෙහි මා තුළ ඇති ගෞරවයත් ළෙන්ගතුකමත් මුදාහරින්නට මට කළ හැකි වෙනත් දෙයක් නොමැති නිසා ඒ මිත්‍රත්වය අප මියෙන තුරා සතුරු බලවේගවලට නොහසුව පවතීවායි යන ළෙන්ගතු හැඟීමෙන් යුතුව, ස්කොට්ලන්තයේ ප්‍රධාන සංඝනායක රාජකීය පණ්ඩිත කඹුරාවල සිරි රේවත හිමිපාණන්ට මගේ හත්වන නවකතාව වන 'රන්කරඬුව' හෘදයංගම සිතින් පිළිගන්වමි.

බටුවන්ගල රාහුල

ස්තුතිය

මෙම නිර්මාණය කරන්නට මා පටන්ගත්තේ මිට අවුරුදු තුනකට පෙර ලංකාවේදීය. එහෙත් විවිධ කටයුතු නිසා එය නිමා කරගැනීමට නොහැකි විය. ගිය අවුරුද්දේ එංගලන්තයට යෑමට අවස්ථාව ලැබුණි. එහිදී ලද විවේකයේදී මෙම නිර්මාණයේ තවත් කොටසක් නිම කළෙමි. එහෙත් අවසන් නොවුණි. මේ මොහොතේ මා මෙම නිර්මාණය නිමාවට පත් කරන්නේ ඉතාලියේ මෝදනාහි මෛත්‍රී විහාරයේ සිටයි.

මෙම තුන්තැනේදී මට මේ කාර්යය සඳහා උදව් කළ අය අතර විවිධ මූලාශ්‍රය සොයාගැනීමට උපකාර කළ පාන්තියේ ශ්‍රී මහා මංගල පිරිවෙන් විහාරාධිපති අප කල්‍යාණ මිත්‍ර ශාස්ත්‍රපති පණ්ඩිත නවුත්තුඩුවේ විමල හිමියන්ට හෘදයංගම ස්තුතිය පිරිනමමි.

එංගලන්තයේ ලෙච්ර්ත් බෞද්ධවිහාරායේ විහාරාධිපති ශාස්ත්‍රපති දෙදියවල විමල හිමිපාණන්ටත් අප කල්‍යාණමිත්‍ර ශාස්ත්‍රවේදී මතුගම පාලිත හිමියන්ටත් ප්‍රියන්ත බංඩාර මහතාටත් මගේ හෘදයගංම ස්තුතිය පිරිනැමෙන්නේ එහිදී මට සියලු සංග්‍රහයන් කරමින් මට අවැසි විවේකය ලබා දීම වෙනුවෙනි.

ඉතාලියේ මෝදනා මෛත්‍රී විහාරයේ විහාරාධිපති ශාස්ත්‍රපති පණ්ඩිත මෙදේරිපිටියේ විමලරතන හිමියෝ මා ඉතාලියට ගෙන්වාගෙන රටතොට පෙන්වමින් අවශ්‍ය විවේකයද ලබාදෙමින් මෙම කෘතිය කෙසේ හෝ මේ අවුරුද්දේ නිම කරන්න යැයි මා දිරිගන්වමින් සියලු ඇප උපස්ථාන කළෝය. උන්වහන්සේට මගේ හදපිරි ස්තුතිය පිරිනමමි. මට ඉතාලියට එන්නට මග පාදා දුන් අප කල්‍යාණ මිත්‍ර ශාස්ත්‍රවේදී වත්තෙහේනේ විජිත හිමියන්ටද විශේෂයෙන් ස්තුති කරමි. එසේම සදීපා ප්‍රකාශන ආයතනයටද මගේ ස්තුතිය හිමි වේ.

බටුවන්ගල රාහුල

ශ්‍රී සුදර්ශනාරාමය
මඩවල, වැලිපැන්න.
දුරකතනː 0342243799
0714464220
e-mail: brahulahimi@gmail.com

1

එකෝමත් එක කාලයක එකෝමත් එක භික්ෂුවක් සතර ස්ථාන වැඳපුදාගැනීමේ අරමුණින් එකෝමත් එක පුරයකින් නැව් නැග එකෝමත් එක නැව් තොටකින් ගොඩ බැස්සේය. ඒ නැව්තොටින් ගොඩබැසගත් භික්ෂුව මග සිතියම් පිරික්සමින් ඉන් ඔබ්බට යන මගකුත් විදියකුත් සොයමින් සිටියේය. එසේ සිටිද්දී කළු අශ්වයකු බැඳගත් කරත්තකරුවෙක් පැමිණ භික්ෂුවට මග පෙන්නන්නට කැමති වුණේය. කරත්තයකින් මේ වන්දනාව යෑමේ කැමැත්තක් භික්ෂුව තුළ මුලදී නොතිබුණද කරත්තයත් අශ්වයාත් දැකීමෙන් එවැනි කැමැත්තක් උපන්නේය.

භික්ෂුව අශ්වයා ළඟට ගියේය. ඌ ඕනැම දුරක් ඕනැම වේගයකින් යා හැකි අශ්වයකු බව අඟවමින් ගාම්භීර ලෙසින් හිස සැලුවේය. භික්ෂුවට කරත්තකරුවා හොඳින් අඳුනා ගැනීමට මගක් නොතිබුණේය. ඔහුගේ බාහිර ස්වරූපය තුළින් ඔහුගේ අභ්‍යන්තරය තේරුම් ගැනීමට භික්ෂුව ඔහු දෙස බලා සිටියේය. ඔහුගේ ශරීරය මහතද නොවුණේය; කෙට්ටුද නොවුණේය. හිසකෙස් කළුද නොවුණේය; සුදුද නොවුණේය; ඔහුගේ ඇඳුම් සංකීර්ණද නොවුණේය; සරලද නොවුණේය. ඔහුගේ පෙනුම වයස්ගතද නොවුණේය; තරුණද නොවුණේය. ඔහු සිනා සෙන්නේද නොවන්නේය; සිනා නොසෙන්නේද නොවන්නේය. මේ මිනිසා කුමන ජාතියක කුමන කුලයක කුමන ආගමකදැයි ඍජුවම සිතාගැනීමට හැකි කිසිදු සලකුණක් භික්ෂුව නොදුටුවේය. භික්ෂුවට ඔහු ගැන ප්‍රසාදයක් හෝ අප්‍රසාදයක් ඇති නොවන්නේය. ඔහු සාමාන්‍ය කරත්තකරුවෙකැයි යන හැඟීම පමණක් භික්ෂුව තුළ පළමු වරට ඇති වුණේය.

මෙතෙක් කර දෙපැත්තේ එල්ලාගෙන සිටි ගමන් මලු දෙක කරත්තයේ තැන්පත් කළ භික්ෂුව කරත්තකරුවාට තම ගමන කොහි සිට කොහාට යායුතුදැයි පැහැදිලි කළේය. ඔහු නිහඬව ඊට සවන් දුන්නේය.

''මෙ නැව් තොටින් ගොඩබසින සියලු පිරිස් යන්නේ සතර ස්ථාන වඳින්න බව මා දන්නවා. ඔබ වහන්සේත් වෙන අරමුණක් ඇතිව ගොඩබැස්සා විය නොහැකියි.''

''ඔව්. මගේ අරමුණත් ඒකම තමා. උඹේ නම මොකද්ද?''

''ගුප්ත කියල කතා කරන්න හාමුදුරුවනේ.''

''හ..ම... ඒකත් හොඳ නමක් තමා. උඹ දූන් මගෙන් කීයක් අය කරනවාද මේ ගමන සම්පූර්ණ කරන්න.''

''කැමති මිලක් ගෙවන්න.''

''මා ගෙවන මිල කීයක් වුණත් උඹ භාර ගන්න සතුටුද?''

''එහෙමයි. මම කැමැත්තෙන් භාර ගන්නවා.''

''මම ඒක කොහොම විශ්වාස කරන්නද? හැම කරත්තකාරයෙක්ම මෙහෙමද?''

''මා ඒ ගැන දන්නෑ හාමුදුරුවනේ...''

''මට උඹ ගැන සැකයි... ගමන අවසානෙ උඹ මා එක්ක රංඩු කරන්න තබාගනීවි මා දෙන මුදල වැඩි කරගැනීමට.''

''එහෙම සිතෙනවා නම් වෙන කරත්තයක නගින්න.''

''හොඳයි..... අපි යමු... මාව පරිස්සම් කරගෙන උඹ මේ ගමන මාව එක්ක යාවිය කියල මං විශ්වාස කරනවා.''

ගුප්ත යාන්තමින් සිනා සී හිස වැනුවේය...

නන්නාඳුනන ගුප්ත අරබයා පැහැදීමක් ඇති කරගැනීමෙ යම් සාධකයක් ඔහු තුළ ඇතිදැයි භික්ෂුව නැවතත් සිතින් සොයා බැලුවේය. ඔහු තුළ යම් පියකරු පෙනුමක් තිබුණත් නැතත් විශ්වාසයක් ඇති කරගත හැකි නම් එය හොඳටම ප්‍රමාණවත් බව භික්ෂුවට සිතෙන්නේය. එහෙත් ඔහු කෙසේ විශ්වාස කරන්නදැයි භික්ෂුවට දැනීමක් නැත්තේය. මොහු මංපහරන්නෙක්ද? නැති නම් කපටියෙක්ද? වංචාකාරයෙක්දැයි නිශ්චිතව දැනගැනීමට භික්ෂුවට කිසිදු සාධකයක් ඔහුගේ මුහුණින් සොයාගත නොහැකි වූණේය. මොහු කවුරු වුණත් තම ගමන්මලු දෙක හොඳින් පරිස්සම කරගෙන සිටීම තම පළමු වගකීම බව භික්ෂුව සිතුවේය. ගමන් මලු දෙක තම ඔඩොක්කුවේ තබාගත් භික්ෂුව එම නැව්තොට අසබඩින් නන්නාඳුනන කරත්තකරුවෙකු සමග මිලක් නියම නොවූ වන්දනාවක ආරම්භය සිද්ධ කළේ ය......

2.

එළ රංචුවට තණ කවමින් තණ ගොල්ලේ ඇවිදිමින් සිටි මහලු ඉන්දියානුවා මොහොතකට පෙර බිම ඇන තබාගෙන මල පහ කළ තැන හරියටම කොතැනදැයි හඳුනාගැනීමට ඒ භික්ෂුවට නොහැකි වුණේය. හේ තණ පලස මත ඉසී තිබූ පිනි පමණක් දක්කේය. තණ ගොල්ලේ සිවුර නොගැවෙන ලෙස එය උභයාංශ කොට පෙරවාගැනීමට භික්ෂුව සැහෙන වෙහෙසක් ගත්තේය. තණ ගොල්ලේ පිනිද ඉන්දියානු මහලු ගොපල්ලාගේ සුළු දියද මිශ්‍ර වූ හුමාලය සහිත දියෙන් භික්ෂුවගේ සිවුරු කොන තෙමී ගියේය. ඒ සමගම තණපත් අතර සැඟවී තිබූ ගොපල්ලාගේ ලාටු මල ඒ භික්ෂුවගේ පා ඇඟිලි අතරින් උඩට මතු වුණේය.

"දෙයියනේ! මුන් අපි වඩින තැන්වල මල පහ කරන්නෙ ඇයි? දෙයියන්ට මේව පේන්නැද්ද?" ඒ භික්ෂුව සාප කරමින් පා ඇඟිලි කරු තණ පඳුරු මත උලමින් ඇඟිලි කරු පිරිසිදු කරගැනීමට උත්සාහ කළේය.

තණ පිට්ටනියට ළා හිරුරැස් වැටෙද්දී ඒ භික්ෂුව සම්මුඛ ස්තූපය දෙස මඳ වේලාවක් බලා සිටියේය; උභයාංශ කරගත් සිවුර තවත් සිරුරට ඇලෙන සේ මනාව සකසාගත්තේය. දොහොත් මුදුන් දී සම්මුඛ ස්තූපය දුර සිට වඳිද්දී භික්ෂුවගේ සිරුරට මහත් සැහැල්ලුවක් දැනුණේය. ඒ සැහැල්ලුව සමගම තමාගේ ඉණ ප්‍රදේශය වට කරගත් රැහැන් පටකින් තමා ස්තූපය දෙසට ඇදෙන්නාක් වැනි දැනීමක් භික්ෂුවට දැනුණේය. ඒ සමගම නිල්පාට හිස් අවකාශය ඉතා සුදු ඝන වලාකුළකින් වැසී ගියේය. ස්තූපයේ හිස මතට පහත් වූ මේ ඝන වලාකුළ වියනක් සේ සෑදී හතර වටින් පොළොව සිපගත්තේය. කපු පුළුන්වලින් කරන ලද විනිවිද නොපෙනෙන මේ වියන යටදී සම්මුඛ ස්තූපයේ එක් කවුළුවක් පමණක් භික්ෂුවට පෙනුණේය. තමා සමග ආවතේවයට ආ ගුප්ත කොහිදැයි භික්ෂුව සෙව්වේය. එහෙත් භික්ෂුවට වෙනත් කිසිවක් නොපෙනුණේය. "පැමිණෙන්න ඇතුළට..." සිහින් ආමන්ත්‍රණයක් එක්වරම භික්ෂුවට ඇසුණේය. භික්ෂුවගේ සියොලඟ හිරිවැටී ගියේය.

"ඔබ කවුද? කොහේ සිටද මේ කතා කරන්නෙ..?"

"මම කැමතියි පළමුව ඔබව හඳුනාගන්න."

"මම වන්දනාවෙ ආපු භික්ෂුවක්; සතර ස්ථාන වැඳගන්න පැමිණි භික්ෂුවක්. අනේ ඔබ කවුද? කොහේ ඉඳන්ද මට මේ කතා කරන්නෙ?"

"මම කොණ්ඩඤ්ඤ හාමුදුරුවෝ. එන්න මේ කවුළුවෙන් ඇතුළට..."

"ඔබ මායාකාරයෙක්. කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේ අනුපදිසේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑවා..."

"ඔව්. ඒත් දැන් ඔබ ඉන්නෙ ඊට ටික වෙලාවකට කලින්."

"මොනවද ඔබ වහන්සේ මේ කියන කතා...?"

"කලබල නොවන්න. ඔබ ඉන්නෙ මා සමග... මා තමයි බුදු රජාණන් වහන්සේගෙන් බණ අසා පළමුව රහත්ඵල ලැබූ කොණ්ඩඤ්ඤ තවුසා... බලන්න මා අත ඇති මේ කරඬුව දෙස."

"කුමක්ද ස්වාමීනි මේ කරඬුව?"

"මේ කරඬුවේ තැන්පත් කර තිබෙන්නෙ අප සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේගෙන් ඇසූ පළමු ධර්මය ඇතුළත් රන්පත... මේ කරඬුව ඔබේ රටේ දළදා මැඳුරෙ තැන්පත් කළ යුතුයි.. මා පිරිනිවන් පාන්නට පෙර ඔබෙන් කරන මේ ඉල්ලීම වගකීමක් ලෙස සිතා ඉටු කරන්න... මේ කරඬුව ඔබට භාර දෙන්නට පෙර මම කැමතියි අපට සිද්ධාර්ථයන් වහන්සේ මුණගැසෙන්න ඉස්සෙල්ලා මේ ඉසිපතනය කොහොමද තිබුණේ කියා ඔබට පෙන්නන්න එතකොට කරඬුව ගැන ඔබට අවබෝධයක් ලැබේවි. එන්න මා සමග." කොණ්ඩඤ්ඤ හිමියෝ භික්ෂුවගේ අතින් අල්ලාගත්තෝය. භික්ෂුව කොණ්ඩඤ්ඤ

හිමියන් පිටුපසින් සිටියේය. මොහොතකින් කොණ්ඩඤ්ඤ හිමියන්ගේ ස්වරූපය වෙනස් වී තාපස වේසයක් ගත්තේය.

"බලන්න මේ ඉසිපතනය දිහා... සත්‍ය ගවේෂකයෝ ඔබ මොබ යන අපූරුව...! අර සාමිවරුන් අහසින් පොළොවට බහින තැන... දනුත් සාමිවරු අහසින් බසින අපූරු ඔබට පෙනෙනවා නේද?"

"ඔව්. ඒත් මං කොහොමද මේවා විශ්වාස කරන්නෙ... මං මීට ටිකකට ඉස්සෙල්ලා දැක්කෙ එළුවො රංචුවක් දක්කගෙන ආපු කිලුටු ඇඳගත්ත ඉන්දියානුවෙක් මේ මළුවෙ මල පහ කරන හැටි. මගේ යටිපතුල්වලත් ඒ වසුරු ගැවුණා.."

"බලන්න අර වප්ප මොනවාද කරන්නෙ කියා ඊට මදක් දුරින් සිටින්නේ භද්දිය, මහානාමත් අස්සජිත් පැන් ගෙන ඒමට මදක් ඔබ්බට ගොසින්.. අපි හැමෝම තනි තනිවම සත්‍ය ගවේෂණයේ යෙදෙනවා."

"එතකොට අර ඇතින් ඉන්නෙ කවුද?"

"ඒ ශිව."

"ශිව මොනවද මෙතන කරන්නෙ?"

"ශිවත් මොනවා හරි කරනවා ඇති... ශිව තාපසයන්ගෙ ඉෂ්ට දේවතාවා හැටියටයි සමහරු පිළිගන්නෙ..."

"මං අහල තියෙන්නෙ ශිව හිමාලයේ කෛලාසකූටයේ පහළ කෙළවරක ව්‍යාඝ්‍ර හමක් එළාගෙන ජටාවක් බැඳගෙන ඒ මත ඉඳගෙන සමාධි පුරනවා කියලයි... ගංගානම් ගඟ ශිවගෙ ජටාමඬුල්ලෙන් ආරම්භ වෙනවයි කියලත් මං අහල තියෙනවා... හින්දු භක්තිකයො තමන්ගෙ සුභාසුභ සියල්ලට ගංගානම් ගඟ ශුද්ධත්වයෙන් සලකන්නෙ ඒ නිසා කියලත් මං අහල තියෙනවා... සමහර වයස්ගත හින්දූන් ජීවිතයේ අවසාන කාලයේ ගංගානම් ගඟේ ඉවුර මත ආශ්‍රමික ජීවිත ගත කරන්න ගොඩක් කැමති බවත් මං අහලා තියෙනවා... මෙතන ඉන්නෙ ඒ ශිව නෙමෙයි නේද?"

"අපත් සමග මෙතනත් සිටින්නේ ඒ ශිවම තමයි.. බලන්න මහු එළාගෙන ඉන්නෙ ඔබ අසා තිබෙන ඒ ව්‍යාඝ්‍ර හම නෙමෙයිද කියලා..."

"මට මොකුත් හිතාගන්න අමාරුයි."

"ඔව්. අපට දැනෙනවා ඔබ මේ වන්දනාව ආරම්භ කරපු තැනම ගොඩක් වෙහෙසට පත් වෙලා... කමක් නැහැ... මදක් වෙහෙස නිවාගන්න මං ඔබට ආරාධනා කරනවා."

"කරුණා කරලා කියන්න මං ඉන්නෙ කොයි කාලෙද?

"ඔබ ඉන්නෙ බුදු හාමුදුරුවො අපට මුණගැහෙන්න තුන්පෝයකට විතර පෙරාතුව. අපි සත්‍ය හොයනවා. අපි බොහෝ දේ දකිනවා. අපට බොහෝ දේ පේන්න පටන් අරගෙන. ඒක මහා වෙහෙසකර කාර්යයක්. එහෙත් නුදෙකලා සත්‍ය ගවේෂණය ඉතා තෘප්තිමත්. ඊට මැවුම්කාරයෙක් නැහැ. ඊට අයිතිකාරයෙකුත් නැහැ.. නිදහස් නිවහල්... කා කෙරෙහි වත් බැඳීම් නැහැ. අපගේ පාලනය, හික්මීම, සියල්ල තියෙන්නෙ අප අතේ... ඔබට පේනවා අර බොහෝ අය වට කරගෙන සිටින කරඬුව. ඒ කරඬුව ගොඩාක් පැරණි එකක්... ලෝහ රාශියක් එකට එකතු කරලා ගොඩාක් අය එකතු වෙලා හදාපු කරඬුවක්... ඒ කරඬුව අතින් අතට යන එකක්. නොයෙක් අය විවිධ කැටයම් කරමින් ඇතුළත විවිධ දේවල් තැන්පත් කරපු කරඬුවක්."

"ඔබ වහන්සේ මට කලින් පෙන්වූ කරඬුව මෙය නොවෙයි නේද?"

"නෑ... මේ එය නොවෙයි.... මේ සිදුරෙන් බලන්න ඇතුළත."

භික්ෂුව ඒ සිදුරින් කරඬුවේ ඇතුළත බැලුවේය... එහි තවත් කරඬුවක් තිබුණේය.. ඒ කරඬුව කොණ්ඩඤ්ඤ හිමියන් තමාට පෙන්වූ කරඬුවට සමාන බව භික්ෂුවට වැටහුණේය. එම කරඬුව වට කරගත් දහස් ගණන් රන්පත් මහ කරඬුව ඇතුළත තැන්පත් වී තිබුණේය.. ඒවා මොනවාදැයි කියවාගැනීමට භික්ෂුවට නොතේරුණේය.. ඒ සියල්ල එකට මිශ්‍ර වී තිබුණේය..

"දුටුවා නේද?"

''එහෙමයි,''

''හොඳයි මං ඔබව ධම්මරාජික ස්තූපය ළඟදි මුණගැහෙන්නම් එතන තමයි අප පළමුවෙන් බණ ඇසූ තැන.''

කොණ්ඩඤ්ඤ තාපසතුමා අතුරුදන් වී ගියේය. භික්ෂුව වටපිට බැලුවේය.. භික්ෂුවගේ සිත නොසන්සුන් බවට පත් වී ගියේය.. සම්මුඛ ස්තූපය වසාගත් සුදු වලාපෙළ ඉවත් වී ගියේය. තරමක් තද හිරුරැසින් ස්තූප භූමිය වැසී ගියේය.

අශ්ව කරත්තයෙන් අශ්වයා මුදාගත් ගුප්ත අශ්වයාට තණ කවමින් සිටියේය. භික්ෂුව ඇත ස්තූප භූමියේ නිසොල්මනේ සිටියේය. ගුප්ත අශ්වයාට නිදහසේ තණ කන්නට ඉඩහැර තට්ටු වෙළෙන්දා ළඟට ගොස් දුංකොළ කුඩු පැකට්ටුවක් මිල දී ගත්තේය. එයින් ටිකක් අත්ලට හලාගත් ගුප්ත හුණු කුප්පියෙන් ස්වල්පයක් එම දුංකොළ කුඩුවල තවරා අත්ල පිට අත්ල ගැසුවේය. ස්වල්ප වේලාවක් එසේ කොට දුංකොළ කුඩු ටික ගුළියක් කොට හක්කේ කොනක තබාගත්තේය. ගුප්තගේ හිතට ඉන් සැහැල්ලුවක් දැනුණේය... භික්ෂුවගේ ගමන් මලු පරිස්සම් කිරීමට සිදු වෙතැයි ඔහු මුලින් සිතා සිටියේය. එහෙත් ඒ ගමන් මලු දෙක භික්ෂුව යන සැම තැනකම කර දෙපැත්තේ එල්ලාගෙන යන නිසා ගුප්තට ඒ ගැන වෙහෙසක් නොදැනුණේය. එම ගමන්මලුවල මොනවා තිබුණත් සියල්ල ඇත්තේ අපිළිවෙළකට බව ගුප්තට වැටහෙන්නේය. මේ භික්ෂුව තරමක් අමතක වීම් සහිත කෙනෙකු බව ගුප්තට සිතෙන්නේය. මල්ලේ උඩ තිබිය යුතු දේවල් මල්ලේ යටට දමාගැනීමෙන් නිතරම භික්ෂුව මල්ලේ අඩිය අතගැම සඳහා මල්ලේ බඩු අදිමින් සිත කලබල කරගන්නා ආකාරය ගුප්ත මේ වන විට කීප වතාවකදීම දැක තිබුණේය.

තට්ටු වෙළෙන්දාගේ තට්ටුව මත ඇති විවිධ දේව ප්‍රතිමා බුද්ධ ප්‍රතිමා දෙස ගුප්ත මොහොතක් බලා සිටියේය. දේව ප්‍රතිමා අතර තිබූ සිව දේව සංකේතයක් ඔහු අතට ගෙන අතගා බැලුවේය. තමා සිටින්නේ සිව දෙවියන්ගේ අඩවියේ බව

ගුප්ත කල්පනා කළේය. තණපත් සහිත උස් භූමිය පසු කර පඩිපෙළක් දිගේ සම්මුඛ චෛත්‍යයේ උඩට ගොස් සිරි නරඹන සංචාරකයන් පිරිස දෙස ගුප්ත බලා සිටියේය. හුමායුන් නමැති මෝගල් අධිරාජයා විසින් ගරාවැටී තිබූ මෙම චෛත්‍යය මුදුනේ පල්ලියක් තනවා තිබූ බව ගුප්ත අසා තිබුණේය. ඒ පල්ලිය ඉදි කර තිබුණේ හරියටම කොතැනදැයි සෙවීමට ගුප්තට වුවමනාවක් නොතිබුණේය. එහෙත් මුස්ලිම් ජනයා මේ ස්ථානයට එන යන හැටි ගුප්ත මීට පෙරද දැක තිබුණේය.

ගුප්ත නැවතත් අශ්වයා මුදාහළ ස්ථානයට අඩි ඉක්මන් කොට ගියේ ඌ තරමක් ඈතට ගොස් සිටි නිසාය. මේ අශ්වයා සමග සැහෙන ගමනක් යැමට ඇති බව ගුප්ත දන්නේය.

දුංකොළ ගුළියේ ශක්තිය තරමක් හීන වී ගොස් තිබූ නිසා නැවතත් දුංකොළ කුඩු ගුළියක් ඒදාගෙන හක්කේ ඔබාගත් ගුප්ත අශ්වයා කරත්තයේ බැන්දේය.

භික්ෂුව සම්මුඛ ස්තූපය වන්දනා කොට ධම්මරාජික ස්තූපය දෙසට යැමට පියවර තැබුවේය. භික්ෂුවගේ අණින් ගුප්ත වතුර බෝතලයත් රැගෙන භික්ෂුවගේ පිටුපසින් ගමන් කළේය. යාචක දරුවෝ කාසි ඉල්ලමින් භික්ෂුවගේ පිටුපසිනුත් ඉදිරියෙනුත් ගමන් කළෝය. භික්ෂුව ඔවුන් පලවා හරිමින් ඉදිරියට ගියේය.

''මම උඹලට හිඟමන් දෙන්නෙ නෑ..... උඹල ඒවට පුරුදු වෙච්ච නිසා තමයි උඹල හැමදාම එකතැනම ඉන්නෙ...'' භික්ෂුවගේ ගෙරවුම් හඬේ අර්ථ නොදත් යාචක දරුවෝ නැවත නැවතත් භික්ෂුවට කරදර කරමින් භික්ෂුවට අත පැවෝය.

''ගුප්ත, උඹම කියපං මේ ළමයි හිඟා කන්නෙ නැතිකමටද බැරිකමටද පුරුද්දටද නැත්තම් වෙන කාගෙ හරි වුවමනාවටද?''

''ඒ ඔක්කොගෙම එකතුවක් වෙන්න ඇති හාමුදුරුවනේ...''

''උඹලගෙ රටේ මහ එවුන්ගෙ නම් හරි කරුණාව අපේ රටවල්වලට උදව් කරන්න.. ඒ වුණාට මෙකෙ තමයි හැමතැනම හිඟන්නො ඉන්නෙ... මුන්ට හිඟමන් දීල අපි කරන්නෙ වැරැද්දක්. මුන්ව තවත් ප්‍රපාතෙට ඇදල දාන එක...

උන් තමන්ට වෙලා තියෙන්නෙ මොකද්ද කියල අඩුම තරමින් හිතන්නවත් පෙලඹෙන්නෙ නැති ජාතියක් කරන එක.. පූසෙක් ඤාව් ගානකොට කවුරුහරි කන්න දෙනව නම් ඌ හැමදාම කරන්නෙ ඤාව් ගාන එක විතරයි... ඌ දන්නව ඤාව් ගාන එක විතරයි කරන්න ඕන කියල... මේ ළමයින්ටත් වෙලා තියෙන්නෙ ඒක.... මේ ළමයින්ට කියා දෙන්නයි ඕන කවුරුහරි ඒ ළමයින්ට වෙලා තියෙන ආසාධාරණය මොකද්ද කියලා... එතකොට කෑම හොයාගන්න මේ ළමයි පෙලඹේවි..." භික්ෂුව දිගටම කියන දේවල් ගුප්ත පමණක් තේරුම් ගත්තේය. ළමයි රංචුව තම උත්සාහය අත් නොහරිමින් භික්ෂුවගේ පසුපසම ආවෝය.... තමන්ට කිසිවක් නොලැබෙන බව දැනගත් එක් පුංචි දරුවෙක් භික්ෂුව ඉදිරියට පැමිණ තම කමිසය ගලවා බඩ පෙන්නුවේය. භික්ෂුවට තමා ඉගෙනගත් න්‍යායන් අමතකව ගියේය... මොළය වෙනුවට හදවත කතා කරන්නට පටන් ගත්තේය... ඒ සමගම පන්තිකාමරයේ මිටි බිත්තියට බර වී ඉකිගසන දූරියගේ රූපය භික්ෂුවට පෙනෙන්නට පටන් ගත්තේය...

"ඇයි ඔයා අඬන්නේ?"

"මගේ බඩ රිදෙනවා... කලන්තෙ වගෙ..."

"මොනවද කෑවේ?"

"කිසිම දෙයක් කෑවෙ නෑ..."

"උදේටවත්...?

"ඊයෙ දවල්ට මසියොක්කා කෑව ලුණුමිරිස් එක්ක. රෑට කෑවෙ නෑ" දූරිය බිම බලාගෙන කීවාය.

"අනේ..."

"කමක් නෑ තව ටිකකින් හරියාවි. මං ටැප් එකෙන් වතුර බිව්ව බඩ පිරෙනකං."

පාසල ඇරෙන්නට තවත් ටික වෙලාවක් ඇත. පන්තියේ ගුරුවරයෙක් නොසිටියේය. ළමයි ගෙවල්වලට යෑමට පොත් අහුරමින් සිටියෝය. මිටි තාප්පයට හේත්තු වීගෙන බඩගින්න නිසා අඬන දූරිය ගැන දරුවා දුක් වූයේය.

"මාත් අද මොනවත් කෑවෙ නෑ නර්මදා..." ළමයා කීවේය.

"බොරු කියන්නෙපා... ඇයි ඔයා ගෙදරින් එනකොට කෑම ගේන්නැද්ද?"

"ගේන්න දෙයක් තිබුණෙ නෑ ගෙදර."

"ඔය බොරු. ඔයාට බඩගිනි නෑ..."

"මේ බලන්න මගේ බඩ දිහා" ළමයා කමිසය උස්සා බඩ පෙන්නුවේය.

"අනේ එහෙනම් ඔයත් බඩගින්නෙ"යි දූරිය කීවාය. ඇය නැවතත් බඩ අල්ලාගෙන මිටි බිත්තියට හේත්තු වී කෙදිරිගෑවාය.

"ඔයා ඔහොමම ඉන්න" දරුවා කැන්ටිමට දිව්වේය.... කැන්ටිම ඇතුළට ගිය දරුවා සාක්කුව අතගෑවේය.. සල්ලි නොතිබුණේය.. අනිත් සාක්කුවද අතගෑවේය. එහිද සල්ලි නොතිබුණේය.. තමා ළඟ සල්ලි නැති බව දරුවාට මතක් වුණේය. ළමයා කැන්ටිමේ එහාට මෙහාට ගියේය. මුදලාලි තවත් ළමයෙකුට බඩු විකුණමින් සිටියේය. දරුවා කැබිනෙට්ටුව ළඟට ගියේය. ඒ කැබිනෙට්ටුවේ බනිස් තිබුණේය. දරුවා හිමින් කැබිනෙට්ටුව ඇර බනිස් ගෙඩියක් අරගත්තේය. එය කාටවත් නොපෙනෙන ලෙස කලිසම් සාක්කුවේ ඔබා ගත්තේය... ආපසු දිව්වේය....

දූරිය බඩ අල්ලාගෙන මිටි තාප්පයට බර වී සිටියාය.

"මේක කන්න" දරුවා බනිස් ගෙඩිය දූරියට පෑවේය. දූරිය බනිස් ගෙඩිය ගෙන දෙකට කඩා කෑල්ලක් දරුවාට දුන්නේය.

"මට බඩගිනි නෑ. මං යන ගමං අඹ කඩාගෙන කන්නම් කැලේ ගහෙන්. ඔයා කන්න."

"අපි දෙන්නම යන ගමං අඹ කමු. ඔයා මේ කෑල්ල කන්න. මට ඇති." දූරිය නැවතත් බනිස් කෑල්ල දරුවාට දුන්නාය. දරුවා එය කටේ ඔබාගත්තේය. එය ගිලෙන්නටත් පෙර පිටුපසින් පැමිණි විදුහල්පති ළමයාගේ අතින් අල්ලාගත්තේය. මුදලාලි පිටුපසින් සිටියේය.

"හොර තක්කඩියා..! තොගේ මහ එවුන්ගෙන් ඉගෙන ගත්තද හොරකම් කරන්න?" විදුහල්පති දරුවාගේ පස්සපැත්තට වේවැලෙන් පහර දුන්නේය.. අන්දමන්ද වූ දූරිය "අනේ සර්, එයාට ගහන්න එපා.." යැයි කෑගැසුවාය..

"උඹත් මේකෙ හවුල්කාරයෙක් එහෙනම්" කියමින් විදුහල්පති දූරියටද වේවැලෙන් පහර දුන්නේය..

"මගේ හැමදාම බනිස් අඩු වෙනව සර්, මේ ළමය තමයි ඔය වැඩේ කරන්න ඇත්තේ හැමදාම" මුදලාලි කීවේය.. තවත් කෝප වූ විදුහල්පති ළමයාට තවත් පහර දුන්නේය.. දූරිය විලාප දුන්නාය. ළමයා ඉවසා සිටියේය. පහරදීම නැවතූ විදුහල්පති ළමයා කාර්යාලයට කැඳෙව්වේය..

"හෙට අම්ම හරි තාත්ත හරි එක්ක ඉස්කෝලෙට එනවා! දන් පන්තියට යන්න පුළුවන්. අම්ම හරි තාත්ත හරි නැතුව ආපහු ඉස්කෝලෙ එනවා නෙමෙයි..." විදුහල්පති විනය නීති අකුරටම ක්‍රියාත්මක කරන බව ඇඟෙව්වේය.. ළමයා පන්තියට ගියේය.. පන්ති භාර ගුරුවරිය පන්තියේ සිටියාය. දූරිය දරුවා දෙස බලා සිටියේය. දරුවා කිසිවක් නොකීවේය... එහෙත් ළමයි කෑගැසුවෝය..

"බනිස් හොරා... බනිස් හොරා..."

"නර්මදාට බඩගිනි වෙන කොට මෙයාට දුක හිතිලා! හූ හූ... තවත් ළමයෙක් කොක්හඬ ලෑවේය.. පන්තිභාර ගුරුවරිය ඒ ළමයින් නිශ්ශබ්ද කරමින් කතා කළාය..

"අපූරු ජෝඩුව.. ඒ වුණාට හොරකම් කරල කන්න දෙන එක හරි නෑනෙ. ඉගනගෙන රස්සාවක් කරල කන්න දෙන්න." ළමයි නැවත හිනා වුණෝය.. දූරිය බිම බලාගෙන සිටියාය. දරුවාද බිම බලාගෙන සිටියේය. අවසාන සීනුව නාද වූයේය.

දරුවාත් දූරියත් පාසලෙන් පිට ව ගෙදර යන්න ගියෝය. දෙදෙනාම වෙනදා යන එම මගේ වෙනදාට වඩා දුක්මුසු මුහුණින් යුතුව නිසොල්මනේ ගියෝය. ළඳුකැලෑව මැදින් යද්දී දරුවා කතා කළේය..

"ඔයාට රිදෙනවද?"

"ඔයාට...?" දූරිය ඇසුවාය.. ළමයා නැතැයි අඟවමින් ඔළුව වැනුවේය.

"මට ගොඩක් බඩගිනි."

"මටත් ගොඩක් බඩගිනි."

"අපි අඹ අහුලමු."

"මම අහුලගෙන එන්නම්. කැලෑවෙ අපි දෙන්න තනියම යන්න හොඳ නෑ."

"ඒ මොකෝ.... අපි යන්නෙ අඹ අහුලන්න.... මාත් එනවා...."

"හම්. එහෙනම් යමු."

භික්ෂුවට එතැනින් එහා යමක් සිහි කළ නොහැක්කේය... ඉන් පසුව ඇහෙන්නේ අඹ ගස් එකට ඇතිල්ලීමෙන් නැගෙන මූසල හඬත් ඒ හඬ සමග මුසු වූ ඉකිබිඳුම් හඬත්ය...

"මෙන්න මේ කාසි ටික මුන්ට බෙදා දීපං ගුප්ත" යැයි කියමින් භික්ෂුව වම් උරයේ එල්ලාගෙන සිටි ගමන් මල්ලෙන් කාසි අහුරක් අරගෙන ගුප්ත අතට දුන්නේය.

භික්ෂුව තමා අතට දුන් කාසි අතර සත පනහෙ කාසි පමණක් නොව, රුපියල් පහේ කාසියකුත් තිබෙන බව ගුප්ත දුටුවේය. ගුප්ත ඒ කාසි පොඩි දරුවන් මැද්දට දැමුවේ ය. සත පනහේ කාසි අතහැර රුපියල් පහේ කාසියට සියලු දරුවෝ පොරකෑවෝය. ගුප්ත තම සාක්කුවේ තිබූ කාසි කිපයක්ද දරුවන්ට දුන්නේය.

භික්ෂුව පා ඉක්මන් කරද්දී ගුප්තද භික්ෂුව පිටුපසින් ගියේය. ගුප්ත එසේ යන ගමන් නැවත කාසිවලට පොරකන දරුවන් දෙස ආපසු හැරී බැලුවේය. භික්ෂුව තම හිස මත වැටෙන හිරු රැස් වැළකීමට අත්ල හිස මත තබාගෙන ගමන් කළේය. ගුප්ත තම හිස දෙපසින් ගලන දහඩිය දිව අගින් ගෙන රස බැලුවේය. ඔහුට එක්වරම මතක් වූයේ තම කුඩා කාලයේ චපාති රොටි අරභයා තම අයියා සමග කළ අරගලයකි. ගල් අඟුරු ළිපේ මැටි බිත්තියේ

රස්නෙත් බුබුළු නැගී පිච්චෙන චපාති රොටි සඳහා අම්මා පුංචි පිටිගුළි දෙකක් පාවිච්චි කිරීම ගැන තමා හෝ අයියා කිසි දිනක කැමති නොවූ බව ගුප්තට මතක් වන්නේය. මේ පිටිගුළි දෙකින් කොයි පිටිගුළිය ලොකුවට තිබේදැයි ඇඟිලිතුඩුවලින් මැන බලා ''මෙ පිටිගුළියෙන් හදන රොටිය මට'' කියමින් අයියා ලොකු ගුළියේ රොටිය ඉල්ලා සිටින්නේය.

''නෑ නෑ. ඒක මට'' යැයි තමාද අයියා සමග පිටිගුළි බෙදාගැනීමට රණ්ඩු වෙද්දී අම්මා වැඩි පිටිගුළියේ ස්වල්පයක් ඇඟිලිතුඩින් ගෙන අනික් ගුළියට එකතු කරන්නීය. නැවතත් අතින් මැන බලා සෑහීමකට පත් වූ පසු පළමු රොටිය කාටදැයි යන ගැටලුව අරභයා අරගලය ඇති වන්නේය. අම්මා පැත්තක් නොගෙන ඉක්මනින් දෙදෙනාටම රොටි පුච්චා දෙන්නට හැදුවත් පළමු රොටිය වෙනුවෙන් කෙරෙන අරගලය නොසංසිඳෙන්නේය. එවිට අයියා කියන්නේ ''මමයි වැඩිමල්'' කියා ය. ''ඒ වුණාට මටයි වැඩිපුර බඩගිනි'' කියමින් තමාද පළමු රොටියේ අයිතිය වෙනුවෙන් සටන් කළ බව ගුප්තට මතක් වන්නේය.

''කෝ උඹේ බඩ පෙන්නපං?''

''මේ බලපං'' තමා කමිසය ගලවා අයියාට ඇකිලී ගිය බඩ පෙන්නද්දී අයියාද තම බඩ පෙන්නූ බව ගුප්තට මතක් වන්නේය.

එසේ බඩ පෙන්නමින් ''මගෙයි වැඩිපුරම බඩ ඇකිලිලා තියෙන්නෙ'' යැයි අයියා කියන්නේය.

''නෑ මගේ... ඕන නම් මැනල බලමු.''

''උඹලා දෙන්නාගෙම බඩට වැඩිය මගේ බඩයි ඇකිලිලා තියෙන්නෙ. මේ බලාපල්ලා! ඒ නිසා රංඩු නොකර කාපල්ලා.'' අම්මා දිය වී ගිය මලකඩ පාට සාරිය සමගම බඩට අත තබා අත්ලෙන් ඇයගේ බඩ මැන පෙන්වන්නීය. පසුව තමා අයියාට පළමු රොටිය දී දෙවැනි රොටිය වැඩිපුර බඩ ඇකිලී තිබූ අම්මාට දුන් බවත් අම්මා එයින් කොටසක් කඩා තම කටේ ඔබමින් ඇඬූ හැටිත් ගුප්තට සිහිපත් වන්නේය.

භික්ෂුව ගුප්තව පසු කර ගොස් ධම්මරාජික ස්තූපය දෙස බලා සිටියේය. කොණ්ඩඤ්ඤ හිමියන් නැවත මුණගැසීමේ කැමැත්තෙන් භික්ෂුව බලා සිටියේය... එහෙත් තමාට මේ මුණගැසුණේ කොණ්ඩඤ්ඤ හිමියන්මදැයි භික්ෂුවට සැකයක්ද ඇත්තේය. එවන් කරඬුවක් භාර ගැනීමට තමා කෙසේවත් සුදුස්සෙකු නොවන බව භික්ෂුවට සිතෙන්නේය. තමා යම් මනෝ විකාරයකින් දුටු දර්ශනයක් විය හැකි බව ඒ සමගම භික්ෂුවට සිතෙන්නේය. භික්ෂුව සෑහෙන තරම් සන්සුන් ගමනින් බිම පරීක්ෂා කරමින් බිම වැටුණු යමක් සොයන මගියකු පරිද්දෙන් ස්තූප භූමියේ ඇවිද්දේය.

'ඔය කිව්වට කොණ්ඩඤ්ඤ හාමුදුරුවො වඩින එකක් නෑ. මං මහ පෘථග්ජන භික්ෂුවක් කියල උන් වහන්සේට නොපෙනෙන්න විදියක් නැහැ.'

එසේ සිතද්දීම හාත්පස නැවතත් වලාකුළකින් වැසී ගියේය. ඒ සමගම නැවතත් මුවන් සාවුන් ගැවසීගත් වනවදුලක තමා තනි වී සිටින බව භික්ෂුවට දැනුණේය.

''දැන් ඔබ ඉන්නෙ අප පළමු ධර්මය ඇසූ ඉසච්චෙමයි.. මා ඔබට මේ කරඬුව භාර දෙන්නෙ ඒ ශුද්ධ වූ ස්ථානයෙදීමයි. මෙය භාරධූර වගකීමක්. එය ඉටු කරන්න උත්සාහ ගන්න.. ඔබට මතක ඇති අර මා පෙන්වූ කරඬුව ඇතුළත තවත් කරඬුවක් තිබූ බව. ඒ කරඬුව තමයි මේ. ඒ මහ කරඬුවෙන් මුදාගත්ත මේ කරඬුවෙ තමයි අප ඇසූ පළමු ධර්මය ඇතුළත් රන්පත තැන්පත් කර තිබෙන්නේ.. ඔබට පේනවා ඇති මෙහි පාදමේ ඇති ලියවැල් සමූහය හැර ඒ මහා කරඬුවේ මෙන් සංකීර්ණ කැටයම් ලියකම් නැති බව. මේ කරඬුවේත් අර මහ කරඬුවේ වගේම සිදුරක් තිබෙනවා. එහෙත් එය ඉතා සියුම් සිදුරක්.. ඒ සිදුර සොයාගන්නකුට එයින් මෙහි ඇතුළත දැකිය හැකියි. එම සිදුරින් ඇතුළත බලන්නකුට අප ඇසූ පළමු ධර්ම දේශනාව නැවත ඇසීමේ දැකගැනීමේ හැකියාව ලැබේවි.. එහෙත් කරඬුව මතුපිටින් බලන්නකුට එහි ඇති වෙනත් වටිනාකම් මිස වෙන කිසිවක් නොපෙනේවි. මේ කරඬුවෙ ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් තිබෙනවා... ඒ කරඬුවට ලොබ බැඳගත් සතුරු පිරිසක්

ඒ කරඬුව අත්පත් කරගන්න උත්සාහ කරනවා... ඒ නිසා එය ආරක්ෂා සහිතව රැගෙන යා යුතුයි. එය ඔබ දළදා කරඬුවේ තැන්පත් කළ යුතුයි.. ඒ වගකීම මම ඔබට භාර කරනවා...''

''අනේ! මා වගේ සාමාන්‍ය භික්ෂුවක් කොහොමද එය කරන්නේ...? මම කිසිම බලයක් තිබෙන කෙනෙක් නෙමෙයි...''

''එයම තමා ඔබ සතු සුදුසුකම. ඔබ වගේ සාමාන්‍ය කෙනකු අත එම කරඬුව තිබෙන බවට කිසිවකුත් සැක කරන එකක් නැහැ.. ඔබත් එහි සියුම් වූ සිදුර සොයාගන්න උත්සාහ කරන්න..''

''ඔබලා වගේ උත්තමයින් නිර්මාණය කරපු මුද්‍රාවන් අපට වටින්නෙ පාරිභෝගික චෛත්‍ය විදියට වන්දනාමාන කරන්න. ඒ භාග්‍යවන්ත අවස්ථාව මට ලැබෙනවා නම් මා ගොඩක් සන්තෝෂ වෙනවා..''

''ඔබ ඉතා සාමාන්‍ය කෙනකු ලෙස හැසිරෙනවාට මා අකමැතියි. යමකුට මේ කරඬුවේ මා කියූ සියුම් සිදුර සොයාගෙන එතැනින් මේ තුළ තිබෙන අප ඇසූ පළමු ධර්මදේශනාව නැවත ඇසීමේ භාග්‍ය උදා කරගත හැකියි.. පහුර එතෙර වීම පිණිස තිබෙන්නක් බව මතක තබාගන්න.''

''ඒත් ස්වාමීනි, ඔබ වහන්සේ මුලින්ම ඇසූ සූත්‍රය අප සතුව තිබෙනවානේ..... එය අපට කටපාඩමින් කිව හැකියි..''

''මෙහි ඇත්තේ අප ඇසූ මොහොතේම ලියූ රන්පතයි.''

''එහෙමයි....'' භික්ෂුව කරඬුව දෝතින් භාර ගත්තේය... එය බරෙන් ඉතා අඩු එකක් වුණේය. පාදම විවිධ කුඩා ලියවැල්වලින් හැඩ වී තිබුණේය.. ඒ හැම ලියවැලක්ම ගර්භය දෙසට මුහුණලා නිමාවට පත් වී තිබුණේය. ගර්භය ලියකම් රහිත මතුපිටකින් යුත්ත වූවේය... කරඬුවේ කොතද ඉතා සරල නිමාවකින් යුත්ත වූයේය.

''මේ කරඬුව අරභයා මා කෙසේ පිළිපැදිය යුතුද හාමුදුරුවනේ...? මෙය ගෞරවනීය ලෙස මා ළඟ තබාගන්නේ කෙසේද?''

''දැනට අවශ්‍ය ඊට ආරක්ෂාව පමණයි. ඒ නිසා ඔබගේ ගමන් මල්ල තුළ එය තබාගන්න... කරඬුවේ පිටත අපවිත්‍ර වීම ගැන ඔබ නොසිතන්න.. ඇතුළත තිබෙන දේ අපවිත්‍ර නොවන ලෙස ආරක්ෂා කරගන්න....''

''එය අපවිත්‍ර වන කාරකයන් මොනවාද ස්වාමීනි?''

''සතුරන් අතට පත් නොවන්න වග බලාගන්න.''

''මා සතුරන් හඳුනාගන්නේ කෙසේද?''

''කරඬුව ඇතුළත ඇති දේ නොයිල්ලා කරඬුව ඉල්ලන යමෙක් වේ නම් ඔහු සතුරකු බව සිතන්න.''

''එහෙමයි.....'' කරඬුව කුමන ගමන් මල්ලේ තබාගත යුතුදැයි මීළඟට භික්ෂුව කල්පනා කරන්නට පටන් ගත්තේය.. දකුණු උරයේ මල්ලට වඩා වම් උරයේ මල්ල පිරිසිදුයැයි භික්ෂුවට වරෙක සිතෙන්නේය. වම් උරයේ මල්ලට වඩා දකුණු උරයේ මල්ල පිරිසිදුයැයි ඊළඟට සිතෙන්නේය..

'නෑ මේ මලු දෙකම එක වගේ. කොයි එකේ දැම්මත් මට පැවරිලා තියෙන්නෙ මේක ආරක්ෂා කරල ගෙනියන එක විතරයි' සිතූ භික්ෂුව එය දකුණු පස මල්ලේ තැන්පත් කරගත්තේය.

''අනේ මා මෙය ගමන් මල්ලේ මෙසේ දැමාගත්තේ මෙහි ආරක්ෂාව පිණිස මිස කිසිම අගෞරවයකින් නොවේ'' භික්ෂුව සිතින් මිමිනුවේය.... කොණ්ඩඤ්ඤ හිමියෝ ඒ වන විටත් අතුරුදන් ව සිටියෝය.

තමා මේ කරඬුව ලබාගන්නවා වෙන කවුරුන් හෝ දැක්කේදැයි භික්ෂුව වටපිට බැලුවේය.. ගුප්ත තරමක් ඇතින් සිටිනු දැක භික්ෂුව තරමක් කලබල වූවේය.

''නැත. එය කෙසේවත් විය නොහැකිය.'' දැන් තමා සිටින්නේ නටබුන් වී ගිය ධම්මරාජික ස්තූපය ළඟ බවත් කරඬුව තමාට ලැබුණේ මුවන් සාවුන් ගැවසීගත් වනවදුලකදී බවත් භික්ෂුවට වහා අවබෝධ වුණේය.

"අපි දැන් මුව කොටුව පැත්තට යමු. මට හරි වෙහෙසයි." ගුප්ත භික්ෂුව පිටුපසින් මුවන් ගාල් කර තිබූ තැන දක්වා පිටුපසින් ගියේය. ඒ අතර ගුප්ත දුංකොළ ගුලියක් යළිත් හක්කේ ඔබාගත්තේය.

"මට වතුර බෝතලේ දීපං...." භික්ෂුව මුවන් කොටු කර ඇති දූල් බිත්තියට මදක් බර වී වතුර බීවේය. භික්ෂුව වතුර බොද්දී දූල් කොටුවේ සිටි මුවපොව්වෙක් දිව එළියට දමමින් භික්ෂුව දෙස බලා සිටියේය. තමා මොහොතකට පෙර දුටු භූමියේ නිදැල්ලේ සැරිසැරූ මුවන් වෙනුවට වර්තමානයේ ඒ මුවන් සංකේතවත් කරන දැල් ගැසූ මුව කොටුවේ සිටින මේ පිපාසිත මුවන් දෙස භික්ෂුව නිසොල්මනේ මොහොතක් බලා සිටියේය.

"උඹටත් වතුර තිබහ වෙලාද? උඹට බොන්න තරම් මෙ බෝතලේ වතුර නෑ. කමක් නෑ. මේ ටික බීපං." භික්ෂුව වතුර බෝතලයේ ඉතිරි වී තිබූ වතුර බිඳක් මුවාගේ කටට හැලුවේය.. හිස් වතුර බෝතලය ගුප්ත අතට දී මුවාගේ ඔළුව අතගෑවේ ය. මුවපොව්වා එතැනින් ඉවත් වී ගියේය.

"ගුප්ත, අපි මූලගන්ධකුටි විහාරෙ පැත්තට යමු.." භික්ෂුව ගමන් මල්ල අතගාමින් යමක් සෙව්වේය. ගමන් මල්ලෙන් යමක් එළියට ගැනීමට භික්ෂුවට යන වේලාව දන්නා ගුප්ත නිසොල්මනේ බලා සිටියේය. භික්ෂුව සෑහෙන වෙහෙසකින් පසුව කොන් නැවුණු පොත් පිංචක් එළියට ගත්තේය.

"මේක තමයි ගමන් විස්තරය." භික්ෂුව පොතේ පිටු පෙරළුවේය.

"මම පොත බලාගෙන නෙමෙයි අශ්ව කරත්තෙ දක්කන්නෙ." "ඔව්. උඹ හොඳට පාරතොට දන්න විත්තිය මට තේරෙනවා.. අපි යමු." භික්ෂුව පොතත් කිහිලි ගන්නාගෙන නැගිට්ටේය. ගුප්ත මූලගන්ධකුටි විහාරයට නුදුරින් නතර වීගෙන බැතිමතුන් දෙස බලා සිටියේය.

"උඹත් මේ ස්ථාන වැඳගනිං. දේවාලෙ කපුවට දෙයියන්ව ගානක් නෑ වගේ උඹටත් මේ රටේ ඉපදිච්ච නිසා මේවයෙ ගානක් නෑ මං හිතන්නෙ. ශ්‍රද්ධාවන්තයකු විසින් දැක වැඳපුදාගෙන

සංවේග උපදවාගත යුතු ස්ථාන හතර ගැන උඹ අහල නැති වෙන්න විදියක් නෑ...."

"මං බලාගෙන තියෙන්නෙ."

"බලාගැනිල්ලයි වැඳගැනිල්ලයි දෙකක්.... උඹ කරත්තෙ දක්කනගමන් දැකගන්න එක වැඳිල්ලක් වෙන්නෙ කොහොමද?"

"මට ඒ ඇති.."

"ඔව්, උඹ හොඳ බෞද්ධයෙක් නෙමෙයිනේ?" භික්ෂුව ගුප්තගේ මුහුණ දෙස සෘජුව බලාගෙන ඇසුවේය.

"මං හැම ආගමකම සංකේතවලට ගරු කරනවා... ඒ ගරු කරන්නේ ඒ හැම සංකේතයකටම සංස්කෘතික කතාවක් තිබෙන නිසා..." ගුප්ත සන්සුන් ලෙස කීවේය.

"උඹට දැනෙන්නෙ ඒක විතරද? ඒවයි උගන්නන දේවල්වලින් උඹ විශ්වාස කරන, අදහන දේවල් නැද්ද?"

"තියෙනවා. ඒක සාතිශය පෞද්ගලිකයි.... ඒ නිසා ඒවා මා සමගම තිබිච්චාවෙ."

"ඒ ඇයි?"

"විශ්වාස කරන කොටසින් ලබන ප්‍රතිඵලය තමාට පමණක් අයිති පෞද්ගලික දෙයක් නිසා..."

"එය හොඳ දෙයක් නම් අනිත් අයටත් කියා දිය යුතුයි නේද?"
"කියා දිය යුතු කොටස ප්‍රදර්ශනය වෙමින් තියෙන්නෙ. ප්‍රදර්ශනය වෙමින් තිබෙන දෙයින් තමන්ට අදාළ කොටස තෝරාගැනීම සාතිශය පෞද්ගලිකයි... එය තවත් කාටවත් දිය යුතු දෙයක් නෙමෙයි.." ගුප්ත හිමින් කීවේය.

මූලගන්ධකුටි විහාරය බැතිමතුන්ගෙන් පිරී තිබුණේය. නෙළුම්මල් සුවඳින් පිරීගිය මලසුන මත භික්ෂුව නෙළුම්මල් වට්ටියක් තබා දොහොත් මුදුන් දී වැන්දේය. ප්‍රධාන බුද්ධ ප්‍රතිමාවේ ධර්මචක්‍ර මුද්‍රාව දෙස භික්ෂුව සෑහෙන වේලාවක් බලා සිටියේය. විහාරයේ බිත්ති මත ඇඳි බුද්ධ චරිතයේ අවස්ථා නිරූපිත චිත්‍ර නරඹමින් භික්ෂුව සෑහෙන වේලාවක් ඔබමොබ

ඇවිද්දේය. ගාථා හඬ, සාදුකාර හඬ, බැතිමතුන්ගේ නත්දෙඩවිලි හඬවල් සමග මුසු වී හික්ෂුවගේ කන් අසල දෝංකාර දුන්නේය. ඉඩ ඇති තැනක් බැලූ හික්ෂුව බුද්ධ ප්‍රතිමාව දෙස බලාගෙන බිම එරමිණියා ගොතාගෙන වාඩි වූවේය. දෑස් පියාගෙන හාවනා කරන්නට හික්ෂුව සැහෙන වෙහෙසක් ගත්තේය. කෙටි කාලයක් පමණක් හාවනා කළ හික්ෂුව පසඟ පිහිටුවා නැවතත් බුද්ධ ප්‍රතිමාවට වැන්දේය. කරඬුවේ සියුම් සිදුර සොයාගන්නට ඇත් නම්යැයි යන හැඟීම මේ සමගම ඇති වුණේය.. එහෙත් මෙතැන කරඬුව එළියට ගැනීම නොකළ යුත්තක් බව හික්ෂුවට දැනුණේය.. තම දකුණු අත මල්ලට ඔබාගෙන කරඬුවේ ගර්භය ඇඟිලිතුඩුවලින් ස්පර්ශ කරමින් එහි සියුම් සිදුරක් ඇද්දැයි හික්ෂුව සෙව්වේය.. එහෙත් එවැන්නක් හික්ෂුවගේ ඇඟිලිතුඩුවලට අසු නොවුණේය.

කැසට් යන්ත්‍රයකින් ඇසෙන දම්සක් පැවතුම් සූත්‍රය හික්ෂුවට පසුබිමින් ඇසෙන්නේය. ඊට කන් දෙමින් හික්ෂුව නැවතත් කරඬුවේ ගර්භය ස්පර්ශ කළේය.. කරඬුවේ මටසිලිටි මතුපිට පමණක් හික්ෂුවගේ ඇඟිලිතුඩුවලට අසු වුණේය. ඒ සියුම් මතුපිට අතගාමින් හික්ෂුව විහාර බිත්ති පුරා ඇඳි සිතුවම් දෙස බලා සිටියේය. ජපන් ජාතික චිත්‍රශිල්පී කොසෙට්ටුගේ හිතේ තිබූ බුද්ධ හක්තිය විසින් මේ සිතුවම් ඇඳෙන්නට ඇතැයි හික්ෂුව විශ්වාස කළේය. බෝධිසත්ව ජීවිතයේ අතීතය තමා කියවා ඇති චරිත විස්තර අනුව ගළපාගැනීමට හික්ෂුව උත්සාහ ගත්තේය. ඒ සමගම හික්ෂුවට තම ජීවිතයේ පැවිද්දට ආ ගමන් මගේ චිත්‍ර දෑස් ඉදිරිපිට මැවී පෙනෙන්නට වුණේය.. හික්ෂුවගේ අත හදිසියේම කරඬුවෙන් මිදී මල්ලේ තවත් සාක්කුවක තිබූ යමක දැවටුණේය.. හික්ෂුව එය අතට ගත්තේය.. එය හිස් පතුරන් විල්ලක් ගසන ලද, දෙකඩ වූ පැන්සලක කොටසකි. පැන්සල්තුඩ දබරැඟිල්ලෙන් අතගා බැලූ හික්ෂුවට එහි සියුම් තියුණු මිනිරන් තුඩ ඇඟිලිතුඩට අසු වුණේය... ඒ සමගම ගස් දෙකක අතු සුළඟට පැද්දෙමින් එකට ඇතිල්ලෙන හඬ ඇසෙන්නට පටන් ගත්තේය... ඒ හඬ සිහින් කෙඳිරියක්ව දම්සක් පැවතුම් සූත්‍රයේ හඬ යටපත් කරමින් දෙකන් අසල ඇසෙන්නට වුණේය. ඒ සමගම එම හඬට එකතු වූ දුක්බර වීණාහඬක්ද ඇසෙන්නට වුණේය ''දෙයියනේ! මෙක මට ඇහෙන්නෙ ඇයි.... මට විතරක්ද මේ කරදරය...? අනේ! මට ඒ හඬ දැන් අහන්න වුවමනාවක් නෑ...''

හික්ෂුව පැන්සල් කැබැල්ලෙන් අත මුදාගෙන දම්සක් පැවතුම් සූත්‍රයට කන් දීමට උත්සාහ ගත්තේය.. කැසට් යන්ත්‍රයේ ඇසෙන දම්සක් සූත්‍රයේ තාලයට එම සූත්‍රය පොත බලාගෙන සජ්ඣායනා කරන බැතිමතුන් පිරිසකගේ හඬ හික්ෂුවට ඇසෙන්නට වූයේය.. ඒ හඬින්වත් තම කන් අසල ඇසෙන හඬ යටපත් වේයැයි හික්ෂුව සිතුවේය. එහෙත් ඒ සියලු හඬවල් අතරින් වීණාහඬක් සමග නැගෙන ශෝකී හඬක් ඇසෙන්නේය. හික්ෂුව නැවතත් බුද්ධ ප්‍රතිමාව දෙස දෑස් හැර බැලුවේය.

''දෙයියනේ!'' යැයි කියූ හික්ෂුව එම පැන්සල් කැබැල්ල කරඬුව තිබූ මල්ලෙන් අනිත් මල්ලට මාරු කළේය...

''උන් වහන්සේ මට කරඬුව දීපු වෙලාවෙ මට ඒක අමතක වුණානෙ...'' ඒ සමගම තමා කළේ වරදක්යැයි යන හැඟීමෙන් හික්ෂුව දුක් වූවේය..

'කමක් නෑ. ඒක කරඬුවේ ගැවුණේ නැනේ' යි සිත හදාගත් හික්ෂුව ගමන් මලු දෙක කරේ එල්ලාගෙන එතැනින් නැගී සිටියේය; අනතුරුව තරමක් නොසන්සුන් ගමනින් මූලගන්ධකුටි විහාරයේ දොරටුව දක්වා පැමිණියේය. හික්ෂුවට සියල්ල අමතක කොට සැහැල්ලු සිතක් ලැබීමේ අවශ්‍යතාව තදින්ම දැනී තිබුණේය. එයින් පසු හික්ෂුව සෑහෙන කෙටි කාලයකින් අවට නටබුන් ගොඩනැගිලි නැරඹුවේය.

එදින දහවල හික්ෂුව ඉන්දියානු කඩයකින් දහවල් දානය ගැනීමට තීරණය කළේය. ඉන්දියානු ක්‍රමයට ආහාර ගැනීමේ කැමැත්තක් හික්ෂුව තුළ මේ ගමන ආරම්භ කිරීමට පෙරම තිබුණේය. ගුප්ත විසින් හික්ෂුව කැඳවාගෙන ගියේ ප්‍රධාන පාරකට යාබදව තිබූ විශාල කෑම කඩයකටය. එහි මිදුල තරමක් විශාලය. ඒ විශාල මිදුලේ තැනින් තැන ලොරි කරත්ත නතර කර තිබුණේය. තැනින් තැන තබා තිබූ ලණු ඇඳන් මත වාඩි වී කඩල පරිප්පු හොද්ද සමග චපාති රොටි ගිල දමන රියැදුරන් දෙස හික්ෂුව බලා සිටියේ වැලකුණක් ඇද දමන කපුටු රංචුවක්

දෙස බලන අප්‍රියතාවකින්ය. ගුප්ත භික්ෂුවට ප්ලාස්ටික් පුටුවක් පෙන්නුවේය. භික්ෂුව එහි වාඩි වීමට පෙර කිපවරක්ම පුටුව අතින් පිස දැමුවේ ය.

''අර කෑම හදන හැටි දැක්කම කොහොමද බං කන්නෙ?''

''පිඟානට දාල ගේන දේ රස බලන්න විතරක් පුරුදු වෙන්න මෙහේ ඉන්නකොට. ඔන්න කැමති නම් රටලූනු මිරිස් කපාපුවත් ටිකක් දාගන්න.... ගල්අඟුරු දාපු ළිපේ මැටි බිත්තියට අලවල තමයි මේ රොටී පුච්චන්නෙ. ඒ රොටිය පිඟානට වැටුණම ආට පිටි කරවුණහම දැනෙන රස විතරක් ගැන හිතුවහම රොටිය කන්න පුළුවන්... මං ඉස්සර ගල් අඟුරු ආකරවල වැඩකරන දුප්පත් කම්කරුවො ගැන. ඒ මිනිස්සුන්ගෙ ශ්‍රමය හූරගෙන කන මුදලාලිල ගැන විතරක් නෙමෙයි රොටිය පුච්චන දාඩිය පෙරාගත්ත මිනිස්සු ගැනත් හිතුවා. ඒ හැම වෙලාවකම මට රොටී හිර වෙන්න පටන් ගත්තා...''

''උඹ හිතුව විතරනෙ? කරපු දෙයක් නෑනෙ....? ඔන නැති විකාර කියවන්නෙ නැතුව දවල් වෙන්න ඉස්සෙල්ලා මේක පිලල ආමු.'' භික්ෂුව එසේ කියමින් තම එක් ගමන් මල්ලක තිබූ පැන්සල් කැබැල්ලේ අගට ගසා තිබුණු හිස් පතුරත් කොපුව අගගෑවේය.

භික්ෂුව කහපාට කඩල හොද්දේ පොඟවාගත් චපාතියක් වේලාව ඉක්ම යන්නට පෙර ආහාරයට ගත්තේය. ගුප්තද භික්ෂුවට යාබද වැල් ඇඳ මත එරමිණියා ගොතාගෙන වාඩි වී භික්ෂුව සමගම ආහාර ගත්තේය.

''ගුප්ත, උඹට එරමිණියා ගොතාගෙන ඉදලා හොඳ පුරුද්දක් තියෙනවා. මං දැකල තියෙනවා මෙහේ මිනිස්සු ගොඩක් වාඩි වෙන්නෙ ඒ විදියට. උඹ නම් වනගත තවුසෙක් ආහාර ගන්නව වගේ වාඩි වෙලා ආහාර ගත්තෙ...'' භික්ෂුව නැවත අශ්ව කරත්තයට ගොඩ වෙන ගමං කීවේය. ගුප්ත සිනහවකින් සංග්‍රහ කොට අශ්වයා දක්කන්නට පටන් ගත්තේය.

''ගුප්ත, අපට තව මෙහේ බලන්න වැදගත් තැන් තියෙනව නම් බලලා බුද්ධගයාවට යන්න හෙට උදේම පිටත් වුණොත් නරකද? සිතියමේ හැටියට නම් හැතැප්ම එකසිය ගානක් තියෙනවා...''

''අපට තව වරුවක් ඉතිරි වෙලා තියෙනවා අද දවසෙ. කරත්තෙ ලන්තෑරුම තියෙන නිසා අපට රෑත් තව පැයක් විතර යන්න පුළුවන්. බුද්ධගයාවට යන්න මං දන්නා, තරමක් කොට කරන්න පාරක් තියෙනවා... අද රාත්‍රියේ අපේ ගෙදර නවාතැන් ගන්න පුළුවන්.''

''උඹට හොඳ විදියකට, ලේසි විදියකට, මටත් කරදරයක් නොවෙන විදියකට මේ ගමන යමු... උඹ ගැන මට පුදුමත් හිතෙනවා වෙලාවකට උඹේ ඔය ඇඳුම ඉන්දියාවේ මොන කුලයක් ජාතියක් නියෝජනය කරන ඇඳුමක්ද කියලවත් මං දන්නෙ නෑ.. ඇත්තටම මටත් නින්ද යන හින්දා කරත්තෙ එළවන ගමං උඹේ විස්තර ටිකක් මට කියාපං. මං මේ ගමන ආරම්භ කරද්දිම හිතුව උඹ ටිකක් වෙනස් මිනිහෙක් කියලා..'' භික්ෂුව එසේ කියමින් කරේ එල්ලාගෙන සිටි ගමන් මලු දෙක ඔඩොක්කුවේ තබාගත්තේය..

භික්ෂුව එක් ගමන් මල්ලක් නැවැත අතගා බැලුවේය. කරඬුව නිරුපද්‍රැතව තිබුණේය. අනෙක් මල්ලද අතගා බැලුවේය. පැන්සල් කැබැල්ලද නිරුපද්‍රැතව තිබුණේය. ගුප්ත ඉදිරිය බලාගෙන කරත්තය දක්කද්දී කරඬුව හොඳින් බැලීමේ ආශාවක් භික්ෂුවට ඒ අතරේම උපන්නේය...

''ඉතින්? කියාපං උඹේ විස්තර ටිකක්.....'' භික්ෂුව නැවතත් ගුප්තට ආරාධනා කරමින් ගමන් මලු දෙක දැතින් උකුළට තද කරගත්තේය.

ගුප්ත අශ්වයාගේ වෘෂණ කෝෂ තම පයින් පිරිමදිමින් අශ්වයාට කිති කැව්වේය. අශ්වයා ගමනේ වේගය තරමක් වැඩි කළේය.

''මට ගෑනු තුන්දෙනෙක් ඉන්නවා. දරුවො හය දෙනෙක් ඉන්නවා. අම්මයි තාත්තයි දෙන්නම නෑ. මං ජීවත් වෙන්නෙ ඒ ගෑනුන්ගෙ ගෙදර. සංචාරකයන්ට මග පෙන්නලා තමයි ජීවිතේ ගැටගහගන්නෙ.''

''ගැනු තුන්දෙනෙක් උඹ මොන නීතියකින් එහෙම දෙයක් කරගන්නාද? අනිත් එක ඒ ගැනු දන්නවද ඒ වග?''

''ඔව් ගැනු තුන්දෙනාම ඉන්නෙ එක ගෙදර. උන් අක්කල නංගිලා. එකියක් තාම වයස දාසයයි. ඒකිගෙ ඇස්දෙක පේන්නෙ නෑ.. ගල් අඟුරු දෝනාවක වැඩ කරද්දි විස වායුවකින් ඒකිගෙ ඇස් දෙක අන්ධ වුණේ... ඒ උණාට ඒකි ලස්සන කොල්ලෙක් වැදුව පහුගිය කාලෙ. ඒකි කවද හරි කාත්කවුරුවත් නැතිව තනි වෙයි කියලා මගේ කසාද ගැනි නිතරම මට කිව්වා... ඒකිට පිරිමි දරුවෙක් දෙන්න කියලා. ඒකි සිව දෙවියන්ට භාර වෙලා පිරිමි දරුවෙක් දීල ඒකිගෙ ඒ බය නැති කරන්න කියලා... මං ඒ දේ කළා....''

''එතකොට අනිත් ගැනි කවුද?''

''ඒ මගේ කසාද ගැනිගෙ අක්කා. එයාගෙ මහත්තයා සුදහමුදා සොල්දාදුවෙක්. එයා මැරුණෙ දේශසීමා අරගලයෙදි.. එතකොට ඒ ගැනිගෙ දෙවනි දරුවා බඩට ඇවිල්ලා මාස දෙකකට වැඩිය නෑ.. ඒකිගෙයි දරුවන්ගෙයි තනිකම නැති කරන්න මට සිද්ධ වුණා.''

''ඒව උඹේ වල්කම හින්ද වෙච්ච දේවල් කියලයි මට හිතෙන්නෙ.''

හිසුව සිනාව කට කොනකින් එළියට වඩින්නට ඉඩ හැර තිබේය. ගුප්ත කිසිවක් නොකියා අශ්වයාගේ වලිගය පිරිමැද්දේය. භික්ෂුවට ගුප්ත පිළිබඳව කුකුසක් උපදින්නේය. ඔහුගේ ජීවිතය ගෙවෙන්නේ කා වෙනුවෙන්ද? එය ඔහු තම තෘප්තිය වෙනුවෙන් කරන්නක් ද? නැති නම් අනුන්ගේ තෘප්තිය වෙනුවෙන් කරන්නක්ද? ඔහුගේ ජීවිතය අනුමත කරනු ඇත්තේ කවුරුන් විසින්ද? ඒ ජීවිතයට ආගමෙන් ලැබෙන සමාව කෙබඳු එකක්ද? ගුප්ත සැබවින්ම එසේ කරන්නේ ඔහුගේ වල් සිත නිසාද? භික්ෂුව ගුප්ත පිළිබඳ තීන්දුවකට පැමිණිය නොහැකිව ලතවුණේය..

''ඔබ වහන්සේ ගුප්තට යටි හිතින් කැමතියිනේ'' හිසුව ඒ කටහඬ ගුප්තගේ නොවන බව එක්වරම වටහා ගත්තේය.

කරත්තය අශ්වයාට ඔනෑ ලෙස යන්නට දී සුරුට්ටුවක් උරන ගුප්තයේ ඡායාව යට කරමින් හිසුවට බේරුණ්ඩ වීණාවක් අතින් ගත් අපූරු වස්ත්‍රවලින් සැරසුණු තරුණයකුගේ රූපයක් පෙනුණේය.

''මං පංචසිඛ. සමහර විට මා ගැන අසා ඇති ඔබ වහන්සේ, මා තමයි සූරියවච්චසා ගැන විරහ ගීයක් සාදාගෙන ගොස් බුදු හාමුදුරුවන් ඉදිරියේ ගායනා කළේ...... දැන් වත් සිහි කළ හැකිද?''

''මොකද නැත්තෙ? සක්‍රදේවේන්ද්‍රයාගේ වීණා වාදකයා. අනේ කොහොමද මෙහාට ආවෙ...?''

''මා ඔබ වහන්සේ ළඟට ආවේ නැහැ. ඔබ වහන්සේ මා වෙත පැමිණ සිටී. බලන්න මේ කරත්තය ඔබ වහන්සේ වැඩපු කරත්තයට සමානද කියා'' හිසුවට පෙනුණේ සුදු අශ්වයන් දෙදෙනකු බඳින ලද සාහිත්‍ය පොතපතේ විස්තර කරන ලද අපූරු රන්පැහැ කරත්තයකි.

''ඇත්තටම බුදු හාමුදුරුවෝ ඔබේ විරහ ගීය අනුමත කරාද?''

''ඇයි ඔබ වහන්සේ එසේ අසන්නේ?''

''නෑ නිකං. ඒකෙ තියෙන්නෙ ශෘංගාරය දනවන පද වැලක් නේද? ඔබ සූරියවච්චසාගෙ ශාරීරික අඟපසඟ අපූරුවට වර්ණනා කළා නේද?''

ගුප්ත සමහර වේලාවන්වලදී තමා වෙත හෙළන අවඥා සහගත බැල්මට සමාන හිනාවක් පංචසිඛගේ මුවින් පිට වනු දකිමෙන් හිසුව තරමක් කලබල වූවේය.

''ගුප්තගේ හිනාවට සමානයි නොවේද මගේ හිනාවත්?''

''ගුප්තගේ ජීවිතයත් ශෘංගාර ගීයක් කියාද ඔබ සිතන්නෙ....?''

''මා එය දන්නෑ.. යමකු කරන හැම ක්‍රියාවකම සම්මුතික දැනුමෙන් ලබාදෙන විනිශ්චයක් තියෙනවා. එහෙත් ඒ විනිශ්චය ක්‍රියාවේ පරමාර්ථය කොතරම් දුරට නියෝජනය කරනවාද කියා මා දන්නේ නෑ.''

"බුදු හාමුදුරුවෝ ඔබගේ ගීයට දුන්නයි කියන විනිශ්චය ධර්මයට ගැළපෙන එකක් නෙමෙයි. ඒ නිසා ඒක ප්‍රබන්ධයක් කියලයි මං හිතන්නෙ."

"ඒක මට ගැළපෙන විනිශ්චයක්. එය මගේ පරමාර්ථය හා බැඳිච්ච විනිශ්චයක්.. ඔබ සම්මුතියේ සිටයි ඔබේ තීරණය දෙන්නේ."

"අනේ මන්දා..."

භික්ෂුව කරඬුව හිමින් පිරිමැද්දේය.. එම කරඬුවේ මෙතෙක් අතට නොඅසු වුණු යමක් තම අතේ දවටෙන බව භික්ෂුවට දැනෙන්නේය. කරඬුවේ බඳ කොටසේ ලියවැල් කැටයම් කොට නොතිබුණු බව භික්ෂුවට විශ්වාසය.. එහෙත් එහි දැන් තම අතට අසු වන ප්‍රමාණයේ ලියවැලක් මෝදු වෙමින් ඇති බව භික්ෂුවට පැහැදිලිව දැනෙන්නේය.

"මට ඔබ සම්මුතියේ සිට දෙන විනිශ්චයම ගුප්තටත් දෙන්න පුළුවන්ද බලන්න... එන්න මා සමග ගුප්ත ශෘංගාර ගීයක් ගයන අපූරුව පෙන්නන්න.. පංචසිඛ භික්ෂුවගේ අතින් අල්ලාගත්තේය.

"මට බෑ.." භික්ෂුව අත ගසා දැමුවේය.

"මට නැවතත් සිනා සෙන්නට සිතේවි. ඒ සිනාවට ඔබ අකමැති බව මම දන්නවා. එන්න මා එක්ක..." පංචසිඛ නැවත භික්ෂුවගේ අතින් අල්ලා ගත්තේය. භික්ෂුව නිහඬ වූවේය.

එය තරමක් පැරණි ලී කැටයම්වලින් අලංකාර වූ ගෘහයක් ආසන්නයේ ඇති පොකුණකි. ඒ පොකුණ ළඟ දිය නාන වයස්ගත කාන්තාවකි. ඇය නැවුම් කළයකින් දිය නාමින් සිටියාය.

"බලන්න ඒ පොඩි දැරිවි දෙස" පංචසිඛ සෙමෙන් කීවේය.

"මොන විකාරයක්ද! නාකි ගෑනියක්නේ ඒ."

"අපි දන්නා සම්මුතිය වෙනස් කරමු. ඔබේ සිත දැනුමෙන් බැහැර කරන්න. ඔබ සතු දැනුම සෝදා හරින්න. මම කියනවා ඇය ඉපදුණේ මීට පාළොස් වසකට පෙර කියා. ඒ ඇගේ ළමා කාලයයි." පංචසිඛ භික්ෂුවගේ කනට කර කීවේය.

"එය කෙසේ නම් සිතන්නද? ඈ මිය යන්න පණ අදින මැහැල්ලක්."

"නැහැ. අග සිට මුලට ගණින්න.. එය මුල කියා සිතන්න එවිට ඒ ඇගේ ළදරු කාලය බව හොඳින්ම දැනේවි. ඇය ශාරීරිකව ගමන් කරන්නේ පිටුපසටයි."

ඇය කාට හෝ හෙමින් ආමන්ත්‍රණය කරමින් සිටියාය.

"මා වැඩිවියට පත් වුණ බව මේ ලෝකයටම කෑගසා කියමි... නුඹලාට මගේ හඬ ඇසෙනවා නොවෙද පෙම්බරයිනි.. අනේ මගේ හුරතල් සිනාව උඹලාට පේනවා නොවේද? මං කැමතියි කසී සළුපටකින් සැරසී මේ සොඳුරු මොහොතේ නුඹලා ළඟට පැමිණෙන්න." ඈ ඉතා උද්යෝගයෙන් තම හිස මතින් බේරෙන වතුර බින්දු දෝතින් ගෙන තොල් මත තබතබා කට ඇතුළත පුරවාගත් වාතයෙන් ඒ ජල බිඳු පිටට විදිමට උත්සාහ කළාය.

"පිස්සු ගැහැනියක්!" භික්ෂුව දෑස් ඉවතට ගන්නට උත්සාහ කළේ ය.

"මට අර විදියට හිනා වෙන්න ඉඩ තියන්න එපා තව ටිකක් බලා ඉන්න."

භික්ෂුවට ඒ වයස්ගත ගැහැනිය පිස්සු ගැහැනියකැයි යන සිතිවිල්ලෙන් මිදෙන්නට නොහැකිව පංචසිඛගේ මුහුණ දෙස බලා සිටියේය. නැවතත් ගැහැනිය දෙස බැලුවේය. ඇගේ හිලාබට ඇස්වලින් පිටතට කාන්දු වන පාළු සොහොන් පිටියක දමා ගිය, කාලයක් පැරණි වී ගිය ඇටසැකිල්ලක සේයාව දැක භික්ෂුව නැවත පංචසිඛ දෙස බැලුවේය.

"මම සූරියවච්චසා ගැන බුදු හාමුදුරුවෝ ඉස්සරහ ගයාපු ගීය මේ හේරුණ්ඩ වීනාව වයමින් ආපසු ගයන්නද?"

"එපා. මා මේ විකාර පරිසරයෙන් අරගෙන යන්න මං හිටපු තැනට."

"බලන්න, අර පැමිණෙන්නේ ඔබගේ රථාචාරියා ගුප්ත. ඔහු කොතරම් තෘප්තිමත් සැහැල්ලු ඇඳුමකින්ද සැරසී සිටින්නේ කියා බලන්න."

උඩුකය නිරුවත් ගුප්ත සිවුරුහන් බාමින් ඒ වයස්ගත ගැහැනිය සමීපයට පැමිණෙන ආකාරය භික්ෂුව බලා සිටියේය. ගුප්ත ඒ වයස්ගත ස්ත්‍රිය ළඟින් වාඩි වෙද්දී ඒ දිරාගිය සිරුරින් යුත් ගැහැනිය ඉතා කෑදරකමින් ගුප්තගේ පාමුල වැතිරී විලාප දුන්නාය....

"මගේ පෙම්බර කුමාරයාණෙනි, ආත්ම සියදහස් ගණනක සිට නුඹව සොයමින් මම ඇවිද්දෙමි. නුඹ හැර සියලු කුමරුන් මා වෙත පැමිණියත් ජීවිතේ තෘප්තිය උන් ළඟ නොතිබූ බව මම උඹට දිවුරා කියමි. නුඹ මා ජීවිතේ සෙව් තෘප්තිය කරා ගෙන යන බව මම දනිමි.. ඉතින් මා මෙතෙක් රැකගත් කුමරි බඹසර නුඹට කිසි ලෝභයකින් තොරව දෙනෝදාහක් ඉදිරියේ පූජා කරමි." ඇගේ කෙඳිරුමේ හඬ භික්ෂුව අසා සිටිද්දී ඇගේ වචනයේ තාලයට පංචසිඛ සිය භේරුණ්ඩ වීණාවේ තත් පිරිමැද්දේය. ගුප්ත ඇගේ ගිලීගිය දෑස් දෙස බලමින් වියළී ගිය දෙතොල් මත තම දෙතොල් තබද්දී භික්ෂුව තම සිවුර නැවත හැද පෙරවාගෙන අහස බලාගෙන සිටියේය.

"අපි යමු නේද?" භික්ෂුව ඇසුවේය.

"ඇත්තටම තව වරක් ඔවුන් දෙස බලන්න. ඔය සිවුර ලිහිල් කරගෙන" පංචසිඛ වීණාවේ තත් පිරිමැදුම් හඬ උච්චස්වරයකට හරවමින් කීවේය. භික්ෂුව දුටුවේ ගුප්තගේ සිරුරට සිර වී සිටි හිරිමල් යොවුන් විය නොයික්මවූ තරුණියකි. දෙපසට විහිදුණු ඇගේ දෑත් මත පිපි තිබු නිල් මහනෙල් මල් දෙකක් මත බඹරු සිය දහස් ගණනක් වසා සිටියෝය.

"ඒ වෙන ගැහැනියක් නේද?" භික්ෂුව පංචසිඛ දෙස නොබලමින් ඇසුවේය.

"මං වීණාවේ තත් පිරිමැදීම නතර කරන්නද?"

"එපා. ඒ හඬට මං කැමතියි."

"ඔබගේ සිවුර බොහෝ ලිහිල් වී ඇත.... එය දැන් නැවත සාදාගන්න" කියමින් පංචසිඛ වීණාවේ තත් පිරිමැදීම නතර කළේය. ඒ අතර භික්ෂුව නැවතත් තරුණිය සෙව්වේය. වැහැරී ගිය සිරුරින් වෙහෙස මුදාහරිමින් සිටි වයස්ගත ගැහැනිය ලොඹු කට විවෘත කරගෙන ගුප්ත දෙස බලා සිටියාය. භික්ෂුව වහා තම ලිහිල් වී ගිය සිවුර සකස් කරගෙන දෑස් පියාගත්තේය.

"අපි පැයක් විතර දුං ඇවිත් තියෙනවා" ගුප්තගේ හඬ නැවත භික්ෂුවට ඇසෙයි....

"උඹ මහ වලත්ත මිනිහෙක්."

"ඇයි එහෙම කියන්නෙ."

"උඹ නාකි ගැනුන්වත් අඹුකමට ගන්න මහ නරුමයෙක්."

"ඇයි සිඟිති ගැහැනු? මං හාමුදුරුවන්ට කිව්වෙ මගේ ගෑනිගෙ නංගිගෙ වයස අවුරුදු දාසයයි කියල" ගුප්ත අශ්වයාගේ වෘෂණකෝෂ පයින් පිරිමැද අශ්වයා කුලප්පු කරමින් කීවේය. නිසොල්මනේ ගිය අශ්වයා ගමන වේගවත් කෙරුවේ ය.

"උඹගෙ විකාර! මට උඹගෙ විකාර අහන්න උවමනාවක් නෑ. මං ශ්‍රද්ධාවෙන් යන වන්දනාවක් මේක. සතර ස්ථාන වන්දනා කරගත්තම මගේ අරමුණ සම්පූර්ණයි.." ගුප්ත නැවතත් දුංකොළ බිඳක් හක්කේ ඔබාගත්තේ ය.

අශ්වයා ගමන් වෙහෙසක් පෙන්නුවේය. අශ්වයාගේ වෘෂණකෝෂ පිරිමැදීමෙන් ගමන ඉක්මන් කිරීමට තමා ගත් වෙහෙස ප්‍රතිඵලයකින් තොර බව ගුප්තට දැනුණේය අශ්වයා එයින් කයට උත්තේජනයක් ලබාගෙන ගමන ඉක්මන් කරනවා වෙනුවට හිස දෙපසට වනමින් කට දෙකොනින් කෙළ වැගිරුවේ ය.

"හාමුදුරුවන්ට මහන්සිද?"

"ඔව් මේ කරත්තෙ ගැස්සීම මට ඔරොත්තු දෙන්නෙ නෑ ආසාවට ආවට."

"ගමනෙ මුලම මෙහෙම වුණොත් තව එහාට යන කොට ගමන එපා වේවි."

"නෑ බං. අපි ටිකක් හති ඇර ඇර මේ ගමන යමු."

"අපේ ගෙදරට තව කිලෝමීටර් තිහක් විතර තියෙනවා."

"එහාට ගියාම වතුර ටිකක් නාගන්න ලැබේවිද?"

"ඔව් ළිඳක් තියෙනවා. නානකාමරේකුත් තියෙනවා ළිඳෙන් නාන්න කැමතිනම් මං අපේ ගෑනියකට කියල වතුර අද්දවල දෙන්නම්. හාමුදුරුවන්ට ඇති තරම් නාගන්න පුළුවන්."

"උඹට පිස්සුද! ගෑනුන්ට කියල වතුර අද්දවගෙන නාන්න පුළුවන්ද මට?" භික්ෂුව සුළඟ සමග පොර බැදූ සිවුරුපට හරිගස්සා ගනිමින් කීවේය.

ගුප්ත කිසිවක් නොකීවේය. භික්ෂුව කරත්තයේ ඇන්දට බර වී අහස දෙස බැලුවේය. අහසේ ළා නිල්පාට අඩු වෙමින් තිබුණේය. කරත්තරෝදවලින් නැගෙන චිරිචිරි හඬත් රෝදයේ කඩඇණය බොස් ගෙඩියේ වදින හඬත් භික්ෂුව වරින් වර ඇසුවේය. වාතයේ ගිනියම් බව විසින් භික්ෂුවගේ කය තරමක් දාඩියෙන් තෙත් කර තිබුණේය. භික්ෂුව සිවුරුපට තරමක් පහළට හෙළාගෙන නිහඬව කරත්තය අදින අශ්වයා දෙස බලා සිටියේය.

"උඹ කිව්ව තේද එකියක් අන්ධයි කියල?"

"ඔව්. ඒ වුණාට ඒකි ඇස් පේන එකියකට වැඩිය හොඳින් වැඩපළ කරනවා."

"කොහොම වුණත් ගෑනු ලවා වතුර අද්දවගෙන නානඑක විනය විරෝධී වැඩක්."

භික්ෂුව තරමක් සිහින් හඬින් කීවේය.

භික්ෂුවට එතෙක් ඇසුණු කරත්තයේ හඬ සිහින් කෙඳිරියක් මෙන් කන් අද්දරින් ඈත් වෙමින් තිබුණේය. පියවෙන ඇරෙන දෑස් ආයාසයෙන් ඇරගෙන සිටීමට උත්සාහ ගනිද්දී ඉතා පැහැදිලි සංවාදයක් භික්ෂුවට ඇසෙන්නට වූයේය.

"අපි රොඩී කුලේ. පහත් කුලවලින් වතුර බොන්න තරකයි. නුඹ වහන්සේ උසස් කුලයක."

"කමක් නෑ නැගණියනි, මට වුවමනා කරන්නෙ වතුර ටිකක් විතරයි පිපාසය සංසිඳුවාගන්න. ඒකට කුල කතාවක් මොකටද?"

"අනේ පිං ඇති සුවාමිනේ, උසස් කුලයක ගෙයකින් වතුර ටිකක් ඉල්ලාගන්න. මම කැමතියි නුඹ වහන්සේගේ පිපාසෙ සංසිඳුවන්න. ඒත් ඒක නොහොබිනා වැඩක්."

"නෑ. මට ඔබගෙන්මයි වතුර ඕන කරන්නෙ.."

"මාත් කැමතියි ඔබවහන්සේගේ පිපාසය සංසිඳුවන්න. ඒත් මේ දරුණු සමාජෙ මටවත් නුඹ වහන්සේටවත් සමාවක් දෙන එකක් නෑ.."

"නෑ නැගණියනි, අනුන්ගෙන් කම් නැත... මගේ පිපාසය සංසිඳුවන්න හැකි නුඹටයි. ඔය උතුරා යන පැන් කළයෙන් මට පැන් පොදක් පිළිගන්වන්න."

"එපා එපා! ආනන්ද හාමුදුරුවනේ, ඒ රොඩී ගැහැනියගෙන් පැන් වළඳන්න එපා!" භික්ෂුවට කෑගැසුණේය. ගුප්ත එක්වරම කරත්තයේ වේගය බාල කොට භික්ෂුව දෙස බැලුවේය.

"ඇයි ඔබ වහන්සේ මොර දෙන්නෙ? මගෙන් වරදක් වුණාද? නැති නම් ඔබ වහන්සේ සිහිනයක් දකිමින් සිටියාද?"

"උඹ උඹගෙ වැඩේ කරපං ගුප්ත. උඹට තේරෙන්නෑ මේවා" භික්ෂුව අහක බලාගෙන කීවේය. නැවතත් ආනන්ද හාමුදුරුවන්ට වෙන දේ දකින්නට භික්ෂුවට ඕනෑ වූයේය.

"මම කිව්වා ඔය ටික දෙයියනේ! ඔබ වහන්සේ ධර්ම භාණ්ඩාගාරික නේද? පෘථග්ජන හාමුදුරුනමක් වුණත් බුදුහාමුදුරුවො ළඟම දූවටිච්ච, බුදුහාමුදුරුවො දේශනා කරපු හැම බණක්ම අහපු හාමුදුරුවො නේද? මේ මොකද වෙන්න යන්නෙ? අනේ බුදුහාමුදුරුවනේ, අන්න ආනන්ද හාමුදුරුවො රොඩී ගුබ්බෑයම පැත්තට වඩිනවා.... ඒ ඇස් දිහා බලන්න ලෝභයි. ඒ යන්නෙ අර රොඩී කෙල්ල දුන් පැන් බිඳෙන් පසු මත් වූ සිතින් නොවේද?" ගුප්තගේ පා ස්පර්ශයෙන් පිරිමැදෙන වෘෂණ කෝෂ සහිත අශ්වයා පස්සා ගාත් තාලයට තබමින් ගමන් කරන අයුරු ගුප්ත දුටුවේ ය. අශ්වයාගේ පා පොළොවේ වදින හඬට අනුව භික්ෂුවගේ මඳක් නිරාවරණය වූ උඩුකයද පැද්දෙන්නට වූයේය.

"උඹ ආනන්ද හාමුදුරුවන්ගෙ ජීවිත කතාව අහල තියෙනවද?" භික්ෂුව ගුප්තගෙන් ඇසුවේය.

"ඔව්, මම දන්නවා."

"උඹ හිතන්නෙ ඒ රොඩී කෙල්ලගෙ මොකකට වහ වැටිල ආනන්ද හාමුදුරුවො ඒකිගෙ ගුබ්බෑයමට යනවයි කියලද?" භික්ෂුව ඇසූ ප්‍රශ්නය ගුප්ත බලාපොරොත්තුවෙන් සිටි එකකි.

"ඇය ආනන්ද හාමුදුරුවන්ට පැන් දෙන වෙලාවෙ කළය පහත් කරද්දී ඇගේ ආශ්වාස ප්‍රශ්වාස වායුව ආනන්ද හාමුදුරුවන්ගෙ මුහුණෙ වදින්න ඇති."

"කෙහෙල්මල්! ඒකි අම්මත් එක්ක එක්කහු වෙලා රොඩී දැහැන මතුරනවා... ආනන්ද හාමුදුරුවො දපනෙ වැටුණෙ ඒ රොඩී දැහැන නිසා."

"එහෙනං ආනන්ද හාමුදුරුවන්ගෙ ආශ්වාස ප්‍රශ්වාස වායුව ඒකිගෙ මූණෙ වදින්න ඇති...." ගුප්ත ඉක්මනින්ම පිළිතුරු දුන්නේය.

"ඒක වෙන්නැති. ආනන්ද හාමුදුරුවො නිර්දෝෂියි."

"පොතෙන් දැකපු ආනන්ද හාමුදුරුවො හාමුදුරුවන්නට හැබැහින්ම ජේන වෙලාවෙ හොඳින් බලන්න" ගුප්ත නැවතත් අශ්වයාගේ වෘෂණකෝෂ පයින් පිරිමැද්දේය. තරමක් කුලප්පු වූ අශ්වයා පිම්මක් ඉදිරියට පැන වේගයෙන් දුවන්නට පටන් ගත්තේය.

"උඹ මාව මේ කරත්තෙන් බිමට දාන්නද ඔච්චර වේගයෙන් අශ්වයා දක්කන්නෙ?" භික්ෂුව ගුප්ත දෙස රවා බලමින් ප්‍රශ්න කළේය.

"අශ්වයා කැමතියි ටිකක් වේගයෙන් යන්න. ඒ උගේ හැටි."

භික්ෂුවට වුවමනා වූයේ රොඩී ගුබ්බෑයමෙන් ඇසෙන මිණි කිංකිණි සෙලවෙන හඬට සවන් දීමටයි. ඒ හඬ නැගෙන්නේ රොඩී කෙල්ලගේ අත් වළලු හා පා සිළම්බුවලින් බව භික්ෂුවට පෙනුණේය. ඇගේ දඟකාර කවට සිනාව සමග මුසු වූ ඇගේ පලඳනා හඬ අශ්වයාගේ ගිගිරි හඬත් සමග මුසු වී භික්ෂුවගේ දෙකන් පතුල් ස්පර්ශ කරද්දී ඇ තමා දෙස අනුරාගී දෙනෙතින් බලා සිටින බව භික්ෂුව දුටුවේය. නිමේෂයකින් ලණු ඇඳක් මත වැතිරුණු ඇය ඇගේ ගිගිරි වැල් සහිත දෙපා එකට එකතු කොට ඇඳවැල් මත විලුඹ හප්පමින් ඒ පා ගිගිරිවැල් හැඬෙව්වාය. දෙපතුල්වල රත් පැහැය දක්වාලමින් ඇ ඒ දෙපා තරමක් ඉහළට ඔසවමින් දෑතේ වළලු හැඬෙව්වාය. ඇය රොඩී දැහැන ජප කරන්නේ කටින් නොව දෙනෙතින් බව භික්ෂුව වහා අවබෝධ කරගත්තේය. එක්වරම ඈතින් වඩින ආනන්ද හාමුදුරුවන්ගේ තෝන්තුවා වූ මුහුණ දුටු භික්ෂුවගේ සිරුර දහඩියෙන් තෙත් වන බවක් දැනුණේය. ඒ රත්පැහැ දෙපතුල් දෙස බලාසිටින තම දෑස්වලට භික්ෂුව තරවටු කළේය. එහෙත් ඒ තරවටුවෙන් මෙල්ල නොවූ දෑස් භික්ෂුවගේ ශරීරය අතහැර ඒ දෙපතුල් අසල රැඳී සිටියේය.

"ඔබ වහන්සේ යන්න මෙතනින්!" භික්ෂුව ආනන්ද හාමුදුරුවන්ට අණක් කරන ලීලාවෙන් කීවේය. ආනන්ද හාමුදුරුවන් තම වචනවලට කීකරු බවක් පෙන්වූ බව භික්ෂුව හිතුවේය.

"ඔව් යන්න. ඔබ වහන්සේ යන්න" භික්ෂුව දෙවැනි වර කියද්දී එය හොඳින්ම ඇසුවේ ගුප්තයි. ගුප්ත භික්ෂුවගේ දෙඩවිල්ල ගැන කිසිවක් නොකියා අශ්වයාට කෙවිටෙන් පාරක් ගැසුවේය. අශ්වයා කීකරු බවක් පෙන්වා උගේ බෙල්ල දෙපසට වැනුවේය.

"හාමුදුරුවො රොඩී ගුබ්බෑයමේ නතර වුණාද?" ගුප්ත හිමින් කටහඬ අවදි කළේය. ලජ්ජාවෙන් බිම බලාගත් භික්ෂුව ගමන්මල්ල අතගා වතුර බෝතලය අතට ගත්තේය.

"දැන් අපේ ගෙදරට ළඟයි" ගුප්ත අශ්වයාගේ තෝන්ලණුව ඇද ඌට පාර පෙන්නුවේය.

එයින් පසු කිසිදු අණකින් තොරව ගමන් ගත් අශ්වයා සැඳෑ කළුවර කපාගෙන ගුප්තගේ ගේ මිදුල දක්වා ගොස් නතර වුණේය. ගුප්තට පෙර අශ්වකරත්තෙන් බැසගත් භික්ෂුව මිදුලේ සරුවට වැවී තිබූ ඇටටේරියා ගස මුල ගල් බංකුවේ

වාඩි වුණේය. එම බංකුවේ වාඩි වී ඉදිරියෙන් ඇති ගුප්තගේ ගේ දෙස බලා සිටියේය. එය ගුප්ත වැනි කරත්තකරුවෙකුගේ ගෙයක් විය නොහැකිය. එය ධනකුවේරයකුගේ මාලිගාවක් වැනි ගෙයකි.. ගුප්ත තමා මේ රැගෙනවිත් ඇත්තේ වෙන කාගේ හෝ ගෙයකටදැයි හික්ෂුව සැක උපදවාගත්තේය.. එම ගෙට යාබදව ඉතා කුඩා ගෙයක්ද දකිය හැක්කේය. එය සමහර විට ගුප්තගේ ගේ විය හැකියැයි හික්ෂුව අනුමාන කළේය.

"ගුප්ත, මේ ගෙවල් දෙකෙන් උඹගෙ ගේ කොයි එකද?"

"අර පොඩි ගෙදර තමයි මං ඉන්නෙ. අනිත් ගේ මට තාත්තා පවරල දීපු ගේ. ඒකෙ ඉන්නෙ අර මං කියාපු ගැනුයි දරුවො ටිකයි."

එසේ කියද්දීම එම විශාල ගේ ඇතුළේ සිට පැමිණි දරුවන් කීපදෙනෙක් යමක් බලාපොරොත්තුවෙන්දෝ ගුප්තගේ මූණ බලා සිටියෝය. ගුප්ත කරත්තයේ තිබූ කඩදාසි පාර්සලයක් ඔවුන් අත තැබුවේය.. මේ සිටින්නේ ගුප්තගේ දරුවන් බව හික්ෂුව දැනගත්තේය..

"උඹ මගදි කිව්වෙ උඹ ඉන්නෙ ගැනිගෙ ගෙදරෙයි කියල නේද?"

"ඔව්. ඒවා ඔවුන් පරිහරණය කරන නිසා ඔවුන්ගේ තමයි."

හික්ෂුව වාඩි වී සිටි ගල්බංකුවට වම්පසින් කුඩා ළිඳක් තිබුණේය.

"මේ ළිඳෙන්ද උඹල වතුර බොන්නෙ."

"නෑ හාමුදුරුවනේ, මම නාන්නෙ ඔය ළිඳෙන්."

"මාත් කැමතියි මේ ළිඳෙන් වතුර ටිකක් නාගන්න. උඹට පුළුවන්නෙ මට වතුර පතිච්චු හතඅටක් ඇද දෙන්න?"

"පුළුවන් හාමුදුරුවනේ"යි ගුප්ත පිළිතුරු දුන්නේය..

"හරි සිසිලයි! රාත්‍රිය ගත කරන්නත් මෙතන හොඳයි වගේ." භික්ෂුව සිහින් සිනාවකින් මුහුණ පුරවාගත්තේය.

"ඔතන අපේ තාත්තගෙ සොහොන තියෙන්නෙ" භික්ෂුව වහා ගල් බංකුවෙන් නැගිට්ටේය.

"ඇයි උඹ මෙතන ගහක් හිටවල බංකුවක් තිබ්බෙ මේක සොහොනක් නම්?"

"ඔතන වාඩි වන ඕන කෙනෙකුට ඒ ගැන අවබෝධයකින් වාඩිවුණාම ප්‍රශ්නයක් නෑ."

"එතකොට උඹේ තාත්තගෙ මළගම සිද්ධ වුණේ ඉන්දියානු ක්‍රමයට නෙමෙයිද?"

"ඔතන තැන්පත් කරල තියෙන්නෙ ගංගානම් ගඟේ පා කරපු අළුවලින් කොටසක් විතරයි. ඒක තාත්තගෙ ඉල්ලීමක්."

"කොහොම වුණත් උඹ මාව බය කළා."

"මම සමහර දවසට නිදාගන්නෙත් ඔය ගල් බංකුව උඩ."

"මාත් හිතාගත්තෙ මේක උඩ නිදාගන්න තමයි. ඒත් උඹ අරෙහෙම කිව්වම මට බය හිතුණ.. කමක් නෑ... අපි දෙන්නම මෙතන නිදාගනිමු."

"යමු එහෙම නම් මං ඉන්න ගෙට." ගුප්ත කුඩා කුටිය භික්ෂුවට පෙන්නා කීවේය..

"මොකද්ද බන් උඹේ ජීවිතේ? ඒ කියන්නෙ උඹ වෙනම ජීවිතයක්ද ගත කරන්නෙ?"

ගුප්ත කිසිවක් නොකියා එම කුටිය දෙසට යන්නට පිටත් වුණේය. භික්ෂුවද තම ගමන් මලු දෙක කරේ එල්ලාගෙන ගුප්ත පිටුපසින් ගියේය.... එම කුටිය ගස්කොළන්වලින් වට වී තිබුණේය. එම ගස්කොළන්වලින් වැටෙන සෙවණැල්ල කුටියට ගුප්ත ස්වරූපයක් ගෙනවිත් තිබුණේය. මැටි බිත්ති සහිත එම කුටියේ වහල ඉලුක්වලින් සෙවිලි කර තිබුණේය. එහි එක් තැනක නිදාගැනීමට වැල්ඇඳක් තබා තිබුණේය. වාඩි වීමට පුටු දෙකක් තිබුණේය. භාජන කීපයක් හා ඇඳුම් තබාගැනීමට ලී රාක්කයක් තිබුණේය. භික්ෂුව කුටියේ සෑම අස්සක් මුල්ලක් නෑරම පරීක්ෂාවෙන් බැලුවේය.

"මෙක ආරක්ෂෙදක කුටියක් වගෙයි නේ ගුප්ත... උඹව අර ගෑනු අනිත් ගෙට වද්දගන්නෙ නැති නිසා මෙකෙ ජීවත් වෙනවද? නැත්නම් උඹ ආගමික ජීවිතයක් ගත කරනවාද?"

"ඒ දෙකම නෙමෙයි."

"එහෙනම්?"

"තෘප්තියෙන් පසු නිදහසේ සිටීම සඳහා."

"උඹගෙ විකාර! එක්කො උඹ ගත කරන්නෙ මට්ටකුණ්ඩලීගෙ තාත්තගෙ ජීවිතේ වගේ ජීවිතයක් කියලයි මට හිතෙන්නෙ."

"අපි යමු අනිත් ගෙටත් හාමුදුරුවනේ" ගුප්ත භික්ෂුවට ආරාධනා කළේය. භික්ෂුව යම් කුතුහලයකින් පසු වන්නේය. භික්ෂුව ගුප්ත සමඟ එම මන්දිරයක් වැනි ගෙට ගියේය.. එය පරම්පරා කීපයක අභිමානය කියාපාන ගෘහයක ලක්ෂණම පෙන්නන්නේය. පෑගීමට ලෝබ හිතෙන බිමකින් යුත් එම සාලය කැටයම් කරන ලද ලීබඩු, පිත්තල බඩු ආදියෙන් යුක්ත වූයේය.. පුරාණ අභිමානය එසේම ආරක්ෂා කරමින් නවීන අභිමානයද අත්විඳින බවට සාක්ෂි සපයන නවීන ගෘහ උපකරණද තැනින් තැන තබා තිබුණේය. උස බිත්තිවලින් යුක්ත එම ගෘහයේ පැරණි පිත්තල පහන් තුළ නවීන විදුලි බුබුළු ඔබ්බවා සාලයට ආලෝකය සපයාගෙන ඇත්තේය. පැරණි බිත්ති කැටයම් ලිස්තර වට කරගත් කාමරවලට ඇතුළු වන දොරවල් නවීන තිරරෙදි යොදා අලංකාර කර ඇත්තේය. ගුප්ත කියූ බිරින්දෑවරු ඉතා පිරිසිදු ඇඳුම් ඇඳ සිටියෝය. මවුහු සිනාමුසු මුහුණුවලින් යුතුව පැමිණ භික්ෂුවට නමස්කාර කළෝය... දෙනෙත් අඳ, බාල යුවතිය කණ්ණාඩියක් පැලඳ සිටියාය. ඇගේ දෙනෙත් අන්ධයැයි භික්ෂුවට කෙසේවත් විශ්වාස කළ නොහැක්කේය. ඇය ඉතා පියකරු මුහුණකට හිමිකම් කියන්නීය. ඇය දුප්පත්කමේ පීඩාවත් කිසිම දිනක විඳි බවක් කියන සලකුණක් භික්ෂුවට ඇගේ සිරුරින් සොයාගත නොහැක්කේය. ගුප්ත තමාට කියා ඇත්තේ බොරු බව ඒ සමගම භික්ෂුව තීරණය කළේය.. ගුප්තගේ අනිත් අඹුවන් දෙදෙනා සාරි ඇඳ සිටි අතර, ළාබාල අඹුව ගවුමකින් සැරසී සිටියා. ඔවුන් තිදෙනාම ගුප්ත කියූ පසුබිමක සිට පැමිණියවුන් බව භික්ෂුව

විශ්වාස නොකරන්නේය. ගුප්තගේ දරුවන් හය දෙනාට වෙන වෙනම කාමර තිබුණේය.. තාත්තාගේ රසකැවිලි ලබාගත් එම දරුවන් ඉන් පසු භික්ෂුව නොදුටුවේය.

"යමු මේ කාමරයට" ගුප්ත එම ගෘහයේ එක් කාමරයකට භික්ෂුව කැඳවාගෙන ගියේය. එහි උස මෙට්ට සහිත, සුදු ඇතිරිලි යෙදූ, දෙතුන් දෙනකුට සුව සේ නිදාගත හැකි විශාල ඇඳ හැර අනෙක් සියලු බඩු භාණ්ඩ සාලයේ ඇති භාණ්ඩවලම අනුරූ ලෙස කුඩාවට හැදූ ඒවා බව භික්ෂුවට වැටහුණේය.

භික්ෂුව එම කාමරයට අයත් නාන කාමරයට ගියේය.. එහි සුවඳ ඒ තුළ දෙතුන් පැයක් ගත කරන්නට ආරාධනා කරන සුවඳක් බව භික්ෂුවට දැනුණේය. එහි තිබෙන නාන බේසමට ඉහළින් බේසමේ දිගා වී පුළුන්පෙඳ වන් පෙන බුබුළු ඇඟ මත දවටාගත් තරුණ ගැහැනියකගේ පින්තූරයක් අලවා තිබුණේය. එම බේසමේ සිට නාන්නකුට ඉදිරි බිත්තියේ සවි කර ඇති රූපවාහිනිය නරඹමින් දිය නෑ හැකිය.. නාන බේසමට මදක් ඉහළින් බිත්තියට සවි කරන ලද දූරකථනය කාට කතා කිරීම සඳහාදැයි භික්ෂුව සිතන්නට වෙහෙසුණේය. අත හෝදන බේසමට ඉහළින් බිත්තියට සවි කර තිබූ කුඩා වීදුරු කැබිනෙට්ටුවේ විවිධ විලවුන් වර්ග, සබන් වර්ග තැන්පත් කර තිබුණේය. පාවිච්චි නොකළ තුවා කීපයක් බිත්තියේ තවත් තැනක පිළිවෙළට තබා තිබුණේය.

"මට මේකෙන් නාගන්න හිතයි බං..." භික්ෂුව සෙමෙන් කීවේය...

"හොඳයි හාමුදුරුවනේ, ඒත් ඔබ වහන්සෙ ළිදෙන් නේද නාන්න කැමතියි කිව්වෙ."

"මේක දැක්කහම මෙතනින් නාන්න හිතුණ බං... මේකෙ උණුවතුරත් තියෙනවා නේද?"

"එහෙමයි හාමුදුරුවනේ, අර රතු කරාමෙ උණුවතුර තියෙන්නෙ."

ගුප්ත භික්ෂුවට ස්නානය පිණිස අවකාශ ලබාදුන්නේය. භික්ෂුව ඒ නානකාමරයෙන් පිට වූයේ මහා විඩාවක් සංසිඳුවාගත්තකු පරිද්දෙන්ය. නානකාමරයෙන් එළියට එන විට ගුප්තගේ එක් අඹුවක් භික්ෂුවට කෝපි කෝප්පයක් පිළිගැන්නුවාය... සාලයේ එරෙන පුටුවක වාඩි වී භික්ෂුව හතර අත බලමින් කෝපි වැළඳුවේය. භික්ෂුව කීපවරක්ම ගුප්තගේ ගෙදර සාමාජිකයන් සමග ගොළු බාසාවෙන් අදහස් හුවමාරු කරගැනීමට උත්සාහ ගත්තේය. ඔවුන් එක එක භාෂා කතා කරන බව පමණක් භික්ෂුවට වැටහුණේය. ගුප්තගේ දරුවන් වැඩි වයස් පරතරයකින් තොර, එකම ආරක හමක් හෝ පැහැයක් හෝ නැති දරුවන් බව භික්ෂුවට දැනුණේය. ඔවුන් තාත්තාගේ පැමිණීම විශේෂ කොට සැලකූ බවක්ද භික්ෂුව නොදුටුවේය... ඒ දරුවන් තමතමන්ගේ ලෝකවල ජීවත් වන පිරිසක් බව භික්ෂුවට ඉක්මනින්ම වැටහී ගියේය.

"මේ ගෑනු තුන්දෙනා කතා කරන්නෙ එකම භාෂාවක් නෙමෙයිනේ.. දරුවොත් එහෙමයි.. උඹට මේ භාෂා හුරු වුණේ කොහොමද?"

"මම ජීවිතේ හැම දාකම අනිත් අයගෙ භාෂා තේරුම් ගන්න උත්සාහ කළා. ඒ අයගෙ භාෂාව මට හොඳට පුළුවන්. මට හාමුදුරුවන්ගෙ භාෂාවත් පුළුවන්නෙ" ගුප්ත කයිවාරුකාරයකු දැයි භික්ෂුව කල්පනා කළේය.

අනතුරුව භික්ෂුව නැවත ගල්බංකුව වෙත ගියේය. ගුප්තද ඒ පසුපසින් ගියේය.

"මමත් වතුර ටිකක් නාගන්නවා හාමුදුරුවනේ" යි කියූ ගුප්ත ළිඳ වෙත ගියේය.

"අච්චර උණුවතුර සැපපහසුකම් තියෙන නානකාමරයක් තියාගෙන උඹ මේ හීතලේ ළිඳෙන් නාන්නෙ මොකටද?"

"මට දෙකම එකයි හාමුදුරුවනේ" යි කියූ ගුප්ත ළිඳෙන් වතුර ඇදගෙන නාන්නට පටන් ගත්තේය. තවත් මොහොතකින් තුවායක් අතින් ගත් ගුප්තගේ ලාබාල අඹුව ළිඳ ළඟට පැමිණියාය. ළිඳත් ගල්බංකුවත් අතර තිබූ පරතරය සඳ එළියෙන් පැහැදිලිව භික්ෂුව දුටුවේය. ඇගේ සිහින් සිනා හඬත් ගුප්තගේ සිවුරුහන් බැමත් අතරින් භික්ෂුවට ඇසුණේ මන්ත්‍ර ජප කරන හඬක්ය.. ඒ සමගම භික්ෂුව දුටුවේ සයනය මත සිනාසලමින් පා සිළඹු සොලවන රොඩී කෙල්ලගේ රූපයයි..... ආනන්ද හාමුදුරුවන් බුදුරදුන් සමග ධර්ම සාකච්ඡාවක් කරන හඬ භික්ෂුවට ඇතින් ඇසෙන්නේය. ඒ ධර්ම සාකච්ඡාවට සවන් දීමට භික්ෂුවට හොඳටම අවශ්‍ය වුණේය. එහෙත් රොඩී ගැහැනියගේ මන්ත්‍ර ජප කරන හඬත් රොඩී කෙල්ලගේ පා සිළඹු හඬත් නිසා බුදු හාමුදුරුවන් කියන දෙය භික්ෂුවට නෑසෙන්නේය. ආනන්ද හිමියන් විටින් විට "එහෙමයි ස්වාමීනි" යන පිළිවදන් දීම පමණක් භික්ෂුවට හොඳින් ඇසෙන්නේය.

'මට බුදු හාමුදුරුවො දකින්න ඇත්නම්' භික්ෂුව කල්පනා කළේය... ඒ සමගම භික්ෂුවට දර්ශනය වූයේ ගුප්තට විහිළුවක් කොට කොක්හඬලා සිනා සෙන ඔහුගේ බාල ඇඹේණියගේ වතුරින් තෙමී ගිය උඩු කයයි....

"මූන්ට පිස්සු!" භික්ෂුව තොල් මැතිරුවේය...

ක්‍රමයෙන් සඳපහන් එළියට ලොල් වූ විවිධ කෘමීන්ගේ නාදයන්ගෙන් ගල්බංකුව හාත්පස වනරොද පිරී ගියේය. ගල්බංකුවට යාර කීපයක් නුදුරින් ගසක ගැටගසා සිටි අශ්වයාගේ පාමුල ඇනතියාගත් ගුප්ත අශ්වයාගේ පාවල තෙල් ගැල්ලුවේය. භික්ෂුව තම දෑත්වලින් තම බත්කෙඳි පිරිමදිමින් ගුප්ත දෙස බලා සිටියේය.

"උඹ ඇත්තටම කරත්තකාරයෙක් කියල මං කොහොම විශ්වාස කරන්නද? උඹ මහා සැප පහසු ජීවිතයක් තියෙන මිනිහෙක්. උඹ පාරම්පරික ධනයකට හිමිකම් කියන මිනිහෙක් නේද?"

"මම ඒව විඳල ඉවරයි හාමුදුරුවනේ."

"නෑ. උඹ ගත කරන්නෙ දෙපිටකාට්ටු ජීවිතයක් කියලයි මට හිතෙන්නෙ" ගුප්ත යාන්තමින් සිනාසුණේය.. එය ගුප්තගේ සිපුරුදු අවඥා සහගත සිනාවම බව භික්ෂුවට දැනෙන්නේය.

"ගුප්ත, මගේ කකුල් දෙකත් රිදුම් දෙනවා බං."

"ඔහොම ඉන්න මං එන්නම්" ගුප්ත අශ්වයාගේ දෙපාවල තෙල් ගැල්වීමෙන් පසු භික්ෂුවගේ පා මුල වාඩි වුණේය.

තෙල් බෝතලයෙන් ස්වල්පයක් තම එක් අල්ලකට හලාගත් ගුප්ත භික්ෂුවගේ මුහුණ බැලුවේය.

"උඹ මොකද්ද කරන්න හදන්නෙ?"

"තෙල් ගාල කකුල් දෙක මිරිකන්න."

"අර අශ්වයට ගාපු තෙල්ද මගේ කකුල්වලත් ගාන්න හදන්නෙ....? උඹ මාව විහිළුවකට ගන්නද මිනිහො......?" භික්ෂුවගේ පුපුරන්නට ආසන්න දෑස් දෙස බලා සිටි ගුප්ත දත් පෙන්නා අල්ලේ තිබූ තෙල් බිම හලා දෑත් පස්ස පැත්තේ ඇතිල්ලුවේය.

"මම නිකං මිරිකන්නම් එහෙනම්." ගුප්ත සිවුරු කොන මදක් ඉහළට ඔසවා භික්ෂුවගේ දෙපා තම ඔඩොක්කුව දෙසට ඇදගත්තේය.. පා ඇඟිලිවලින් පටන්ගත් සම්බාහනය භික්ෂුව දෑස් පියාගෙන විඳගත්තේය.. බත්කෙන්ද දෙසින් නැගුණු වේදනාව ගුප්තගේ සම්බාහනයෙන් මැකී යන බවක් භික්ෂුවට දැනුණේය.

"දන් ඔය මදැයි? මම කැමතියි මේ සඳ පායගෙන එන රාත්‍රියට.. උඹ මොනව හරි කාල මටත් තේවතුර ටිකක් අරගෙන වරෙං."

"හාමුදුරුවො අර ගෙයක් ඇතුළෙ සැතපෙනවද? මේ ගල්බංකුවෙ සැතපෙනවද?"

"ඒක තමයි මාත් කල්පනා කෙරුවෙ...." භික්ෂුව ගල්බංකුව ඉදිරිපිටින් පෙනෙන මන්දිරය දෙසත් ගුප්තගේ කුටිය දෙසත් ගල්බංකුව දෙසත් බැලුවේය... සොහොනක් මත ඇති ගල්බංකුව මත වාඩි වී සිටින භික්ෂුව එක්වරම තීරණයක් ගැනීමට නොහැකිව ළතවුණේය...

"හොඳයි. කල්පනා කරල කියන්න හාමුදුරුවනේ."

ගුප්ත ඇනතියාගත් තැනින් නැගිට ගල්බංකුව ළඟින් ඉවත්ව ගියේය. භික්ෂුව පායාගෙන එන චන්ද්‍රයා දෙස බලාගෙන සිටියේය. භික්ෂුවට නැවතත් රොඩී ගුබ්බෑයමේ පා සිළම්බු හඬ ඇසෙන්නට පටන්ගත්තේය. ඒ සමගම අඹගස් දෙකක් සුළඟින් එකට ඇතිල්ලීමෙන් නැගෙන හඬද ඇසෙන්නට පටන්ගත්තේය. භික්ෂුවට ඕනෑ වූයේ ඒ සියලු හඬවල් අමතක කොට බුදු රදුන් ආනන්ද හිමියන්ට දේශනා කළ බණ ඇසීමටය. එහෙත් බුදු රදුන්ගේ හඬ පමණක් දෝංකාරයක් ලෙස භික්ෂුවට ඇසෙතත් ඒ කියන්නේ මොනවාදැයි භික්ෂුවට නෑසුණේය.

"ඔය පා සිළම්බු හඬ නතර කරගනිං අම්මණ්ඩියෙ, මට බුදු හාමුදුරුවො ආනන්ද හාමුදුරුවන්ට දේශනා කරන බණ අහන්න තියෙනවා" භික්ෂුව මදක් කෝපයෙන් කියද්දී භික්ෂුවට ඇසුණේ පා සිළම්බු වෙනුවට දෑතක වළලු හැඬවෙන හඬයි. භික්ෂුව වහා දෑස් ඒ හඬ ආ දෙසට යොමු කළේය. ගුප්තගේ බාල අඹුව භික්ෂුව ඉදිරියේ පෙනී සිටියාය. ලා කෙසෙල් කොළයක් මත තබන ලද උණු චපාතියක් ඇය අතේ තිබුණේය. ඇය සිහින් සිනාවකින් භික්ෂුවට සංග්‍රහ කොට චපාතිය තැබූ කෙසෙල් කොළය භික්ෂුව දෙසට පෑවාය. භික්ෂුව එම චපාති රොටිය දවටා තිබූ ලා කෙසෙල් කොළය දෙස බලා සිටියේය. 'මැයගේ දෑස් නොපෙනෙතැයි කියන්නේ කෙසේද?' ඇයගේ අඩවන් වූ දෑස් දෙස බැලූ භික්ෂුව නැවතත් සිය නෙත්, ලා කෙසෙල් කොළය දෙසට යොමු කළේය. භික්ෂුවගෙන් ප්‍රතිචාරයක් නොලද ඈ ගල් බංකුව මත රොටිය තබා යන්නට ගියාය. මොහොතකින් එම ලා කෙසෙල් දල්ල චපාතියේ උණුසුමින් මෙළෙක් වන සුවඳ භික්ෂුවට දැනුණේය. භික්ෂුව චපාති රොටිය රැඳුණු ඒ ලා කෙසෙල් කොළය හෙමින් නාසයට ළං කළේය. එම කෙසෙල් දල්ලේ සුවඳින් භික්ෂුවගේ නාසය කිවිසුම් බර වූයේය.

"ගුප්ත, මෙහෙ වරෙං ටිකකට" භික්ෂුව චපාතිය රැඳුණු කෙසෙල් කොළය දෑත මත තබාගෙන කතා කළේය. ගුප්ත මොහොතකින් භික්ෂුව ඉදිරියේ පෙනී සිටියේය.

"උඹට පිස්සුද මේ අවේලාවෙ මට රොටී එව්වෙ? මෙන්න මේක අරං පලයං. මට තේ වතුර කෝප්පයක් විතරක් ගෙනත්

දීපං'' ගුප්ත කිසිවක් නොකියා රොටිය ගැනීමට අත පෑවේය. භික්ෂුව උණුසුම් රොටිය පමණක් ගුප්ත අතට දී, කෙසෙල් දල්ල තම දෑත මත තබාගත්තේය.

''මේ කෙසෙල් දල්ල රත් වෙන කොට දැනෙන සුවඳට මම කැමතියි. මං පුංචි කාලෙ අම්ම තාත්තට බත් බදින කොට මට ඔය සුවඳ හොඳට දැනිල තියෙනවා.....'' ගුප්ත රොටිය පමණක් ගෙන යන්නට ගියේය.

''ඉක්මනට වරෙං, මම මේ එළියෙ නිදගන්නෙ. උඹත් මා ගාව නිදගනිං. සඳ එළියයි සිසිල් වාතයයි අපට හොඳ නින්දක් ගෙනේවි.''

''හොඳයි හාමුදුරුවනේ,'' ගුප්ත එතැනින් ඉවත් වී ගියේය... 'ඔය කිව්වට ඒ මිනිහ එනඑකක් නෑ මේ සොහොනෙ නිදාගන්න... අර එකෙකුට එකෙක් දෙවෙනි නැති පැහැපත් ගෑනු තුන්දෙනයි අර මන්දිරෙයි දාල මේ සොහොනෙ නිදාගන්නෙ මොන මිනිහාද?' භික්ෂුව සිතින් තර්ක කළේය..

භික්ෂුව නැවතත් අහස දෙස බලා සිටියේය. ඒ අතරේ රොටිය ගෙන ආ දැරිවියගේයැයි සැක කළ හැකි හුරුබුහුටි සිනා හඬකින් හාත්පස නින්නාද දෙන්නට විය. ඊටම එකතු වූ ගුප්තගේ සිනාහඬත් අනික් ගැහැනුන්ගේ සිනාහඬවල් සමග මුසු වී භික්ෂුවට ඇසෙන්ට පටන්ගත්තේය. ඒ සමගම ගස් දෙකක් එකට එකට ඇතිල්ලෙන හඬත් භික්ෂුවට ඇසුණේය... ඒ හඬත් සමගම මිටි තාප්පයකට බර වී ඉකිබිඳින දැරියකගේ රූපයක්ද පෙනෙන්නට පටන්ගත්තේය. ඒ සියල්ල අමතක කර දෑස් පියාගන්නට භික්ෂුවට ඕනෑ වුණේය. ඒ සමගම භික්ෂුවට වාපාතියෙන් උණුසුම් වූ කෙසෙල් දල්ලේ සුවඳද දැනෙන්නට පටන්ගත්තේය. භික්ෂුව ඒ කෙසෙල් කොළය දෙස බලා සිටියේය. වපාතියේ රස්නයෙන් තරමක් කළු පැහැයට හැරුණු කවාකාර මුද්‍රාවක් එහි නිර්මාණය වී ඇති සැටි භික්ෂුවට පෙනෙන්නේය. එම කෙසෙල් දල්ල නැවත සිඹ බලන්නට භික්ෂුවට සිත් පහළ වුවත් භික්ෂුව දෙවරක් නොසිතා කෙසෙල් දල්ල වම් අතින් ගුලි කොට අත දිගහැර ඈතට විසි කළේය. පුළඟට ප්‍රතිවිරුද්ධ දෙසට විසි වූ කෙසෙල් කොළය වැඩි දුරකට විසි නොවී ගල්බංකුව අසලම බිම පතිත වුණේය..

''අර පැත්තෙන් ඍතු තුනෙන් ඕනෑම ඍතුවකට ගැළපෙන ලෙස සැදූ මන්දිරයක සුවපහසු යහන්. තවත් පැත්තකින් මැටි කුටියක තැබූ වැල් ඇඳක්. තවත් පැත්තකින් සොහොනක් මැද ඇට්ටේරියා ගහක් මුල තැබූ ගල් බංකුවක්. මේ තුන් පැත්තට මැදිව නින්ද සොයන භික්ෂුවක්.... හත් හා හත්.... මම නම් තෝරාගන්නේ අර මන්දිරයේ සුවපහසු යහන'' භික්ෂුවට කන් අසලින්ම ඇසුණේය...

''කවුද? මොනවද මේ කියන විකාර කතා..?''

''මම උදායි හාමුදුරුවො.... ඔබ වහන්සේලාගේ විනය පොතේ මට සැහෙන තැනක් තියෙනවානේ.... මතක ඇතිනේ...''

''අනේ ඔබ වහන්සේ යන්න මෙතැනින්..... ඔබ වහන්සේලා නිසා තමයි විනය පොත ඔච්චර ලොකු වුණේ..'' භික්ෂුව නෝක්කාඩු කීවේය...

''යන්න අර මන්දිරයට. සුවපහසු යහනක මේ රාත්‍රිය ගත කරන්න.. ඔබට සිව්පසයෙන් උවැටන් කරන්න ඒ මාණවිකාවන් බලා සිටිනවා.''

''මට මේ ගල්බංකුව හොඳයි.... කරුණා කර මෙතැනින් ඉවත්ව යන්න.''

''හොඳයි. මම යනවා. මගෙන් උපදෙස් ගත්ත බොහෝ භික්ෂූන් සිටියා... ඒත් ඔබ වහන්සේ ගැන මට කණගාටුයි...''

ගුප්තගේ වැඩිමහලු බිරිඳ ගෙනවිත් දුන් දුම් දමන තේ කහට කෝප්පය මදක් නිවෙන්නට ගල් බංකුවේ කොනකින් තැබූ භික්ෂුව අහස දෙස බලා සිටියේය. කෝප්පය ගෙනැවිත් දුන් ගැහැනියත් වපාතිය ගෙනැවිත් දුන් ගැහැනියත් දෙදෙනාම ගුප්ත අඹුකමට තබාගන්නේ මොන රාග ගින්නකින්දැයි භික්ෂුව කල්පනා කළේය. ඔහුට අඹුවන් තුන්දෙනකු සිටීම ගැන භික්ෂුවට ඇති වූයේ පිළිකුලකි.

''මුන් මහ අසමජ්ජාති එවුන් බලාගෙන ගියාම'' භික්ෂුව තමාටම කියාගත්තේය. අහසේ පායා එන බ්‍රහස්පතී තරුව නිවැරදිව හඳුනාගැනීමට භික්ෂුව වෙහෙස ගත්තේය. බ්‍රහස්පතී

තරුවයැයි භික්ෂුව හඳුනාගත් තාරකාව ක්‍රමයෙන් විශාල වී, තම දෑස් නිලංකාර කරවන නිල්පාට කවාකාර වස්තුවක් තමා දෙසට පහත් වන ආකාරයක් භික්ෂුව එක්වරම දුටුවේය. භික්ෂුව ගල්බංකුව මත එරමිණියා ගොතාගෙන වාඩි වී මොහොතක් විනය මෙනෙහි කළේය. ඇවතක් මෙතෙක් සිදු නොවුණත් ඇවැත් දෙසාගැනීමට වෙනත් භික්ෂුවක් ළඟ නොසිටියත් භික්ෂුව තනියම ඇවැත් දෙසාගත්තේය. ඇවැත් දෙසාගැනීමෙන් පසු භික්ෂුව තම සිවුර සකස් කොට පෙරවා සිවුරේ කප්ප බින්දු තැබූ තැන් සෙව්වේය. සිවුරේ එක් වාටියක මුල්ලේ තබා තිබූ කවාකාර කහට පැල්ලම් අතගාමින් කඨිනයකට ලැබුණු එම සිවුර දරා සිටීමට තමාට ඇති පුදුසුකම් සිහි කළේය. එසේම එම සිවුර පිළිබඳ විනය අධිෂ්ඨානයද කළේය.

තම හාත්පස දේවතා එළියකින් පිරීගොස් ඇති බවක් භික්ෂුවට පෙනුණේය.

"ස්වාමීන් වහන්සේ විනය මෙනෙහි කරනවා නේද?"

"ඔව්. ඒක නරකක්ද?" භික්ෂුව තමාට නොපෙනෙනත පුද්ගලයා කවුරු වුව කම් නැතැයි සිතා පිළිවදන් දුන්නේ ය.

"මාව අඳුනනවද? හොඳට බලන්න මා දිහා..." භික්ෂුව තම හිසට ඉහළින් සිටින්නේ කවුදැයි හඳුනාගැනීමට උත්සාහ කළේ ය.

"මම දේවදත්ත. මේ ඉන්නේ අජාසත්ත..... මගේ මිත්‍රයා.."

"අපෝ දෙයියනේ! මහ පොළොව පළාගෙන අපායෙ ගිය ඔබ වහන්සේ කොහොමද මෙතෙන්ට අවේ.....? අජාසත්ත කියන්නෙත් පිතෘ ඝාතකයෙක්..... අනේ මම සතර ස්ථාන වන්දනාවෙ ආපු විනය ගරුක භික්ෂුවක්. මම බුදු හාමුදුරුවො වෙනුවෙන් පැවිදි වෙච්ච කෙනෙක්. මට කරදර කරන්නෙපා. ඔබ වහන්සේ බුදු හාමුදුරුවන්ට ගල් පෙල්ලපු, බුදු හාමුදුරුවන්ගෙ ඇඟේ ලේ හොල්ලපු පව්කාර හාමුදුරුවො නේද? දෙන්නම ආනන්තරිය පාප කර්ම කරගත්ත දෙන්නෙක් නේද? යන්න යන්න මෙතනින්......." භික්ෂුව තම හිතට පැමිණි බිය යටපත් කරගෙන නිර්භිත ස්වරයක් මතු කරගැනීමට උත්සාහ කළේය..

"හම් හොඳයි. මම නවතින්න ආවෙ නෑ... මට අර කරඬුව ඕනා. මම ආවෙ ඒකට" දේවදත්ත හිමියන්ගේ ගැඹුරු වූත් අධිෂ්ඨානශීලී වූත් වචනවලින් භික්ෂුව තරමක් සැලී ගියේය...

"මො...මොන කරඬුවක්ද?"

"කොණ්ඩඤ්ඤ හාමුදුරුවො දීපු කරඬුව. ඒක මම හොයමින් සිටියෙ..."

"ඒක උන් වහන්සෙ මට දුන්නෙ මාව විශ්වාස කරල. කොහොමවත් ඒක මම ඔබ වහන්සේට දෙන්නෙ නෑ..."

"එම කරඬුව හිමි මට. එයින් ඔබ වගේ කෙනෙකුට කිසිම ප්‍රයෝජනයක් නෑ.. ඒක මට දෙන්න.... ඔබත් අප සමග එකතු වෙන්න."

"මොනවා! මගේ අමාමෑණි බුදු හාමුදුරුවන්ට නිග්‍රහ කරපු ඔබ වහන්සෙ එක්ක එකතු වෙන්න මම? ඒක කවදවත් සිද්ධ වෙන්නෙ නෑ."

"ඔබලා හිතුවාට මම බුදු හාමුදුරුවන්ට විරුද්ධ වුණා කියල, උන් වහන්සේ එහෙම හිතන්නෑ... මාත් එක්ක පන්සීයක් පිරිස ඉන්නවා."

"ඊට වඩා පිරිසක් හිටියත් මම ඔබ වහන්සේ සමග එකතු වෙන්නෑ. ඔබ වහන්සෙ බුදු හාමුදුරුවන්ව ඝාතනය කරන්න උත්සාහ දරපු කෙනෙක්. ආනන්තරිය පාප කර්ම කරගත්ත කෙනෙක්. ඔබ බුදු හාමුදුරුවන්ට වෛර කළ කෙනෙක්."

"ඔබලා සියල්ලට වැරදිලා. අපි උන්වහන්සේට විරුද්ධ වුණේ නෑ. ඒක ඔය කරඬුවේ නිමාව පිළිබඳව තිබ්බච තාර්කික ගැටලුවක්. ඒක තරමක් දුර දිග ගිය එක ඇත්ත..... බුදු හාමුදුරුවො සිද්ධාර්ථ කුමාර අවධියෙ ඉදන් මා එක්ක හිටියෙ, එකට කටයුතු කළේ..... අපේ පෞද්ගලික ගැටලුවක් තිබුණෙ නෑ......"

"කොහොම වුණත් මේ කරඬුව ඔබට දෙන්න බෑ. අනිත් අතට ඔබ වහන්සේට අලුතින්ම වෙන එකක් නිර්මාණය කරන්න පුළුවන් නේ? ඇයි මේක ඉල්ලන්නෙ."

''ඔය කරඬුව වෙනුවෙන් මමත් මහන්සි වෙච්ච කෙනෙක්... ඒක මටත් අයිතියි. අලුතින් නිර්මාණය කරන කිසිම කරඬුවක් කොතරම් හොඳ වුණත් ඔය කරඬුවට තියෙන වටිනාකම ලැබෙන්නෙ නෑ... ඒකෙ අයිතිය මටත් තියෙන්න ඕන. සිද්ධාර්ථයන් වහන්සේ, පස්වග තවුසන් විතරක් නෙමෙයි ඔය කරඬුව නිර්මාණය කරන ලෝහ සොයාගත්තෙත්. මමත් ඒකෙ කොටස්කාරයෙක්... මා එහි අයිතිය වෙනුවෙන් සටන් කරන්න පටන්ගත්තා. ඒකට මට විතරක් සාධාරණ වෙච්ච හේතු තිබුණා. ඒවා ඔබලා වගේ අය සමග කතා කිරීමෙන් පලක් නෑ.''

''කොහොම වුණත් මේ කරඬුවේ අයිතිකාරයා ඔබ වහන්සෙ වෙන්නෙ කොහොමද? ඒක අයිති කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේට. උන් වහන්සේ තාපසකාලයේ අනිත් තවුසන් හතර දෙනත් එක්ක සිද්ධාර්ථ තාපසතුමා මුණගැසෙන විටත් මේ කරඬුවේ කොටසක් නිර්මාණය කර තිබුණු බව එතුමා මා සමග ප්‍රකාශ කළා... ඔබ වහන්සේ කවදාවත් සිද්ධාර්ථයන් වහන්සේ සමග වනගත වෙච්ච කෙනෙක් නෙමෙයි...''

''ඔබ කොණ්ඩඤ්ඤ හාමුදුරුවන්ගෙන් දැනගෙන තියෙන්නෙ බොහොම ටිකයි.. කරඬුවේ ඉතිහාසය ඊට වඩා ගොඩාක් පැරණියි..''

''පැරණියි...?''

''ඔව්.... ඔය කරඬුව මහා කරඬුවක අනුරුවක්. ඒ කරඬුව පළමුවෙන්ම හදන්නෙ විදුලි කොටන කොට බියට පත් වෙච්ච එක් ආදිකාලීන මිනිසෙක්... ඉරට බය වෙච්ච, සඳට බය වෙච්ච, වැස්සට බය වෙච්ච මිනිස්සුත් ඒ කරඬුව හදන්න සම්මාදම් වුණා...''

''එහෙනම් හැමෝටම අයිති කරඬුවක් ඇයි ඔබ වහන්සේ තනි අයිතියට පත් කරගන්න හදන්නෙ?''

''ඕක හැමෝටම අයිති නෑ. ටික දෙනෙකුටයි අයිති. ඒ අයිතිය මටත් තියෙනවා.. ඕකෙන් බොහෝ වැඩ කළ හැකි බව මා දන්නවා... මගේ මිත්‍ර අජාසත්ත රජ්ජු දන්නවා... ඒක නිසා කරදර නොවිඳ ඔය කරඬුව අපට භාර දෙන්න.. ඔය කරඬුව ජනගත කිරීමේ අපූරු සැලසුමක් අප සතුව තිබෙනවා... ඊට ඔබත් දායක වෙන්න..... ඔබ කරඬුවේ හිස කොයිපැත්තක පිහිටිය යුතුද කියාවත් නොදනයි එය මල්ලේ දමාගෙන සිටින්නේ''

''මම එය සොයාගන්නම්. කරුණා කර ඔබ වහන්සේ මෙතනින් වඩින්න. අවීචි මහ නරකාදියෙ ඉදල ආපු ඔබ වහන්සෙට ඔය සිවුරත් අකැපයි.... අර ඉන්නෙ ඒකටම හරි යන පවුකාර යාළුවත්...''

දේවදත්ත හිමියන්ගෙන් පිළිවදන් ලැබෙතැයි භික්ෂුව අපේක්ෂා කළත් ඉතා ගැඹුරු සිනා හඬක් හැර වෙන කිසිවක් භික්ෂුවට නෑසුණේය.

'දෙයියනේ! ඒ කරඬුව අරන් පැන්නවත්ද?' වහා භික්ෂුව තම ගමන් මල්ල අතගා කරඬුව එළියට ගත්තේ ය.... චන්ද්‍රකාන්තියෙන් දිලිසෙන ඒ කරඬුව දෙස භික්ෂුව බලා සිටියේය. එම කරඬුවේ ගර්භය ඉතා නිදහස්ව තිබුණත් ඒ දෙසට ඇදී එන ලියවැල් කීපයක් භික්ෂුවට දකින්නට ලැබුණේය.. ඒවා තමා කරඬුව භාර ගනිද්දී නොතිබුණු ඒවා බව භික්ෂුවට පැහැදිලිය.

'දෙයියනේ! මේකෙ ලියවැල් වැවෙන ඒවා නේ... මේකෙ තියෙන සියුම් සිදුර වැහෙයිද?' භික්ෂුව විස්සෝප වූවේය.... එහි සියුම් සිදුර දැකගැනීමේ පිපාසයෙන් භික්ෂුව කරඬුව සඳ එළියට අල්ලා ඒ සියුම් සිදුර සෙව්වේය.. එහෙත් එවැනි සිදුරක් භික්ෂුවට දැකගැනීමට නොහැකි වුණේය.

''මෙය දළදා මාලිගාවේ තැන්පත් කරන්නට පෙර මට ඒ සියුම් සිදුර සොයාගන්න බැරි වේවිද දෙයියනේ.... අනේ මා ගරු කරන ශ්‍රී විෂ්ණු දිව්‍ය රාජෝත්තමයාණන් වහන්ස. ඔබ වහන්සේ නිර්මල බුද්ධ ශාසනය ආරක්ෂා කරනවා සත්‍යවාදී සැබෑ නම් මේ කරඬුවේ සියුම් සිදුරින් මට මෙහි ඇතුළත පෙන්වනු මැනවි..'' භික්ෂුව සිහින් හඬින් අහසට දෑත් දිගු කරගෙන කන්නලව් කළේය...

භික්ෂුවට එයින් අනතුරුව ඇසුණේ අශ්වයාගේ වසුරු විම වැටෙන හඬයි...

'මෙ පිස්සු මනුස්සයා අශ්වයාත් මෙතැනම බැඳල ගිහිල්ල නේ...!' යි සිතූ භික්ෂුව ගුප්තට හඬ නගා කතා කළේය. ගුප්තගේ සිනා හඬත් බිරියන් එකිනෙකා පරයමින් නගන කොක්හඬලැමත් භික්ෂුවගේ සිතට කෝපයක් ගෙනාවේය. තම හඬ ගුප්තට නෑසීම ගැන භික්ෂුවගේ සිතට නැගුණේ ඊටත් වඩා කෝපයකි.

"කිසි ජීවිත සංවරයක් නැති කාලකන්නි හැත්තක්! අම්මප ගැනු තුන්දෙනකුට පුළුවන්ද විළිලැජ්ජාවක් නැතිව ඔහොම එක මිනිහෙක්ව වට කරගෙන ජීවත් වෙන්න? එක ගැනියෙකුට හරි මොළයක් තියෙනව නම් ඔය මිනිහගෙ මත්තෙ ඔහොම ඉන්නවද? මෙ වගේ මිනිහෙකුට අර තාඹර දැරිවි මොකට රැවටිලාද?"

තවත් සුළු මොහොතකින් භික්ෂුව දුටුවේ ඇස් අදහාගත නොහැකි සිදුවීමකි. ගුප්තගේ බිරින්දෑවරු තුන්දෙන එළිමහනට ආවෝය. ඔවුන්ගේ සිනා හඬ ගල්බංකුව දක්වා ඉතා පැහැදිලිව ඇසුණේය. ගුප්තගේ පාමුල වැතිරෙන බිරින්දෑවරු යම් ආයාචනයක් කරන්නෝය. ඒ ආයාචනය භික්ෂුවට ඉතා හෙමින් ඇසෙන්නේය. එහෙත් ඔවුන් කතා කරන භාෂාව භික්ෂුවට නොවැටහෙන්නේය.. එහෙත් එය ආයාචනාවක් බවත්, එයට ගුප්තගේ අනුමැතිය ලැබුණු බවත් භික්ෂුව ඔවුන්ගේ හැසිරීම්වලින් වටහාගත්තේය. දෙනෙත් අඳ, බාල අඹුව මිටින් හළ කිරිල්ලියක සේ ඔබමොබ දුවන්නට පටන් ගත්තේ එම ආයාචනාව ඉටු වන බව දැනගත් ප්‍රීතියෙන් විය හැකිය. ඇගේ දෑස හොඳින් පෙනෙන බව භික්ෂුවට දැනෙන්නේය.. තවත් ටික වේලාවකින් සඳ එළිය කපාගෙන එතැනට පැමිණියේ කරත්ත තුනකි. ඉන් බැසගත් සර්වාභරණයෙන් සැරසුණු නව යොවුන් පුරුෂයෝ තුන් දෙන සිනාමුසු මුහුණින් පැමිණ ගුප්තට ආචාර කළෝය. ගුප්තද ඔවුන්ට පෙරළා ආචාර කළෝය. එම පුරුෂයෝ තුන්දෙන තවත් නිමේෂයකින් එම අඹුවන් තුන්දෙනාගේ අත් අල්ලාගෙන නර්තනයක යෙදුණෝය. ගුප්ත මැටි කුටියේ ආලින්දයට වී මොවුන් දෙස බලා සිටියේය. මේ අශික්ෂිත දර්ශනය තමාට දකින්නට සිදු වූයේ මේ වන්දනාව කිලුටු කරන අතුරු දර්ශනයක් ලෙසදැයි භික්ෂුව කල්පනා කළේය. සිත ශ්‍රද්ධාවෙන් පුරවාගෙන මේ යන වන්දනා ගමන ගුප්ත වැනි කරත්තකාරයකු නිසා දූෂණය වන්නේ ඇයිදැයි භික්ෂුව දහඅතේ සිතන්නට පටන් ගත්තේය. එම නර්තනය තුළ අඹුවන් එම පුරුෂයන් තුන්දෙනාගේ අතින් අතට මාරු වෙමින් ගියෝය. ඔවුන් දෙස ගුප්ත බලා සිටියේ කිනම් හැඟීමකින්දැයි භික්ෂුව නොදත්තේය. අවසානයේ සඳඑළියෙන් ආලෝකවත් වූ තණ බිමේ ඔවුහු රතිකෙළියේ යෙදෙන අයුරු දකින්නට පෙර භික්ෂුව තම ගමන් මල්ලේ මුහුණ හොවාගෙන අසුභ නිමිත්ත වඩන්නට පටන් ගත්තේය.

ඔවුන්ගේ පෙම් සෝෂාව නතර වූයේ කොයි වෙලාවේදැයි භික්ෂුවට මතකයක් නොතිබුණේය. නින්දත් නොනින්දත් අතර සිටිමින් භික්ෂුව තමාට කොණ්ඩඤ්ඤ හිමියන්ගෙන් ලැබුණු කරඬුව දේවදත්ත හිමියන්ගෙන් පරිස්සම් කරගැනීමෙ කාර්යයේ නියැලී සිටියේය. වියළි කොළ පැගෙන හඬක් නිසා භික්ෂුව නැති ගත්තේය. හාත්පස බලද්දී ගුප්ත පැදුරු කඩමාල්ලක්ද සහිතව භික්ෂුව සිටි ගල්බංකුව පාමුල බිම දිගා වෙමින් සිටියේය. භික්ෂුවට ඔහු ගැන යම් හිරිකිතයක් දැනුණේය. ඔහුගේ ළඟින් වහනය වූ දඩිය සමග මුසු වූ විලවුන් සුවඳ තමාට වපාතිය ගෙනත් දුන් දැරිවියගේද නැති නම් අනිත් අඹුවන්ගේ ශරීරවල තැවරූ විලවුන් සුවඳදැයි භික්ෂුව කල්පනා කරමින් සිටියදීම නින්ද ඔවුන්ගේ සිරුරු ස්පර්ශ කළේය.

පසුදා ඔවුහු දෙදෙන බුද්ධගයා දක්වා යන දුෂ්කර ගමන ආරම්භ කළෝය. ඔවුන් උදේ පිට වෙද්දී ගුප්තගේ ගෙදරින් මගට කැම සඳහා රස කැවිලි සාද දී තිබුණි.

මග වෙහෙස දුරු කිරීම සඳහා ගුප්ත විටින් විට ගී ගායනා කළේය. ගුප්තගේ ක්‍රියාවන් ගැන තමා තුළ කිසි පැහැදීමක් නැති බව ඇඟවීමට නිතර භික්ෂුව උත්සාහ කළේය.

"උඹ මහ ඕලාරික මිනිහෙක්. උඹට අහු වෙලා ඉන්න අර ගැනුත් ඒ වගෙයි. මට උන් ගැන මුලින් අනුකම්පාවක් ඇති වුණ එක ඇත්ත. ඒ උණත් උන් උඹට වැඩිය වල් විදියට හැදිච්ච එවුන්... උඹල මොකක් හරි මානසික ලෙඩකින් පෙළෙන සත්තු ටිකක්... උඹට පුළුවන්ද මිනිහො උඹෙ ගැනි තව මිනිහෙකුට පූජ කරල උන්ගෙ වල්කං බලා ඉන්න? ඡීහ්... උඹල වගේ

නරුමයො ජාතියක්.. ඉන්දියාව ශුද්ධ දේශයක්. ඒ ශුද්ධ දේසෙ උඹල වනසල දාල...'' ගුප්ත අශ්වයාගේ වෘෂණකෝෂ තම පයින් පිරිමදිමින් අශ්වයා කුලප්පු කළේය.

''හාමුදුරුවනේ, වෙස්සන්ත්ර රජ්ජුරුවොත් තමන්ගෙ බිරිඳව පරිත්‍යාග කළා නේද?''

''උඹ ඒ පාර අපේ බුදු හාමුදුරුවන්ගෙ බෝසත් චරිතය තොපේ කාලකණ්ණි වැඩ සාධාරණීකරණය කරගන්න පාවිච්චි කරනවද?''

''නෑ හාමුදුරුවනේ, වෙස්සන්තර රජ්ජුරුවො බිරිඳ පරිත්‍යාග කළේ වැඩකාරකමට නෙවෙයි.... රතිකෙළියට ගෑනියෙක්ව සොයන තවත් මිනිහෙකුටයි ඒ පරිත්‍යාගය කළේ. ඒක සංස්කෘතික වශයෙන් කොයිවිදියට බලපෑවත් බෝසතාණන් වහන්සේ අත්හැරීම සඳහා ගත්ත වැදගත් තීරණයක්.''

''උඹ හිතන්නෙ මන්ද්‍රි දේවිය දන් දුන්නෙ සාමාන්‍ය මිනිහෙකුට කියලද? ඒ දන් දුන්නේ ශක්‍රදේවේන්ද්‍රයන්ට.''

''කවුරු ආවත් ඒ වෙලාවෙ එතනට ආවෙ බමුණෙක්. බමුණාටයි වෙස්සන්තර රජ්ජුරුවො මන්ද්‍රි දේවිය දන් දුන්නෙ. එවැන්නෙක් බිරිඳ ඉල්ලා සිටින්නේ අහවල් කාරියකටදැයි කියල බෝසතාණන් වහන්සේ නොදැන සිටියැයි කියන්න පුළුවන්ද? ඒ දන්දීම කළේ ලිංගික කුහකත්වය ඉරිසියාව පහ කරගත්ත හිතකින් කියලයි මම කියන්නේ. තෘප්තියෙන් පසු අතහැරීමෙ මාවත එතැන තියෙනවා.'' හික්ෂුව ගුප්ත දෙස නොබලා තම ගමන් මල්ලේ ඇති කරඬුව දෙස බැලුවේය. එය නිරුපද්‍රැතව තිබුණේය. ගුප්ත නැවතත් මලයාලම් ගීයක කොටසක් ගායනා කළේය...

අහස දීප්තිමත් නිල්පාටකින් යුක්ත වූවේය. ඉඳහිට වේගයෙන් පා වී යන සුදු වලාකුළකින් හිරු රැස් මොහොතකට මැකී යන්නේය. හික්ෂුව තම ගමන් මල්ලට අත දමා කරඬුව අතට ගත්තේය. එහි හැඩයත් ඒ කරඬුවේ පාදම වට කරගත් කැටයමුත් දෙස හික්ෂුව බලා සිටියේය... එම සියුම් කැටයම්වල අර්ථ විවිධාකාර ලෙස තේරුම් ගත හැකි බව හික්ෂුවට දැනෙන්නේය.

ගුප්ත මෙම කරඬුව අතට ගත හොත් මෙ සියුම් කැටයම් ඔහු දන්නා තරමින් තේරුම් කරනු ඇත. එහෙත් කැටයම් තුළ යම් නිශ්චිත අර්ථයක් තිබෙන්නට බැරිකමක් නැතැයි හික්ෂුවට සිතෙන්නේය.

එක් වරම කරත්තයේ බර දෙගුණයක් වී ගිය බවක් හික්ෂුවට දැනුණේය. අශ්වයාගේ ගමන් වේගය බාල වෙද්දී ගුප්ත අශ්වයාට නිදහසේ ගමන් කරන්නට දී දුම්කොළ වඩියක් ඒදුවේය.

''එතකොට ඔය කරඬුව මට දෙන්නෙම නෑ...'' හික්ෂුව නැවතත් කලබල වූයේය. වහාම කරඬුව තම ගමන් මල්ලේ අඩියේ සඟවාගත්තේය.

''මට ඔබ වහන්සේගෙන් හරි කරදරයි... ඔබ දේවදත්තයෙක්ම තමයි'' හික්ෂුව මුහුණ ගමන් මල්ල දෙසටම යොමාගෙන කීවේය.

''ඔබ ඵ්පනීය ප්‍රශ්නවලට පිළිතුරු දැනගන්න කැමතිද?'' දේවදත්ත හිමියන්ගේ ගාම්භීර හඬ නැවත හික්ෂුවට ඇසුණේය.

''බුදු හාමුදුරුවො ප්‍රතික්ෂේප කරපුව මට දැනගන්න වුවමනාවක් නෑ.''

''ඒ වුණාට මම හොයාගත්තා. ඔය කරඬුව දුන්නොත් මම ඒව ඔබ වහන්සෙට කියා දෙනවා.''

''මට ඒව දැනගන්න කිසිම වුවමනාවක් නෑ... මට මගේ පාඩුවෙ මේ වන්දනාව කරගන්න දෙන්න. පිං සිද්ධ වේවි.''

''ඇයි ඔබ වගේ මෝඩයෙකුට ඔය කරඬුව කොණ්ඩඤ්ඤ හාමුදුරුවො දුන්නෙ කියලයි මට හිතාගන්න බැරි.... කමක් නෑ.... කැමති නම් ඔය කබල් කරත්තෙන් බැහැල එන්න අර ලස්සන දිව්‍ය රථයට. බලන්න රථාචාරියා කවුද කියල....''

'අජාසත්ත රජ්ජුරුවෝ' හික්ෂුව රථාචාරියා හඳුනාගත්තේය.

''කැමති නම් එන්න මාත් සමග. මම ඔබට දිව්‍ය ලෝකෙ එක්ක යන්නම්.''

''ඒ කියන්නෙ ඔබ වහන්සේ අවීචි මහා නරකාදියෙන් නිදහස් වුණාද? ඒ කොහොමද? මම බණපොතේ අහල තියෙන්නෙ ඔබ වහන්සේ පණපිටින්ම අවීචි මහා නරකාදියට ඇදගෙන ගියාය කියලා.''

දේවදත්ත හිමියෝ අවඥා සහගත සිනාවකින් භික්ෂුවට සංග්‍රහ කළා විනා පිළිතුරක් නොදුන්නේය..

"ඔබ රාජ් බලය යොදල අපායෙනුත් පැනගත්තද?" භික්ෂුව නැවතත් ඇසුවේය. ඊටද පිළිතුරක් දේවදත්ත හිමියන්ගෙන් නොලැබුණේය.

"ඒක කොණ්ඩඤ්ඤ හිමියන්ගෙ ඉල්ලීමක් පරිදි මා විසින් ඉටු කළ යුතු කාරියක් වෙනුවෙන් රැගෙන යන කරඬුවක්. එය ඔබ වහන්සේට කෙසේවත් දිය නොහැකියි... ඒ ගැන නැවත කතා කිරීමේ තේරුමක් නෑ."

"ඔබ මේ ලෝකයේ ආරම්භය ගැන දන්නවද? මේ විශ්වය හැදුණු හැටි දන්නවද? සාක්ෂි ඇතිව ඔප්පු කරන්න දන්නවද?"

"නෑ. මට දැනගන්න අවශ්‍යත් නෑ. මට ඕන මේ අනන්තයක් නොපෙනෙන සසරින් ගැලවෙන්න විතරයි."

"ඔබ හරි ආත්මාර්ථකාමියි..... කමක් නෑ. මොහොතකට මේ රථයට නගින්න.... ඔන්න මං ඔබ වහන්සේගේ අතින් අල්ල ගත්තා......"

"කරඬුව මගෙන් පැහැරගන්න හදන්නෙපා. ඒක හොරකමක්, මංකොල්ලකෑමක්."

"නෑ. බය වෙන්නෙපා. ඒක ඔබ කැමැත්තෙන් දෙන දවසක මම ගන්නම්."

තම දෑස් එක්වරම නිලංකාර වී යන බවක් භික්ෂුවට දැනුණේය. කාලයේ වේගය හෝ අවකාශයේ දුර කොතරම්දැයි භික්ෂුවට සිතාගැනීමට අවස්ථාක් නොලැබුණේය.

"දෙයියනේ! මේ කොහේද?" භික්ෂුව අසරණ ලෙස දේවදත්ත හිමි දෙස බලා සිටියේය....

"ඔබට පේනවද අර ග්‍රහලෝකය....? ඒකෙ කවුද බලන්න දැන් ඉන්නෙ."

"උස සත්තු විශේෂයක්. ඩයනෝසරයන් නේද? මොකක්ද ඒ ලෝකය."

"එතන ඉඳන් තමයි අපි මෙතෙන්ට ආවෙ."

"වෙන්න බෑ කොහොමවත්. අපි ඉන්න ලෝකෙ කොහෙවත් ඔය දර්ශන දකින්න නෑ...."

"ඇත්ත. ඒත් මේ ඉන්න ග්‍රහලෝකයට තාම අපේ පෘථිවිය පේන්නෙ ඔය විදියට. ඔබව තව දුර ග්‍රහලෝකයකට එක්ක ගියොත් ඔබට බලාගන්න පුළුවන් අපේ ග්‍රහලෝකය සකස් වෙන හැටි. කැමතිද එච්චර දුර මා එක්ක යන්න?"

"එපා එපා. මාව අර හිටපු කරත්තෙටම ගිහින් ඇරලවන්න මගේ ඔළුව කරකැවෙනවා."

තවත් මොහොතකින් භික්ෂුවට දැනුණේ තමා සුපුරුදු ලෙස ගුප්තගේ කරත්තයේම වාඩි වී සිටින බවයි. ගුප්තගේ ගී හඬ තරමක් උස් හඬින් ඇසෙන්නට වූයේය. භික්ෂුව වහාම කරඬුව නැවත අතට ගත්තේය..

"දෙයියන්ගෙ පිහිටයි... කරඬුව තියෙනවා." භික්ෂුව කරඬුව අතගෑවේය.. කරඬුවේ බඳ කොටසේ යම් සනකමක් අතට දැනුණෙන් භික්ෂුව කරඬුව මල්ලෙන් එළියට ගෙන පරීක්ෂා කළේය.. එහි තවත් කැටයම් වැලක් ලියලමින් තිබෙන බව භික්ෂුව දුටුවේය.

"දෙයියනේ! මේ කරඬුව දේවදත්ත හාමුදුරුවෝ විනාශ කරනව වත්ද? අනේ මහා විෂ්ණු දෙවියනේ! මෙහි සියුම් සිදුර මට දකින්නට නොලැබුණත් කමක් නෑ.. මේක නිරුපද්‍රැතව දළදා මාලිගාවේ තැන්පත් කරන්න මට මේක ආරක්ෂා කර දෙන්න දෙයි හාමුදුරුවනේ.." යි භික්ෂුව අහසට දෑත් දිගු කරගෙන මිමිණුවේය..

භික්ෂුව කරඬුව මල්ලේ තැන්පත් කොට ගුප්ත කරත්තය දක්කන දෙස බලා සිටියේය. ගුප්ත සමග තමාට කතා කරන්නට යමක් නැති වීම ගැන භික්ෂුවට යම් සංවේගයක් දැනුණේය.

දින දෙකක් යන්නට පෙර බුද්ධගයාවට යා හැකි බව ගුප්ත කියද්දී භික්ෂුවට සිනා පහළ වුණේය.

"ඇයි හාමුදුරුවනේ?"

"නෑ. මට හිනා ගියේ උඹේ ඔය පරණ කරත්තෙට වඩා කොච්චර ඉක්මනින් මේ ලෝකෙ වටේ යන්න පුළුවන්ද කියල හිතිච්ච නිසා."

"හම්... ඒත් හාමුදුරුවො දන් යන්නෙ මගේ කරත්තෙ" ගුප්තගේ සිනාව සරදමක්යැයි භික්ෂුවට හැඟුණේය. ගුප්ත අශ්වයාට කෙවිටෙන් පහරක් ගැසුවේය. අශ්වයා ගමන් වේගය වැඩි කළේය.

එක් කුඩා නගරයක කරත්තය නතර කළ ගුප්ත එයින් බැස භික්ෂුවටද දහවල් ආහාරය සඳහා ආරාධනා කළේය... ඔවුන් එම කඩයට ගොස් ආහාර ගනිද්දී තාම්පුරාවක් වයමින් ගී ගයමින් මුදල් එකතු කරන යුවතියකගේ දර්ශනය නිසා භික්ෂුවට හදිසියේ ගුප්තගේ ළාබාල බිරිඳ සිහි වූයේය. ගී ගයන දැරිය ගුප්තගේ බිරිඳගේ නිවුන් සොහොයුරියක්දැයි සැක හැර ගැනීමට භික්ෂුවට අවශ්‍ය වුණේය. ඒ නිසාම භික්ෂුව ගුප්තගේ මුහුණ දෙස හොරැහින් සිපවනාවක්ම බැලුවේය. එහෙත් ගුප්තගේ මුහුණේ කිසිදු වෙනසක් නොපෙනුණේය. ඔහු චපාති කෑලි අල හොද්දේ පොඟවමින් ඉතා සැහැල්ලුවෙන් ආහාර ගත්තේය. ගුප්ත මහා කපටියකු බව භික්ෂුව කල්පනා කළේය.... ඔහු ඇගේ ගීයෙන් සතුටු වෙමින් සිටින බව භික්ෂුවට ඒ සමගම අවබෝධ වූයේ ඔහු ඇගේ ලයාන්විත ගායනයෙන් මත් වී තාලයට හිස දෙපසට පද්දමින් ආහාර ගත් නිසාය.....

"ගුප්ත, උඹේ අර බාල අඹුව වගේ නේද අර දැරිවි......"

"එහෙමද....?"

"උඹ මහ කපටි කයිරාටික මිනිහෙක්! ඒ රූපෙයි මේ රූපෙයි කිසි වෙනසක් නෑ. මට ඇත්ත කියපං. ඒ අර උඹේ බාල අඹුවගෙ නිවුන් සහෝදරී නේද?"

"මටත් පේන්නෙ ඒ වගේ. ඒත් එයාට සහෝදරියක් හිටියෙ නෑ...."

"මෙතෙන්ට කන්න එන ඔක්කොම ඒ දැරිවිගෙ සංගීතෙනුයි පෙනුමෙනුයි දෙකෙන්ම මත් වෙලා වගේ. මට හිතෙන්නෙ මේ හෝටල්කාරයාගෙ උප්පරවැට්ටියක් වෙන්න ඇති මිනිස්සු රඳවගන්න..."

"මට හිතෙන්නෙ ඒ සින්දුවට කවුරුත් කැමතියි වගේ. ඔය ඔක්කොම තාල අල්ලන්නෙ ඒ සින්දුව නිසා...." ගුප්ත එසේ කියද්දීම ගී ගයමින් සිටි දැරිය එක් වරම වයමින් සිටි තාම්පුරාවට බර වී බිම ඇදවැටුණාය..... එහෙත් කිසි කෙනෙක් ඈ වෙත ළං වී ඇයට සිදු වූයේ කුමක්දැයි බැලීමට ඉදිරිපත් නොවුණාහ. භික්ෂුවට අසීමිත කණගාටුවක් ඇති වූයේය. ගුප්ත එක් වරම එතැනට ගොස් ඇගේ අතක් අල්ලා බැලුවේය. අප්‍රාණික ඇගේ අත සෙමින් ඇගේ කය මත තැබූ ගුප්ත වහා තාම්පුරාව වයමින් ගීයේ ඉතිරි අර්ධය ගයන්නට පටන් ගත්තේය. භික්ෂුව බෙහෙවින්ම කෝපාවිෂ්ට වූවේය. මෙතරම් හරියක් මේ දැරියට සිදු වී තිබෙද්දී ගුප්ත තිරිසනකු ලෙස හැසිරෙන බව භික්ෂුවට දැනුණේය.

"නවත්තපං ඕක!" භික්ෂුව තර්ජනය කරද්දී ගුප්තගේ ගී නදින් මත් වූ පිරිස ඔල්වරසන් දෙන්නට වූවෝය.

"මූන් මහ සත්තු ජාතියක්....." භික්ෂුව තමාටම කියාගත්තේය. එම ගීය අවසන් වන තුරු ගැයූ ගුප්ත තාම්පුරාව එතැනම බිම තබා, දැරිය මියගොස් සිටින බව කඩ අයිතිකරුට කීවේ ය.

භික්ෂුව කරත්තයට ගොඩ වූයේ මියගොස් සිටින දැරිය දෙස මහත් අනුකම්පාසහගත බැල්මක් අවසන් වතාවටත් හෙළමින්ය... ඇගේ මරණය කෙසේ නම් විශ්වාස කළ හැකි මරණයක්දැයි භික්ෂුවට සිතාගැනීමට නොහැක්කේය. ඇගේ පියකරු සිනාව, කටහඬ නිමේෂයකින් සදහටම නැති වී යෑම දේව ශාපයක් ලෙස භික්ෂුව සිතුවේය.. ඒ සිරුර අතහැර කරත්තයට නැගගැනීමට භික්ෂුවට සෑහෙන වේලාවක් ගත වූයේය. දැස් අග කඳුළු මෝදු වන බවක් භික්ෂුවට එක් වරම දැනුණේය. ඒ සමගම භික්ෂුවට ගස් එකට ඇතිල්ලෙන හඬ ඇසුණේය. ඒ හඬ සිහින් ළතෝනියක් වී ක්‍රමයෙන් තාම්පුරාවේ ගී තාලය හා මුසුව ශෝකී රාවයක් ලෙස ඇසෙන්නට පටන් ගත්තේය. ඒ හඬ කන් පතුල ස්පර්ශ කරද්දී තම ඇස් දෙක කඳුළින් පිරෙන බවද භික්ෂුවට දැනුණේය. එය වළකාගනු වෙනුවට භික්ෂුව නිල්පාට හිස් අහස දෙස බලාගෙන දෑස් මතින් ගලා යන කඳුළට ඉඩ දී සිටියේය.

අශ්වයා ඉතා කම්මැලි ගමනක යෙදී සිටියේය. ගුප්තගේ මුහුණ බැලීමටවත් භික්ෂුව තුළ දන් කැමැත්තක් නැත්තේය. මෙවැනි ගති ඇත්තකු සමග මේ ගමන යැමට සිදු වීම තමා ලද අවාසනාවක් ලෙස භික්ෂුවට දැනෙන්නේය.

"කියපං බූරුවෝ, තෝ කොහොමද අර දුරිච් මැරිල වැටිල ඉද්දි සින්දු කිව්වෙ...?" සෑහෙන දුරක් ගිය පසු භික්ෂුව ප්‍රශ්න කළේ කරත්තයෙන් පිටටද ඒ හඬ පැතිරෙන තරම් ආවේගයකිනි...

"ආ.... තාම ඒ දුරිච් හාමුදුරුවෝ එක්කද...? මම කළේ ඒ වෙලාවෙ කරන්න පුළුවන් යුතුකමක්. ඇය මළ බව කිව්වා නම් අර සන්තෝසෙන් හිටපු මිනිස්සුන් එවේලෙ අසන්තෝෂ වෙනවා..... ඇය මිය ගියා. එය ඉවරයි. මිනිස්සු ඇගෙන් සන්තෝෂ වුණේ ඇගේ ගීය නිසා. ඒ ගීය මා ගයා ඔවුන් සන්තෝෂ කළා....."

"අපූරුයි උඹේ යුතුකම! ඔවට කියන්නෙ සත්ත්ව ගති" ගුප්ත කිසිවක් නොකීවේය. ඔහු අශ්වයාට කැමති සේ කරත්තය අදින දෙස බලාගෙන දුම්කොළ වඩියක් ඒදුවේය..

ගුප්තගේ සැබෑ ස්වරූපය කුමක්දැයි තේරුම් ගැනීමට භික්ෂුව බොහෝ අවස්ථාවල උත්සාහ ගත්තේය. එහෙත් ඔහු කවුදැයි භික්ෂුවට නොවැටහෙන්නේය. ඒ නිසාම ගුප්ත කෙරෙහි කෝපයක් භික්ෂුවගේ සිතේ වරින් වර උපදින්නේය.. මහා මන්දිරයකට හිමිකම් කියන ගුප්ත කෙරෙහි ගෞරවයක් වරෙක භික්ෂුවගේ සිතේ ජනිත වන්නේය. තවත් වරෙක ඔහු කරන ක්‍රියා නිසා පිළිකුලක් උපදින්නේය. ඔහුගේ ආගම, ජීවිත දර්ශනය කුමන මූලයකින් පැවත එන්නේදැයි භික්ෂුවට සැක හැර දැනගැනීමේ ක්‍රමයක් නොතිබුණේය.. තමාගේ මිනුම්දඬුවලින් මැන බලන කල ඇති වන කෝපය පමණක් භික්ෂුව සමග සිටියේය.

3.

ඔවුන්ට දින දෙකක අවසානයේ බුද්ධගයාවට යා ගැනීමට හැකි වුණේය. භික්ෂුව විශ්‍රාම ශාලාවට ඇතුළු වූයේ ගමන් වෙහෙසත් බුද්ධාලම්බන ප්‍රීතියත් ගී ගැයූ දැරිය මළ ශෝකයත් සම සේ දැනුණු සැඳෑවකය.... ගුප්ත අශ්ව කරත්තයත් රැගෙන වෙනත් තැනකට ගියේ පසුද මුණගැසීමේ පොරොන්දුව සමගය...

රාත්‍රිය සුව සේ ගත කිරීමට භික්ෂුවට අවශ්‍ය වුණේය. ඇවැත් දෙසාගෙන සිල් පිරිසිදු කරගැනීමට භික්ෂුවට විශේෂයෙන් වුවමනාව තිබුණේය. සන්සුන් පරිසරයක් අපේක්ෂා කළ භික්ෂුවට ඒ සන්සුන් බව විශ්‍රාම ශාලාවේ නැති බව වැඩිවේලාවක් යන්නට පෙරම අවබෝධ වුණේය. සමහරු තමා වෙළෙන්දන්ගෙන් මිල දී ගත් රෙදිපිළි මාල වළලු ආදියේ හැඩ බලමින් ඒවාගේ ගුණදොස් ගණන් මිනුම් ගැන කතා කළෝය. සමහරු තමා මේ සිටින්නේ බුදුන් පිරිනිවන් පා වදළ තැනද නැති නම් පළමු ධර්ම දේශනාව කළ තැනදැයි හරියාකාරව දැනගැනීම සඳහා වෙහෙසුණෝය. තවත් සමහරු බුදුන්ගේ ගුණ ගැයුවෝය. තවත් සමහරු ගෙවල් දොරවල්වල මොනවා සිදු වෙන්නේදැයි දැනගැනීමේ කුතුහලයෙන් දුරකථන කුටිය ළඟ දුරකථන පණිවිඩ ලබාගැනීම සඳහා පෝලිම් ගැසී සිටියෝය. ගිරා සන්දේශයේ අම්බලමේ කතා නම් වර්ණනාව භික්ෂුවට එක්වරම සිහි වුණේය.. භික්ෂුවට ලැබුණේ උඩු මහලේ කාමරයකි... එම කාමරයට වැදුණු භික්ෂුව දොර වසාගෙන ශාලාවෙන් ඇසෙන හඬවල් අමතක කිරීමට උත්සාහ කළේය.

භික්ෂුවට තම ගමන්මලු දෙකේ ඇති අනවශ්‍ය දේවල් ඉවත් කොට එම ගමන්මලු දෙක පිළිවෙළකට අසුරාගැනීමට සෑහෙන දවසක සිට අවශ්‍ය වුණේය. එහෙත් එම මලුවලින් මොනවා ඉවත දැමිය යුතුදැයි භික්ෂුව තීරණයක් ගැනීමට නොහැකිව සිටියේය.

අද නම් ගමනට අවශ්‍ය දේ හැර අනිත් සියලු දේ වීසි කර දමමියි සිතා භික්ෂුව මලු දෙකේ ඇති සියලු දේ ඇඳ මත හෙළුවේය.. අනතුරුව මොනවා අයින් කළ යුතුදැයි සැහෙන වේලාවක් කල්පනා කළේය. චන්දනාවට අනවශ්‍ය බොහෝ දේවල් මේ ගොඩවල් දෙකේ ඇති බව සිතමින් අවශ්‍යයැයි හැගෙන දේවල් නැවත මලුවල තැන්පත් කරන්නට පටන් ගත්තේය.

බඩගිනි වෙතැයි බියෙන් ආහාර වර්ග තබාගත්තේය. ලෙඩ වෙතැයි බියෙන් බෙහෙත් තබාගත්තේය. සීතල වෙතැයි බියෙන් සිවුරු තබාගත්තේය. මැසිමදුරුවන්ගෙන් පීඩා වෙතැයි බියෙන් පෙරවනා තබාගත්තේය. සතුරු බලවේග ඇති වෙතැයි බියෙන් යන්ත්‍ර නූල් තබාගත්තේය. හන්දිපත් වේදනා ඇති වෙතැයි තෙල් තබාගත්තේය. පාළුවක් දැනෙතැයි බියෙන් පොත් තබාගත්තේය. වැස්සට අසු වෙතැයි බියෙන් කුඩය තබාගත්තේය. මුදල් නැති වෙතැයි බියෙන් පසුම්බිය තබාගත්තේය. ජීවිතය අමතක වෙතැයි බියෙන් සිහිවටන තබාගත්තේය. අවසානයේ ඇඳ මත කිසිවක් ඉතිරි නොවී සියල්ල නැවත මලුවලම තැන්පත් වුණේය. එක් මල්ලක් බර වැඩි වූයෙන් කරඬුව ඇති මල්ලට තෙල් බෙහෙත් නූල් යන්තර පොත් ඇසුරුවේය... ඉන් පසු මලු දෙක සමාන බරකින් යුක්ත වූවේය.

භික්ෂුව නැවතත් කරඬුව අතට ගත්තේය. විදුලි පහන් එළියට කරඬුවේ රන් පැහැය හොඳින් දර්ශනය වේ. සියලු ලෝහ වර්ග එකතු කොට සැදුවත් එය රන් පැහැයෙන්ම බැබළුණේය. එහෙත් එහි විවිධ ලියවැල් හතරවටින් ලියලා කරඬුවේ ගර්භය දෙසට ඇදී එමින් ඇති බව භික්ෂුව දුටුවේය. එය කෙසේ සිදු වන්නක්දැයි භික්ෂුවට පැහැදිලි නොවන්නේය. කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේ මෙවන් දෙයක් මේ කරඬුවට වන බවක් තමාට නොකීවේ මන්දැයි භික්ෂුව කල්පනා කළේය. මේ සතුරු බලවේගවල බලපෑමක්යැයි භික්ෂුව අනුමාන කළේය.

"කරඬුවට මොනවා වුණත් ඇතුළත ඇති දේට හානියක් නැත්තම් කමක් නෑ" භික්ෂුව තමාටම කියාගත්තේය.

භික්ෂුව කරඬුවෙන් දෑස මුදාගෙන මොහොතක් භාවනාවේ පසු වූවේය... ඒ පියාගත් දෙනෙත් අබියස බුදු රජාණන් වහන්සේගේ රූපය දර්ශනය වීමෙන් භික්ෂුව මහත් ගෞරවයකින් සහ බියකින් අවසර පැතුවේය..

"භාග්‍යවතුන් වහන්ස, මට නමස්කාර කරන්න අවසර!" භික්ෂුව උන් වහන්සේගේ පාමුල වැඳ වැටුණේය.

"ඔබ බුද්ධයැයි සිතාගෙන මා නමස්කාර කළේ නම් එය වැරදීමකි. මම මහා කාශ්‍යප; ප්‍රථම ධර්ම සංගායනාව සංවිධානය කළ මහා කාශ්‍යප. බුදුන්ගේ රූපයට සමාන රූපයකින් යුක්ත නිසා ඔබ රැවටෙන්නට ඇති.."

"ස්වාමීනි, මට සමා වෙන්න... මම බුදුන් උපන් දේශයේ සතර ස්ථාන වැඳගැනීමට පැමිණි භික්ෂුවක්."

"ඒ ගැන මම දන්නවා. ඔබේ භාරයේ තිබෙන කරඬුවත් රැගෙන එන්න දැන් මා සමග..... ස්වල්ප කාලයකට..."

"අනේ ස්වාමීනි, ඔබ වහන්සේ අඬගසන ඕනෑම තැනකට මම එන්නම්. ඒත් කොයි ඉසව්වටදැයි කැමති නම් කියන්න ස්වාමීනි."

"පළමු සංගායනාව සිදුවෙන තැනට."

භික්ෂුව බොහෝ කැමැත්තෙන් නැගී සිටියේය.. කරඬුව සහිත මල්ල කරේ එල්ලාගත්තේය..

"එපා ඔය ගමන යන්න..." එක්වරම පසුබිමින් ඇසුණු හඬ භික්ෂුව හඳුනා නොගත්තේය..

"මම පුරාණ හාමුදුරුවෝ. ඔබ යන්න එපා" නැවතත් භික්ෂුවට පසුබිමින් ඇසුණේය. එහෙත් භික්ෂුව තීරණයක් ගැනීමට පෙරම භික්ෂුවගේ දකුණතේ ඇඟිලි තවත් අතක ඇඟිලි සමග බැඳී ගියේය.

විසිතුරු මණ්ඩපයක් මත රාජ භටයන් රාශියකගේ මුරකාවල් මැද රහතන් වහන්සේලා රැස් වී සිටින ආකාරය භික්ෂුව දුටුවේය. එහි ආසන දෙකක් හිස් ව තිබුණේය. එම ආසනයට යාබදව

සිව් භික්ෂූන් කිප නම රහස් සාකච්ඡාවක නියැලී සිටින අයුරු භික්ෂුව දුටුවේය. එම රහස් සාකච්ඡාව පැවැත්වෙන තැනට යාබද ආසනය මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ ආසනය බව භික්ෂුව වහා අවබෝධ කරගත්තේය.

"ඔබට මින් ඔබ්බට එන්නට අවසර නැහැ.. අර පෙනෙන විසිතුරු මණ්ඩපය ඇතුළේ ඔය කරඬුව තබන්න පමණයි ඔබට අවසර තිබෙන්නේ.. එය නැවත ඔබ අතට ලැබේවි."

භික්ෂුව එම මණ්ඩපය මැද කරඬුව තැන්පත් කොට පසෙකට වූවේය.. තමා කළේ වැරදි වැඩක්දැයි සියල්ල සිදු වීමෙන් අනතුරුව භික්ෂුව කල්පනා කරන්නට පටන් ගත්තේය...

'මට කොණ්ඩඤ්ඤ හාමුදුරුවෝ මේ වගක් කිව්වෙ නෑ... ඒත් පුරාණ හාමුදුරුවෝ යන්න එපා කිව්වා... ඒක මොකක් හරි පෞද්ගලික හේතුවක් නිසා වෙන්න ඇති. කොහොමවත් කාශ්‍යප මහරහතන් වහන්සේ මේ කරඬුවට අයහපතක් නොකරන බව මට විශ්වාසයි.' භික්ෂුව සිත සනසාගන්නට වෑයම් කළේය..

භික්ෂුව සංගායනා භූමිය දෙස නැවත බලා සිටියේය. එහි ඇති අනෙක් අසුන ආනන්ද හිමියන් වෙනුවෙන් අවසන් මොහොතේ පිළියෙල වූවක් බව රහස් සාකච්ඡාවෙන් අනාවරණය කරගැනීමට භික්ෂුවට හැකි වූයේය. ඔවුහු ආනන්ද හිමියන්ට විරුද්ධව චෝදනා පත්‍රයක් පිළියෙල කරමින් සිටියෝය. භික්ෂුව තුළ සියුම් සංවේගයක් උපන්නේය. ආනන්ද හිමියන් නොමැති මොහොතක මෙවැනි චෝදනා පත්‍රයක් සකස් කරන්නේ සැබැවින්ම ඇයිදැයි යන ගැටලුව භික්ෂුව තුළ මතු වෙමින් තිබුණේය.

"මේ මොහොත ශ්‍රද්ධාවට වඩා ප්‍රඥාව මෙහෙයවිය යුතු මොහොතකි" භික්ෂුවට කාශ්‍යප මහරහතන් වහන්සේගේ හඬ ඇසුණේය.

ආනන්ද හිමියන්ගේ රූපය භික්ෂුව දුටුවේ මේ අතරය. රොඩ් ගුබ්බෑයමට වැඩි ආනන්ද හිමියෝ දූත් පැසුණු හිස කෙස් සහිතව අසූ වස ඉක්මවා සිටියෝය. භික්ෂුවට ඒ ආනන්ද හිමියන්ම යැයි සැක හැර දැනගැනීමට හැකි වූයේ වෙන් වූ අසුනේ උන් වහන්සේ තැන්පත් වූ නිසාය... සියලු රහතන්

වහන්සේලාගේ අවධානය ආනන්ද හිමියන් වෙත මොහොතකට යොමු වනු භික්ෂුව දුටුවේය.

ආනන්ද හිමියන් තමා මෙන්ම ආගන්තුකයකු වූයේ ඇයි දැයි භික්ෂුව කල්පනා කළේය. නන්නාඳුන භික්ෂුවක් සාකච්ඡා මණ්ඩපයට බලහත්කාරයෙන් පැමිණියේයැයි සැක සිතූ මුර භටයෝ රහතන් වහන්සේලාගෙන් අණ ලැබෙන තෙක් විමසිල්ලෙන් පසු වූවෝය. ආනන්ද හිමියන් බුදුන් ළඟම සිට ධර්මය හොඳින් ඇසූ භික්ෂුවක ලෙස මේ සාකච්ඡාවට නියතයෙන්ම සහභාගි විය යුතුය යන නිගමනයේ සිටින්නට සියලු රහතන් වහන්සේලාට බැරි වූයේ ඇයිදැයි භික්ෂුව කල්පනා කළේය. ආනන්ද හිමියන්ට විරුද්ධව චෝදනා පත්‍රය ඉදිරිපත් වෙද්දී භික්ෂුවට ඉවසාගත නොහැකි සංවේගයක් උපන්නේය. ඒ චෝදනාවලට තමා නිවැරදිකරු වූවත් සංඝ කැමැත්ත එය නම් එය වරදක් ලෙස පිළිගන්නා බව ආනන්ද හිමියන් කියද්දී භික්ෂුවට ඇඬුම් ආවේය.

"අනේ ආනන්ද හාමුදුරුවනේ! කියන්න අජීවී බුදු සිරුර මාගමුන් ලවා වන්දවන්නට පෙර ජීවී බුදු සිරුර යසෝදරාවගේ කඳුළින් දෝවනය වූ බව..."

සංගායනා භූමියෙන් තමා කොයි මොහොතේ පැමිණියේද, සංගායනාව කොතරම් කාලයක් පැවතුණාද යන්න භික්ෂුවට අවබෝධයක් නොතිබුණත් එම කරඬුව නැවත තමා අත ඇති බව භික්ෂුව දුටුවේය. එහෙත් එය කලින් කරඬුවේ බරට වඩා බරින් යුක්ත බව භික්ෂුවට දැනෙන්නේය.

"දෙයියනේ! කරඬුව මාරු වුණාවත්ද?" භික්ෂුව කරඬුවේ මතුපිට හොඳින් පරීක්ෂා කළේය.. එහි ලියවැල් රාශියක් අලුතින් ලියලා ඇත... එහෙත් එය තමා අත තිබූ කරඬුවම බව භික්ෂුවට සැකයක් නැත්තේය. එහි බර වැඩි වූයේ ලියකම් සඳහා අලුතින් ලෝහ එකතු වීම නිසායැයි භික්ෂුවට සිතෙන්නේය.

භික්ෂුවට නැවතත් අසන්නට ලැබුණේ විශ්‍රාම ශාලාවේ වන්දනාකරුවන්ගේ ගාලගෝට්ටියකි.. ඒ කුමක් අරභයාදැයි දැකගැනීමට භික්ෂුව කාමරයෙන් එළියට පැමිණ පහළ මාලය

දෙස බලා සිටියේය. ශාලාව බොහෝ වන්දනාකරුවන්ගෙන් පිරී ගොසිනි. එක් එක් කණ්ඩායම්වල වන්දනාකරුවෝ තම ගමන්මලු වෙනත් අය සොරාගනිතැයි බියෙන් එයටම තුරුලු වී බිත්ති මුලුවලද අයින්වලද මැදද බිම වාඩි වී සිටියෝය. ඒ සියලු දෙනා තමා අයත් නඩය කුමක්දැයි දැක්වෙන නාම පුවරු සහිත කරපටි ඉණපටි, හෝ තොප්පි පැලඳ සිටියෝය. විවිධ කණ්ඩායම්වලින් තම කණ්ඩායම වෙන් කර අඳුනාගැනීම සඳහා නඩේ ගුරාලා විසින් මෙසේ හඳුනාගැනීමේ ලාංඡන පැලඳවීම සිරිතක් විය හැකි බව හික්ෂුව සිතුවේය. මේ ගාලගෝට්ටිය සිදු වන්නේ එසේ හඳුනාගැනීම සඳහා කහපාට කරපටි පැලඳගත් පිරිසක් අතර බව හික්ෂුව දුටුවේය.

"අපේ නඩේ ගුරා හදිසියෙ මැරිච්ච එක ඇත්ත. ඒත් මේ වන්දනාව අපි කොහොම හරි කරන්න ඕන. ඔය හැමෝම දැක්ක එතුමා මැරෙන්න මොහොතකට කලින් තමුන්නාන්සෙලාගෙ පාස්පෝර්ට් ටික මා අතට දීල කිව්ව කතාව.. මුදල් පරිහරණය කලේ වර්ණසිංහ මහත්තයා බව ඇත්ත. ඒත් මේ වැඩේ එතුමා මට හාර කළ බව ඔය අය ඇහින් දැක්කා..."

"ඒක සම්පූර්ණ වැරදි කතාවක්. ඒ ආසන්න අවස්ථාවෙ වික්‍රම මහත්තයෝ, මහත්තය ළඟ හිටපු හින්ද පාස්පෝර්ට් ටික මහත්තයා අතට දුන්න එක ඇත්ත. රහසින් මොන මොනවද කුටු කුටු ගාපු එකත් ඇත්ත... ඒත් අපේ නඩේ හාර ගන්න මහත්තයාට පත්ගාත්තු කරපු බවක් අපි දන්නෑ. කවුරු නඩේ ගුරා වුණත් කමක් නෑ. අපි මේ ගමන ආවෙ ඉතා අමාරුවෙන්. අපේ දරුවො වියදම් කරල අපිව එව්වෙ. අපට අපේ අරමුණ ඉෂ්ට කරගන්න විදියක් හදල දෙන්න. එච්චරයි.." එක් තලතුනා පුද්ගලයෙක් තරමක් උස්හඬින් කීවේය.

"ඔව්. අපේ දරුවො රටට ණය වෙලා අපිව මේ වන්දනාව එව්වෙ...." කෙනෙක් කීවෝය.

"අපිත් තියෙනවට ආව නෙමෙයි" තවත් අයෙක් කීවෝය. තලතුනා පුද්ගලයාගේ කතාව සමහරුන් අනුමත කරන බවක් පෙනුණත් මුදල් පරිහරණය කළ වර්ණසිංහ මහතා තරමක් උස් හඬින් කතා කලේය.

"මෙයා කොහොමද මේකට සුදුස්සෙක් වෙන්නෙ? මමයි මේ ඔක්කොම සංවිධානය කළේ. මා අතයි මුදල් තියෙන්නෙ. නවාතැන් ගන්න තියෙන තැන්, බස් රථ... මේ ඔක්කොම ගැන දන්නෙ මම. අන්තිම මොහොතෙ මා ළඟ නොසිටි නිසා මෙයා අතට පාස්පෝර්ට් ටික දුන්න එක ඇත්ත.. මිස්ට වික්‍රම, තමුසෙ මේක අවුල් නොකර ඔය පාස්පෝර්ට් ටික මා අතට දීල මම කියන විදියට මේ ගමනෙ ඉතිරි ටික කරගන්න උදව් වෙනවා.."

"මිස්ට වර්ණසිංහ, මමයි මේ හැමතැනකදිම මේ වන්දනාකරුවන්ට ඒ ඒ ස්ථාන විස්තර කරල දුන්නෙ. එදා ඉඳන් ඒ පළපුරුද්ද තමුන්ට නෑ කියල හොඳටම දන්නවා. මමයි ඒ ස්ථානවල තොරතුරු නිවැරදිව දන්නෙ. මමයි යන්න ඕන තැන් දන්නෙ... ඔබේ යුතුකම මේක අවුල් නොකර මට සහයෝගය දෙන එක."

"හරි. වාද ඕන නෑ. අපි ඔය දෙන්නම අපේ නඩේ ගුරාලා විදියට පිළිගන්නම්. කරුණාකරලා ඔය දෙන්නා සමගියෙන් අපව වන්දවන්න ඉතිරි ස්ථාන ටිකත්" තවත් මැදිවියේ ගැහැනියක කිව් කතාව බොහෝ පිරිසක් පිළිගත් බවක් පෙන්වන බව හික්ෂුව අනුමාන කලේය. එහෙත් වර්ණසිංහගේ හෝ වික්‍රමගේ මූණුවල එතරම් ප්‍රසාදයක් නොමැති බව හික්ෂුව දුටුවේය.

"අපි කැමතියි වර්ණසිංහ මහත්තයාගේ නායකත්වයෙන් මේ ගමන යන්න" කෙනෙක් කීවෝය.

"නෑ. අපි කැමතියි වික්‍රම මහත්තයාගේ නායකත්වයෙන් මේ ගමන යන්න" තවෙකෙක් කීවෝය. මේ ගාලගෝට්ටිය අනිත් නඩවලට බාධාවක් වූයෙන් විශ්‍රාම ශාලාව හාරකරු පැමිණ ඔවුන්ට අවවාද කලේය..

"මෙතන ඉන්නෙ ඔය නඩේ විතරක් නෙමෙයි.. මෙතන එක එක තැන් වන්දනා කරගන්න ආපු තවත් නඩ ඉන්නවා..... ඒගොල්ලන්ට කරදරයක් නොවන විදියට ඔයගොල්ලන්ගෙ ප්‍රශ්න විසඳගන්න. කරුණාකරල මෙතන කෑගහන්නෙපා" විශ්‍රාම ශාලාවේ පාලකයාගේ හඬ තරමක් රෞද්‍රය.

ඔවුහු තමතමන්ට හිතපක්ෂපාතී උදවිය සමග වෙන වෙනම රහස් සාකච්ඡා පවත්වන්නට වූහ.. වර්ණසිංහ මහතාත් වික්‍රම මහතාත් නඩය දෙකට බෙදාගෙන හෝ තම ආධිපත්‍යය යටතේ වන්දනා ගමන යැමට ඇති ආශාවෙන් මෙන් තමන්ට පක්ෂව එන පිරිස කවුරුන්දැයි බලමින් උන්නෝය.. රහස් සාකච්ඡාවලින් පසුව වික්‍රම මහතා ළඟට නඩයේ කොටසක් ගියෝය. වර්ණසිංහ මහතා ළඟට කොටසක් ගියෝය. තවත් සමහරු තීරණයක් නොමැතිව සාලාවේ මැදට වී සිටියෝය. නැවතත් ගාලගෝට්ටිය උත්සන්න වූයේය. මේ අතර වෙනත් නඩවල ගුරාලා පැමිණ මේ කණ්ඩායමට නායකත්වය දෙන්නට ඉදිරිපත් වූවෝය.. ඊටද සමහරු කැමති බව ඇඟවූවෝය.. සමහරු දැඩිව විරුද්ධ වූවෝය.. නැවතත් විශ්‍රාම ශාලාවේ පාලකයා පැමිණ තර්ජනය කළේය..

"දැන් මට සිද්ධ වෙනවා ඔයගොල්ලන්ව දොට්ට දාන්න මෙතනින්. අනිත් අයට මහ කරදරයක්නේ මේක... ඔන්න නොකිව්වයි කියන්නෙපා.. පොලිසියට කතා කරල ඔය අයව දොට්ට දාන්න සිද්ධ වේවි මෙහෙම ගියොත්."

පිරිස වහා විසිර ගියෝය... එහෙත් ඔවුන් හෙට දවසේ කුමක් කරගනිත්දැයි භික්ෂුවට නිනව්වක් නැත්තේය. භික්ෂුව නැවතත් සයනය මත වැතිරුණේය..

"ඔබ වහන්සේට වෙහෙසද?"

"නෑ. මට වෙහෙසක් නෑ.... ඔබ වහන්සේ කවුද?"

"මම පුරාණ හිමියෝ."

"සමාවෙන්න මෙහෙම අහනවට. ඇයි ඔබ වහන්සේ ධර්ම සංගායනාවට සහභාගි නොවන්න තීරණය කළේ....? ඒක සංඝ සාමග්‍රියට කැළලක් නෙමෙයිද?"

පුරාණ හිමියන්ගේ ගැඹුරු ඉරියව් සහිත මුහුණ දෙස භික්ෂුව පිළිතුරු අපේක්ෂාවෙන් බලා සිටියේය.... එහෙත් උන් වහන්සේ කතා කරනවා වෙනුවට තම හිස අතගා දකුණු අතට අරගත් කුඩා කරඬුවක් භික්ෂුවට පෙන්නුවේය.

"මේ කරඬුව දෙස බලන්න.." භික්ෂුව ඒ කුඩා කරඬුව දෙස ඇසිපිය නොහෙළා බලා සිටියේය. එය තමා දළදා මාලිගාවේදී දැක තිබූ දන්ත ධාතුවට සෑම අතින්ම සමාන, එතරමම කුඩා වූවකි. එය කැටයම් රහිත දන්ත ධාතුවේ සරල හැඩය පමණක් ගත්තකි. එය ඉතා දීප්තියකින් බැබළෙන ආකාරය භික්ෂුව දුටුවේය... එයින් නික්මුණු රශ්මි කදම්බයක් තම දෑස් කුහරයෙන් ඇතුළු වී මොළය දක්වා ගමන් කරන බවක් භික්ෂුවට දැනුණේය.

"මම නික්ම යා යුතුයි. ඔබ සැතපෙන්න" පුරාණ රහතන් වහන්සේ නික්මෙන්නට සූදානම් වන මොහොතේ භික්ෂුව උන් වහන්සේගේ දෙපා මත නළල තබා වැන්දේය.

"මට කොණ්ඩඤ්ඤ හාමුදුරුවෝ දුන් කරඬුවෙ වගේ ඔය කරඬුවෙත් කැටයම් ලියලනවද? හාමුදුරුවනේ...." භික්ෂුව ගෞරවනීය ලෙස ඇසුවේය..

"මෙය දැනට මා සන්තකයේ පමණයි තිබෙන්නේ.. එය කවුරුන්වත් සොයමින් සිටින කරඬුවක් නෙමෙයි.. ඒකට ඓතිහාසික වැදගත්කමකුත් නෑ... ඒක නිසා ඒක කාගෙවත් අතින් අතට යන්නෙ නෑ. ඒක නිසා ඒකට හානියක් වෙන්න විදියකුත් නෑ."

"ඔය කරඬුව ඔබ වහන්සේ කාටවත් දෙන්න කල්පනාවක් නැතිද?"

"එහි ඇතුළත දකින්න කැමති කෙනෙකුට මේ කරඬුව ලැබේවි." එම පිළිතුරත් සමග පුරාණ මහරහතන් වහන්සේ භික්ෂුවගේ නෙත් මානයෙන් ඈත් වී ගියෝය. භික්ෂුව නැවතත් කරඬුව සුරක්ෂිතව ඇතිදැයි මල්ලට අත දමා බැලුවේය. එය සුරැකිව තිබෙන බව දුටු භික්ෂුව එය දෑතින් ගෙන අතගා බැලුවේය. භික්ෂුවට වුවමනා වූයේ එය පුරාණ රහතන් වහන්සේ විසින් පෙන්වන ලද කරඬුවට යම් සමානකමක් දරන්නේදැයි දැනගැනීමටය. එහෙත් එය පුරාණ හිමියන් පෙන්වූ කරඬුවට වඩා සියලු අතින් විශාල එකකි.. භික්ෂුව කරඬුව තෙල් කඩදාසියක ඔතා නැවත මල්ලේ ඔබා එය හිස ඉද්දරින් තබාගෙන සැතපෙන්නට උත්සාහ කළේය....

පසුදා උදෑසනම භික්ෂුව ගුප්ත බලාපොරොත්තුවෙන් විශ්‍රාමශාලාව ඉදිරිපිට බලා සිටියේය.. පෙරදා රාත්‍රියේ කෝලාහල කරගත්, කහපාට පටී පැලඳගත් නඩය තම ගැටලුව විසඳාගෙන නොතිබුණේය. එම නඩයේ එක් පිරිසක් වර්ණසිංහ මහතාගේ පිටුපස සිටියෝය. තවත් පිරිසක් වික්‍රම මහතාගේ පිටුපස සිටියෝය. තවත් සමහරු ගත හැකි තීරණයක් නැතිව සිටියෝය. තවත් පිරිසක් හඳුනාගැනීමෙ කහපාට පටී ගලවා දමා වෙනත් නඩවලට එකතු වෙමින් සිටියෝය. වික්‍රම මහතාට එකතු වී සිටි පිරිස තම කරපටිය වෙනස් කිරීමට අකැමැති වූවෝය. වර්ණසිංහ මහතාගේ නඩයද එම ලාංජනය සහිත කහපටිය වෙනස් කිරීමට අකැමැති වූවෝය.. ඔවුහු ඊළඟට හඳුනාගැනීමේ පටියේ අයිතිය සඳහා අරගල කළෝය...

මේ අතර ගුප්ත පැමිණියේය. ඔහු තරමක් පිරිසිදු ඇඳුමකින් සැරසී සිටියේය. අශ්වයා නාවා පිරිසිදු කර තිබීම නිසා උගේ පස්සා පැත්තේ තැනින් තැන තැවරී තිබූ වසුරු භික්ෂුව මෙදින නොදුටුවේය. උගේ වලිගයේ සුදු ලෝම ඉතා පිළිවෙළකට පීරා තිබෙන බවක් භික්ෂුව දුටුවේය. ගුප්තගේ සිනාව නිතරම තමාට කරන සරදම් සිනාවක් ලෙස භික්ෂුව සිතුවේය.

"උඹ ටිකක් පමා වෙච්ච නිසා අර විකාරකාරයින්ගෙ කෝලහලය බල-බලා හිටියා... උන්ගෙ විකාර බල-බලා ඉන්න වෙලාවක් නෑ.. අපි යමු. අපට දැන් යන්න තියෙන්නෙ ජයශ්‍රී මහා බෝධිය ළඟට. ඒකට කරත්තෙ ඕන නෑ. උඹත් වරෙන් මා එක්ක පයින් යන්න."

භික්ෂුව පෙරමුණ ගත්තේය. ගුප්ත ගමන් මල්ල ඉල්ලද්දී භික්ෂුව එය ප්‍රතික්ෂේප කළෙත් ගුප්තට තිබුණේ භික්ෂුව පිටුපසින් ගමන් කිරීම පමණි. ගුප්ත කරත්තය නතර කර දමා, භික්ෂුව පිටුපසින් ගමන් කළේය.

"උඹ ඉස්සර වෙයං... උඹනේ මේවයෙ පාරවල් හොඳට දන්නෙ."

ගුප්ත පෙරමුණ ගත්තේය. ඔවුන් ජයසිරිමහා බෝධියට යද්දී එහි සලපතළ මළුවේ දණ්ඩ නමස්කාර කරන ජපන් ජාතිකයන් රාශියකුත් ඉන්දියානුවන් කීප දෙනකුත් භික්ෂුවට

දකින්නට ලැබුණේය.. උක්කුටිකයෙන් ඉඳ හෝ පසඟ පිහිටුවා වැඳීමකට වඩා එම වන්දනාවේ විශේෂත්වයක් ඇතැයි භික්ෂුවට සිතුණේය.. තම ශ්‍රද්ධාව ප්‍රකාශ කරන්නට එයම හොඳම වැඳුම බව කල්පනා කළ භික්ෂුවද සලපතළ මළුවේ දිගා වී දණ්ඩ නමස්කාරයෙන් ජයසිරිමහා බෝධිය වන්දනා කළේය.... භික්ෂුව වර්තමාන බෝධි වෘක්ෂය අසබඩ පිහිටි වජ්‍රාසනය වෙත ගියේය. වජ්‍රාසනය පාමුල ජටා දැරූ පුද්ගලයෙක් සිටියේය. ඔහු එම වජ්‍රාසනයේ කැටයම්වැලක් අතගාමින් සිටියේය. ඔහු භික්ෂුව දැක යම් සන්තෝෂයකින් සිනාසුණේය.

"ඔබ වහන්සේ මුණගැසීමේ බලාපොරොත්තුවෙනුයි මා සිටියේ."

"මොකද්ද දන්නෑ වුවමනාව?" මොහු ගල්වඩුවෙකැයි භික්ෂුව සිතුවේය.

"මම කපිල. ඔබ වහන්සේගේ භාරයට පත්ව ඇති කරඬුවේ පාදම දෙස බලන්න, මේ වජ්‍රාසනයේ පාදමේ කැටයම්වලට සමානද කියා." භික්ෂුව වහා කරඬුව ගෙන බැලුවේය.. භික්ෂුවට එම කැටයම් හා තම කරඬුවේ පාදමේ ඇති ලියවැල් කැටයම් අතර යම් සමානකමක් පෙනුණේය.

"මා අසා ඇති පරිදි ඔබ සාංඛ්‍ය දර්ශනයේ අයිතිකාරයා නේද? මොකද මෙතන කරන්නෙ? මේ කැටයම්වල යම් සමානකමක් ඇති.."

"ඔව්. මේ කැටයම්වලට මගෙත් සම්බන්ධයක් තිබෙනවා. ඇත්තම කිව්වොත් ඔබ වහන්සේගේ අතේ ඇති කරඬුව මටත් අයිති එකක්. මා ඒක ඉල්ලන්න නෙමෙයි පැමිණියේ. ඒත් ඔබ වහන්සේ ඒ වග දැන සිටිය යුතු නිසා මතක් කරන්නයි මා මෙහි රැඳී සිටියේ."

භික්ෂුව කපිල ඍෂිවරයා දෙස බලා සිටියා විනා කිසිවක් නොකීවේය...

'දෙයියනේ! මේ විදියට මෙකට කීදෙනෙක් අයිතිවාසිකම් කියාවිද?' භික්ෂුව යම් බියකින් කරඬුව මල්ලේ තැන්පත් කරගත්තේය.

"දෙවියනි! මාගේ මේ වන්දනාව මෙතරම් වෙහෙසකර ගමනක් වූයේ කෙසේද? මට උදව් කරන්න දෙවියනි.." අහස දෙස බලාගෙන තොල්මැතිරූ භික්ෂුව තම සගයා වූ ගුප්ත අත ඇති වතුර බෝතලය ඉල්ලාගෙන එයින් වැඩි කොටසක් එක හුස්මට පානය කළේය.....

භික්ෂුව තම වෙහෙසකර බව නොඅඟවා බුදුරදුන් සත්සති ගත කළ ස්ථාන වන්දනාවට පෙර ගුප්ත සමග බුද්ධගයා විහාරය ඇතුළට ගියේය. භික්ෂුව මල් හඳුන්කූරු ඉටිපහන් කීපයක් දෝතින් රැගෙන එහි පූජාසනය මත මල් තැන්පත් කොට පසඟ පිහිටුවා වැන්දේය. ප්‍රධාන බුද්ධ ප්‍රතිමාව දෙස දෑස් නොපියා භික්ෂුව බලා සිටියේය. තමා ඉබේම බුද්ධානුස්සති භාවනාව වඩමින් සිටින බව භික්ෂුවට මොහොතකින් අවබෝධ වූයේය.. බුද්ධානුස්සතිය වඩාත් නිවැරදිව වැඩීමේ අරමුණින් නවඅරහාදි බුදුගුණ අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සිහි කළේය. ඒ සමගම භික්ෂුවට මහත් කලබලයක හඬ පසුබිමින් ඇසුණේය. තමා වෙනත් කාලයක වෙනත් පරිසරයක නොව වර්තමානයේම සිටිමින් අත්දකින මේ කලබලය කුමක්දැයි තේරුම්ගැනීමට වෙහෙස වුණේය.

"අපට මේ පූජාසනය අයිතියි. මේක මත ශුද්ධ ජලය පූජා කිරීමේ අයිතිය හින්දූන්ට අවශ්‍යයි" ඔවුහු මහත් උද්වේගයකින් කියනු භික්ෂුවට ඇසුණේය.

"මේ තියෙන්නෙ සිව ලිංගයේ කොටසක්. ඒක අපට අයිතියි. අපට මෙහි වන්දනා කරන්න ඉඩ දිය යුතුයි."

"ඒක අමූලික බොරුවක්. මේක සිව ලිංගයේ කොටසක් නෙමෙයි. මේක බුද්ධ ප්‍රතිමාවක පාදමක්.." මහාවිහාරයේ විහාරාධිපති හිමියෝ දේශපාලන නායකයාට පිළිවදන් දුන්නෝය. දේශපාලන නායකයා ඇතුළු කණ්ඩායම බලහත්කාරයෙන් විහාරයට ඇතුළු වන්නට උත්සාහ දරද්දී පොලිසිය එය මැඩ පැවැත්වූයේ විධිමත් පරීක්ෂණයකින් පසු ඒ පිළිබඳ තීන්දුවක් ගත හැකි බව කියමින්ය. භික්ෂුව මේ සිද්ධියෙන් තරමක් තැති ගත්තේය.

බුද්ධානුස්සති භාවනාව අතරමග නවතා දැමූ භික්ෂුව විහාරයෙන් දොට්ට බැස්සේය. තම හිසට වැටෙන උදා හිරු රශ්මිය සිවුරු කොනින් වැළකාලීමට භික්ෂුව උත්සාහ ගත්තේය. බෝධි වෘක්ෂය අබියසට ගිය භික්ෂුව බෝධියට මුහුණලා එරමිණියා ගොතාගෙන සලපතළ මළුවේ ඉඳගත්තේය. භික්ෂුව සෑහෙන වේලාවක් ඇසිපිය නොහෙළා බෝධිවෘක්ෂය දෙස බලා සිටියේය. ඇස් වෙහෙසවීමෙන් පසු භික්ෂුව ගුප්ත දෙස බැලුවේය. ගුප්තගේ මුහුණේ කලින් නොදුටු දීප්තියක් තිබෙන අයුරු භික්ෂුව එක්වරම දුටුවේය. මෙතෙක් භික්ෂුවට අප්‍රියව සිටි ගුප්ත තුළින් දුටු ප්‍රසන්න බව නිසාම භික්ෂුව ගුප්තගේ දෑස් දෙස ප්‍රේමභාවෙන් බලා සිටියේය. තම සිත යම් නිමිත්තක දැවටී සිත සමාධිගත වෙමින් තිබෙන බවක් හැඟී ගියේය. ඒ සමාධිගත වූ සිත ඒ නිමිත්තේ විපරිණාමය මෙනෙහි කරද්දී ඇස් කෙවෙනි තුළ පහන් ආලෝකයක් දැල්වෙමින් තිබුණේය..

ගුප්තගේ රූපය ක්‍රමයෙන් ළදරුවකුගේ රූපයක් බවට පත් වූයේය. ඒ ළදරුවා ඉතා කුඩා රෙදි කඩක තබා තිබුණේය. දරුවා උඩු අතට හැරී සිටි අතර, ඔහු අහස දෙස බලාගෙන සිටියේය. දරුවා දෑත් ගුළිකරගෙන සිටියේය.. ගුළිකරගත් දෑතේ ඇඟිලි ක්‍රමයෙන් දිගහැරුණේය.. එම අත්ල මත වුල්ලපත්තක හිමියෝ සුදුරෙදි කඩක් ගෙනැවිත් තැබුවෝය.. සුදුරෙදිකඩ අත්ල මත දිය වී, ඒ අත්ල සුදුරෙදි කඩේ පැහැයම ගත්තේය.. දරුවාගේ කට ඇරුණේය... දරුවාගේ නාසය ඇරුණේය... දරුවාගේ ඇස් හැරුණේය... දරුවාගේ කන් ඇරුණේය... දරුවාගේ සුදෝසුදු අත් අහස දෙසට දිගු වුණේය... හිරු එළිය වැටුණේය.. දෙඅත් තෙත් වූවේය. සුළඟ හැමුවේය. දූවිලි ගසාගෙන ආවේය. සුදෝසුදු දෑත් දූර්වර්ණ වන්නට පටන්ගත්තේය. දරුවා අතට අසු වන දේ අතින් ගත්තේය; කටේ ඔබාගත්තේය. දරුවා පෙරළුණේය. දරුවා නැගිට්ටේය. දරුවා ඇවිද්දේය.. තව තවත් සුළඟ හැමුවේය. තව තවත් දූවිලි ගසාගෙන ආවේය. තව තවත් දෑත් දහඩියෙන් තෙත් වූවේය.. තව තවත් ඒ තෙත මත දූවිලි වාඩිලාගත්තේය.. මුළු ගේ පුරා දරුවා ඇවිදිමින් අතට අසු වන දේ කටේ ඔබාගත්තේය. අනතුරුව දරුවා ගෙයින් පිටතට ගියේය. ගෙයින් පිට ඇති

දෑ කටේ ඔබාගත්තේය. දරුවා මගට බැස්සේය. මග දිගේ ඉදිරියට ගියේය. ඔහු ටිකෙන් ටික විශාල වූවේය.. මගදිගේදීද ඔහු තමාට හමු වන බොහෝ දේ කටේ ඔබාගත්තේය. ඔහුගේ කුස ක්‍රමයෙන් පිරෙන්නට පටන්ගත්තෝය. පාර දිගේ ඇවිදිමින් මුණගැසෙන මිනිසුන්ගෙන් ඔහු කැමති මිනිසුන් ගිලගත්තේය. යානවාහන ගොඩනැගිලි ආදියෙන් ඔහු කැමති දේ ගිලගත්තේය. ගිලගැනීමෙන් පිරීගිය කුසක් සහිත ඔහු එක්තැනකදි ආපසු හැරුණේය. ඔහු සමග තවත් පුද්ගලයෙක් ඒ සමාන රූපයෙන්ම පෙනී සිටියේය. දෙදෙනාගේම කුසවල්, කටවල්, ඇස්, නාස්, කන් සමානය. දෙදෙනම ආපසු එන්නට පටන්ගත්තෝය. එක් අයෙක් ගිලගත් දේවල් නැවත වමාරමින් ආවේය. අනෙක් පුද්ගලයා ඒ කුසපිටින්ම පැමිණියේය. දෙදෙනම භික්ෂුව ඉදිරියේ නතර වූවෝය. කුස හිස් කරගත් තැනැත්තා හිනා වුණේය. පිරුණු කුසින් යුතු තැනැත්තා උදරයේ බරින් මිරිකුණේය... දෙදෙනම රෙදි කඩ මත වැතිරුණෝය. උදරයේ බර ඇති තැනැත්තා අනෙකාගේ සිනාමුසු මුහුණ දැක වෙව්ලුවේය. ඔහුගේ බඩ තවතවත් පිම්බුණේය. ඔහු ඇඬුවේය; නත් දෙඩෙව්වේය; ළතෝනි දුන්නේය; පොළොව බදාගත්තේය; මියගියේය. උදරය හිස් තැනැත්තා දෑත් පපුව මත තබාගත්තේය. නිල් අහස දෙස බැලුවේය. හුස්ම වාතලයට මුසු කළේය.

"ගුප්ත!" භික්ෂුව කලබලයෙන් කෑගැසුවේය.

"ඇයි හාමුදුරුවනේ?" පිළිවදන් දුන් ගුප්ත තම කිහිල්ලේ තිබූ වතුර බෝතලය භික්ෂුව දෙසට පෑවේය.

භික්ෂුව වතුර බෝතලය අතට ගනිමින් ගුප්ත හඳුනාගැනීමට දෑස් මදක් විශාල කළේය.

"උඹ මොහොතකට කලින් කොහේද ගියේ? උඹට මොකද වුණේ? උඹ අහස දිහා බලාගෙන හුස්ම පිට කළා නේද?"

"ඔබ වහන්සේ පොළොව බදාගෙන හුස්ම පිට කළා නේද?" ගුප්ත ඇසූ දෙයින් භික්ෂුව තුෂ්ණිම්භූත වූවේය..

"මට ටිකක් කලන්තෙ වගේ. උඹ ටිකක් මා ගාවින්ම හිටපන්

ගුප්ත. මට එක එක විකාර දේවල් පේනවා. මේ දේශගුණේ මට ඔරොත්තු දෙන්නෙ නැද්ද කොහෙද..."

"අපි කරත්තෙට යමු හාමුදුරුවනේ."

"තව ටිකකින් යමු..." භික්ෂුව වතුර උගුරක් පානය කරමින් කීවේය. භික්ෂුව නැවතත් ජයසිරිමහා බෝධි වෘක්ෂය දෙස බලාගෙන බුදුගුණ සිහිපත් කළේය.....

භික්ෂුව මදක් සිතට විවේකය අපේක්ෂා කරමින් බෝධිවෘක්ෂය දෙස බලා සිටිද්දී ඉතා උස් හඬින් සාධුකාර දෙමින් බෝධීන් වහන්සේ දෙසට එන මහා පෙරහරක් දුටුවේය. විශ්‍රාම ශාලාවේ සිටි සියලු නඩ එකට එකතු වී මේ පෙරහරේ ආවෝය. එහෙත් ඒ ඒ නඩ වෙන් කර හඳුනාගන්නා ලාංඡන සියලු වන්දනාකරුවෝ පැලඳ සිටියෝය. සමහරු සාධුකාර දුන්නෝය. සමහරු පිරිත් කීවෝය. සමහරු කවි කීවෝය. සමහරු ගාථා කීවෝය. සමහරුන්ගේ අතේ මල්ය. සමහරුන්ගේ අතේ තෙල්ය. සමහරුන්ගේ අතේ පැන්ය. සමහරුන්ගේ අතේ කොඩිය. සමහරුන්ගේ අතේ පොත්ය. සමහරුන්ගේ අතේ පිරිකරය. මේ සියලු දෙනා බෝධිය පාමුලදී වෙන් වෙන්ව තමතමන්ගේ නඩේගුරාලා වට කරගත්තෝය. වික්‍රම මහතාත් වර්ණසිංහ මහතාත් අවසන් වතාවට ලාංඡනපටිය අරභයා ඇති කරගත් හබය සමථයකට පත් වී තිබුණේය. කහපාට පටිය වෙනස් නොවී තිබූ අතර, වර්ණසිංහ මහතාගේ කණ්ඩායමේ ලාංඡනපටියට නිල්වර්ණයෙන් ලොකු තිලකයක් තබා තිබුණේය. වික්‍රම මහතාගේ පටියට දුඹුරුපාට ලොකු තිලකයක් තබා තිබුණේය. ඒ දෙදෙනාගෙන් කැඩී වෙනත් නඩවලට එකතු වී සිටි පිරිස් කිසිම තිලකයක් නොතබාගෙන පැරණි පටියෙන්ම සිටියෝය.

නඩේගුරුන් විසින් තම කණ්ඩායම් පෙරහැරෙන් වෙන් කරගෙන ජයසිරිමහා බෝධිමළුවේ වෙන වෙනම තැන්තැන්වල වෙන වෙනම සිට වෙන වෙනම වන්දනා කෙරුණේය. නඩේගුරුන් විසින් කියනු ලබන ගාථා කවි බැතිමත්හු ශබ්ද නගා කීවෝය.. ඒ සියලු කණ්ඩායම්වල හඬවල් එකට මුසු

වී මහා ඝෝෂාවක් ලෙස බාහිරට ඇසෙන්ට පටන්ගත්තේය.. ඒ ඝෝෂාව අවසානයේ ඔවුහු බෝමළුවෙන් සිහිවටන එකතු කළෝය.. මළුවේ බෝකොළ නොමැති වූයෙන් සමහරු කාටත් නොපෙනෙන සේ බෝඅතුවලින් කොළ කඩාගෙන ගමන් මල්ලේ ඔබාගත්තෝය. ඒ සමහරු මළුවෙන් වැලි ගෙන ගමන් මල්ලේ ඔබාගත්තෝය. බෝ කොළ නොමැතිකමින් දුකට පත් වූ ශ්‍රද්ධාවන්තයන් ඇමතූ සමහර නඩේගුරෝ එම බෝ කොළ විකිණීමට ඇති කඩ පෙන්නුවෝය. පිරිස පොරකමින් එම කඩ වට කරගෙන පොලිතින් ආවරණ යොදන ලද බෝකොළ මිල දී ගත්තෝය.. පිරිස විසිරී යන තෙක් භික්ෂුව නිසොල්මන්ව මේ දෙස බලා සිටියේය. ගුප්ත පමණක් බෝධියෙන් පිටත ඈතින් පෙනෙන කඩපෙළ දෙස බලා සිටියේය.

ඇසතු බෝ වෘක්ෂයේ අතුපතර දැවටීගත් සිසිල් වාතය තම ගත දැවටෙද්දී භික්ෂුව සැහැල්ලු සිතක් උපදවාගත්තේය. ඒ සමගම භික්ෂුව දුටුවේ තණ මිටියක් රැගෙන බෝ මැඩ වෙතට එන තවුසකුගේ දර්ශනයයි. ඒ නම් සිද්ධාර්ථයන් වහන්සේම බව භික්ෂුව ප්‍රත්‍යක්ෂ කළේ ඔහු අත තිබෙන කුසතණ මිටිය නිසාය. තමා කියවා තිබූ බෝසත් චරිත කතාවල විස්තර කරන ලද බෝසත් රූපයට කෙසේවත් සමීප නොවන රූපයකින් යුත් මේ පුරුෂයා බෝසතාණන් වහන්සේයැයි විශ්වාස කරන්නේ කෙසේදැයි භික්ෂුව නැවතත් විපිළිසර වූවේය. එහෙත් ඔහු අත තිබෙන්නේ කුසතණ නිසා භික්ෂුව තම සැකය මැඩගත්තේය. බෝසතාණන් වහන්සේ එම කුසතණ බිම එළද්දී තව පිරිසක් බෝසතාණන් වහන්සේ වට කරගත්තෝය. ඔවුහු තමන් ගෙන ආ කුසතණ ස්වල්පය බැගින් බෝසතාණන් වහන්සේට පිළිගැන්නුවෝය. මේ පිරිස අතර කොණ්ඩඤ්ඤ ආදි පස්වග තවුසෝද ආලාරකාලාම හා උද්දකරාමපුත්තද, කපිල ඍෂිවරයාද සිටියෝය. බෝසතාණන් වහන්සේ එම කුසතණ පිළිගෙන බෝ මැඩ කරා එළඹියෝය. ඉතා පහසු ඉරියව්වකින් බෝමැඩ මුල ඉඳගත් සිද්ධාර්ථ තවුසාණෝ සියලු කුසතණ එක ගොඩකට දමා එම තණ සියල්ල එකට මිශ්‍ර කළෝය; මිශ්‍ර කරමින්, එම තණ අතර තිබූ දිරා ගිය, ඉදී ගිය, මේරූ කොළ සහ ඊතණ නොවන වෙනත් තණ වර්ග ඉවත් කළෝය. අවසානයේ බෝ මැඩ එළාගන්නට ඉතිරි වූයේ තණ ස්වල්පයකි. එයින් තැනූ තණ පලස ඉතා ලා කොළ පාටක් ගත්තේය. සිද්ධාර්ථයන් වහන්සේ එම තණ පලස මත එරමිණියා ගොතාගෙන තැන්පත් වුණෝය. සිද්ධාර්ථයන් වහන්සේගේ දෑස් ක්‍රමයෙන් අඩවන් වෙද්දී ඉවත දැමූ තණපත්‍ර ලබාගැනීම සඳහා මහා පිරිසක් පැමිණියෝය. එම පිරිස පොරකමින් දබර කරමින් තණ පත්‍ර අයිති කරගත්තෝය. ඔවුන් එතැනින් ඉවත් වී යද්දී එරමිණියා ගොතාගෙන භාවනානුයෝගීව සිටින බෝසතාණන් වහන්සේගේ ඍජුකාය භික්ෂුවට දකින්නට ලැබුණේය. පටිච්චසමුප්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සිහි කරන බෝසතුන්ගේ ප්‍රසන්න රූපකාය වට කරගෙන නැගෙන රශ්මිමාලාවක් භික්ෂුව ඊළඟට දුටුවේය.. එය ජීවිතයේ සියලු කෙලෙස් මරුවන් පරදා ලැබූ විජයග්‍රහණයේ සංකේතයක් බව භික්ෂුව සිතුවේය.

"සාදු... සාදු... සාදු..." යැයි ශබ්ද නැගූ භික්ෂුව දණ්ඩ නමස්කාර කරමින් බෝධි වෘක්ෂය වන්දනා කළේය.

භික්ෂුව එතැනින් නැගී සිටියේ බුදුහිමියන් සත්සති වන්දනා කළ ස්ථාන නැරඹීමේ ශ්‍රද්ධාවන්ත සිතිනි.

බුදු රජාණන් වහන්සේ පස්වන සතිය ගත කළ ස්ථානය වූ අජපාල නුගරුක මුල භික්ෂුව සක්මන් කරද්දී භික්ෂුවගේ කන්පතුල් පිරිමදින මිහිරි ස්ත්‍රී හඬක් ඇසෙන්නට වූයේය. ඒ හඬ පංචසිඛගේ හේරුණ්ඩ වීණාවේ තත් පිරිමදින හඬ තරම් මිහිරියැයි එක්වරම භික්ෂුවට සිතුණේය. භික්ෂුව ඒ හඬට සවන් දී සිටියේය.

"සිද්ධාර්ථයෙනි... දූත් අපට තොප තද වන්නේ ඇයිද? තොප පෙර කුස රජව උපන් කල ප්‍රභාවතීන් තොප හැර පලා ගියදා තොප ඒ සා රාජ්‍යයක් හැර පියා උන් පසුපස්සෙහි එකදා සියයක් යොදුන් දිවූ දවස් සඳහන් නැද්ද? තවද: සත්මසක් මුළුල්ලෙහි දර පැන් ඇද බත් මාළු පිස එම ස්ත්‍රිය නිසා අරක්කැමිකම් කොට තොප ගත් දුක් සඳහන් නැද්ද? තවද: වළන් කද කර තබාගෙන හිණි පාමුල හී මළහොත් වෙස් ගෙන ඇස පෙරළාලා එදා තොප

වැදහොත් ලෙස් මෙදා සඳහන් නැද්ද? තවද: එම ස්ත්‍රිය නිසා වීර්යය වඩන තොප එදා කැසපොට ගොනාගෙන කළල් මැද සිට බඳුන් සේදූ ලෙස් සඳහන් නැද්ද? තවද: එක් කලෙක චුල්ලපදුම ජාතකයෙහි ප්‍රිය වූ කාන්තාවක නිසා රජය හැර ගොස් ඈ පය බිම ගෑ නොදිම්යි කරහිඳුවා ගෙන දුරු මග ගෙවා යන දා ඈ පැන් බොම්යි කී වේලෙහි පැන් නැත්තේ තොපගේ තෙල පුළුල් උරමඬල පළා ලේදිය පොවා ඈ පිපාසා නිවා ඇවිදි ලෙස් මෙදා සඳහන් නැද්ද? තවද: තොප සුහලක්ෂණ ජාතකයෙහි සුහ ලක්ෂණා නම් බිසවුන් කර හිඳුවාගෙන රාජවීථි මධ්‍යයෙහි වන මධ්‍යයෙහි යන්නා සේ කාමයෙන් අන්ධව එදා තොප ගිය සැටි මෙදා සඳහන් නැද්ද? තවද: සංකප්ප ජාතකයෙහි තොප බරණැස් රජුගේ අග මෙහෙසුන් බිසවුන් දැක ලෝභ කොට එකෙණෙහිම පත් සිඳපු පක්ෂියකු සේ ආකාශයෙන් බිම හී එබඳු වූ ධ්‍යාන සුවය හැර උයනට ගොස් සද්දා මුළුල්ලෙහි නොකා නොබී එසමයෙහි තොප කළ ස්ත්‍රී ශෝකයම මෙසමයෙහි දූන් මඳව ගියේද? තවද: පෙර තොප තක්ක ජාතකයෙහි ගඟබඩ පන්සලක් කොට ධ්‍යාන සුවයෙන් වසන කල දියෙන් යන කාන්තාවක දැක ඈ දියෙන් ගොඩ නගා ඈ කෙරේ කළ ලෝභයෙන් ධ්‍යාන සුවය හැර ගොස් ඈ හා සමගින් වැස තොප මෝරු වෙළෙඳාම් කොට එදා ජීවත් වූ සැටි මෙදා දූන් සඳහන් නැද්ද? තවද: පෙර තොප විනීල ජාතකයෙහි ස්වර්ණහංසරාජව ඉපිද පක්ෂීන් කෙරෙහි හීන වූ කපුටු ධේනුවක හා සමග සංවාස කොට විනීල නම් පුතකු ලදින් ඒ කපුටුවා හා කපුටුධේනුව නිසා එකාවනුව ඇවිද එදා ජීවත්ව තොප ගත් දුක් සඳහන් නැද්ද? තවද: පෙර තොප උම්මාදන්ති ජාතකයෙහි රජව නුවර පැදකුණු කොට යන දා උම්මාදන්ති නම් ස්ත්‍රියක දැක ඈ කෙරෙහි කළ ලෝභයෙන් කාමෝන්මාදව ආ පස්සෙහි රජගෙට ගොස් නොයෙක් විලාපයෙන් ඈ මත්තේ නොයෙක් ගී කියා එදා තොප ඇඬූ ලෙස් මෙදා දූන් සඳහන් නැද්ද? පෙර මෙසේ කී එකී එකී ස්ත්‍රියක නිසා දුක් ගත්තා වූ තොප දූන් අප සසියයක් ප්‍රිය කාන්තාවන් දැක තද වන්නේ නොයෙදෙයි. හිමි අපට දූන් කාමාස්වාදය කරව...''

මරඟනන්ගේ ඒ ගතුකීම් සියල්ල භික්ෂුවට ඇසුණේ හේරුණ්ඩ වීණාවේ තත් පිරිමැදිමෙන් නැගෙන අනුරාගි තාලයට ගැයෙන ගීයක් ලෙසය..

භික්ෂුව ඒ හඬ තවත් අසනු රිසින් අහස දෙසට කන් යොමාගෙන සිටියේය. එහෙත් ඒ හඬ ක්‍රමයෙන් මැකී යද්දී.. භික්ෂුව දුටුවේ බුද්ධගයාවට එන ගමනේදී දුටු ගී ගැයූ දැරියගේ නිසල කය ගුප්ත ඔසවාගෙන විත් තම දෙපා මුල තබන ආකාරයයි. ඇය සිහි ලබා නැවත ගී ගයමින් භික්ෂුව වට කරගෙන නටන්නට පටන් ගත්තාය. ගුප්තගේ ලාබාල ඇඹේණිය උණු රොටි ඔනාගෙන ආ ළා කෙසෙල් දල්ල සුළඟේ ගසාගෙන විත් භික්ෂුවගේ මුහුණ මත තැවරුණේය. රොටියේ උණුසුමට පිච්චෙන කෙසෙල් දල්ල නාසයේ තැවරෙද්දී භික්ෂුව දෑස් පියාගෙනම ඒ සුවඳ ආඝ්‍රාණය කළේය. තම ගමන් මල්ලට අත එබූ භික්ෂුව එහි සුරක්ෂිතව තැබූ පැන්සල් කැබැල්ල අතට ගත්තේය.. එය නාසයට අල්ලා බැලූ භික්ෂුවට දැනුණේ චපාති රොටියේ රස්නයෙන් පිච්චෙන එම ළා කෙසෙල් දල්ලේ සුවඳමය.. එම සුවඳ ආග්‍රහණය කරද්දී තම රුධිරය වේගයෙන් මුළු සිරුර පුරා ගමන් කරන බව භික්ෂුව අත්දුටුවේය. තමා යමක් වමාරමින් නැවත අනුභව කරන බවක් භික්ෂුවට දැනුණේය. එහි අපුල ගතියක් නොව, මිහිරි බවක් භික්ෂුව අත්වින්දේය...

''ගන්න මේ කිරි බඳුන දැතට'' ඒ ආමන්ත්‍රණය පුරුෂ හඬකි.

''බීය වන්නෙපා. ගන්න මේ කිරි බඳුන'' ඒ තවත් භික්ෂුවකි.

''ඔබ වහන්සේ කවුද?''

''මම චුල්ලපන්තක.... මම තමා බුදුරදුන් දුන් සුදු රෙදිකඩ පිරිමැද රහත් බව ලැබූ භික්ෂුව.''

''මේ කිරි බඳුන?''

''ඔව්, ඒ දෙස හොඳින් බලන්න.''

''එය ඉතා පිරිසිදු කිරි බඳුනක්.''

''ඔව්, බලා සිටින්න ඒ දෙස.'' භික්ෂුව කිරි බඳුන දෙස බලා සිටිද්දී.... සුළඟේ ගසාගෙන ආ කුණු අංශු ඒ කිරි බඳුන මත

වැටුණේය. ටිකෙන් ටික එම සුදුපාට කිරි බඳුන මඩ පැහැයකට හැරී ගියේය..... චූල්ලපන්තක හිමියන් පෙරහන්කඩයක් ගෙන එම කිරි පෙරුවේය..... කිපවරක් එසේ පෙරා වෙනත් බඳුනකට දැම්මේය.... නැවත එම කිරි බඳුන සුදුපාටින් බබළන්නට වූයේය. නැවතත් සුළඟ හැමුවේය.... නැවත එම කිරි බඳුන කිලිටි වූවේය. චූල්ලපන්තක හිමි නැවතනැවතත් එම කිරි බඳුන පෙරුවේය.. නැවතනැවතත් පිරිසිදු වූයේය. එහෙත් වාතයට නිරාවරණය වෙද්දී... කිරි බඳුන නැවතනැවතත් කිලිටි වීම සිදු වූවේය.

"මෙය හරියන කාරියක් නොවෙයි.... අප මේ කිරි මත දූහුවිලි කුණු නො ඇලෙන ලෙස මේ කිරි මුදවාලිය යුතුයි." චූල්ලපන්තක හිමියෝ නැවතත් කිරි බඳුන පෙරා ඊට මුහුන් යෙදුවේය.. මුහුන් යොදා ටික වේලාවක් එය ආරක්ෂා කළේය..... කිරි බඳුන මිදී ගියේය.... එය තද ඝන ගතියකින් යුක්ත වූයේය. තෙතමනය නැති වී එය වියළී ගියේය. චූල්ලපන්තක හිමියෝ එම ඝන වූ වියළි කිරි වාතයට අභිමුඛ කරගෙන සිටියේය. නැවතත් මහා සුළං හැමුවේය. කුණු අංශු රොඩු ඒ සුළඟේ ගසාගෙන ආවේය. කිරි මත ඒවා වැටුණේය. එහෙත් ඒවා කිරි මත නොරැඳුණේය. ඒවා කිරි සමග මිශ්‍ර නොවුණේය. ඒ දූවිලි රොඩු සුළඟ විසින්ම ඉවතට රැගෙන ගියේය.

"මා රෙදිකඩින් දුටු දේ...... ඔබට කිරි බඳුනින් පෙන්නුවා..... ඔබට එය කළ හැකියි...."

චූල්ලපන්තක හිමියන්ගේ අතුරුදන් වීමෙන් පසු භික්ෂුව තම ගමන් මල්ලේ ඇති කරඬුව නිරුපද්‍රැතව ඇද්දැයි බැලුවේය. එය දීප්තිමත් පැහැයක් ගත්තේය. එහෙත් එහි තවත් කැටයම් ලියවැලක් මෝදු වෙමින් තිබෙන්නේය. ඒ කැටයම් වැල් එකිනෙක මුණගැසෙමින්, එකිනෙක යා වෙමින්, එකිනෙක මාරු වෙමින් මෝස්තර මැවෙන බවක් භික්ෂුවට පෙනෙන්නේය. භික්ෂුව නැවතත් කරඬුව ගමන් මල්ලේ ඔබාගත්තේය..

සත්සති ගත කළ ස්ථාන වන්දනාවෙන් පසුව භික්ෂුවට දැඩි වෙහෙසක් දැනුණේය. එහෙත් ගුප්ත වෙහෙසක් නොපෙන්නුවේය.

"අපි යං බුද්ධඝෝෂ ස්මාරකය නරඹන්න" ගුප්ත යෝජනා කළේය. භික්ෂුව තම චාරිකා සටහනේ බුද්ධඝෝෂ ස්මාරකය ගැන සඳහන්ව ඇද්දැයි සොයා බැලුවේය. එහෙත් එවැන්නක් අසා තිබුණත් එය කොතැනක තිබේදැයි භික්ෂුවට අවබෝධයක් නොතිබූ නිසා භික්ෂුව තම චාරිකා සටහනින් එය ඉවත් කරගෙන තිබුණේය.

"මම පාර දන්නෑ බං. මගේ සිතියමෙත් එතැන ගැන සටහන් වෙලා නෑ." භික්ෂුව මැළි කරද්දී ගුප්ත නැවතත් සිනා සුණේය.

"මට උඹේ හිනාව මහා විකාරයක් ගුප්ත. මට හිතෙන්නෙ උඹ ඔච්චමට හිනා වෙනව කියලයි."

"නෑ හාමුදුරුවනේ, අර පේන්නෙ ඒ ස්මාරකේ තමා." ජයසිරිමහා බෝධියට තුදුරින් ඇති ස්මාරකය ගුප්ත හඳුන්වා දීමෙන් පසු භික්ෂුවට ලජ්ජාවක් ඇති වුණේය. එහෙත් භික්ෂුව එවැන්නක් නොපෙන්වා ගුප්ත පිටුපසින් එම ස්මාරකය තෙක් ගමන් කළේය.

කුඩා ස්තූප කීපයකින් වට වූ එම ප්‍රධාන ස්තූපය බුද්ධඝෝෂ හිමියන්ගේ භස්මාවශේෂ තැන්පත් කොට තනා ඇති බව ගුප්ත භික්ෂුවට කියා දුන්නේය. අඩි තිහක් තරම් උස වූ එම ස්තූපයේ පාදම අල්ලා බැලීමේ සියුම් ආශාවක් භික්ෂුවට එක් වරම උපන්නේය. භික්ෂුව එම ස්තූපය සමීපයටම ගියේය. තම මැදැඟිල්ලෙන් ස්තූපයේ ගඩොළු ස්පර්ශ කරමින් බුද්ධඝෝෂ හිමිපාණන්ගේ පාලි අටුවා ගැන සිතන්නට පටන්ගත්තේය..

තම සිරුර ගඩොළු අතරින් ඇතුළට ඇදී යන බව භික්ෂුවට එක් වරම දැනුණේය. භික්ෂුව එයින් ආසක්තව නිසොල්මන්ව සිටියේය. එම චෛත්‍ය ගර්භයේ මැද නිල් මැණික්වලින් කරන ලද ආසනයක් මත පූන තූලකින් ගැට ගසන ලද රන් කරඬුවක් තබා තිබුණේය. එම කරඬුව වට කරගත් බමුණෝ යාතිකා කරමින් සිටියෝය. රන් කරඬුව ඉතා සියුම් කැටයමින් අලංකාර කර තිබුණේය. සිංහල කතා කරන භික්ෂු පිරිසක් බමුණන්ගේ පාමුල තණ පත් එළාගෙන ඒ මත වාඩි වී සිටියෝය. එම භික්ෂූන් අත ඉතා කුඩා කරඬුව බැගින් තිබුණේය. එම භික්ෂු පිරිස ඒවා

තම දෝත මත තබාගෙන ඔවුන් ඉදිරිපිට තිබූ එම මහා කරඬුවට වන්දනා කරමින් සිටියෝය. මේ භික්ෂූන් වාඩි වී සිටින්නේ බෝසතාණන් වහන්සේ බෝමැඩදී ඊතණ පත් ශුද්ධ කරද්දී ඉවත ලූ තණපත්‍ර මත බව භික්ෂුව ඉක්මනින්ම අවබෝධ කරගත්තේය.

"සුවපත් වේවා!" ගැඹුරු කටහඬක්. කරඬුව ඇතුළතින් නික්මෙන හඬ භික්ෂුවට ඉතා පැහැදිලිව ඇසුණේය.

"ඔබ වහන්සේට බුදුබව අත්වෙන්ට ඕනෑ අපේ දහම් ඇස පාදා දුන්නාට." එම භික්ෂු පිරිස එක හඬින් කියා සිටියෝය.

"මෙන්න ඔබ වහන්සේලා මට පාලියට නගන්න දුන් සිංහල අටුවා පොත්. කැමති දෙයක් මේවාට කරන්න."

"අපි මේවාට ගිනි තියනවා" ඒ භික්ෂූහු එම පොත් අතට ගන්නා ගමන් කීවෝය..

"ඔබලාගේ කැමැත්තක්" කරඬුව ඇතුළතින් පැමිණි හඬ නතර වූයේය. ඒ සමගම එම භික්ෂු පිරිස තම අත් මත මෙතෙක් සුරැකිව තබාගෙන සිටි සිංහල අටුවා පුස්කොළ පොත් බිම දමා ගිනි දැල්ලුවෝය... තම අත් මත තබාගෙන සිටි කුඩා කරඬුද ඔවුහු එම ගින්නටම හෙළුවෝය. එම ගින්න නිවී යද්දී කරඬුව වට කරගෙන් මන්තර ජප කරමින් සිටි බමුණෝ නිවී ගිය ගින්නේ ශේෂ වූ අළු ගෙන භික්ෂූන්ගේ නළල් මත ආලේප කළෝය...

තවත් මොහොතකින් නළල් මත අළු ගාගත් භික්ෂූහු එතැනින් නික්ම ගියෝය. භික්ෂුව වහා තම ගමන් මල්ලට අත දමා කරඬුව නිරුපද්‍රැතව ඇතිදැයි බැලුවේය..

"අනේ දෙයියනේ....!" භික්ෂුවට එක්වරම කියැවුණේය. කරඬුව පුරා තැනින් තැන අළු තැවරී තිබුණේය. භික්ෂුව තම සිවුරු කොනින් එම අළු පිසදැම්මේය. එහෙත් එම අළු ඉවත් නොවුණේය..

'ඇතුළටත් ගියාද?' භික්ෂුව විස්සෝපයට පත් වුණේය.. තමාට දුන් වගකීම නිසි ලෙස ඉටු කරගැනීමට බැරි වෙතැයි යන හැඟීම නිසා භික්ෂුව මේ විස්සෝපය වින්දේය. සිදුරක් පෙනෙන්නට නැති නිසා කරඬුව ඇතුළට අළු නොයන්නට ඇතැයි භික්ෂුව සිතුවේය.. නැවතත් කරඬුව මල්ලේ දමාගත් භික්ෂුව තැති ගත් සිතින් යුක්තව වටපිට බැලුවේය... තමා නැවතත් බුද්ධඝෝෂ හිමියන්ගේ ස්මාරකය අසල සිටින බව භික්ෂුවට ප්‍රත්‍යක්ෂ වුණේය.

භික්ෂුව දැඩි වෙහෙසකර බවක් පෙන්නුවේය. ගුප්ත ඉක්මනින්ම අශ්ව කරත්තය රැගෙන ආවේය. අශ්ව කරත්තයට නැගගත් භික්ෂුව සේනානි නියම්ගම දක්වා තමා ගෙන යන ලෙස ගුප්තට කියා සිටියේය. නේරංජනා නදියේ ජලය පිරී ඇති බැවින් ගඟ තරණය කිරීමට නොහැකි බවත්, බුද්ධගයාව අසලින් ගඟ ඉවුරට පමණක් යා හැකි බවත් ගුප්ත භික්ෂුවට දැනුම් දුන්නේය.

"කමක් නෑ. අපි ඒ ඉසව්වට යමු." භික්ෂුව කැමැත්ත පළ කළේය.

ඔවුහු නේරංජනා නදී ඉවුරට ගියෝය. ගුප්ත තම දකුණු අත දිගු කොට එහා ඉවුරේ ඈතින් පෙනෙන සේනානි නියම්ගම භික්ෂුවට පෙන්නුවේය... භික්ෂුව මෙපිටින් පෙනෙන බුද්ධගයා විහාරයේ කොත නෙතට හසු කරගත්තේය; නැවත ගංඉවුර දෙස බලා සිටියේය.

"අන්න බෝසතාණන් වහන්සේ සුජාතාගෙ රන් තලිය ගඟට දමනවා. බලාපං ගුප්ත උඹට පේනවද? උඹට පේනවද? අනේ ඒ ආශ්චර්යය මට බලන්න ඕන. දැන් ඒ පාත්‍රය උඩුගං බලා යාවි....."

ගුප්ත නිහඬව සිටියේය... භික්ෂුවද නිහඬව සිටියේය.... ඒ නිහඬ බව තවත් ස්වල්ප මොහොතක් එසේම පැවතුණේය.

"මගේ පව්කාරකම! අනේ දෙයියනේ! මට පේන්නෙ ඒ පාත්තරය ගඟේ පහළට පා වෙන ආකාරයක්. ඒක වෙන්න බෑ... ඒක වෙන්න බෑ.... මට ඒ ආශ්චර්යය පේන්නෙ නැත්තෙ ඇයි...? ගුප්ත උඹට පේන්නැද්ද? අනේ ඒ පාත්තරය ඇයි පහළට ගසාගෙන එන්නෙ?"

"නෑ.... ඒක ඉහළට යන බව මට පේන්නෙ" නිහඬව සිටි ගුප්ත සෙමෙන් පිළිතුරු දුන්නේය.

"එහෙනම් කොහොමද ඒක පහළට යන බවක් මට පේන්නෙ? අනේ, මේ වන්දනාවෙ මං දකින්නම ආස කරපු ආශ්චර්යය මට නොපෙනෙන්නෙ ඇයි? ගුප්ත උඹ වගේ කරත්තකාරයෙකුට ඒ ආශ්චර්ය පේන්න විදියක් නෑ මට නොපෙනී.... ඇත්ත කියාපං, ගුප්ත උඹටත් පේන්නේ ඒ පාත්තරය ගඟේ පහළට ගසාගෙන යන ආකාරයක් නේද?"

"හාමුදුරුවනේ, ගඟේ ඉවුරු දෙස නොබලන්න. ඉවුරු අතහැර වතුර දෙස බලන්න. එතකොට පෙනේවි හාමුදුරුවන්ටත් පාත්තරය උඩුගං බලා යන හැටි."

"උඹට ඔල්මාදෙද? ඉවුරු දෙක අතහැරල ගඟ දිහා බලන්නෙ කොහොමද? ඉවුරු නැත්තං කොහොමද ඒක ගඟක් වෙන්නෙ...?"

"ඉවුරු නැත්තම් ගඟක් නෑ... ගඟ පහළට ගලනවා කියන ඒ සම්මුතීන්ගෙන් මිදෙන්න හාමුදුරුවනේ. එහෙම ඉවත් වෙලා ජලය දෙස බලන්න හාමුදුරුවනේ. එතකොට ඔබ වහන්සේට පෙනේවි පාත්තරය උඩුගං බලා යන ආකාරය,"

"උඹගෙ අණ්ඩර දෙමළ....! උඹ දන්න ඉළව්වක් නෑ. උඹ වගේ කිලුටු ඉන්දියානුවෙකුට කොහොම පේන්නද ශ්‍රද්ධාවෙන් සතරස්ථාන වන්දනාවෙ ආපු මට නොපෙනෙනව නම්...." ගුප්ත නිහඬව නේරංජනා නදිය දෙස බලාගෙන සිටියේය... භික්ෂුවද නිහඬව සෑහෙන වෙලාවක් ගඟ දෙස බලා සිට, හිස් අවකාශය දෙසට දෑස් යොමාගෙන තවත් මොහොතක් කණගාටුවෙන් පුතුව අහස දෙස බලා සිටියේය.

"අපි යමු දැං." භික්ෂුව පහත් හඬින් කතා කළේය....

භික්ෂුව නැවත කරත්තයට ගොඩ වූයේ සෑහෙන වෙහෙසකර බවක් මුහුණින් පෙන්නමින්ය..

"මට දැන් ඕන ටිකක් වේලාසනින් නිදාගන්න. මාව විශ්‍රාම ශාලාවට දාල, උඹ හෙට උදේම වරෙන්. අපට පාන්දරින් පිටත් වෙන තරමට ලේසියි."

භික්ෂුව කරත්තයේ වාඩි කරවාගත් ගුප්ත අශ්වයාට නිදහසේ යන්නට ඉඩ හරිමින් ඌට පාර පමණක් පෙන්නුවේය.

භික්ෂුව ඒ මන්දගාමී ගමනේදී ගුප්තගේ සන්සුන් කයත් මුහුණත් සිත් සේ නැරඹුවේය. තමා තුළ ගුප්ත අරභයා තිබූ පිළිකුල යම් තරමකින් ක්ෂීණ වී ඇති බවක් භික්ෂුවට දැනෙන්නේය. එහෙත් ඔහුගේ ඔච්චම් සිනාව භික්ෂුව නොඉවසුවේය. නේරංජනා නදියේ පාත්තරය උඩුගං බලා යන ආකාරය තමාට දැකගැනීමට නොහැකි වූයේ ඇයිදැයි අවබෝධ කරගැනීමට භික්ෂුව තනිවම වෙහෙසුණේය. ගුප්ත එය දුටුවායැයි පැවසීම අමූලික බොරුවක් බව භික්ෂුව විශ්වාස කළේය. ඉවුරු දෙස නොබලා ගඟ දෙස බලන්නේ කෙසේදැයි ගුප්තගෙන් ප්‍රශ්න කිරීමට භික්ෂුවට අවශ්‍ය වුවත් එසේ ඇසීම තම අභිමානයට කැළලක් බව භික්ෂුව කල්පනා කළේය.

භික්ෂුව විශ්‍රාම ශාලාවට නුදුරින් තිබූ තට්ටු කඩ පේළියේ සෑම කඩයකටම ගොඩ වෙමින් කුඩාදේ ලොකු කර බලන කණ්ණාඩියක් සෙව්වේය.. කරඬුවේ සියුම් සිදුර එවැනි තාක්ෂණික උපකරණයකින් දැකිය හැකි වෙතැයි යන හැඟීම භික්ෂුව තුළ හදිසියේ උපන්නේය. බොහෝ කඩවල මිල හෙට්ටු කරමින් ඇවිද්ද භික්ෂුව එක් තට්ටු කඩයකින් එවැනි කණ්ණාඩියක් මිල දී ගත්තේය... එයත් එක් ගමන් මල්ලක දමාගෙන භික්ෂුව විශ්‍රාම ශාලාවට පැමිණියේය..

විශ්‍රාම ශාලාවේ පොදු ශාලාවේ ගමන් මලු අතරින් නැගෙන අසූචි ගඳක් නිසා පිරිස කලබලයෙන් තමතමන්ගේ සෙරෙප්පු සපත්තු පරීක්ෂා කරන ආකාරය භික්ෂුව දුටුවේය.. භික්ෂුවටද ඒ ගඳ දැනුණේය. එහෙත් කාටවත් අසූචි පැගුණ වගක් නොපෙනේ... ඒ ගඳ එන්නේ බිත්තිය මුල්ලේ තිබූ ගමන්මලු අතරින් බව බොහෝ දෙනෙක් කීහ.. තම ගමන් මලු එළියට අදිමින් තමන්ගේ ගමන් මල්ල පිරිසිදු බව ඔප්පු කරන්නට සියලු දෙනා උත්සාහ දැරුවෝය... එහෙත් නඩේගුරා මියයෑමෙන් පසු කැඩී ගිය වන්දනා නඩයේ කහපාට පටිය මත දුඹුරුපාට තිලකය තබාගත් කණ්ඩායමේ වන්දනාකාරියකගේ එක් මල්ලකින් එළියට

ගත් බඩුමුට්ටු අතර තිබූ එක් කුඩා පොදියකින් මේ ගඳ එන බව සියලු දෙනා දුටුවෝය...

"ඕකෙ මොනවද?" විශ්‍රාම ශාලාවේ භාරකරු ඇසුවේය..

"මම නේරංජනා ගං ඉවුරෙන් ගත්ත වැලි ටිකක්" ඇය ඒ මල්ල මහත් ගෞරවයෙන් දෝත මත තබාගෙන කීවාය..

"ලිහමු ටිකක් බලන්න." එය ලිහා බලද්දී අසූචි ගඳ එන්නේ ඒ වැලිවලින් බව සියලු දෙනාට වැටහුණේය.. විශ්‍රාම ශාලාවේ පාලකයා ඒ අසූචි මිශ්‍ර වැලි වීසි කරන්නැයි අණ කරද්දී බොහෝ අය තමතමන්ගේ මලුවලට අත දමමින් සිහිවටන පිණිස ගත් ඒ වැලි හොරරහසේ නාසයට අල්ලා බලමින් අසූචි ගඳ එන බව දැන ඒවා හොරරහසේම ගෙන ගොස් විසි කරන අයුරු භික්ෂුව දුටුවේය. සමහරු ඒ සිහිවටන වැලි නාසයට අල්ලා ඉඹ බලා අසූචි මිශ්‍ර නැතැයි සැකහැරගෙන නැවත මලුවලම ඔබාගත්තෝය.

විශ්‍රාම ශාලාවේ තම කාමරයට වැදුණු භික්ෂුවට ඉක්මනින් සයනය මත අත්පා විහිදුවා නිදහසේ සැතපීමේ අවශ්‍යතාව දැඩිව දැනුණේය. ඊටත් වඩා තමා මිල දී ගත් අත්කාවයෙන් කරඬුවේ සියුම් සිදුර සොයාගැනීමේ දැඩි වුවමනාවද භික්ෂුව තුළ තිබුණේය. ඇර දමා තිබූ දොර ඉදිරියෙන් යාබද කාමරය වෙත දෑත් පටලවාගෙන සිනා සෙමින් යන තරුණ ජෝඩුවක් භික්ෂුව දෙස බලා අත වනාගෙන ගියෝය. ඔවුන්ගේ සැහැල්ලු ඇඳුම් සහ ඉරියව් දෙස භික්ෂුව මොහොතක් බලා සිටියේය. ඔවුන් යුරෝපීය රටක ජෝඩුවක් විය හැකියැයි භික්ෂුව අනුමාන කළේය. ඔවුන් දොර පසු කර ගිය පසු ඉක්මනින් කාමරයේ දොර වසා දැමූ භික්ෂුව කයේ දහඩිය උණු දියෙන් සෝදාගත්තේය. අනතුරුව භික්ෂුව සුදු ඇතිරිල්ලෙන් සරසා තිබුණු එම සයනය මත එරමිණියා ගොතාගෙන වාඩි වී අත්කාවයත් කරඬුවත් අතට ගත්තේය... එහි සියුම් කැටයම් මත අත්කාවය තබමින් භික්ෂුව සිදුර සෙව්වේය... එහෙත් එහි සිදුරක් දකගැනීමට නොලැබුණේය. ඉතා විශාලව පෙනෙන කැටයම් ලියවැල් පමණක් භික්ෂුව දුටුවේය... අත්කාවයට තවතවත් ඇස ළං කරමින් කරඬුව පරීක්ෂා කරන භික්ෂුවට විශ්‍රාමශාලාවේ පහළ මාලයෙන් නැගුණු අසූචි ගඳම නැවත දැනෙන්නට පටන්ගත්තේය.

"දෙයියනේ! කරඬුවෙන්ද?" නැත... එය අත්කාවයෙන් බව භික්ෂුව වහා අවබෝධ කරගත්තේය... ජනෙල් කවුළුව දක්වා ගිය භික්ෂුව එම අත්කාවය එළියට වීසි කළේය...

කරඬුවේ සිදුර දැකීමේ උත්සාහය තාවකාලිකව අතහැර දැමූ භික්ෂුව ඇඳේ දෙපැත්තට පෙරළෙමින් කාලය ගත කළේය. නින්ද අද තමා අසලට නොඑන එකක් බව භික්ෂුවට දැනුණේය. ඒ නිසාම භික්ෂුව සයනයේ එරමිණියා ගොතාගෙන ආනාපාන සතිය වඩන්නට වෙහෙසුණේය. හුස්ම ඉහළට ඇදෙන හඬත් පිට වන හඬත් භික්ෂුව ඉතා පරිස්සමෙන් ශ්‍රවණය කළේය. ඒ හඬ ක්‍රමයෙන් මහා ඝෝෂාවක් බවට පත් වීමට වැඩි වේලාවක් ගත නොවුණේය. එම ඝෝෂාවක් වූ හඬ මුහුදක රළ නැගෙන හඬක් සේ භික්ෂුව අසල දෝංකාර දෙන්නට වූයේය. තම හුස්ම ගැනීම මෙතරම් ඝෝෂාකාරී එකක් වූයේ කෙසේදැයි භික්ෂුව ඒ අතර සිතන්නට වෙහෙසුණේය... එසේ සිතන විට අරමුණෙන් සිත මිදිය යුතු වූවත් තමා හුස්ම ගන්නා සහ පිට කරන හඬ මහා ඝෝෂාවක් ලෙස තමාට ඇසෙන්නේ කෙසේදැයි භික්ෂුව නැති ගත් සිතින් සිතන්නට වූයේ ය. එම ඝෝෂාව ක්‍රමයෙන් පැහැදිලි මිනිස් හඬවල් බවට පත් වූයේය.. එය පිරිමි ගැහැනු ආදි බොහෝ පිරිසකගේ හඬවල් ලෙසින් භික්ෂුවට වෙන වෙනම ඇසෙන්නට පටන් ගත්තේය. ක්‍රමයෙන් ඒ වචන ඉතා පැහැදිලි තේරුම් සහිත වචන ලෙස භික්ෂුවගේ කන්පතුල් ස්පර්ශ කරගත්තේය.

"ඒ සිවුර අපි දේවදත්ත හාමුදුරුවන්ට පූජා කරමු."

"නෑ. ඒක අපි සැරියුත් හාමුදුරුවන්ට පූජා කරමු."

පිල් දෙකක සංවාදයක හඬ දැන් භික්ෂුවට පැහැදිලිව ඇසෙන්නේය. සැරියුත් හිමිට සිවුර පූජා කළ යුතුයැයි හඬ නගන පිරිස ස්වල්ප වූ අතර, දේවදත්ත හිමියන්ට එය පූජා කළ යුතුයැයි කියන පිරිසේ හඬ විශාල වූවේය.

දාන ශාලාවේදී සියලු භික්ෂූන් තුෂ්ණීම්භූත භාවයෙන් සිටියදී එම අගනා සිවුර දේවදත්ත හිමියන්ට ලැබුණේය. එහිදී බොහෝ පිරිසක් සාධුකාර දෙන හඬ භික්ෂුවගේ දෙසවන් පත් අතර නින්නාද දෙන්නට වූයේය. දේවදත්ත හිමියන් එම සිවුර පෙරවාගෙන පිරිස පසු කරගෙන තමා සමීපයට එන අයුරු භික්ෂුව දුටුවේය.

''දැන්වත් ඔය කරඬුව මට දෙන්න.'' දේවදත්ත හිමියෝ ඉතා සංවර ගම්භීර හඬකින් කීවෝය.

''එය කෙසේ වත් කවදා වත් නොවන්නක්. ඔබ වහන්සේ ඒ සිවුර පිළිගැනීමට කෙසේ වත් සුදුසු නොවන බව බුදුන් දෙසුවා මට කෙසේ අමතක වන්නද? මිනිසුන් ඔබගේ ගුණයට නොවේ බලයට වසඟ වී ඒ සිවුර ඔබ වහන්සේට පූජා කළා විනා ශීලාදි ගුණයකට පූජා නොකළ බව මම හොදින්ම දන්නවා.'' භික්ෂුව නිර්භයව කීවේය.

දේවදත්ත හිමියෝ භික්ෂුව දෙස අවඥාවෙන් බලා එතැනින් ඉවත් වූවෝය. එවේලෙහි දේවදත්ත හිමියන් පසුපසින් විශාල භික්ෂු පිරිසක් ඉතා ප්‍රීති සිනා නගමින් යන්නට වූහ. භික්ෂුව කණගාටු සිතින් මේ දර්ශනය දෙස බලා සිටියේය. භික්ෂුව දේවදත්ත හිමියන් ගැන තීරණයක් ගැනීමට නොහැකිව ළතවුණේය.. වරෙක දේවදත්ත හිමියන් මේ කරඬුව ලබාගන්නට උත්සාහ දරන්නේ කරඬුවට හොදක් කරන්නමයැයි සිතෙන්නේය. තවත් වරෙක එය විනාශ කිරීම සදහා ඉල්ලන බව සිතෙන්නේය.. එම රත්වන් සිවුර සැරියුත් හිමියන්ට නොදී දේවදත්ත හිමියන්ට පූජා කිරීමට මිනිසුන් පෙළඹුණේ ඇයිදැයි භික්ෂුව හිතන්නට වෙහෙසුණේය.. රාජපාක්ෂිකව සිටින දේවදත්ත හිමියන්ට රජුගෙන් ලැබෙන අනුග්‍රහය නිසා කොයි මොහොතක හෝ පැමිණ මේ කරඬුව බලහත්කාරයෙන් රැගෙන යනු ඇතැයි භික්ෂුවට සිතෙන්නේය.

භික්ෂුව නැවතත් තම ගමන් මල්ල පරීක්ෂා කළේය. නිරුපද්‍රැතව කරඬුව තිබෙනු දැක භික්ෂුව සැහැල්ලු හුස්මක් හෙළුවේය. භික්ෂුව අනෙක් ගමන් මල්ලද අතගා බැලුවේය..

කරඬුව තිබේදැයි සොයා බලන සෑම විටකම අනෙක් ගමන් මල්ලේ ඇති පැන්සල්කොටයත් තිබේදැයි සොයා බැලීම භික්ෂුව නොදැනුවත්වම සිදු වන්නකි.. තමා එසේ නොකරමියි සිතා සිටියත් එය එසේම සිදු වන්නේය.

''මට ඕන එකෙන් මිදෙන්න, දෙයියනේ! ඇයි මං මේක වීසි නොකරන්නෙ?'' භික්ෂුව නැවතත් කරඬුව අතට ගෙන එහි සිදුර අනුමානයෙන් දකින්නට උත්සාහ කළේය.. සිතින් තර්ක කරමින් පරිමාව හැඩතල අනුව සිදුර මේ ඉසව්වේ තිබිය යුතුයැයි අනුමාන කරමින් ඒ තැන් ඇඟිලි තුඩින් අතගාමින් සිදුර සෙව්වේය.. එහෙත් ඒ උත්සාහයෙන් ප්‍රතිඵලයක් නැති තැන භික්ෂුව ගමන් මල්ලට අත දමා පැන්සල් කැබැල්ල අතට ගත්තේ එය වීසි කරමියි යන හැඟීමෙනි... එය අතට ගත් පසු භික්ෂුවට ඇසෙන්නට පටන්ගත්තේ සුපුරුදු විලාපයයි... ගස් එකට ඇතිල්ලීමෙන් නැගෙන පාළු මූසල හඬත් සමග සිහින් ඉකිබිඳුමක හඬ භික්ෂුවට ඇසෙන්නට පටන්ගත්තේය. භික්ෂුව දෑතින් කන් වසාගෙන පැන්සල් කැබැල්ල නාසය සමීපයට ගත්තේය... ඉන් නැගෙන්නේ මීට ටික වේලාවකට කලින් විශ්‍රාමශාලාවෙන් නැගුණු අසූචි ගදම බව භික්ෂුවට දැනුණේය. භික්ෂුව වහා පැන්සල් කොටය වීසි කළේය... එය බිත්තියේ වැදී දොරමුල්ලට වැටෙද්දී අඹගස් දෙක සුළඟින් එකට ඇතිල්ලෙන හඬම භික්ෂුවට ඇසුණේය.

''ඒක ආපහු ඕන නෑ'' භික්ෂුව සිත හදාගෙන කොට්ටයේ මුහුණ සඟවාගත්තේය...

නිදිමත ඉතා ඉක්මනින් තමා ආක්‍රමණය කරන්නේ නම් හොදයැයි සිතමින් භික්ෂුව දෑස් පියාගත්තේය.... අඩවන් වූ දෑස් සහිතව භික්ෂුව බිත්තිය පැත්තට හැරුණේය. යාබද කාමරයේ සිටින ගිහි ජෝඩුවේ කතාබහ භික්ෂුවට ඇසෙන්නේය. අපැහැදිලි බසකින් කෙරෙන ඒ කතාව තේරුම් ගැනීමට භික්ෂුව උත්සාහ නොකළේය. එහෙත් ඒ කතාබහ කරන්නේ තමාගේ කාමරය ඉදිරිපිටින් යන විට අතවනාගෙන ගිය ජෝඩුව බව භික්ෂුවට ප්‍රත්‍යක්ෂය. කතාවෙන් පෙරී වෙනම මතු වන ගැහැනියගේ සිනා හඬත් පුරුෂයාගේ සිනා හඬත් සයනයේ විරිවිරියත් නො

ඇසෙන ලෙස ගමන් මල්ලේ කර පටියෙන් හික්ෂුව තම කත් වසාගත්තේය. බිත්තියේ හුණු බදාමය ගිනියම වී ඉන් නැගෙන දැඩි රශ්මියකින් හික්ෂුවගේ මුහුණට දාඩිය දමන්නට වූයේය. අල්ලපු කාමරයේ ගින්නක් දෝ යන සැකයෙන් හික්ෂුව එම හුණු බදාම බිත්තියට අත්ල තබා බැලුවේය. එම බිත්තිය රත් වූ ලෝහ තහඩුවකින් නැගෙන උණුසුම තරම් දැඩි උණුසුමකින් යුක්ත වූවේය. එම රස්නයෙන් හික්ෂුවගේ උගුර කට වේළී යන්නට වැඩි වේලාවක් නොගියේය.

"මේ පැන් පොද වළඳන්න හිමියනි."

"එපා. මට ඇති පිපාසයක් නැහැ."

"ආනන්ද හිමියන්ට මා පැන් නොදුන්නේ අප හීන කුලේ නිසයි... ඒත් උන් වහන්සේගේ දැඩි ඉල්ලීම නිසා මා පැන් දුන්නා.... දැන් මගේ කුල බිය පහව ගියා. අනේ ඔබ වහන්සේත් පිපාසයෙන්. මේ පැන් වළඳන්න...... මම කැමැත්තෙන්මයි මේ පිළිගැන්වීම කරන්නේ....."

"එපා එපා. මට කිසි පිපාසයක් නෑ.... මට දහඩිය දැමුවේ අල්ලපු කාමරයේ ගින්නක් වගේ. මේ බිත්තිය හොඳටම රත් වෙලා."

"විය හැකියි. ඒත් ඒ ගින්නට වඩා ඔබ වහන්සේගේ පිපාසය බලවත් ස්වාමිනි. බිය නොවී මේ පැන් වළඳන්න... නැති නම් ඔබ වහන්සේගේ දිව ගිලී යාවි...."

"මම එක පාරක් කිව්වා. මට ඔබගේ පැනෙන් කාරියක් නෑ. මට වද නොදී වහාම මෙතනින් යන්න."

"බිය නොවන්න. මා නුඹ වහන්සේට රොඩී දැහැන මතුරන්න කියා මගේ මෑණියන්ට කියන්නේ නෑ.. පැන් පමණක් වළඳා පිපාසය සංසිඳුවාගන්න."

හික්ෂුව ඇයට පිළිවදන් නොදී ජලනන්දන පිරිත කටපාඩමින් කියන්නට පටන් ගත්තේය. තොල්මතුරමින් කියන

පිරිතේ ආනුභාවයෙන් රොඩී කෙල්ලගේ දර්ශනය තම දෑස් සමීපයෙන් ඈතට ගිය බව වැටහී ගියෙන් හික්ෂුව පිරිත අතහැර දමා සුව නින්දකට පිවිසියේය.

පාන්දර ජාමයේ හික්ෂුව ඇහැරුණේ තම උකුළ සීතල වී ඇති බව දැනීමෙනි. රොඩී කෙල්ල ඇගේ වතුර කළය තම උකුළට හලා ගොස් ඇති බව හික්ෂුවට වැටහුණේ තම නානකඩය තෙත් වී තිබෙනු දැකීමෙනි. හික්ෂුව වහාම ඇඳෙන් බැස නානකාමරයට ගොස් නානකඩය මාරුකොට අලුත් නානකඩයක් දවටාගෙන නැවතත් ඇඳට වැටී ගැඹුරුම නින්දක් ආස්වාදනය කළේය.

පසු දින උදෑසනින් පැන්පහසු වූ හික්ෂුවගේ කයට මහත් සැහැල්ලුවක් දැනුණේය. තමා පෙරදා රාත්‍රියේ විසි කළ පැන්සල් කැබැල්ල කොහාට වැටී ඇද්දැයි හික්ෂුව සෙව්වේය. එය දොරමුල්ලේ නොතිබුණේය. බිත්ති පාමුල කොතැනකවත් නොතිබුණේය. හික්ෂුව නැවත තම ගමන් මල්ල අතගා බැලුවේය.. පුදුමයකි..! කරඬුව තිබූ මල්ලේම එම පැන්සල් කැබැල්ල තිබුණේය. හික්ෂුව වහා එම පැන්සල් කොටය නැවත අනෙක් මල්ලේ ඔබාගත්තේය.

කිඹුල්වත් පුරය බලා යන ගමන කෙසේ කොතැනින් පටන් ගත යුතුදැයි හික්ෂුවට පැහැදිලි අවබෝධයක් නොතිබුණේය. ගුප්ත තමා අවශ්‍ය තැනට රැගෙන යාවියැයි යන විශ්වාසය හික්ෂුවට තිබෙන්නේය. ගුප්ත නියමිත වේලාවට වැඩ කරන, පාරතොට ගැන හොඳ අවබෝධයක් ඇති, සැහැල්ලුවෙන් සිටින පච්කාර මිනිසෙකුයැයි යන්න හික්ෂුව මෙතෙක් ගුප්ත පිළිබඳව කර ඇති පැහැදිලි විනිශ්චයයි. එහෙත් ඔහු කෙරෙහි තමා තුළ පවතින්නේ ප්‍රියතාවක්ද අප්‍රියතාවක්දැයි හරිහැටි අවබෝධයක් හික්ෂුවට නැත්තේය.

ගුප්ත නියමිත වේලාවටම කරත්තයත් රැගෙන විශ්‍රාම ශාලාව ඉදිරිපිටට පැමිණියේය.

ඔහු ඉතා පිරිසිදු ඇඳුමක් ඇඳ සිටියේය. ඔහුගේ පිරිසිදු බව හික්ෂුවගේ සිතට සැහැල්ලුවක් ගෙනාවේය.

''උඹ වෙනදට වැඩිය ප්‍රසන්නයි.. ඊයෙටත් වඩා පිරිසිදු ඇඳුම ඇඳලා'' භික්ෂුව ගුප්ත දෙස බලාගෙන යාන්තමින් සිනා සෙමින් කීවේය.

ගුප්ත අශ්වයාගේ වලිගය තම වම් අතින් පිරිමදිමින් භික්ෂුවට කන් දෙන බවක් ඇඟෙව්වේය. කරත්තයට නැගගත් භික්ෂුව හරිබරිගැහී වාඩි වෙද්දී ගුප්ත දුංකළ වඩියක් ඒදා කටේ ඔබාගත්තේය.

ඔවුන් ගමන ආරම්භ කරන විට ළා හිරුරැස් බුද්ධගයා විහාරයේ ඉහළ බිත්ති ආලෝකවත් කරමින් තිබුණේය.

ඔවුන්ගේ ගමන තරමක් වේගවත් එකක් වූයේය. ගුප්ත අශ්වයා සමග කතා කරමින් උගේ ගමන තවත් වේගවත් කිරීමට උත්සාහ ගත්තේය. භික්ෂුව පැද්දෙන කරත්තයේ ලීපටි ඇන්දට හේත්තු වී තම ගමන් මල්ලෙන් එළියට ගත් පොතක පිටු පෙරළුවේය.

''කොහොමද? ඊයේ රාත්‍රිය හාමුදුරුවනේ? හොඳින් සැතපුණාද?''

''ඔ.....ඔව් ඇයි...... උඹ එහෙම ඇහුවෙ එකපාරටම?''

''මම නිකමට ඇහුවෙ. මට සුවදායක නින්දක් ලැබුණා.... ඉතා කර්කශ බිමක මම නිදාගත්තේ. ඒත් හොඳින් නින්ද ගියා.''

''එහෙනම් උඹ මත්පැන් බොන්න ඇති හොඳට...''

''ඉස්සර මට එහෙම නැතුව සමහර රාත්‍රීන් ගෙවා දමන්න අමාරු වුණ එක ඇත්ත.... ඒත් දැන් එවැනි අවශ්‍යතාවක් දැනෙන්නෙ නෑ..''

''ඒක උඹ නතර කරගත්තෙ කොහොමද?''

''ඉබේ නතර වුණා. එය අවශ්‍ය නොවන දෙයක් වුණා. මා ඒ වෙනුවෙන් ගත් වෙහෙසක් නෑ.... එපා වීම බීමෙන්ම මා තුළ ඇති වූවක්.''

''හැම බේබද්දෙකුටම එහෙම වෙන්නෙ නැත්තෙ ඇයි?''

''අතෘප්තිමත් බව.''

''උඹ කියන්නෙ හැම දෙයක්ම තෘප්තියෙන් අවසන් වෙනව කියලද?''

''නෑ. තෘප්තියෙන් පසු නිමා කිරීමේ අවශ්‍යතාව දැනෙනවා. ඒ අවශ්‍යතාව නිමා කිරීමේ මාවත හදා දෙනවා. මා අත්දකිමින් සිටින්නෙ එයයි.''

''උඹ කියන විදියට අපට ආස හිතෙන හැම දෙයක්ම කාල විඳල බලල තෘප්තිමත් වෙලා නිමා කරන්න උත්සාහ කරන්න ඕන කියලද?''

''මම අත්දකිමින් ඉන්න විදියට අපේ එක් එක් ඉන්ද්‍රියට අදාළව එක් එක් අරමුණක් විතරයි තියෙන්නෙ.. ඒක බෙදිල ගිහිල්ල තමයි විවිධ අරමුණු හැදෙන්නෙ. තවත් පැහැදිලි කළොත් ඇහැට අරමුණු වෙන රූපය කියන දේ එකක්ම පමණයි. ඒක අංශුවලට බෙදිල තමයි රූප ගොඩක් හැදෙන්නෙ. සරල විදියටම කිව්වොත් කාව්‍ය ශාස්ත්‍රයේ තියෙන සමුද්‍රඝෝෂ විරිත අරගෙන අපි ගොඩාක් තනු හදාගන්නව වගේ අපි මූලික රූපය අරගෙන විවිධරූප හදාගන්නවා.. අතෘප්තිය පවතින්නෙ මේ රූප ගොඩම අල්ලගත්ත නිසා. සියලු රූප එකම ගොඩකට දාල එක රූපයක් කියල දැනගත්ත දවසට රූපය පිළිබඳ අතෘප්තිය සංසිඳෙනවා.''

''උඹ අඹුවො තුන්දෙනෙක් තියාගෙන ඉන්නෙ ඇයි එහෙනම්.. උඹ රූපය එකක් විදියට හිතනව නම්?''

''එය මගේ සතුට පිණිස වූවක් නම් මා ඉදිරියේ ඔවුන් කැමති වෙන පුරුෂයන් සමග මෛවුන්දම් සොයද්දී මා කෝප විය යුතුව තිබුණා. මට මගේ තෘප්තියේ සීමාව පෙනුණත් ඔවුන්ට ඔවුන්ගේ තෘප්තියේ සීමාව පෙනී නෑ.. ඔවුන් තෘප්තිමත් කිරීම මගේ යුතුකමක් කියලා මට හිතුණා... ඒ වගකීමත් මං අවසන් කළා කියලයි මට හිතෙන්නෙ.''

''උඹගෙ විකාර! බුද්ධාගමට විරුද්ධ කතාවක් උඹ කියන්නෙ.... බුදුබණේ තියෙන්නෙ උට්ඨාන වීර්යයෙන් වළක්වාගෙන එහි යථාර්ථය දැනගෙන නිමාවට පත් කරගන්න කියලයි...''

"සිද්ධාර්ථයන් වහන්සේ තෘප්තියෙන් පසු නිමාව දැකපු කෙනෙක් කියලයි මං හිතන්නෙ."

"උඹ කොහොමද එහෙම හිතන්නෙ? උන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම්පුරලා උට්ඨාන වීර්යයෙන් බුදු වෙන ආත්මෙත් ගොඩාක් දුක් විඳලා බුද්ධත්වයට පත් වුණේ...."

"මට නැවත කියන්න තියෙන්නෙත් සිද්ධාර්ථයන් වහන්සේ ඒ සත්‍ය සොයා ගියේ තෘප්තියෙන් පසුවයි.."

"උඹ වගේ කරත්තකාරයෙකුගෙන් මට ඊට වඩා උත්තරයක් බලාපොරොත්තු වෙන්න බැහැ. ඇයි ගොන් නාම්බො, බුදුහාමුදුරුවො විනය නීති පැනෙව්වෙ මොකටද? උඹ කියන විදියට ඒ භික්ෂූන් වහන්සේලාට ඕන විදියට තෘප්තිමත් වෙන්න දීල ඉන්න තිබුණ නේ... ඒ තෘප්තිය අවසානෙ නිවන් දකිනවා නම්!"

"ඇත්ත හාමුදුරුවනේ, අවුරුදු විස්සක් ඒක නොකළේ සාසනේට ආව සියලු දෙනා තෘප්තියෙන් පසු නිමාව පිණිස එකතු වෙච්ච පිරිසක් නිසා. ඉන් පසු ව එකතු වෙන්නෙ අතෘප්තියෙන් නිමාව සොයන පිරිසක්...."

"තෘප්තියෙන් පසු නිමාව පිණිස ආ බොහෝ පිරිසක් මේ ශාසනයේ සිටි බව උඹ දන්නෙ නැද්ද ගුප්ත? පළවෙනි ශික්ෂාපදය පනවන්නෙ සුදින්න හාමුදුරුවන්ට. ඒ හාමුදුරුවො ගිහි කල සැප ගැන කලකිරි සසුනට ආ කෙනෙක්...."

"උන් වහන්සේව මාර්ගයෙන් ආපසු හැරවීමෙ සාධාරණ හේතු තිබුණ නේද හාමුදුරුවනේ, ලිච්ඡවීන් අපුත්‍රක පවුල්වල ධනය රාජසන්තක කරගත් නිසා සුදින්න හාමුදුරුවන්ගේ පවුලේ උදවියට පුත්‍ර බීජයක් අවශ්‍ය කළ නිසා වෙච්ච දෙයක් නේද ඒක? එවැනි සාධාරණ හේතු නැති ශික්ෂාපද අතෘප්තිය ඉතිරි කරගෙන බඹසර හැසිරීම සඳහා පැමිණි පිරිස නිසා සිදු වූ දේවල් කියලයි මම හිතන්නෙ... ඊට පස්සෙ වැදිරියක් සමග මෙවුන්දම් සෙව්වෙ අතෘප්තියෙන් පැමිණ බඹසර විසීමට ගත් උත්සාහය අසාර්ථකයි කියනඑක නේද හාමුදුරුවනේ?

"රාහුල කුමාරයා වගේ කෙනෙක් ජීවිතේ මොනව ලබාගෙනද එන්නෙ? ඒත් හත් හැවිරිදි වියේදීම රහත් වෙනවා...."

"අවශ්‍යතාව වුණේ තාත්තගේ ආදරය... ඒක ලැබුණා.... වයසට අවශ්‍ය කරන තෘප්තිය එතන තිබුණා. සත් වයස් කෙනෙකුට මෝරපු කෙනෙකුගෙ අවශ්‍යතා මතු වෙන්නෙ නෑ.... ඒ මතු වෙන්න ඉස්සෙල්ල උන් වහන්සෙ රහත් වුණා

"උඹ කියන්නෙ තෘප්තිමත් නොවෙච්ච කෙනෙකුට ශාසනයේ ඇලුම් ඇති කරගැනීමෙන් එලක් නැති බවද?"

"නෑ හාමුදුරුවනේ, අසහනය කලකිරීම එපා වීම කියන මේ දේවල් නිසා බඹසර විසීම වෙනවා. ඒත් අසහනය, කලකිරීම, එපා වීම, බිය, නොසතුට, මේ ඕනම තත්ත්වයකින් විස්තර කරන්න උත්සාහ කරන්නෙ එතෙක් ලබාපු තෘප්තිය නතර කිරීමට කැමතියි කියන ඉඟිය."

"උඹ දොඩවනව වැඩියි. මට මේ පොත බලන්න දීල උඹ කරන්නෙ දක්කපං." භික්ෂුව තරමක් නොරිස්සුම් සහගත ලෙස කී කතාවට ගුප්ත අවනත බවක් පෙන්නා අශ්වයාට දිගේලි වූ මාර්ගයේ රිසි සේ ගමන් කරන්නට හැර තෝන් ලණුව බුරුල් කරගෙන සිටියේය...

තමා ගුප්ත ප්‍රතික්ෂේප කරන්නේ කරත්තකාරයකු නිසාද? නැති නම් තමා තුළ පවතින යම් මහන්තත්වකමක් නිසාද? නැති නම් තමන්ගේ අදහස් හා ගුප්තගේ අදහස් නොගැළපෙන නිසාද? එහෙමත් නැති නම් ගුප්ත තමා සමග සසඳද්දී ඔහු බොහෝ පහළින් සිටින කෙනෙකැයි තම සිත යෝජනා කරන නිසාදැයි භික්ෂුව සිතන්නට උත්සාහ ගත්තේය. ඒ හැමදෙයක් ම එකතු වී ගුප්ත තමා වෙතින් ප්‍රතික්ෂේප වන බව භික්ෂුවට දැනෙන්නේය..

තම කන් අසල රැව්දෙන අඳෝනාවේ හඬත් මිටිනාප්පයේ එල්ලී ඉකිබිඳින දූරියගේ රූපයත් තම මනසින් සදහටම අතුගා දමන්නට ඇති අවශ්‍යතාව හැර වෙන අවශ්‍යතාවක් තමන්ට නැතැයි භික්ෂුවට නිතර සිතෙන්නේය.. තම ජීවිතයේ සියලු කරදර දුක් වේදනා පවතින්නේ ඒ හඬත් රූපයත් නිසා බව භික්ෂුව සිතා සිටින්නේය.

4.

කිඹුල්වත් පුරයේ සතර දිසාවෙන් හමන සිසිල් සුළඟින් භික්ෂුව ප්‍රබෝධය ලැබුවේය. බුදුරදුන් කිඹුල්වත් පුරවරයට වඩමවාගැනීමට කාලුදායි රහතන් වහන්සේ ගාථා හැටකින් කළ මාර්ග වර්ණනාව භික්ෂුව සිතින් සිහි කළේය.

"වහන්ස, දැන් වෘක්ෂයෝ ගිනි අඟුරු වැනි රතු පැහැති දළු ඇත්තෝය; පරණ කොළ වැටී පල දරන කාලයට පැමිණියෝ වෙත්. ඒ වෘක්ෂයෝ ගිනි දැල් සහිත වූවන් සේ බබළත්. මහා වීරයන් වහන්ස, දැන් කිඹුල්වතට වඩින්නට සුදුසු කාලයයි..."

"මැණියනි, මට මගේ පියාණන් අවැසියි.." භික්ෂුව තම කන් සිදුරු අතර නින්නාද දුන් නුපුරුදු කටහඬින් බිය ගත්තේය.

"මපුත, නොහඬන්න, මේ මාලිගයේ මට දෙන්නට බැරි වූ එකම දෙයත් එයයි. එහෙත් ඒ දේ මා නුඹට අද ලබාදෙනවා... සත්වසක් පුරා මා හිල්ලුවාට වැඩිය නුඹ පිය සෙනෙහස ඉල්ලා හිල්ලූ බව මා දන්නවා. එන්න මේ කවුළුව ළඟට. ඔබ සත්වසක් පුරා නොදුටු ඔබේ පියා මම නුඹට පෙන්වන්නම්... මා විශ්වාස කරන්න පුතණුවනි, අර සංවර ගමනින් වඩින්නේ ඔබේ පියා. ඔව්. ඒ ඔබේ පියා.... යන්න දැන් තරයේ වැළඳගෙන ජීවිතයේ මට දීමට නොහැකි වූ ඒ උත්තම දායාදය ඉල්ලාගන්න.."

"මං පියගැටපෙළක් දිගේ එච්චර වේගයෙන් දුවගෙන ගිහිං තිබුණෙ නෑ... විශ්වාස කරන්න මගේ මාලිගාවෙ මං දැකල තිබුණු ඇඳුම් ආයිත්තම්වලට වඩා වෙනස් වස්ත්‍රවලින් සැරසුණු දහස් ගණනක් පසු කරගෙන ගිහිං මං කවදාවත් දැකල නොතිබිච්ච මගේ පියාණන් මං හඳුනගත්තා. මට කිසි බයක් දැනුණෙ නෑ. මට දැනුණෙ මහා ආරක්ෂාවක්. මං ඒ සුළැඟිල්ලෙ එල්ලුණා. මගේ පියාණන් වහන්සේ ඒ ඇඟිල්ල අතහැරියෙ නෑ.. මට ඕන කරල තිබිච්ච දේ එතුමන් හොඳින් දැන සිටිය බව මට විශ්වාසයි..."

පිරිපුන් සත්හැවිරිදි රාහුල සාමණේරයන්ගේ දිප්තිමත් ඇස් දෙස භික්ෂුව බලා සිටියේය. "ඇයි ඔබ වහන්සේ නැති ගත් දෙනෙතින් යුතුව සිටින්නේ....? මා නම් මෙහි පැමිණියේ නොලැබුණු යමක් වෙනුවෙන්. ඔබ ලැබුණු දේ අතහැර පාළොස් වසින් පැවිද්දට පැමිණියේ ඇයි?"

"මා ළඟ ඊට හොඳින් ගැළපෙන පිළිතුරක් නෑ..."

"ඔබ ශ්‍රද්ධාවෙන් පැවිදි වෙච්ච කෙනෙක්ද? ප්‍රඥාවෙන් පැවිදි වෙච්ච කෙනෙක්ද?"

"මා ළඟ ඊටත් පිළිතුරක් නෑ.. ඒ කොහොම වුණත් මට ඕන මේ සසරෙන් ගැලවෙන්න."

"ඒ අරමුණ පහළ වුණේ කවදාද කියා හරියටම සිහි කළ හැකිද? එය සැබවින්ම ඔබ තුළ ඔබ නිසා හටගත්තක්ද? නැති නම් අනෙකකු නිසා ඔබ තුළ හටගත්තක්ද?"

"ඇයි ස්වාමීනි මා වෙහෙසට පත් කරන්නෙ....? ඔබ වහන්සේ මේ ශාසනයේ සිටි උත්තම රහතන් වහන්සේ නමක් නේද?"

"ඔබ මා මුණගැසී සිටින්නෙ ඊට ටිකක් පෙරාතුවයි. මට දැනගන්න ඕනෑ කරන්නේ පැවිදි වීමෙන් පසුව ඔබට ඔබේ මැණියන් පියාණන් වුවමනා වූයේ නැද්ද කියායි..."

"මං හුරු වුණා ඒ අය නැතිව ඉන්න.."

"එසේ නම් ඇයි ඔබේ සහෝදරයා විවාහ වෙන දවසෙ ඔබ සිවුරු කොන කඳුළින් තෙත් කළේ?"

"අලුත් ලේලියි පුතයි පිළිගන්න මගේ අම්ම සමන් කැකුළු දාපු වතුර කොතලය අරගෙන ඒ අය ඉදිරියට එනකොට මට ඉහිලුම් නැතිව ගියඑක ඇත්ත.."

"ඒ මොහොත වන විට ඔබ පරිණතයි. එහෙත් ඇයි අර හුරුව ඔබෙන් ගිලිහී ගියේ....?"

"අනේ ස්වාමීනි, මා අමතක කරන්න හදන දේවල් නැවත එළියට නොගනු මැනවි.. බලන්න මා කෙතරම් සංවරව සිවුරු

පෙරවනවාද? බුදුන් වදිනවාද? වතාවත් කරනවාද? විනයානුකූලව ජීවත් වෙනවාද? කියා.''

''එත් ඔබේ අධ්‍යාත්මයේ යමක් හිර වී තිබෙන බවක් ඔබට දැනෙන්නැද්ද? ඒ හිර වූ දේ විටින් විට වමාරමින් ඔබ රස කරකර අනුභව කරන්නැද්ද? එය නැවත ගිල කාට වත් නොපෙනෙන ලෙස සඟවා තබාගන්නෙ නැද්ද? එසේ සඟවා තබාගෙන නොවෙයිද ඔබ මේ වන්දනාව කරන්නෙ? සමා වන්න මා ඔබව වෙහෙසට පත් කළා නම්.''

''ඔව්. මා අපිරිසිදුයි, මා අපිරිසිදුයි. මා පිරිසිදු වෙන්න උත්සාහ දරමින් සිටිනවා, හුරු වෙමින් සිටිනවා....'' හික්ෂුව දැසේ කඳුළු පුරවාගෙන කීවේය. රාහුල හාමුදුරුවන්ගේ දසුන හික්ෂුවගේ දැස් මානයෙන් ඉවත් වී ගියේය.

හික්ෂුව තම කරඬුව තම ඇඟිලිතුඩින් පිරිමදිමින් එහි සියුම් සිදුර නැවත සොයන්නට පටන්ගත්තේය.. එහෙත් එහි මතුපිට වැවෙමින් තිබෙන ලියවැල් මිස වෙන කිසිවක් හික්ෂුවගේ අතට හසු නොවුණේය..

රම්‍ය මාලිගාවේ නටබුන් දැකීමේ කැමැත්තෙන් ගිය හික්ෂුවට දකින්නට ලැබුණේ මහල් නවයකින් යුත් ඉතා අපූරු මාලිගාවකි. එහි බිත්ති ඉතා ඝන වූ අතර, සිදුරු රහිත බිත්ති වූයේය. ජනෙල් ඉතා කුඩා ඒවා වූවේය. ප්‍රධාන දොරටුවෙන් මාලිගාවට ඇතුළු වෙද්දී හික්ෂුව දුටුවේ එහි ඇතුළත බිත්ති රක්ත වර්ණ ගිනි දැල්වලින් සිත්තම් කර තිබෙන ආකාරයයි. සියලු බුමුතුරුණු කම්බිලියෙන් කරන ලද ඒවාය. ඒ මත පා තබා යෑමට හික්ෂුවට ලෝබකමක් ඇති වූයේය. බිම් මහලේ තැනින් තැන දැල්වෙන උඳුන්වලට අඟුරු ඇතුළු කරන රූපත් සේවිකාවෝ හික්ෂුව පැමිණි බවක් නොදැක ඔවුන්ගේ කාර්යයේ නියැලී සිටියෝය. හික්ෂුව ගිනි උඳුන ළඟට ගොස් තම දැත් උණුසුම් කරගෙන මහලින් මහල පසු කරමින් උඩුමහල දක්වා නැගගත්තේය. ගල් රූප බඳු වූ සේවකසේවිකාවන් දෙස හික්ෂුව මොහොතක් බලා සිටියද ඔවුන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් නැති තැන හික්ෂුව උඩුමහල්තලයේ සඳලුතලය දක්වා ගමන් කළේය.

එම සඳලුතලය දැඩි සීතල වාතයෙන් යුක්ත වූ අතර, එහි යසෝදරා දේවියත් පුතණුවනුත් මාලිගාව දෙසට වැටී ඇති මාවත දෙස බලා සිටියෝය.

'දෙයියනේ! මා මේ දකින්නේ සිහිනයක්ද? සැබැවක්ද? මෙය මා විශ්වාස කරන්නේ කෙසේද?' හික්ෂුව සිතන්නට වූවේය. පාෂාණීභූත ස්වරූපයක් පෙන්වූ සේවිකාවන් හැර යසෝදරා දේවිය සහ පුත් කුමරුන් පමණක් සවිඥානකව යමක් බලාපොරොත්තුවෙන් සිටින බව හික්ෂුවට දැනුණේය. ඔ හිස මුඩු කොට, ගුරුපාට වස්ත්‍රයක් ඇඳ සිටින්නීය. ස්වාමියා මළ දුකින් ළතැවෙන ඉන්දිය සාම්ප්‍රදායික ගැහැනියකගේ ස්වරූපය යසෝදරා වැනි බුද්ධිමත් කාන්තාවකට ලැබුණේ ප්‍රිය විප්‍රයෝගයෙන් ප්‍රසාරණය වූ සිත නිසායැයි හික්ෂුව විශ්වාස කළේය. ඇගේ දෙකන්පෙති පාළුවට ගොස් ඇත්තේය. නළල් තලයේ හිස් අවකාශය ශෝකයේ රැළි විසින් ග්‍රහණයට ගෙන තිබුණේය.

''කුමරියනි.... මේ දැඩි සීතල කවුළුව ළඟ මේ සත් වයස් දරුවා සමග කෙසේ පසු වන්නීද?''

''මා සත්වසක්ම මේ දරුවා සමග මේ කවුළුවෙන් ඇත පාර දෙස බලා සිටි බව ඔබ වහන්සේ නොදන්නෙහිද? මේ හේමන්ත ඍතුව අවසන් වී ගිම්හාන ඍතුව උදා වූ කාලයයි. බලන්න ගහකොළ පලබර වී ඇති සැටි. එහෙත් හේමන්තය, ගිම්හානය, වස්සාන කියන ඍතු කීයක් මා පසු කළාද මේ දරුවා සමග මේ සීමැදුරු කවුළුවෙන් එපිට බලාගෙන.''

''ඔබතුමිය බුදු රාජාණන් වහන්සේ එන තුරුද බලා සිටින්නේ?''

''නැත නැත. මා බලා සිටින්නේ මගේ ස්වාමියාත් මේ දරුවාගේ පියාත් එන තුරු.''

''කුමරියනි, සව් කෙලෙසුන් නැසූ බුදු පියාණන් වහන්සේ මිස ඔබට ඔබගේ සැමියා නැවත මුණ නොගැසෙන බව විශ්වාස කරන්න.''

"නැත. ඔබ බලා සිටින්න. මාගේ සැමියා මා සොයා එන අයුරු ඔබට දකගන්නට ලැබේවි."

"කුමරියනි කෝප නොගන්න.. අප වෙහෙසන තනිකම හුදෙකලාව සමාධියක් ලෙස සිතේ උපේක්ෂාව සමග පවත්වාගෙන යා හැකි බව ඔබට බුදු පියාණන් වහන්සේ කියා දේවි."

"මා ඒ හුදෙකලාව තනිකම මුදාහරින්නේ ශෝක ඇස් සහිතව මේ කවුළුව සමීපයට වී බව ඔබ වහන්සේ මගේ ස්වාමියාට කියන්න.. මට ඊට අවශ්‍ය වන්නේ භෞතික ප්‍රතිකාරයක් මිස ආධ්‍යාත්මික ප්‍රතිකාර්යක් නොවන බවත් කියන්න. දැන් මා සමීපයෙන් නික්ම යන්න. මට මේ හුදෙකලාව තනිකම විරහ ගීයක්. එය මට ගයන්න දෙන්න. ඒ ගායනාව මේ මුළු කපිලවස්තුව පුරාම ඇසෙන්න ඉඩ හරින්න. එය මාගේ සැමියා මේ පුරයට පැමිණ සිටින මේ මොහොතේ ඔහුට හොඳින් ඇසේවි."

භික්ෂුවට යසෝදරා කුමරිය ගැන සානුකම්පිත හැඟීමක් ඇති වන්නේය. රාහුල කුමරුත් තමා සමග නොදොඩන්නේ මන්දැයි භික්ෂුව සිතන්නට උත්සාහ කළේය.. ඒ රාහුල කුමරු දැඩි ශෝකයෙන් සිටින නිසා විය හැකියැයි සිතූ භික්ෂුව පහළමාලයට බසින්නට පියගැටපෙළ සමීපයට එද්දී සර්වාභරණයෙන් සැරසුණු කුමාරයෙක් වේගයෙන් පඩිපෙළ තරණය කරගෙන ඉහළ මාලයේ යසොදරාගේ කුටිය දක්වා ගමන් කළේය. ඒ සමගම යසෝදරාගේ සංවේගාත්මක ගී රාවය ඉකිබිඳීම් හඬ සමග රාවප්‍රතිරාව දුන්නේය... එය තමා ජීවිතයේ අමතක කරදමන්නට උත්සාහ දරන හඬම නොවේදැයි භික්ෂුව කල්පනා කළේය. ගස් දෙකක් සුළඟ නිසා එකට ඇතිල්ලෙමින් නගන පාළු මූසල හඬකින් පටන්ගන්නා ඒ හඬ විලාපයක්ව ශෝකී ගීතයක්ව නැවතත් භික්ෂුවට ඇසෙන්ට පටන්ගත්තේය. ඊට යසෝදරා කුමරියගේ හඬද එකතු වී ඇත්තේය.

භික්ෂුව පහළ මාලයට බැසීම නතර කොට නැවතත් යසෝදරා කුමරිය සිටි සඳලුතලය දක්වා ගමන් කළේය.

මීට මොහොතකට පෙර සිටි යසෝදරා කුමරිය වෙනුවට එහි සිටියේ කිඳුරියකි. ඇගේ ශරීරය නිරාවරණය වී තිබූ අතර, සර්වාභරණයෙන් සැරසී යසෝදරා සොයා පැමිණි කුමරා කිඳුරෙකුව සිටියේය. කිඳුරාගේ ශක්තිමත් බාහු මත සුරතල් වූ රාහුල කුමරු පියාගෙන් ආගිය තොරතුරු අතොරක් නැතිව විමසමින් පියාගේ පපුවේ රෝමකූපවලින් අදිමින්, පියාගේ නම්මුල් විකමින් තොඳොල් වූවේය. කිඳුරියගේ හිස ගැටපිච්ච මල්දාමයකින් වැසී තිබුණේය. ඒ මල්දාමය මොහොතකින් රක්තවර්ණ රුධිරයෙන් නැහැවී ගියේය.. කිඳුරා වහාම පුතු පසෙකට කොට ඇය සමීපයට පැමිණියේය. ඇගේ පපුව මත කිඳා බැස තිබූ හීය කිඳුරා පරිස්සමෙන් ගලවා දමද්දී අඩවන් වූ දෑස් සහිත කිඳුරිය ඔහුගේ නග්න පපුවට දෙතොල් තබාගෙන අප්‍රාණික ශරීරයේ බර කිඳුරාගේ දෑත් මතට මුදා හැරියාය. හීය විද්දේ කවුරුන්දැයි නොසෙවූ කිඳුරා ඇය වත්තන් කරගෙන යහන මත වාඩි වී ඇගේ හිස තම උකුළ තලය මත හොවාගත්තේය. දුදුරු වූ හදවතින් වහනය වන උණු රුධිරය නතර කිරීමට කිඳුරා තම දෙතොල් හී පහරින් සිදුරු වූ තැනට තබාගෙන උණුසුම් ප්‍රශ්වාස වාතය පිම්බේය. ස්වල්ප වේලාවකින් ලේ වහනය නතර වී ඇය සිහි ලබමින් සිටියාය. හිස දෙපසින් පහළට බේරෙමින් තිබූ අමු ගැටපිච්ච මල්දම ඕ ඇමුණුම් තුලෙන් ගලවා සඳලුතලයේ මිටි බිත්ති කණ්ඩිය මතට විසි කළා ය. එම ගැටපිච්ච මල්දම බිත්ති කණ්ඩිය මත සුළගේ තාලයට පැද්දෙමින් තිබුණේය. පංචසිඛ හේරුණ්ඩ වීණාව වයමින් සිටියේය. ගැටපිච්ච මල්දම මිටි බිත්තිය මත පැද්දෙන අයුරු භික්ෂුව බලා සිටියේය. පන්ති කාමරයක මිටි බිත්තියට බර වී ඉකිබිඳින ළදැරියකගේ රූපය භික්ෂුවට පෙනෙන්නට පටන්ගත්තේය.

හේරුණ්ඩ වීණාවේ තත් පිරිමැදෙන හඬ ඒ සමගම පැතිර සතර අතටම විහිද ගියේය. ශෝකී ගී රාවයේ හඬ සහ රිද්මය වෙනස් වූයේය. ඒ හඬ ප්‍රිය විප්‍රයෝගය අතහැර ප්‍රිය සම්ප්‍රයෝගය සමරන ගී හඬක් සහ තාලයක් බවට පත් වුණේය.

කිඳුරිය සුවපත් වූ ළයින් යුතුව නැගී සිටියාය. හේරුණ්ඩ වීණාවේ තාලයට පැද්දෙමින් තිබූ ගැටපිච්ච මල්දම භික්ෂුවගේ

මුහුණ මතට වැටුණේය. එහි නැවුම් සුවඳ භික්ෂුවගේ නාස්පුඩු මත තැවරෙද්දී හමා ගිය සිසිල් සුළඟින් භික්ෂුවගේ පපුවේ රෝම කූප නැළවෙන්නට පටන් ගත්තේය. නිල්වන් අහස ඝන වලාකුළකින් වැසී යද්දී නිදහස් අහසේ පියාසලන වැහිලිහිණි රංචුවක් සඳලුතලයේ එක් කවුළුවක් මත වැසුවෝය. වීණාවේ තත් පිරිමැදෙන හඬ අනුකරණය කළ වැහිලිහිණියෝ මිහිරි ගී ගැයුවෝය. කින්නරාවියගේ පා දැල් හඬත් වැහිලිහිණින්ගේ ගී හඬත් එකට මුසු වී ගියේය. අඳුරු සුදකින් වැසීගිය අහසින් පහළට රූරා හැලෙන මිහිදුම් සළුපටකින් හාත්පස වැසී ගියේය. භික්ෂුව තම නාස්පුඩුවලින් සමන්මල් සුවඳ දැඩිකොට ආඝ්‍රාණය කරගනිද්දී මල්දම භික්ෂුවගේ දෙඅත්ලටත් නාස්පුඩුවලටත් සිර වීමෙන් තෙරපුණේය. තෙරපීමෙන් පෙති පොඩි වන ගැටපිච්ච මලින් වහනය වූ සුවඳ තමාට ජීවිතයේ මින් පෙර කිසිම දිනක දැනී නොතිබුණු බව භික්ෂුවට වැටහී ගියේය. හේරුණ්ඩ වීණාවේ උද්වේගකර තාලය ක්‍රමයෙන් සිහින් ස්වරයකට හැරෙද්දී මිහිදුම් පටලය මැදින් අහස් කුසට ඇදීගිය වැහිලිහිණි රංචුවේ පියාසර හඬ භික්ෂුවගේ කන්පතුල් මතින් හෘදයවස්තුව දක්වා ගමන් කළේය.

භික්ෂුව තදින් හුස්ම ඉහළට ඇද්දේය; පහළට හෙළුවේය... පියාගත් දැස් නැවත නොහැර සිටියදී භික්ෂුවට ඇසුණේ උදාන වාක්‍යකි...

"මම නිමා කළෙමි... මම නිමා කළෙමි... එහි නිරාමිස සුවය මම අත්විඳිමි.." ඒ හඬ උඩුගුවනේ දෝංකාර දෙද්දී භික්ෂුව දුටුවේ රම්‍ය මාලිගාවේ සිට අහසින් වඩින යසෝදරා රහත් තෙරණියයි....

භික්ෂුව තම ගමන්මල්ලේ ඇති කරඬුව දෑතින් ස්පර්ශ කළේය... ඒ සමගම අනෙක් ගමන්මල්ලේ ඇති පැන්සල් කැබැල්ල වෙත ඉබේම භික්ෂුවගේ අත ගියේය...

"මම ඔලාරිකයි.... මම ඔලාරිකයි.... ඇයි මට මේක තවම වීසි කරන්න බැරි වුණේ.... එදා රෑ මං මේක වීසි කළා නේද? ඒක වීසි කළා නම් කොහොමද උදේ මල්ලෙ තිබුණේ...? එක්කෝ

ආපහු මං නින්දෙන්ම ඒක මල්ලෙ ඔබාගත්ත ඇති..." භික්ෂුව නොයෙක් දේ සිතමින් ඇවිද්දේය.. භික්ෂුවට නන්ද කුමරුන් සිහිපත් වේ. ඒ සමගම ජනපද කල්‍යාණියගේ රූපය දර්ශනය වේ... ඇගේ දුක්බර ආයාචනය ඇසේ..

"ආර්ය කුමරුනි, ගිය සැණින් එන්න. මා බලා සිටිනවා ඔබ එන තුරු.."

"කුමරුනි, මා බලා සිටිනවා... ඔබ තවම නැහැ."

"කුමරුනි, එන්න."

"එන්න."

"එන්න."

භික්ෂුවට නැවතත් ශෝකී හඬක් ඇසෙන්නේය. ඒ හඬ හා මුසුව මිටිතාප්පයේ එල්ලී ඉකිබිඳින දැරියකගේ රූපය පෙනෙන්නේය.

"නන්ද.... මිනිස් රූප බිම අඳිනඑක හොඳ නෑ.. එය නොකළ යුත්තක්."

ලජ්ජාවට පත් නන්ද හිමියෝ ඇඟිලි තුඩින් බිම අඳිමින් සිටි ජනපද කල්‍යාණියගේ රූපය මකාදැම්මෝය.

"මම සිවුරු අතහැර යනවා ස්වාමීනි....."

"ඇයි... ඒ....?"

"මා එන තුරු ජනපද කල්‍යාණිය බලා සිටිනවා...."

"ඇය ගොඩක් ලස්සනද?"

"එහෙමයි. ගොඩාක් ලස්සනයි...."

"එන්න මා සමග..." භික්ෂුවට බුදුරදුන් සමග පසුපසින් යන නන්ද හිමියන්ගේ රූපය පෙනෙන්නේය.

"දිව්‍ය අප්සරාවන් පන්සියයක් ලබාගැනීමේ අරමුණින් භාවනා කරල කෙනෙකුට නිවන් අවබෝධ කරගන්න පුළුවන්ද?" භික්ෂුවගේ සිතේ පැනයක් මතු වන්නේය.

මුහුණ මතට වැටුණේය. එහි තැවුම් සුවඳ භික්ෂුවගේ නාස්පුඩු මත තැවරෙද්දී හමා ගිය සිසිල් සුළඟින් භික්ෂුවගේ පපුවේ රෝම කූප නැළවෙන්නට පටන් ගත්තේය. නිල්වන් අහස සත වලාකුළකින් වැසී යද්දී නිදහස් අහසේ පියාසලන වැහිලිහිණි රංචුවක් සඳලුතලයේ එක් කවුළුවක් මත වැසුවෝය. වීණාවේ තත් පිරිමැදෙන හඬ අනුකරණය කළ වැහිලිහිණියෝ මිහිරි ගී ගැයුවෝය. කින්නරාවියගේ පා දැල් හඬත් වැහිලිහිණින්ගේ ගී හඬත් එකට මුසු වී ගියේය. අඳුරු සුදකින් වැසීගිය අහසින් පහළට රූරා හැලෙන මිහිදුම් සළුපටකින් හාත්පස වැසී ගියේය. භික්ෂුව තම නාස්පුඩුවලින් සමන්මල් සුවඳ දැඩිකොට ආඝ්‍රාණය කරගනිද්දී මල්දම භික්ෂුවගේ දෙඅත්ලටත් නාස්පුඩුවලටත් සිර වීමෙන් තෙරපුණේය. තෙරපීමෙන් පෙති පොඩි වන ගැටපිච්ච මලින් වහනය වූ සුවඳ තමාට ජීවිතයේ මින් පෙර කිසිම දිනක දැනි නොතිබුණු බව භික්ෂුවට වැටහී ගියේය. හේරුණ්ඩ වීණාවේ උද්වේගකර තාලය ක්‍රමයෙන් සිහින් ස්වරයකට හැරෙද්දී මිහිදුම් පටලය මැදින් අහස් කුසට ඇදීගිය වැහිලිහිණි රංචුවේ පියාසර හඬ භික්ෂුවගේ කන්පතුල් මතින් හෘදයවස්තුව දක්වා ගමන් කළේය.

භික්ෂුව තදින් හුස්ම ඉහළට ඇද්දේය; පහළට හෙළුවේය... පියාගත් ඇස් නැවත නොහැර සිටියදී භික්ෂුවට ඇසුණේ උදාන වාක්‍යකි...

"මම නිමා කළෙමි... මම නිමා කළෙමි... එහි නිරාමිස සුවය මම අත්විදිමි.." ඒ හඬ උඩුගුවනේ දෝංකාර දෙද්දී භික්ෂුව දුටුවේ රම්‍ය මාලිගාවේ සිට අහසින් වඩින යසෝදරා රහත් තෙරණියයි....

භික්ෂුව තම ගමන්මල්ලේ ඇති කරඬුව දැතින් ස්පර්ශ කළේය... ඒ සමගම අනෙක් ගමන්මල්ලේ ඇති පැන්සල් කැබැල්ල වෙත ඉබේම භික්ෂුවගේ අත ගියේය...

"මම ඕලාරිකයි.... මම ඕලාරිකයි.... ඇයි මට මේක තවම වීසි කරන්න බැරි වුණේ.... එදා රෑ මං මේක වීසි කළා නේද? ඒක වීසි කළා නම් කොහොමද උදේ මල්ලෙ තිබුණේ...? එක්කො ආපහු මං නින්දෙන්ම ඒක මල්ලෙ ඔබාගන්න ඇති..." භික්ෂුව නොයෙක් දේ සිතමින් ඇවිද්දේය.. භික්ෂුවට නන්ද කුමරුන් සිහිපත් වේ. ඒ සමගම ජනපද කල්‍යාණියගේ රූපය දර්ශනය වේ... ඇගේ දුක්බර ආයාචනය ඇසේ..

"ආර්ය කුමරුනි, ගිය සැණින් එන්න. මා බලා සිටිනවා ඔබ එන තුරු.."

"කුමරුනි, මා බලා සිටිනවා... ඔබ තවම නැහැ."

"කුමරුනි, එන්න."

"එන්න."

"එන්න."

භික්ෂුවට නැවතත් ශෝකී හඬක් ඇසෙන්නේය. ඒ හඬ හා මුසුව මිටිතාප්පයේ එල්ලී ඉකිබිඳින දැරියකගේ රූපය පෙනෙන්නේය.

"නන්ද.... මිනිස් රූප බිම අඳිනඑක හොඳ නෑ.. එය නොකළ යුත්තක්."

ලජ්ජාවට පත් නන්ද හිමියෝ ඇඟිලි තුඩින් බිම අඳිමින් සිටි ජනපද කල්‍යාණියගේ රූපය මකාදැම්මෝය.

"මම සිවුරු අතහැර යනවා ස්වාමීනි....."

"ඇයි... ඒ....?"

"මා එන තුරු ජනපද කල්‍යාණිය බලා සිටිනවා...."

"ඇය ගොඩක් ලස්සනද?"

"එහෙමයි. ගොඩාක් ලස්සනයි...."

"එන්න මා සමග..." භික්ෂුවට බුදුරදුන් සමග පසුපසින් යන නන්ද හිමියන්ගේ රූපය පෙනෙන්නේය.

"දිව්‍ය අප්සරාවන් පන්සියයක් ලබාගැනීමේ අරමුණින් භාවනා කරල කෙනෙකුට නිවන් අවබෝධ කරගන්න පුළුවන්ද?" භික්ෂුවගේ සිතේ පැනයක් මතු වන්නේය.

''පුළුවන්. මා අතෘප්තිය නිමා කළේ තෘප්තියේ මනෝමය රූපයක් හිත ඇතුළෙ තබාගෙන එය මට ලැබෙන තෑග්ගක් ලෙස සිතාගෙන, අනුන් පෙන්නපු අරමුණක් වෙනුවෙන් අනුන් වර්ණනා කරන අරමුණක් වෙනුවෙන් මම ගමන් කළා, මගේ තෘප්තියේ තෑග්ග ලබාගැනීම සඳහා... එහෙත් ඒ ඉලක්කයට ගිය පසු තෑග්ග මට අවශ්‍ය නැති වුණා..''

''එහෙමයි.....'' භික්ෂුව දෑත් එකතු කොට නන්ද රහතන් වහන්සේට වන්දනා කළේය...

පැන්සල් කැබැල්ල කරඬුව ඇති ගමන්මල්ලේ තිබුණාට වරදක් නැතැයි භික්ෂුවට සිතෙන්නේය. භික්ෂුව හදිසියේ යමක් මතක් වූවකු ලෙස වම් කරේ ගමන් මල්ලට අත දමා පැන්සල් කොටය ගෙන එය කරඬුව තිබූ මල්ලේ ඔබාගත්තේය... එහෙත් මල්ල හිස් වී තිබුණේය.

''දෙයියනේ කරඬුව..!'' කරඬුව එහි නොතිබුණේය. භික්ෂුව අනෙක් මල්ලට අත දමා බැලුවේය.. කරඬුව එහිත් නැත.... භික්ෂුව බිම ඉඳගත්තේය...

''අනේ! ඔබ වහන්සේ, මට පැවරූ වගකීම මං ඉටු කරන්නේ කොහොමද? කරඬුව පැහැරගෙන. එය දේවදත්ත හාමුදුරුවො මායාබලෙන් පැහැරගෙන. අනේ මට කමා කරන්න කොණ්ඩඤ්ඤ හාමුදුරුවනේ...'' භික්ෂුව මැසිවිලි නැගුවේය..

''අනේ මේ ශාසනය භාර මහා විෂ්ණු දෙවියන්ටවත් පෙනුණෙ නැද්ද? මේ අපරාදෙ...''

''ඇයි ඔබ බියට පත් වෙලා? මේ තියෙන්නෙ කරඬුව....... අපි වජ්ජිපුත්තක භික්ෂූන්. අපි වෙනම සංගායනාවක් කළා.... එතනට මේ කරඬුව අප අරගෙන ගියා. අමනාප නොවන්න. එය ආපසු භාරදෙන්නයි අපි ආවේ.'' භික්ෂුව කෝපයෙන් එම භික්ෂූන් දෙස බලුවේය...

''ඔබ වහන්සේලා ඇයි එහෙම කළේ.... ඔබ වහන්සේලා කළේ හොරකමක්! මේ කරඬුව අපිරිසිදු කළා නේද?''

''නෑ බලන්න...'' ඔවුහු කරඬුව භික්ෂුව අතට දුන්නෝය... කරඬුව ඉතා දීප්තිමත් වී තිබුණේය. එහෙත් එහි අලුත් කැටයම් ලියවැල් ඉතා අලංකාර ලෙස නෙළා තිබුණේය. එය තවත් බරින් වැඩි වී තිබුණේය.

භික්ෂුව නිහඬව කරඬුව භාර ගත්තේය... ඉන් පසු භික්ෂුව ඔවුන්ගේ මුහුණවත් නොබලා එය උරමල්ලේ තැන්පත් කොට උර මල්ල දකුණු උරයේ එල්ලා ගත්තේය... එම උරය හොඳටම බර වී ඇත්තේය. කරඬුව කොණ්ඩඤ්ඤ හිමියන්ගෙන් භාර ගැනීමේදී තිබූ සැහැල්ලුව දැන් එහි නොමැත්තේය. මහා බරක් තම කර මත ඇති බව දැන් භික්ෂුවට දැනෙන්නේය.

''හාමුදුරුවනේ,'' යි ගුප්ත භික්ෂුවට ආමන්ත්‍රණය කළේය. භික්ෂුව ඒ වන විට නටබුන් අතර සිටියේය. මහා ස්වප්නයකින් ඇහැරුණු භික්ෂුව ගුප්ත දෙස මොහොතක් බලා සිටියේය.. ගුප්තගේ ස්වරූපය වෙනස් වී තිබුණේය. සැබවින්ම මේ තමා කරත්තයෙන් මෙතෙක් රැගෙන ආ ගුප්ත නොවේ. ඔහු ගුප්ත නොවන්නේද නොවේ..

''නගින්න හාමුදුරුවනේ කරත්තයට'' ගුප්ත සමග තර්ක කරන්නට, වාද කරන්නට භික්ෂුවට දැන් නොසිතේ... ඔහු ශාන්ත ස්වරූපයකින් යුත් රූපයක හිමිකරුවෙකු වී සිටින්නේය. ඔහුගේ මුහුණේ ගැඹුරු පෙනුමක් ඇත්තේය. තළල් තලයේ රැළි ප්‍රඥාව පහළ කරගැනීම සඳහා කාල්පනික ලෝකයේ සිටි පුද්ගලයෙකුගේ මහලු නළල් රැළිවලට සමානය. භික්ෂුව කතාවකින් තොරව කරත්තයේ වාඩි වුණේය.

ඉතා ඝන සිසිල් වාතය කපාගෙන කරත්තය වේගවත් ගමනක යෙදුණේය. අශ්වයා ඉතා වැදගත් ගවේෂණ ගමනක යෙදෙන ගවේෂකයෙකුගේ ස්වරූපයෙන් කරත්තය ඇද්දේය. එහෙත් මේ ගමන බිමින් නොව, උඩින් යන ගමනක් බව භික්ෂුවට දැනුණේය. ගුප්ත තමා මායාකාරී ගමනක ගෙනයන්නේය යන සිතිවිල්ලද භික්ෂුවට ඇති වුණේය.. ගමනාන්තයේදී භික්ෂුවට දකින්නට ලැබුණේ සීත පරිසරයක මහා පෝලිමක සිටින කිඳුරුකිඳුරියන් පිරිසකි. ඔවුන් සෑම කෙනෙකුගේම ළය හීයකින් පසාරු වී ගොස්

තිබුණේය. එහෙත් ඉන් වැහෙන ලේ සීතලට ඝන වී තිබුණේය. ඔවුහු පෝලිමකට එක් වී සිටියෝය. තමා මේ දකින්නේ මීට මොහොතකට පෙර යසෝදරා කුමරිය විසූ රම්‍ය මාලිගාවේදී දුටු කිඳුරාට සහ කිඳුරියට සමාන තවත් කිඳුරුකිඳුරියන් සමූහයක් නොවේදැයි සිතුණේය.

"හාමුදුරුවනේ, මේ කොහේද කවදාද කියල ඔබ වහන්සේ දන්නවාද?"

නැතැයි අඟවන්නට භික්ෂුව හිස සැලුවේ ය.

"නීතිගත සියදිවි නසාගන්නන්ගේ පෝලිම මේ."

"උඹට පිස්සු!" භික්ෂුව කීවේය.... ගුප්ත සුපුරුදු උපහාස සිනාවෙන් සංග්‍රහ කොට ඉවතට ගියේය. භික්ෂුව තමා අතරමං වී ඇතැයි බිය ගත්තේය. ලෝකයේ සියලු ආගම් නියෝජනය කරන සර්වාගමික නිකායිකයෝ මේ පෝලිමට පිටින් සිට පෝලිමේ සිටින පිරිස වෙතට පිංකැට අල්ලාගෙන සිටියෝය.

"අවසන් පරිත්‍යාගය අප වෙත කරන්න" එම ආගමික නියෝජිතයෝ පිරිස දැනුවත් කෙරුවෝය. තම අවසන් කාසිය පිංකැටවලට දමන්නන්ගේ සිත් තුළ එම අවසන් කාසිය වෙනුවෙන් හටගත් ලෝබකමක් තිබෙන්නේයැයි අනුමාන කළ නොහැකි ලෙස ඔවුහු නිහඬ ඉරියව් පෑවෝය. ස්වර්ගය හෝ විමුක්තිය පිළිබඳව තම සිතේ පැලපදියම් වූ අවිශ්වාසය මුසු වූ විශ්වාසයක් ඔවුන්ගේ සිත් තුළ ඇතැයි ගුප්ත භික්ෂුවගේ කනට කර කීවේය.

"මට තේරෙන්නෙ නෑ මේ මොනවද වෙන්නෙ කියල" භික්ෂුව රහස් හඬින් කීවේය..

"විමුක්තිය, ස්වර්ගය හෝ අවසන් සැපත වෙනුවෙන් ඔවුන් තුළ තිබූ ජීවිත විශ්වාසයන් සියල්ල ඔවුන් අතේ ඇති අවසන් කාසියටවත් ලබාගත හැකියැයි විශ්වාස කිරීම භයානක විශ්වාසයක් නෙමෙයිද හාමුදුරුවනේ? ඒ මාර්ගය කියා දුන්නෙ කවුද? ඒ මාර්ගයේ අයිතිකාරයා කවුද හාමුදුරුවනේ?"

"කරත්තකාරයෝ. උඹ කතා කරනවා බොහෝම වැඩි... උඹ මාව නොමග අරින්න හදනවා වගෙයි..."

"නෑ හාමුදුරුවනේ, බලන්න අවසන් කාසිය පරිත්‍යාග කරන මිනිසුන්ගේ මුහුණු මත ලියවී ඇත්තේ විශ්වාසයත් සැකයත් අතර හැඟීමක් නෙමෙයිද? ඒ සැකය විමුක්තිය හෝ ස්වර්ගය ගැනද? නැති නම් මාර්ගය ගැනද හාමුදුරුවනේ?"

භික්ෂුව නිරුත්තරව පෝලිම දෙස බලා සිටියේය. පෝලිමේ කෙළවරේ එක් තැනක පුටුවක අත් මේස් පැලඳගත් උඩුකය නිරාවරණය වූ පුද්ගලයෙක් සිටියේය. මේ පෝලිම සැදී ඇත්තේ ඔහුගේ අවසන් සංග්‍රහය ලබාගැනීමේ අරමුණින් බව භික්ෂුවට දැන් ප්‍රත්‍යක්ෂය. ඔහුගේ රූපය තමා කුඩා කාලයේ පොතකින් දුටු පෘථිවිය ඔසවාගෙන සිටින ඇට්ලස් යෝධයාගේ රූපයට බෙහෙවින් සමාන බව භික්ෂුවට සිතුණේය.. ඔහුගේ අතේ එන්නත් කටුවක් තිබුණේය. පෝලිමේ සිටින කිඳුරුකිඳුරියෝ තම වාරය පැමිණි පසු ඔහු ළඟට ගමන් කරති. එසේ ගමන් කරද්දී ආගමික නායකයෝ ඔවුන්ගෙන් අවසන් පරිත්‍යාගය ලබාදෙන ලෙස ඉල්ලා සිටිති. තම අවසන් කාසියත් ආගමික නායකයන්ට පූජා කරන පිරිස එකිනෙකා පසුපසින් ගොස් එන්නත ලබාගනිති. එන්නත විදගන්නා පිරිස් වැඩි දුරකට නොගොස් මහපොළොව බදාගෙන වැතිරෙති. එම මිනී සමූහ මිනීවළක තැන්පත් කිරීම සඳහා ආණ්ඩුවේ ඩෝසර් යන්ත්‍ර ට්‍රැක්ටර් ආදිය යොදා තිබෙන්නේය.

"මේ මොකද්ද මං දකින්නෙ? මෙහෙම දෙයක් වෙන්න පුළුවන්ද? ගුප්ත, මේක උඹේ මායාවක් නේද?" භික්ෂුව නිහඬ බව බිඳිමින් ප්‍රශ්න කළේය...

"දෙයියනේ! අපේ මිනිස්සුත් මේ පෝලිමේ ඉන්නවා! මුන්ට පිස්සුද?" භික්ෂුව එම පෝලිමේ සිටි ලාංකිකයැයි හඳුනාගත් පිරිස වෙතට ගියේය.

"උඹලට තියෙන ප්‍රශ්නයක් මා එක්ක කියහල්ල. මොකද්ද මේ කරගන්න අපරාධෙ? උඹලට දරුමල්ලො නැද්ද? අනික මෙහෙම මැරෙන්න තරම් උඹලට තියෙන ප්‍රශ්න මොනවද?

උඹල ජීවිතේට පන්සලකට පල්ලියකට කෝවිලකට ගියපු ඇයො නෙමෙයිද?" භික්ෂුව උස් හඬින් අසද්දී ඔවුහු භික්ෂුවට සරදම් සිනාවකින් සංග්‍රහ කළෝය. එම සිනාව ගුප්ත තුළිනුත් පංචසිඛ තුළිනුත් තමා දක්ක සිනාවට සමාන බව භික්ෂුවට වහා අවබෝධ වුණේය.

"කතා කරපල්ලා යක්කුනේ, උඹලට පිස්සුද?"

ඔවුන්ගෙන් උත්තරයක් භික්ෂුවට නොලැබුණේය.. ඔවුහු මරණයේ ආස්වාදය විඳිම පිණිස පෝලිමේ පෙරමුණට එන්නට පමා වීමේ පසුතැවිල්ලෙන් පමණක් පසු වූවෝය. භික්ෂුව කනස්සලු සිතින් ගුප්ත දෙස බලා සිටියේය.

"මේ පෝලිමේ ඉන්න ඔක්කෝම මිනිස්සු කිඳුරුකිඳුරියන් වගේ. ඔවුන්ගේ ළය හි පහර වැදී සිදුරු වී ඇති සැටි උඹට පේනවාද ගුප්ත?"

"ඔව් හාමුදුරුවනේ."

"අනේ ඇයි ඒ මිනිස්සු අර දදුරු වෙච්ච හදවතට රිංගන ඉහඳයන්ව පන්නා දමන්නෙවත් නැත්තෙ..? ඔවුන්ට වේදනාවක් දැනෙන්නැද්ද?"

"ඔවුන් ඒ ඉහඳයන්ට ඉඩ දී තම වාරය එන තෙක් බලා සිටින්නේ සුවදායක මරණයක් වෙනුවෙන්."

"මරණය සුවදායක වෙන්නෙ කොහොමද බං."

"නැති නම් ඔවුන් මෙතරම් ප්‍රීතියෙන් ඔවුන්ගේ වාරය එන තෙක් බලා සිටීවිද?"

"අපටවත් ඔවුන්ව මේ මරණයෙන් බේරාගන්න බැරිද? ගුප්ත මට මහා කණගාටුවක් දැනෙන්නෙ. අර අන්තිම කාසිය එකතු කරන ආගමික නියෝජිතයන්ටවත් බැරිද මේ මිනිස්සුන්ට ජීවිතේ තියෙන වටිනාකම කියා දෙන්න?"

"ඔවුන් කකුත්ථා නදියෙන් එතෙර වෙන්නට ගොස් අතරමංව ගිය පිරිසයි හාමුදුරුවනේ."

"කකුත්ථා නදියෙන් එතර වෙන්න ගිය පිරිස..?"

"ඔව් හාමුදුරුවනේ.... ඒ ගඟ අසබඩට අපි යනවා නේ.. අපි දැන් යමු.... ඔබ වහන්සේගේ වන්දනාවට ප්‍රමාද වෙනවා. අපට ලුම්බිනියට යන්න තියෙන කාලය අපතේ යනවා.."

ගුප්ත පළමුව කරත්තයට නැංගේය. භික්ෂුව සිකරු බවක් පෙන්නමින් කරත්තයේ ඉඳගත්තේය. මෙතැන සිට ලුම්බිනියට තව කොතරම් දුරක් ඇද්දැයි යන ප්‍රශ්නයවත් භික්ෂුවට අසන්නට සිත් නොදේ. භික්ෂුවගේ සිත තෝන්තුවා වී ඇත්තේය. දයාව අනුකම්පාව කණගාටුව පසුතැවිල්ල ආදී සියල්ලකින් යුක්ත සිතකට දැන් භික්ෂුව හිමිකම් කියන්නේය. ඒ සිත, පසුතැවිලි වූ සිත පමණක් ජීවත් වීම සඳහා ප්‍රමාණවත් වේදැයි භික්ෂුවට අසන්නට කෙනෙක් නොසිටියේය. රජ්ජුමාලාලා, කිසාගෝතමීලා, පටාචාරලා ආදී බොහෝ පිරිසකට නැකම් කියන කින්නරකින්නරාවියන් සමූහයක් තමාගේද සහාය ඇතිව අපායට තල්ලු කර හරින ශෝචනීය පරිසරයක් පසු කර තමා පලායන්නේයැයි යන හැඟීම භික්ෂුවට තිබෙන්නේය.

5.

ලුම්බිනි උයනින් හමා එන සල්මල් සුවඳ මුසු වූ මඳනලින් භික්ෂුව ළය පුරවාගත්තේය... තමා කොතරම් කාලයක් කොතරම් දුරක් ගෙවා ලුම්බිනියට පැමිණියේදැයි භික්ෂුව නොදත්තේය.

බෝසත් උපත සිදු වූ තැන නැරඹීමට භික්ෂුව ගුප්ත සමග ගියේය. භික්ෂුව දුටුවේ මායා දේවියගේ ගෙවී ගිය ගල් ප්‍රතිමාවයි. එය ගෙවී ගොස් ඇත්තේ දරු ඵල නොලත් අම්මලා එම පිළිමය උරච්චි කර වතුර බීම නිසායැයි ගුප්ත කීවේය..

භික්ෂුව කල්පනා කරමින් ඒ ගෙවී ගිය මායා දේවියගේ පිළිරුව දෙස බලා සිටියේය. භික්ෂුවගේ ඇස් අඩවන්ව ගියේය.

අඹගස් එකට ඇතිල්ලෙන හඬ නැවතත් භික්ෂුවට ඇසෙන්නට පටන්ගත්තේය. මිටිතාප්පයකට බර වී බඩගින්නට ඉකිබිඳින දූරියගේ ඉකිබිඳුම් හඬත් ඒ සමගම ඇසෙන්නට වූයේය. ඒ දූරියගේ අත් අල්ලාගත් දහස් ගණන් ළමයි ඒ ඉකිබිඳුම හඬට එකතු වූවෝය. ඒ ළමයින්ගේ අත් අල්ලාගත් තරුණතරුණියෝද වැඩිහිටියෝද ඒ ඉකිබිඳුම් හඬම නැගුවෝය. ඒ හඬ ක්‍රමයෙන් අදෝනාවක් වූයේය. ඒ අදෝනාව අහස්තලය පුරා පැතිරී ගියේය. රජුගේ මාලිගාවේ ඉහළ අහස මේ අදෝනා හඬින් පිරී ගියේය.. රජු වහවහා නිමිති බලන්නන් කැඳෙව්වේය. බමුණන් කැඳෙව්වේය. පුරෝහිතයන් කැඳෙව්වේය. පණ්ඩිතයන් කැඳෙව්වේය. ඒ සියලු දෙනාගෙන්ම මේ අදෝනාවේ පල විපාක ඇසුවේය. ඔවුහු සියලු දෙනා ඒ අදෝනා හඬ රජුගේ මංගල නිමිති වළකාලන මූසල හඬක් බවත්, රජුට අසුභ බවත් ඒ හඬ නතර කිරීමට වඩා කළ හැක්කේ සමනය කිරීම බවත් කියා සිටියෝය.

ඔවුහු රජු සඳලුතලයට කැඳවාගෙන ගොස් පහළ අදෝනා නගන්නන් පෙන්නමින් පිළිවෙත් කීවෝය. ඒ නිමිත්ත පාඨකයන්ගේද පුරෝහිතයන්ගේද පණ්ඩිතයන්ගේද බමුණන්ගේද උපදෙසින් රජු රාජ ගබඩාවේ මිදිගබඩාව විවෘත කොට දුන්නේය. රාජපුරුෂයෝ එයින් රිසි සේ මිදි ගෙන යුෂ සෑදූවෝය. හදන හදන යුෂ බඳුනේ දිය නොමුසු නොයිඳුල් කොටස රජුටම වෙන් වුණේය. තවත් කොටසක් රාජපුරුෂයන්ටද බමුණන්ටද පුරෝහිතයන්ටද නිමිත්තපාඨකයන්ටද වෙන් කරගත්තෝය.. ඉතිරිය දිය සමග මුසු කොට ඉහළමාලයේ සඳලුතලයේ කවුළු දොර එළිපත්තේ සිට පහළ අදෝනා නගන්නන්ගේ කටවල් මත හෙළුවෝය. අත් දිග උන් කකුල් දිග උන් ඉහළට දෝත් පා ඒ මිදියුෂ අහසේදීම අත්පත් කරගත්තෝය. උන් තම දරුවන්ටද ඒ මිදියුෂ පොවමින් උන්ද බොමින් තවතවත් දෝත් ඉහළට ඔසවමින් ඒ මිදියුෂ එකතු කළෝය. මිටි උන් උස උන්ගේ ඇඟිලිකරු අතරින් පෙරී බිමට වැටෙන මිදියුෂ බිඳකින් උන්ගේ දරුවන්ගේ කුස තෙමා උන් බඩගින්නේ සිට විලාප නැගුවෝය. උස උන් අදෝනා නවතමින් රජුට ස්තුති ගී කියන්නට පටන්ගත්තෝය. මිටි උන්ගේ අදෝනා යටපත් වී, උස උන්ගේ ස්තුති ගී රාව රජුගේ උඩුමහල්තලය දක්වා ඇසෙන්නට පටන්ගත්තේය. සතුටෙන් ඉපිලී ගිය රජුගේ අණින් රාජපුරුෂයෝ ඒ මිදි යුෂ තවතවත් පහළ හෙළුවෝය. උස උන් තවතවත් මිදියුෂ එකතු කරගත්තෝය. මෙයින් කෝපව ගිය මිටි උන් උස උන්ගේ පා කොනිත්තන්ට පටන්ගත්තෝය. ඒ නියපොතුපහරවල් පයින්ම මඩිමින් උස උන් මිදියුෂ එකතු කරමින් ස්තුති ගීතම ගැයුවෝය. එයින් කෝප වූ මිටි උන් උසවුන්ගේ ස්තුති ගී යටපත් වන ලෙස මහහඬින් කැගසන්නට පටන්ගත්තෝය. වැලපුම් හඬ සමග කලහ හඬ අහසේ නැගෙන දරුණු ගෙරවුම් හඬක් සේ අහස් තලය වසාගත්තේය. ඒ හඬින් බිය වූ රජු නැවතත් උපදෙස් පැතුවේය. තලල් මත අළු තවරාගත් භික්ෂූහුද බමුණෝද තමන්ට කළ හැකි වෙනම කාරියක් ගැන රජුට උපදෙස් දුන්නෝය. මේ හඬ රජුගේ මංගල නිමිති වනසාලන මූසල හඬක්ම බවත් රජුගේ අවසරය සහ අනුග්‍රහය ලැබෙන්නේ නම් ඒ හඬ ශුද්ධ වූ ඕම්කාරයක් කොට රජුටම ආශිර්වාද සලසාගත හැකි බවත්

තළල් මත අළු තවරාගත් මේ බමුණෝ කීවෝය. ඒ මූසල හඬ ශුද්ධ වූ ඕමකාරයක් කොට තමාට ආශීර්වාද සලසන්නේ නම් බමුණන්ට දහසින් බැඳි පියල්ලෙන් සැලකීමට රජු ගිවිසියේය. බමුණෝ සියදහස් ගණන් වීණා හඬවල් ඒ භයානක හඬට මුසු කළෝය. එයින් එහි උද්වේගකර බව නැතිව ගියේය.. වැලපුම බර නැතිව ගියේය. ඒ හඬ යටපත් කරමින් වීණා හඬ වැඩිපුර රජුට ඇසෙන්නට පටන්ගත්තේය. රජු බමුණන්ට සහාය පිණිස ගායකයන්ද කැඳෙව්වේය. වාදකයන්ද කැඳෙව්වේය. නළුවන්ද නිළියන්ද කැඳෙව්වේය. ඔවුහු මිදියුෂ බොමින් ගැයුවෝය.. වැයුවෝය.. නැටුවෝය.. අහස වසාගත් ඒ භයංකාර හඬද වැලපීම හඬද ශුද්ධ වූ ඕම්කාරයක් ලෙසින් රජුට ඇසෙන්නට පටන් ගත්තේය.. රජු දහසින් බැඳි පියලි දෙමින් උන් එම කාරියේම දිගින් දිගටම යෙදෙව්වේය.

අදෝනා නගන්නන්ගේ පෙරමුණේ සිටියෝ තවත් කෝපව ගියෝය. ඒ කෝපය ඔවුහු විවිධ ලෙස මුදාහැරියෝය.. රජු එයින් දැඩි කෝප ගත්තේය. කෝප වූ රජු තමාගේත් තම රාජ්‍යයේත් ආරක්ෂාව වෙනුවෙන් තනි තීරණම ගත්තේය. රාජපුරුෂයන්ට නියෝග නිකුත් කළේය. රාජපුරුෂයෝ මේ අදෝනාකරුවන්ගේ පෙරමුණේ සිටි පිරිසට දෙතිස් වද දුන්නෝය. ඒ දෙතිස් වදයෙන් පීඩා වූවෝ විලාප නැගුවෝය.

ඒ හඬට තවත් දහස් ගණන් හඬවල් එකතු වූයේය. තරුණ බාල මහලු හඬවල් සමග ඒ විලාපය මුසු වී මහා විලාපයක්ම වූයේය. ඒ විලාප නගන්නෝ මායාපිළිමය නැවීම සඳහා තම දෙතන් මිරිකමින් කිරි සෙව්වෝය. කිරි සිඳී ගිය දෙතන්වලින් රුධිරයම ගලා ආවේය. ඔවුහු එයින් මායාපිළිමය දෝවනය කළෝය.

මායා දේවියගේ සිරුර තෙමාගෙන ගලා යන ඒ රුධිරය ඒ සියලු දෙනාගේ කඳුළු සමග මුසු වී ගියේය.. ලේ පැහැය ක්‍රමයෙන් සුදුපැහැයට හැරුණේය. මායා දේවියගේ පියවුරු තෙමාගෙන වැහෙන ඒ කිරි කඳුළකින් එක් පුංචි කුමාරයකුගේ දෙතොල් තෙමී ගියේය... එයින් ආශ්වාස ප්‍රශ්වාස උරුමය ලැබූ කුමරා පියවර හතක් ඉදිරියට ගියේය. එකෙණෙහිම ඒ මහා විලාපය සාධුකාර හඬක් බවට පරිවර්තනය වූයේය. භික්ෂුවද ඒ සාධුකාර දීමට හවුල් වූවේය. ඒ සාධුකාර හඬ මැද්දේ හත්වන පියවර දක්වා පැමිණි කුමාරයා තමා ලෝකයට අග්‍ර වන බවත්, ජ්‍යෙෂ්ඨ වන බවත්, ශ්‍රේෂ්ඨ වන බවත්, මෙය තමාගේ අන්තිම ඉපදීම බවත් කියා සිටියේය. මේ සිංහනාදයට සවන්දුන් අදෝනා නගන පිරිසෙන් එක් කොටසක් පළමු වැකියට කැමති වූවේය. තවත් කොටසක් දෙවැනි වැකියට කැමති වූවේය. තවත් කොටසක් තුන්වැනි වැකියට කැමති වූවේය. තවත් කොටසක් අවසන් වැකියට කැමති වූවේය. පළමු වැකියට කැමති වූවෝ කුමරුගේ සිරුරේ ශක්තිය සෙව්වෝය. දෙවැනි වැකියට කැමති වූවෝ එම සිරුරේ රූප ලක්ෂණ සෙව්වෝය. තුන්වැනි වැකියට කැමති වූවෝ කුමරුගේ සිරුරේ ඥාණ ලක්ෂණ සෙව්වෝය. සිව්වැනි වැකියට කැමති වූවෝ එම සිරුරේ ශාන්ත ලක්ෂණ සෙව්වෝය.

භික්ෂුව පියවි ලෝකයට පැමිණ බලද්දී නැවත දුටුවේ මායා දේවියගේ ගෙවී ගිය ගල් රූපය උරච්චි කරමින් ඒ වතුර බොන පිරිස පමණි. භික්ෂුව එතැනින් ඉවත් වී ලුම්බිනිය වැඳපුදාගෙන කරත්තයට නැංගේය.

6.

ඔවුහු කුසිනාරාව දෙසට ගමන් ගනිමින් සිටියදී අම්බපාලියගේ අඹ උයන දුක්කෝය. අශ්වයා ගමන වුවමනාවෙන්ම බාල කළේය. සෑම ගසකම අඹ පිරී තිබුණේය. භික්ෂුවගේ කන්පතුල් එක්වරම දෝංකාර හඬකින් පිරී ගියේය. එය භික්ෂුවට නිතර ඇසෙන අඹ ගස් දෙකක් එකට ඇතිල්ලෙන හඬයි. එහෙත් මෙතෙක් ඇසූ ශෝකී හඬ නම් නොවේ.. එය කන් පිනවන මිහිරි ගී නාදයක් මෙන් ඇසෙන්නට පටන් ගත්තේය. අඹගස් දුකීමෙන් ඒ හඬ වෙනස් වූවාදැයි භික්ෂුව සැක ඉපදවූවේය. ඒ හඬට තම ඉඳුරන් අවදි වී, ගතේ හිරිගඩු පිපෙන බවක් භික්ෂුවට දැනුණේය.. භික්ෂුව තමාට මේ කුමක් සිදු වීගෙන එන්නේදැයි බිය ගත්තේය.

"කරත්තය ඉක්මනින් දක්කාපං" යැයි භික්ෂුව ගුප්තට අණ කළේය. ගුප්ත අශ්වයාට කෙවිටෙන් ගසද්දීද අශ්වයා අඩි නොසොල්වා බලා සිටියේය. භික්ෂුව වතුර උගුරු කීපයක් බී කරත්ත ඇන්දට බර වී අඹ උයන දෙස බැලුවේය. අඹ ගස්වල අතු එකට ඇතිල්ලීමෙන් නැගෙන හඬ සියලු අතින් ඇසෙන්නට පටන් ගත්තේය. ඒ හඬ වීණා හඬක් සමග මුසුව දෙවැනි වර ඇසෙන්නට වූයේය. එය පංචසිඛ වීණාවේ තත් පිරිමදින හඬට සමාන හඬක් බව භික්ෂුවට දැනුණේය. භික්ෂුව ඒ හඬ ශ්‍රවණය කරමින් අඹ උයන දෙස බලා සිටියේය.

අඹ වනය සිසාරා සිසිල් සුළඟ හමා ගියේය. අඹ ගස් අතර විවිධ වර්ගවලින් යුත් ඉතා පලබර වූ හුරුබුහුටි අඹ ගස් තිබුණේය. මධ්‍යම ප්‍රමාණයේ ගස් තිබුණේය. වයස්ගත වූ ගස් තිබුණේය. මේ සියලු ගස් එක් විශාල අඹ ගසක් වට කොටගෙන පැවතියේය. සමහර ගසක විවිධ වර්ගයේ අඹ හටගෙන තිබුණේය. සමහර ගසක එක් වර්ගයක අඹ පමණක් තිබුණේය. අඹ ගස් පාමුල තමන් කැමති අඹ වර්ගයක් තමන් කැමති පරිද්දෙන් රස විදීමේ අපේක්ෂාවෙන් පිරිස් රැස් කන්නාහ. ඒ පිරිස අතර රජවරුද ආවතේවකාරයෝද සිටුවරුද උස මිනිස්සුද මිටි මිනිස්සුද තරුණයෝද බාලයෝද වැඩිහිටියෝද සිටින්නාහ. අඹ උයනේ අඹ අපේක්ෂාවෙන් අඹ ගස් මුල සිටින සියලු දෙනාගේ ඇස් රතුපාට වී ඇත්තේය. අඹගස් භාරව සිටින මේවර කරන්නියෝ අම්බපාලියගේ අණින් ගස් මුදුන්හි සිට අඹ එල නෙළා දෙන්නාහ. ඒ අඹ එල ලබාගැනීම සඳහා සෑම අඹගහක් මුලම පිරිස් පෝලිම් ගැසී සිටින්නාහ. පෝලිම්වල සිටි පිරිස් තමතමන්ගේ කාසි පොදි පෙන්නමින් තමා කැමති අඹ පෙන්නමින් ඒවා ඇණවුම් කරන්නාහ. සමහරු ඉදුණු අඹ ඉල්ලති. සමහරු අමු අඹ ඉල්ලති. සමහරු ගැට අඹ ඉල්ලති. සමහරු පිපාසය සංසිඳුවාගැනීමට අඹ ඉල්ලති. සමහරු බඩගින්න නිවාගැනීමට අඹ ඉල්ලති. සමහරු රෝගී බවට ඔසුවක් ලෙස සලකා අඹ ඉල්ලති. සමහරු රස බැලීම පිණිස අඹ ඉල්ලති. සමහරු විනෝදය පිණිස අඹ ඉල්ලති.

භික්ෂුව කරත්තයේ ඇන්දකට බර දී අඹ උයන දෙස බලා සිටියේය. ගුප්ත දුංකොළ ස්වල්පයක් අල්ල මත තබාගෙන එය ඒදුවේය. එක් රෝගී සිටුවරයෙක් එක් අඹ ගසක් මුල දණ නමාගෙන අඹ ගස වන්දනා කරන්නේය. ඔහු තම අතේ තිබූ කාසි පොදිය මේවර කරන්නියට පෙන්නා ඉල්ලීමක් කරන්නේය.

"නුඹ අත ඇති අඹ වෙනත් කැමති කෙනෙකුට දෙන්න. මේ පහළ අත්තට බැස මාගේ සිරුර පුරා ඇති කුෂ්ටය සුව වන තුරු අඹ අත්තකින් පහර දෙන්න."

ගසේ පාමුල අත්තකට බැසගත් මේවර කරන්නිය අඹ අත්තක් කඩා ඔහුගේ පිටට පහර දෙන්නීය.. රෝගී සිටුවරයා තම සළුව ඉවත් කොට පිට පාගෙන සිටින්නේය... මේවර කරන්නිය ඔහුගේ පිට රතු වන තුරු අඹ අත්තෙන් පහර දී මුදල් ලබාගෙන අඹ වෙනත් කෙනෙකුට විකුණන්නීය. ඔහු ඉවතට යද්දී තවත් කෙනෙක් එතැනට එන්නේය.

තවත් මේවර කරන්නියක් ඉදුණු අඹ කඩා ඈතට විසි කරන්නීය. ඒවා ලබාගැනීමට නාකි සිටුවරු පොරකන්නාහ. තරග කළ නොහැකි වයස්ගත සිටුවරයෙක් ඔහුගේ කාසි පොදිය ගස

මුදුනේ සිටින මේවර කරන්නියට පෙන්නා අඹ ඉල්ලන්නේය. ඇය කාසිපොදිය දෙස බලා ඉදුණු අඹයක් නෙළා ඔහු වෙතට පාද්දී එම වයස්ගත සිටුවරයා ඉල්ලීමක් කරන්නේය.

"ඔබේ දැතින් ඔය අඹගෙඩිය මිරිකා ඉන් නැගෙන අඹ පැණි.. මේ ලොඹු කටට හලන්න. මා කැමති එසේ අඹ රස විදින්නයි." ඇය මී අඹ ගෙඩිය දැතින් මිරිකා අඹ ඉස්ම ඔහුගේ ලොඹු කටට වැහෙන්නට සලස්වන්නීය.

එක් මේවර කරන්නියක් ඉදුණු අඹ තම දෙපයින් තළා ඒ අඹ යුෂ තම පා ඇඟිලිවලින් ගෙන තණතිල්ලේ උඩුකුරුව වැතිරී සිටි අත්පා දුබලයන් පිරිසකට පොවන්නීය. ඔවුහු අඹයුෂ තැවරුණු ඇගේ මොළොක් දෙපතුල් දෙතොලින් ස්පර්ශ කරමින් අඹ යුෂ බොන්නාහ. ඉන් ආඩම්බර වන ඈ තම දෙපයින්ම ඔවුන්ගේ මුහුණු පුරාත් සිරුර පුරාත් අඹ යුෂ තවරන්නීය. ඒ රසයට ලොල් වූ දුබල අත්පා ඇති ඔවුහු ඇගේ පාමුල තම කාසි තබමින් ඒ අඹ රස විදින්නාහ.

තවත් කෙනෙක් අඹ හපාගත නොහැකිවදෝ මේවර කරන්නියන්ගේ පාමුල සිට ඒ අඹ හප කර තම මුව මත හලන ලෙස ආයාචනා කරන්නාහ. ඒ මේවර කරන්නියෝ අඹ කටින් හපහපා ලොඹුකටවල් මත හලන්නාහ.... මේවර කරන්නියන්ගේ බේටය සමග මුසුව ගිය ඒ අඹ ඒ දුබලයෝ රස කරමින් අනුභව කරන්නෝය.

කිහිල්ලේ කාසි පොදි ඇති උස මිනිස්සු කැමති කැමති අඹ ගසින් ගෙඩි කඩකඩා කමින් ඒ අඹ එලයන්ගේ ශේෂ වූ කොටස් උයනේ තැන් තැන්වල හලන්නාහ. කාසි නැති මිටි මිනිස්සු ඒ ශේෂ වූ අඹ පොරකමින් අත්පත් කරගන්නාහ.

සමහර බිරින්දෑවරු අඹ එල මිලට ගෙන ඒවා තම ස්වාමි පුරුෂයන්ට දී, ඔවුන් ඒවා රස කර කන අයුරු බලා සිටින්නෝය. සමහර ස්වාමිපුරුෂයෝ තම බිරින්දෑවරුන්ට එසේ අඹ මිලට ගෙන දී ඔවුන් ඒ අඹ රසවිදින අයුරු බලා සිටින්නෝය. සමහරු ඉදුණු අඹ පසෙක ලා ගැට අඹ ලුණු සමග අනුභව කරන්නාහ. සමහර සිටුවරු අඹ එල උක්කුටිකයෙන් සිට වළඳන්නාහ.

සමහරු සිටි පියවරෙන් සිට වළඳන්නාහ. සමහරු තණතිල්ලේ වැතිර සිට වළඳන්නාහ. උදාර ඇඳුම්ආයිත්තම්වලින් සැරසුණු රාජකුමාරවරු තම සළුපටේ අඹයුෂ ගෑවෙනවාට බියෙන් මෙන් තම සළුවට උඩින් පැලඳවූ රෙදිකඩක් මත අඹ තබාගෙන අනුභව කරන්නාහ. තවත් සමහරු විවිධ ඉරියව් පාමින් අඹ වළඳන්නාහ.

අම්බපාලිය මේ සියලු දෙනාගේම කුසගිනි නිවා පිපාසය සංසිඳුවා රෝග සුව කර අවසන් කළාය...

"මාගේ මෙහෙවර මෙයින් නිමාවට පත් කරනවා... තුඹලා අතෘප්තියෙන් පසු වූවත් මා තෘප්තියේ සමාප්තියට පැමිණ සිටිනවා.. එහෙයින් නිමා කිරීම පිණිස මා නික්මෙනවා.."යි කියමින් අම්බපාලිය අඹ උයන අතැර දමා නික්ම ගියාය.

භික්ෂුව කරත්තයේ පැති ඇන්දකට බර වීගෙන දෙනෙත් පියාගෙන කේසා, ලෝමා, නඛා, දන්තා, තචෝ-තචෝ, දන්තා, නඛා, ලෝමා, කේසා යන තචපංචකය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මැතිරුවේය. ගුප්ත භික්ෂුව දෑහැතින් මුදවා අඹඵල ගෙනත් දෙන්නදැයි ඇසුවේය. භික්ෂුව දෙනෙත් හැර ගුප්ත දෙස යාන්තමින් බලා එය ප්‍රතික්ෂේප කළේය.

"හාමුදුරුවන්ගේ ඇස් හොඳටෝම රතු වෙලා" ගුප්ත හිමින් කීවේය.

"මට වතුර ටිකක් දීපං ගුප්ත...." යැයි කියමින් භික්ෂුව කරත්ත ඇන්දට බර වීගෙනම සිට දෙනෙත් පියාගත්තේය. ගුප්ත භික්ෂුවගේ මුහුණට වතුර බින්දු කීපයක් ඉස්සේය...

"ගුප්ත, භික්ෂුවගේ සාගින්න වැඩියි... අර අම්බපාලියගේ අඹ උයනින් කැමති අඹ එලයක් ගෙනැවිත් උන් වහන්සේගේ සුදහගින්න නිවන්න....." ඒ උපදෙස උඩුගුවනේ නින්නාද දෙද්දී ගුප්ත හාත්පස බැලුවේය...

"ඔබ මාව හඳුනනවා නේද ගුප්ත...? මම උදායි ස්ථවිරයෝ.. සෙය්‍යසක භික්ෂුවට සමාන වැහැරී ගිය මේ භික්ෂුව කෙරෙහි උපන් කරුණාවෙන් මම මෙහි පැමිණියේ...."

"ඔබ වහන්සේ එදා සෙය්‍යසක භික්ෂුවට දුන් උපදේශය බුදුහාමුදුරුවෝ ගර්හාවට ලක් කළා නේද? පළවෙනි සංඝාදිසේසය පනවන්නෙ එයින් පසුව නේද?"

"ඒක නම් එහෙම තමයි. ඒත් කෘශ වී ගිය සෙය්‍යසක භික්ෂුව පණලබා නැගී සිටියේ මගේ උපදේශයෙන් පසු නොවෙයිද? මොහු දැන් සිටින්නේ අධික ක්ෂුධාවෙන්. අඹ ඵලයක් හැර මේ මොහොතේ මේ භික්ෂුවට දිය හැකි වෙනත් කිසිදු දෙයක් මට නොපෙනේ.... පළමුව මේ ක්ෂුධා ගින්න නිවන්න..."

"උන් වහන්සේ ඊට අකැමැතියි......"

"එය අකැමැත්ත නෙමෙයි, බිය. නිරාවරණය වූ පරිසරයට ඇති බිය."

"ඒ පරිසරයට බිය නොවූ ඔබ වහන්සේ ප්‍රතික්ෂේප වුණා නේද?"

"ඒත් මා නිමා කළා."

"ඔබ වහන්සේ කියන්නේ තෘප්තියෙන් පසු නිමාව දක්නා කියලද?"

"එය එසේයි කියා මට සහතික දෙන්න කෙනෙක් නෑ."

"මේ භික්ෂුව අඹ වනය දකීමෙන් හටගත් පිපාසයත් ක්ෂුධාවත් දෙකම ඇත්තෙක්; නොකල්හි අනුභවය නුසුදුසුයි යන නීතියෙන් පීඩා විඳින්නෙක්."

"එය පිළිගැනීමෙන් නෙමෙයිද පැවිද්ද ලබාගෙන තිබෙන්නෙ?"

"එය මොහු ලබාගත්තේ අවබෝධයෙන්. දැනුමෙන් කියලද ඔබ හිතන්නෙ....?"

"නෑ... සමහර විට තෘප්තියෙන් පසු නිමාව පිණිස පැමිණි කෙනෙක් නොවිය හැකියි.."

"ඔව්. මා වගේම මොහුත් තෘප්තියෙන් පසු නිමාව පිණිස පැමිණි කෙනෙක් නොවේ.. ඔබව මා මේ භික්ෂුවගේ අතීතය වෙත ගෙන යන්නදැයි උදායි හිමියෝ ඇසූහ..... ගුප්ත හිස වැනුවේය.

"එහෙනම් අපි යමු මේ භික්ෂුවගේ අතීතයට." උදායි හිමි ගුප්තගේ අතින් අල්ලාගත්තේය..

7.

ගුප්තට දරියකගේ ඇඬුම්හඬක් ශ්‍රවණය වන්නට වූයේය. "අනේ තාත්තේ, අපි අඹ ඇහින්දා විතරයි. අපි වරදක් කළේ නෑ. අපට ගහන්න එපා."

"කට වහපිය. ඒක විදුහල්පතිට මං කියා දෙන්නම්. මේ අසමජ්ජාති කොල්ලොත් එක්ක තෙයියාඩගං නටන්නෙ ඇටෙන් පොත්තෙන් එළියට එන්න ඉස්සෙල්ලා." උස් හඬින් නැගෙන ගෝරනාඩුව ගුප්තට ශ්‍රවණය වන්නේය. එම රෞද්‍ර මිනිසා පූජක බමුණා දරුවන් ගෙන ගිය සෙයින් ළමයින් දෙදෙනාටම පහර දෙමින් දෙදෙනාම ඇදගෙන ලඳුකැලෑව පසු කරමින් පාසල දෙසට ගියේය. ළමයින් දෙදෙනා ඇදගෙන විදුහල්පතිගේ කාමරයට යද්දී බොහෝ පාසල් ළමයින් පාසල ඇරී ගෙවල්වලට ගොස් තිබුණත් ක්‍රීඩා පිණිසත් අමතර පන්ති සඳහාත් නතර වී සිටි ශිෂ්‍යශිෂ්‍යාවෝද ගුරුවරුද මේ දර්ශනයෙන් අන්දමන්දව ඇස් උඩ අයා බලා සිටියෝය.

"ඉස්කෝලෙ මහත්තයෝ, මේ අසමජ්ජාති කොල්ලා අපේ මේ නොදරුවත් එක්ක ලඳුකැලෑවෙ තනිපංගලමෙ ඉන්නවා මගේ අතටම අහු වුණා." විදුහල්පතිගේ නළල රැළිගැන්වුණේය. ඔහු කිසිවක් කියාගත නොහැකිව ළමයින්ගේ මුහුණු දෙස මාරුවෙන් මාරුවට බැලුවේය....

"ඇත්තද බොල? උදේ හොරකම් කරල අහු වුණා. ඒකෙ උණුහුම යන්න කලින් තවත් එකක්. කියපියව් ඇත්ත. මොකද්ද තොපේ ඇයිහොඳයිය?" යැයි ඇසූ විදුහල්පතිවරයා දරුවාට එරෙහිව වේවැල අතට ගත්තේය...

"මං අපේ එකිව ඉස්කෝලෙන් අස් කරගන්නවා."

"කලබල නොවී ඉන්නව. මං බලාගන්නම්කො."

"අපි වරදක් කළේ නෑ ස....ර්, අඹ ඇහිලුව විතරයි....."

''අඹ අහුලන්න උඹලට කැලෑවදින්නම ඕනද?'' යැයි උස්ස්වරයෙන් ඇසූ විදුහල්පතිවරයා වේවැල ගෙන දරුවාට පහර දෙන්නට පටන්ගත්තේය. දරුවා වේදනාවෙන් ඇඹරුණේය..

''කියපං ඇත්ත... කියපං ඇත්ත... මොනවද තොපි කළේ..?'' විදුහල්පති ගෝරනාඩු කරමින් පහර දුන්නේය.

''අනේ එපා සර්... එයාට ගහන්න එයා මගේ යාළුවා..... අනේ සර් එපා.. ගහන්න එපා... අපි වරදක් කළේ නෑ'' යැයි කියමින් ඈ විදුහල්පතිවරයාගේ වේවැල ඉදිරියට පැන්නාය... විදුහල්පති වියරු වූවේය..

''මං උඹල දෙන්නම ඉස්කෝලෙන් අස් කරනවා'' කියමින් ඔහු දූරියටද පහර දුන්නේය..

''ජේනව නේද තමුන්ගෙ එකීගෙත් තියෙන ඇට්ටරකම?'' විදුහල්පති තාත්තා ඉදිරියේදී දූරියට තවදුරටත් පහර දීම හොඳ නැතැයි සිතා දරුවාට තවත් වේවැල් පහර කීපයක් දුන්නේය. එසේ දරුවාට තළද්දී දූරිය විදුහල්පතිගේ පාමුල වැඳවැටී ''අනේ ගහන්න එපා... එයා වරදක් කළේ නෑ'' කියමින් හඬාවැටුණාය.. දූරියගේ තාත්තා දූරිය නැගිට්ටුවාගත්තේය... ඇය ඉකිබින්දාය.. දරුවාද ඉකිබින්දේය..

''කියපං ඇත්ත.. උඹල හැමදාම ඉස්කෝලෙ ඇරිල තනිපංගලමෙ ඔය ලඳුකැලෑවට වැදෙනව නේද?''

''නෑ.... සර්... අද විතරයි අපි ගියේ....''

''තව බොරුත් කියන හැටි......'' විදුහල්පති දරුවාට තවත් පහරක් ගැසුවේය.

විදුහල්පති පහර දීම නවතා දූරියගේ පියා දෙස ගැඹුරු බැල්මක් හෙළුවේය...

මේ ළමයට කරදරයක් කරලද මේ කොල්ලා?''

''එහෙම දෙයක් වුණා නම් මං මුන්ගෙ සනුහරේම කැති ගානව. එච්චර හරියක් වෙන්න ඉස්සෙල්ල තමයි මං විසඳුමක් හොයාගෙන ආවෙ.''

''අනේ නෑ සර්, බුදුඹප, දෙයියම්පල්ල නෑ.... අපි අඹ අහුලන්න ගියේ.... අපි වෙන වරදක් කළේ නෑ..'' දූරිය උත්තර බැන්දාය..

''කොහොම වුණත් මං මේ කොලුවගෙ දෙමව්පියො ගෙන්නල මේකට විසඳුමක් ගන්නම්.''

''ඉව් ඉස්කෝලෙ මහත්තයො. මූ මේ ඉස්කෝලෙන් අස් කරේ නැත් නම් මං මගේ එකීව ඉස්කෝලෙන් අස් කරගන්නවා.'' ඔහු කොල්ලා දෙස රවා බලමින් කීවේය....

දූරිය පමණක් අතින් අල්ලාගත් දූරියගේ පියා පිටව ගියේය.

''තෝත් පල දූන්. හෙට අම්ම හරි තාත්ත හරි එක්ක වර.'' විදුහල්පති නැවතත් සැරෙන් කීවේය.

එදින රාත්‍රියේ දරුවාගේ තාත්තාද වෙරිමතින් පැමිණ දරුවාට අතින් පයින් පහර දුන්නේය. අම්මා දරුවාගේ හිස අතගාමින් මින් පසු එවැනි වැරදි නොකරන්නැයි අවවාද කළාය. මෙය මෙතරම් දුරදිග ගියේ එදින හවස දූරියගේ තාත්තා ගෙදරට පැමිණ කළ ගෝරනාඩුව නිසා බව දරුවාට දැනෙන්නේය.

පසුදා මව සමග පාසලට ගිය දරුවා මහත් ලජ්ජාවකින් පෙළුණේය.. පන්තිකාමරයේ ඉහළ පන්තිවල සිටින අයියලා අක්කලාත් ගුරුවරුනුත් දරුවා දෙස බැලුවේ මිනීමරුවකු දෙස බලන ලෙසිනි... පහළ පන්තිවල ළමයි ''අන්න අඹයා අන්න අඹයා'' යැයි කෑගැසුවෝය. තවත් සමහරු ''බනිස් හොරා''යැයි කෑගැසුවෝය. දරුවා ලජ්ජාවෙන් ඇඹරුණේය... විදුහල්පතිගේ කාමරයට යන්නට පෙරම දරුවා තීරණයක් ගත්තේය...

''මට බෑ අම්ම මේ ඉස්කෝලෙට එන්න. අනේ මාව අස් කරගෙන යන්න'' දරුවා ඇවිටිලි කළේය.

''අනේ පුතේ, ලොකු සර්ට වැඳල සමාව අරගෙන මේ ඉස්කෝලෙම ඉඳහං මයි පුතේ...'' අම්මාද ඇවිටිලි කළාය.

''මම නම් ආපහු මේ ඉස්කෝලෙට එන්නෑ කවදාවත්. අපට තඩිබෑවේ කිසිම හේතුවක් හොයන්නෙ බලන්නෙ නැතුව.. මට මේ ඔක්කොම හිනාවෙනවා. ඔන්න අම්මෙ මාව අස් කරගත්තත්

නැතත් මං මේ ඉස්කෝලෙට නම් එන්නෙ නෑ. එහෙම වුණොත් මං කොහේ හරි යනව යන්න'' දරුවා ස්ථිර ස්වරයෙන් කීවේය.

විදුහල්පති කාමරයේදී විදුහල්පතිගේ ගොරනාඩුව නැවතත් ඇසෙන්නට වුණේය. දරුවා හොරෙකු බවත්, ගෑනු ළමයෙකු සමග සම්බන්ධ වී ඇති බවත් විදුහල්පති චෝදනා කළේය. දරුවා අම්මාට ඇඟිල්ලෙන් ඇන්නේය..

''මං දරුවා වෙන ඉස්කෝලෙකට දාගන්නම් මහත්තයො.....''

''මම ළමයට දඬුවම් කළා. ආපහු මෙව නොකරන්න පොරොන්දු වෙනව නම් මං මේ ළමයාව තියාගන්නම්'' අම්මා දරුවාගේ මුහුණ දෙස බැලුවාය.. දරුවා නැවතත් අම්මාට ඇඟිල්ලෙන් ඇන්නේය...

''කමක් නෑ මහත්තයො. දරුව මං වෙන ඉස්කෝලෙකට දාගන්නම්.''

''ඒක කැමැත්තක්. මේ ළමයා නිසා අපේ ඉස්කෝලෙ කීර්තියටත් කැළලක් වුණේ... මේ සිද්ධිය පොඩි වුණාට ඒ දූරිවිගෙ තාත්ත මුළු ගමේම දූන් ගිනිතියල තියෙන්නෙ. වෙන ඉස්කෝලෙකට ගිහිල්ල හරි හොඳින් ඉගෙනගෙන මිනිහෙක් වෙන්න බලනවා'' විදුහල්පති එසේ කියමින් අස්වීම සහතිකය ලියා දුන්නේය..

දරුවා අම්මාගෙන් මිදී පන්තිකාමරය දක්වා ගියේය.. එහෙත් පන්ති කාමරයට ඇතුළු වී තම යාළුවන්ට කතා කොට යන්නට තරමේ දහිරියක් දරුවාට නොතිබුණේය. පන්තිකාමරයේ ගුරුවරයෙක් නොසිටියේය. ඒ පාසල පටන්ගැනීමේ සීනුව තවම නාද වී නැති නිසා බව දරුවාට මතකය. දරුවා පන්තිකාමරයේ පිට පැත්තේ සිට තමා වාඩි වී සිටි පුටුව දෙස බැලුවේය.. ඒ හිස් පුටුව ළඟ අනෙක් පුටුවේ දූරිය වාඩි වී සිටියාය.. දරුවා ඇය දෙස බැලුවේය. දූරියද දරුවා දෙස බැලුවාය.. දූරිය පන්තියෙන් නැගිට බිත්තිකණ්ඩිය දක්වා පැමිණියාය. ඔවුහු මොහොතක් ඔවුනොවුන් දෙස බලා සිටියෝය... දූරිය රහසින් ඉකිබින්දාය.. දරුවාද ඉකිබින්දේය.

''මං වෙන ඉස්කෝලෙකට යනවා.''

''මටත් යන්න ඇත් නම්..'' දූරිය කීවාය..

ඔවුන්ගේ යාළුවෝ මොවුන් දෙස බලාසිටියෝය. එහෙත් ඔවුහු දරුවාට විහිළු නොකළෝය. දැරිය තම අතේ තිබූ පැන්සල දෙකට කැඩුවාය. එහි එක් කොටසක් දරුවා අතට දුන්නාය.... දරුවා එය භාර ගත්තේය.. දරුවා බිත්තිකණ්ඩිය පසු කොට යන්නට ගියේය.. දූරිය හයියෙන් ඉකිබින්දාය. ඒ හඬ දරුවාට වඩාත් හොඳින් දූනුණේය. දරුවා පාසල් ගේට්ටුවෙන් පිට වෙද්දී යළිත් පන්ති කාමරය දෙස බැලුවේය. පන්තිකාමරයේ බිත්තිකණ්ඩියේ එල්ලී තමා දෙස බලා සිටින දූරියගේ ශෝක හරිත මුහුණ දරුවා අවසන් වරට දුටුවේය. දරුවා ඒ දෙස නොබලා ඇස් අකුළාගෙන පාසලෙන් පිටතට පැමිණියේය.

ගෙදර පැමිණි දරුවා ඇඳට වී දවසම ගත කළේය... තාත්තා පැමිණි පසු තමාට නැවත ගුටිකන්නට සිදු වෙතැයි දරුවා බිය ගත්තේය... දරුවා දහම්පාසල් පොතේ පිටු පෙරළමින් තාත්තාගේ අඳුරු මුහුණද විදුහල්පතිගේ දරුණු මුහුණද ළමයින්ගේ ඔච්චම් කරන මුහුණුද අමතක කිරීමට උත්සාහ ගත්තේය... තම මල්ලීගේ ඔච්චම් සිනාවද දරුවාට සිහිපත් වන්නේය. තමා පාසලෙන් පිටවෙද්දී මිටිතාප්පයට බර වී වැලපුණු දූරියගේ රූපය සිතේ දැඩි කනස්සල්ලක් ඇති කළේය. ඇය බඩගින්නේ අඬද්දීද දුකට අඬද්දීද එකම රූපයකින් යුක්ත වූවාය..

දහම්පාසල් පොතේ නන්ද කුමාරයාගේ කතාව දෙවැනි වතාවටත් දරුවා කියැවුවේය. අනතුරුව දරුවා අම්මාට මෙසේ කීවේය...

''අම්මෙ, මාත් මහණ වෙනවා.''

''අනේ එහෙම කොහොමද මගෙ පුතේ?''

''නෑ මං මහණ වෙනවා.... මං මහණ වෙනවාමයි'' දරුවා ස්ථිර ලෙසම කීවේය...

අම්මා එය විහිළු සිතින් ඉවසා කරබාගත්තාය.... එහෙත් දරුවා වෙනත් පාසලකට යැමට අකමැති වුණේය. තාත්තා දරුවාට එයින් පසු දඬුවම් නොකළේය. ඒ: දරුවා ගෙදරින් පැනයාවියැයි තාත්තා තුළ තිබූ බිය නිසාය..

කොල්ලට මහණ වෙන්න ඕනය කියන්නෙ..." අම්මා දරුවාගේ තාත්තාට කීවාය..

"මාත් කැමතියි එහෙම වෙනවට නම් මගේ පව්කාරකම්වලට පිනක් වත් එකතු වෙන්නැතැයි" තාත්තා සැහැල්ලු ලෙස කීවේය.

"ඔහේ කිව්වට මට වැඩිපුර ඉන්න එකක්යැ...?"

"මටෙයි කියලත් වෙනම දරුවො නෑ අම්මණ්ඩියෙ.. ඕක ගෙදරින් පැනල ගියොත් තව විජ්ජුම්බරයක්... බඹා කෙටූ හැටියටලු ඕව වෙන්නෙ. ඔන්න පන්සලේ හාමුදුරුවොත් එක්ක ගිහිං කතා කොරපං. මට ඕවයෙ තේරුමක් නෑ" තාත්තා තීරණයක් ගැනීමෙ වගකීම අතහැරදමුවේය.

මහණ වීම සඳහා දරුවාගේ සිතේ ඇති පෙලඹවිල්ල වැඩි වෙමින් තිබුණේය.. දරුවා දහම්පාසල් පොත් වැඩිපුර කියෙව්වේය. එහි විවිධ චරිත කතා නිසා දරුවා තුළ ඒ ආශාව වැඩි වූයේය. තමාගේ හිත් රිදීමේදී තමා ළග සිටියේ දහම්පාසල් පොතේ තිබූ චරිත කතා පමණක් බව දරුවාට දැනුණේය.. ඒ නිසාම දරුවා මහණ වීම සඳහා දැඩි ආශාවක් දැක්වූවේය.

දරුවාගේ අම්මා කොතරම් ඇවිටිලි කළත් දරුවාගේ තීන්දුව වෙනස් නොවුණේය.. තම මිතුරු දැරිය සිහිපත් වෙද්දී දරුවාගේ සිත පාළුවකින් පිරී යන්නේය. පන්තියේ මිටිතාප්පයට බර වී අඬන ඇයට මොනවා හෝ කන්න දී ඇය සිනස්සන්නට ඇති නම් යන හැඟීම දරුවා තුළ නිතර නිතර පහළ වුණේය.. දුකට ඇඬූ දැරිය සමග අඹ අහුලන්නට යෑමෙ ආශාවක්ද බඩගින්නට ඇඬූ දැරිය බඩගින්නෙන් මුදා හිනැස්සවීමේ ආශාවක්ද දරුවා තුළ එකවර උපදින්නේය. මේ දෙදෙනාම එක් අයෙකු බව දැනීමෙන් ඒ දැරිය අතහැර යෑමේ බැරිකමක්ද දරුවා තුළ උපදින්නේය.

එහෙත් ඇයගේ කුස පුරවන්න හෝ දුක නිවන්න හෝ දරුවාට කිසිදු මාර්ගයක් නොතිබුණෙන් දරුවාගේ සිත මහණ වීම කෙරෙහි තදින් ඇදී ගියේය.. නන්දකුමාරයාගේ කතාව කියවීමෙන් පසු දරුවා තුළ හදිසියේ මහණ වීමෙ අදහස ඇති වූයේ ජනපද කල්‍යාණියත් දැරිය වගේයැයි සිතුණු නිසා පමණක් නොවේ. බෝසතාණන් වහන්සේ උපන් ගමන් කළ සිංහනාදයේ

සියලු පද ආශාවෙන් කියැවූ දරුවා තුළ බෝසතාණන් වහන්සේ මහා වීරයෙකු ලෙස දැනෙන්නට පටන් ගත්තේය. තමා සීතලට පොරවන අම්මාගේ චීත්ත රෙද්ද හෝ තාත්තාගේ සරම ඇතුළේ ඇති උණුසුමට වඩා උණුසුමක් ඒ බෝසතාණන් වහන්සේගේ තුළ ඇතැයි දරුවාට දැනුණේය.

දරුවාගේ තීරණය වෙනස් නොවුණේය. තමා පන්සලට භාර නොදෙන්නේ නම් ගෙදරින් පැන යන බවට දරුවා තර්ජනය කළේය.. අවසානයේ දරුවා ගමේ පන්සලේ හාමුදුරුවන්ට භාර කෙරුණේය. දරුවාගේ ජන්ම පත්‍රය පරීක්ෂා කළ ලොකුහාමුදුරුවෝ දරුවා තම මිත්‍ර හාමුදුරුනමකට භාර කළේය.. ඒ අනුව දරුවා ගමෙන්ද දෙමාපියන්ගෙන්ද මල්ලිගෙන්ද දැරියගෙන්ද වෙන් වී ඈත පළාතක පන්සලක නතර වුණේය..

පැවිදි වූ දරුවා යමක් අමතක කිරීමට නිතරම උත්සාහ දරමින් සිටියේය. පන්සල් වත්තේ ආවාස මිදුලේ එක ළග පායට හැදුණු අඹ පිරුණු අඹගස් දෙකක් තිබුණේය. මේ අඹ ගස මුල වාඩි වී සාමණේර බණදහම් පොත පාඩම් කරද්දී සුළගින් මේ ගස් දෙකේ අතු එකට ඇතිල්ලෙන හඬ සාමණේරයන්ට ඇසෙන්නේය. ගස් අතු නගන මේ හඬ, බඩගින්න නිසා මිටිතාප්පයට බර වී ඉකිබිඳි දැරියගේ හඬටත්, තමාට විදුහල්පති පහර දෙද්දී ඉකිබිඳි දැරියගේ හඬටත්, පාසලෙන් අස් වී එන දිනයේ පන්තිකාමරයේ එම මිටිතාප්පයටම බර වී ඉකිබිඳි දැරියගේ හඬටත් සියලු අතින් සමාන බව සාමණේරයෝ සිතුවෝය. සාමණේරයෝ ඉන් පසු එම ගස් මුලින් ඉවත් වී බුදුකුටියේ පාඩම් කළෝය. එතැනටද මේ වැලපුම් හඬ ඇසෙන්නට පටන් ගත්තේය. පසුව සුළග නැති දිනකත් මේ හඬ ඇසෙන්නට පටන් ගත්තේය. රාත්‍රියේදී නිදි යහනේදීත් මේ අඹ අතු එකට ඇතිල්ලෙන හඬ ඇසෙන්නට පටන් ගත්තේය. ටික කලකින්ම වෙනත් පළාතක පිරිවෙනකට අධ්‍යාපනය සඳහා ගිය සාමණේරයන්ට එහිදීද මේ හඬ ඇසෙන්නට පටන්ගත්තේය. මේ වදකාර හඬ තමාට මහා කන්දොස්කිරියාවක් බව සාමණේරයන්ට දැනුණේය.

එක් නිවාඩුවකට පන්සලට පැමිණි සාමණේරයෝ ලොකුහාමුදුරුවන් පන්සලේ නැති අවස්ථාවක් බලා මන්නයකින් මේ අඹ ගස්දෙකේ පොතු රහින්නට පටන් ගත්තේය.. අඹ

ගස් මැරී යෑමෙන් තමන්ට ඇසෙන මේ විලාපය නතර වෙතැයි සාමණේරයෝ සිතුවෝය. එහෙත් අඹ ගසේ පොතු ගැලවීමේ වරදට ලොකුහාමුදුරුවන්ගෙන් දඬුවම ලැබුණා හැර සාමණේරයන්ට එම හඬ නාසා සිටින්නට බැරි වූවේය.

තම හිතට ශෝකයත් කෝපයත් උපදවන මේ හඬ නාසා සිටින්නේ කෙසේදැයි කල්පනා කරන හැම විටකම උන් වහන්සේට ඒ හඬ තවතවත් ඇසෙන්නට පටන් ගත්තේය. කියන්නට කෙනෙකු අසන්නට කෙනෙකු නොසිටි නිසා සාමණේරයෝ තනි වී විසඳුම් සොයන්නට පෙලඹුණෝය. නිතර මේ ගැනම සිතන්නට පටන් ගනිද්දී පන්තියේ යාළුවන් මේ සිතීමට ඉඩ නොදී කතාබහ කිරීම, විහිළුතහළු කිරීම, වෙනත් දේවල් ගැන කතා කිරීම සාමණේරයන් තුළ කෝපයක් ඇති කළේය. ඒ නිසාම සාමණේරයෝ නිතරම ඒ අය මගහරින්නටත් ඔවුන්ගෙන් ඈත් වී ඉන්නටත් උත්සාහ කළෝය. අනිත් අයගේ කතාබහ, ආමන්ත්‍රණය කිරීම් සාමණේරයන් තුළ ද්වේෂයක්ම ඇති කළේය. එවැනි අවස්ථාවලදී ඔවුන් සමග රණ්ඩු කිරීමටත් ඔවුන්ට බැණවැදීමටත් සාමණේරයෝ හුරු වූහ. මේ නිසා පන්තියේ කොන් වෙන දඩබ්බරයන්ගේ ගොඩට සාමණේරයෝ ඉබේම තල්ලු වී ගියෝය. එහෙත් ඒ දඩබ්බරයන් සමගද සාමණේරයෝ කුලුපග නොවී තනි වී සිටින්නට උත්සාහ කළෝය.. පාඩම් කිරීම් අතපසු කරන දඩබ්බරයන්ගේ ගොඩටම දමා මේ සාමණේරයන්ටද ගුරුවරු දොස් නැගුවෝය; පන්තියේ දණගස්සවා තැබුවෝය; ටොකු ඇන්නෝය; වේවැල් පහර දුන්නෝය. මේ දඬුවම්වලින් සාමණේරයෝ වේවැල් පහර කද්දී ඒ කෙරෙහි විශේෂ උනන්දුවක් ආශාවක් ඇති කරගත්තෝය. අඹ ගස් එකට ගැවෙද්දී නැගෙන හඬට වඩා සජීව ඇඬුම් හඬක් සාමණේරයන්ගේ පසුබිමින් ඒ වේවැල් පහර වදිද්දී ඇසෙන්නට පටන් ගත්තේය. විදුහල්පති තමන්ට පහර දෙද්දී දූරිය විලාප දුන් හඬ මේ සෑම පහරකෑමකදීම සාමණේරයන්ට හාත්පසින් ඇසුණේය.. මේ නිසා ටිකෙන් ටික සාමණේරයෝ මේ වේවැල් පහර කෑම සඳහාම හිතුවක්කාර වැඩ කළෝය; ඕනෑකමින්ම ගුරුවරුන් කෝප ගැන්වූවෝය. අල්ල පැළී ලේ වැගිරෙද්දී ඈතින් ඇසෙන ඒ ඉකිබිඳුම් හඬ සාමණේරයෝ ආශාවෙන් අසාගෙන සිටියෝය.

දිනපතා පාඩම්වැඩ අතපසු කිරීමෙන් විෂයන් දහයටම අදාළ ගුරුවරුන්ගෙන් වේවැල් පහර කන්නට සිදු වෙද්දී සාමණේරයන්ට ඒ ඉකිබිඳුම් හඬ තවතවත් ඇසුණේය. ඒ හඬ අලුත් කරගැනීමට හෝ නැවත ඇසීමට සිතෙන හැම වෙලාවකදීම සාමණේරයෝ වරදක් කළෝය. පාඩම් වැඩ අතපසු කිරීමට වඩා සැහැසිකමක් කොට ගුටිකෑමට සාමණේරයන්ට වුවමනාව ඇති වන්නේය. එහිදී ඒ ඉකිබිඳුම් හඬ මහා හයියෙන් ඇසෙතැයි සාමණේරයෝ සිතුවෝය.

දිනක් උන් වහන්සේ තවත් සාමණේර නමකට කිසිදු හේතුවකින් තොරව බිම දමාගෙන පහර දුන්නෝය. එය දුටු පරිවේණාධිපති හිමියෝ අතට අසු වූ මුසුන් දණ්ඩ ගෙන සාමණේරයන්ට තඩිබෑවෝය... ලේපැහැගැන්වුණු පස්සා පැත්තක් සහිතව කාමරයට වැදුණු සාමණේරයන්ට ඒ ඉකිබිඳීම් හඬ සිය දහස් වාරයක් ඇසෙන්නට පටන් ගත්තේය... සාමණේරයන් ගෙන් පහර කෑමට ලක් වූයේ පිරිවෙනේම සිටි චණ්ඩි සාමණේර නමක නිසා අනිත් සාමණේරවරුන්ගේ විශේෂ සැලකිල්ලක් මේ සාමණේරයන්ට ලැබුණේය. එයින් උද්දාම සිතක් සාමණේරයන් තුළ පහළ වූයේය. තමා ඔවුන්ගේ වීරයෙකු වෙමින් සිටින බව සාමණේරයෝ සිතූහ. පාළු වී ගිය සිතට එය සහනයක්ම වූයේය. මෙයින් පසු සාමණේරයෝ ගුටිකෑම අරභයාම නොව, අනිත් අයගේ අවධානය පිණිසද චණ්ඩි වැඩ කරන්නට පටන් ගත්තෝය.

කාලයක් යද්දී ගුටිකෑමෙන් පදම් වූ ශරීරයකට හිමිකම් කියූ සාමණේරයෝ තවත් දිනක ගණිත ගුරුවරයා සමග ආරවුලක් ඇති කරගත් ඉංග්‍රීසි ගුරුවරයාට තර්ජනය කළේය... සාධාරණය යුක්තිය ගැන කතා කළේය. කරදඬු උස් වූ මේ සාමණේරයන් නාහෙට නාහන කෙනෙකු බව දන්නා ඉංග්‍රීසි ගුරුවරයා සාමණේරයන් වහන්සේගෙන් සමාව ගත්තේය. එහෙත් හෙතෙම වහාම ඒ ගැන පරිවේණාධිපති හිමියන්ට පැමිණිලි කළේය. මේ කතාව ගුරුවරුන් අතර කතාබහට ලක් වීමත් සමග පරිවේණාධිපති හිමියෝ සාමණේරයන් කැඳවා ගුරුවරයකුට තර්ජනය කිරීම සම්බන්ධයෙන් කෝප ගෙන මුසුන් දණ්ඩ අතට ගත්තෝය..

"මට ගහන්න විතරක් එපා... ගැහුවොත් මාත් ගහනවා... මං කතා කළේ සාධාරණය" යැයි සාමණේරයෝ ප්‍රථම වතාවට පරිවේණාධිපති හිමියන්ට තර්ජනය කළෝය.. මේ අවස්ථාවේ පසුබෑ පරිවේණාධිපති හිමියෝ පසුදාම ගුරු හාමුදුරුවන් ගෙන්නවා අස්වීමේ සහතිකය ලියා දුන්නෝය.

ගුරු හාමුදුරුවෝද සාප කොට සාමණේරයන්ට පන්සල තහනම් කලාපයක් බව කියා එම අස්වීම් සහතිකයද සාමණේරයන් අතට දී ඕනෑ කුදයක් ගහගන්නයැයි කියමින් යන්නට ගියෝය.

පිරිවෙනත් පන්සලත් දෙකම අහිමි වූ සාමණේරයෝ එදින රාත්‍රියේ පළමු වතාවට ගමන් ගාස්තුව සඳහා පරිවේණාධිපති හිමියන්ගේ මේස ලාච්චුව බිඳ මුදල් සොරකම් කරගත්තෝය. එහි තිබූ මුදල් ගණන් නොකර අතට අසු වූ ප්‍රමාණය ගමන් මල්ලේ දමාගෙන පිරිවෙනින් පලා ගියෝය. රාත්‍රිය පුරා යන එන මගක් නොදන බස් නැවතුම්පොළේ සැහෙන වේලාවක් රැඳී සිට මහ රාත්‍රියේම තම මිත්‍ර ගණිත ගුරුවරයාගේ ගේ සොයාගෙන ගියේය. මේ හිමියන්ට මේ විපත වූයේ තමා නිසායැයි සිතූ ගණිත ගුරුවරයා ඔහු එදින උන් වහන්සේ ගෙදර නතර කරගෙන සිට පසුදා තම භාරකාරත්වය යටතේ කොළඹ පිරිවෙනකට භාර කළේය.

මෙවක් පටන් එක් ස්ථිර අධිෂ්ඨානයකින් පාඩම් වැඩට මහන්සි වූ සාමණේරයෝ පිරිවෙන් අවසාන විභාගය, උසස්පෙළ විභාගය කිරීමට සුදුසු පරිද්දෙන් සමත් කරගත්තෝය.

මෙයින් තවත් අධිෂ්ඨානයක් ඇති කරගත් සාමණේරයෝ ලැබෙන පිරිකරින් පොතපත පිරිමසාගෙන උසස්පෙළ විභාගය දෙවරක් ලියා විශ්වවිද්‍යාලයට යෑමට වරම් පාදාගත්තෝය.. මේ සියල්ල කරද්දී විටින් විට ඇසෙන වැලපීම් හඬ යටපත් කරගන්නට උන් වහන්සේ භාවනා කළෝය... එහෙත් එය ඒ කාලසීමාවට පමණක් සීමා වෙයි... නැවත මතු වන්නේය..

විශ්වවිද්‍යාලයේදී සම්මිශ්‍ර වූ තරුණ සමාජය මධ්‍යයේදී ඒ වැලපුම් හඬ දෙකක් වී ඇසෙන්නට පටන්ගත්තේය. දූරිය මිටිතාප්පයට බර වී දුකට හැඬූ හඬ වෙනමත් බඩගින්නට හැඬූ හඬ වෙනමත් ඇසෙන්නට පටන්ගත්තේය.. දහවලදී දූරිය බඩගින්නට අඬන හඬ සමූහ ළතෝනියක් දක්වා ක්‍රමයෙන් වෙනස් වී ගියේය. ඒ හඬ සාමණේරයන්ට සමූහය සමග සිටියදී නිතර නිතර ඇසෙන්නට වූයේය. එහෙත් දූරිය තමා පාසලෙන් අස් වී එන මොහොතේත් විදුහල්පති පහර දෙද්දීත් හැඬූ හඬවල් දූන් වෙනම ඇසෙන්නේය.. එය රාත්‍රියේදී සාමණේරයන්ට වැඩිපුර ඇසුණේය.. එවිට සාමණේරයෝ නේවාසිකාගාරයට වී ඒ හඬට සවන් දුන්නෝය. ඒ හඬ ශෝකී ගීයක් ලෙසින් ඇසෙන්නට පටන් ගත්තේය. ඊට ඉතා දුක්බර වීණා වාදනයක් එකතු වී තවත් විටක ඇසෙන්නට පටන් ගත්තේය. එහෙත් දහවලේදී දැරියගේ ඇඬුම් හඬ මහා වැලපුමක් ලෙසින්ම ඇසෙන්නට පටන්ගත්තේය.

"අනේ එපා... ගහන්න එපා... අපි වරදක් කළේ නෑ.. අපි බඩගින්නට අඹ කන්න ගියේ" යන වදන් අමුඅමුවේ උන් වහන්සේගේ කන් පතුල් මත වැදුණේය. එවිට උන් වහන්සේ දෝතින් කන් වසාගෙන සිටින්නට උත්සාහ කළෝය. එහෙත් කන් ආවරණය වූ ඇඟිලිකරු අතරින් ඒ හඬට තවත් හඬවල් දහස් ගණන් එකතු වී ඇසෙන්නට වූයේය.. ඒ සියලු හඬවල් අතරින්ද ඇසුණේ "අනේ අපට ගහන්න එපා... අපි වරදක් කළේ නෑ..." යනුවෙන්මය... මේ හඬට සවන් නොදෙන්නවුන් වෙනුවෙන් දහවල් කෝප වන සාමණේරයෝ ඒ අසාධාරණකම් වෙනුවෙන් යුක්තිය ඉල්ලා කවි ලිවෝය.. ඒවා පත්තරවලට යැව්වෝය. රාත්‍රියේදී ඒ ශෝකී හඬ ගීයක් කොටගෙන සවන් දුන්නෝය... එවිට සිතට නැගෙන සිතිවිලිද කවි කොට පත්තරවලට යැවීම සිදු කළෝය... සාමණේරයන් දහවල ලියන කවි ප්‍රගතිශිලි ඒවා වූ අතර, රාත්‍රියේ ලියන කවි ශෝකී දුක්බර කවිම වූයේය. සාමණේරයන්ට මේ දුක් කවි ලිවීම නතර කරන්නට වුවමනා වූයේය. ඊට රාත්‍රී ඇහෙන දූරියගේ දුක්බර හඬ නාසා සිටිය යුතු බව සාමණේරයෝ දැන සිටියෝය.. ඒ නිසා ඒ හඬ අමතක කිරීමට සාමණේරයෝ භාවනා කළෝය.. මෙයින් ප්‍රගතියක් ලබන සාමණේරයෝ සමහර දිනක රාත්‍රියෙත් රණගීම ලියුවෝය.. එහෙත් බොහෝ රාත්‍රීන්වල සාමණේරයන්ට ඇසුණේ දූරිය දුකින් හඬන හඬමය..

සාමණේරයෝ ඉදහිට ගමට ගොස් තම අම්මාත් තාත්තාත් මල්ලිත් බලා ආවේය... ඒ සෑම අවස්ථාවකදීම දූරිය පිළිබඳ හිතින් සොයා බැලුවත් ඇසින් සොයන්නට ඇය දකින මානයක නොසිටියාය.. ඇය රස්සාවකට ගොස් ඇති බව අම්මා කිව්වාය. ඇය කොහේ සිටියත් සාමණේරයන් කැමති වූයේ ඇය මිට්තාප්පය ළඟ අඬමින් සිටියදී නැවත දකිමටය... ඇයට නැවත බනිස් ගෙඩියක් හෝ අඹගෙඩියක් අහුලා දී බඩ පුරවා ඇය සතුටු කිරීමටය... තමා පාසලෙන් අස්ව යද්දී ඉකිබිඳි මුහුණ හෝ විදුහල්පති තමාට පහරදෙන විට දුකින් හැඬූ දූරිය සාමණේරයන්ට දකිමට ප්‍රියත් නැත්තේය. එහෙත් මල්ලිගේ විවාහය දා ඒ සියල්ල නොපිට පෙරළී තම නෙත් කඳුළින් තෙත් වූයේ ඇයිදැයි සාමණෙරයන්ට සිතාගත නොහැක්කේය.

දහවල් කාලයේ සියලු අතින් කැකෑරෙන ලේ සහිත සාමණෙරයෝ සිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන පිරිස් අතරට එකතු වී නොබියව සටන් පාඨ කීවෝය. බඩගින්නට අඹ කෑ වරදට බොහෝ දේ තමාට අහිමි වූ බව දත් සාමණේරයෝ එවැනි බඩගිනිකාරයන්ගේ දුක්අඳෝනා සටන් සාධාරණ බව නිතරම සිතුවෝය.. මේ නිසා කම්කරු සටන්වලදීද සාමණේරයෝ පෙරමුණට ගියෝය. නායකත්වය අවැසි තැනදී නායකත්වය දුන්නෝය. පොලිස් මැඩලීම්වලදී සාමණේරයෝ නොබියව ඉදිරියට ගියෝය. බැටන් පොලුපහරවල් වදිද්දී දූරියගේ වැලපුම් හඬට සවන් දෙමින් මාංසපේශි උලුප්පා ගත්තෝය. සමහර විට ඔවුන්ට පෙරළා පහර දුන්නෝය. පොලිස්කූඩුවේ ලැගීමට නොබියව ඉදිරිපත් වූවෝය.. සාමණේරයන්ට දූත් වැඩිපුරම ඇසෙන්නේ දූරිය බඩගින්නට හැඬූ හඬ පමණක්ය... මේ නිසා සාමණේරයෝ සෑම රාත්‍රියකම දුක් කවි වෙනුවට රණගී රණකවිම ලියුවෝය.

මාක්ස්වාදි පොතපතින් ලැබුණු අමතර දැනුමත් ඒ වෙනුවෙන් පෙනී සිටි කණ්ඩායමත් කරණ කොටගෙන සාමණේරයන් වහන්සේ ඉබේම විප්ලවීය සංකල්ප කෙරෙහි වැඩිපුර ආකර්ෂණය වන්නට පටන් ගත්තෝය.. ඉක්මනින්ම එහි ප්‍රබල ක්‍රියාකාරිකයෙකු වූ සාමණේරයෝ විප්ලවීය අත්පත් කරගැනීම් කෙරෙහි වැඩි විශ්වාසයකින් කටයුතු කළෝය; දූරියගේ බඩගින්නේ ඇඬුම් ස්වරය සමූහ ගායනයක ස්වරයක් කොට සවන් දුන්නෝය. එහෙත් කලාතුරකින් රාත්‍රියක ඇය දුකට ඇඬූ ඇඬුම් ස්වරය ශෝකී ගීයක් කොටගෙන තනිවම ඇසුවෝය.

සාමණේරයෝ විප්ලවීය මාවතේ අරමුණු දිනාගැනීම වෙනුවෙන් මහත් වෙහෙසින් නොබියව කටයුතු කළෝය; ඉගෙනගත්තෝය; අනුන්ට කියා දුන්නෝය. මාර්ගය සුද්ධපවිත්‍ර කරගත්තෝය.

එහෙත් ඒ සටනේ සංධිස්ථානයකදී සාමණේරයෝ අතරමං වූවෝය.. අසරණ වූවෝය; අනාථ වූවෝය. ඔවුන්ගේ හඬ යටපත් වෙමින් ආයුධ හඬ සතර අත පැතිර ගියේය. සමූහයම ආයුධ මර්දනයට අසුව ගියේය.

සියල්ල ආයුධබලයෙන් යටපත් වෙද්දී සාමණේරයන් වහන්සේට එක් හමුදා කඳවුරක මරණයේ වාරය එන තුරු බලා සිටින්නට සිදු වූවේය.. දිනපතා දෑස් බැඳ එළියට රැගෙන යන තම සහෝදරසහෝදරියන් ඒ යන්නේ අවසන් ගමන බව සාමණේරයෝ දැන සිටියෝය.. ඔවුන්ගේ අවසාන විලාපය කඳවුර අසලින්ම සාමණේරයන්ට ඇසුණේය.

"අනේ අපි වරදක් කළේ නෑ. අපි මරන්න එපා...'' යන ළතෝනිය හැම පැත්තෙන්ම ඇසෙන්නට වූයේය. සමහර රාත්‍රියක ඇත්ත දැනගැනීමේ දඬුවම් පෝලිමට සාමණේරයන් කැඳෙව්වේය... හමුදාහටයන්ගේ දරුණු පහරකෑම්වලට බියෙන් ඇත්ත කියා ජීවිතය ඉල්ලා සිටින තරුණතරුණියන් සාමණේරයන්ට දැකගන්නට ලැබුණේය.. සාමණේරයෝ හමුදා හටයන්ගේ තුවක්කු පහරවල් සපත්තුපහරවල් මස්ගොබ පුප්පාගෙන ඉවසා සිටියේය. දූරිය බඩගින්නට අඬන හඬ ඇසෙද්දී තවමත් සාමණේරයන්ගේ මස්ගොබ ඉලිප්පී සියලු වද විඳගැනීමේ ශක්තිය ශරීරයට එන්නේය.. සපත්තුපහරකට පොලුපහරකට විලාපලන බොහෝ පිරිස් ගිරව් මෙන් දොඩවද්දී ඒ පහරකෑම්වලදී සාමණේරයෝ මුනිවතින් මස්ගොබ පුම්බාගෙන සිටියෝය. ඔවුන් සමග පොරබදා තුවක්කුවක් උදුරාගෙන මේ වධකයන් මරාගෙන මැරෙන්නට සාමරණේරයන්ට සිතුණු වාර බොහෝය.

එම කඳවුරේ සිටි කිසිවකු බැලීමට හෝ බේරාගැනීමට දෙමව්පියෝ නාවෝය; නෑයෝ නාවෝය; මිතුරෝ නාවෝය; දුගී, මගී කිසිකෙනෙක් නාවෝය.. කළුවර, අමු ලේ ගඳ, අමු මස් ගඳ සහිත විශාල උස බිත්ති සහිත සිමෙන්ති පොළොවේ සීතලේ නිදන ඔවුහු මරණයේ වාරය එන තෙක් පමණක් බලා සිටියෝය.

දිනපතා පහර කෑමෙන් හෙම්බත් වූ සාමණේරයන්ට මිටිකාප්පයේ එල්ලී අවසන් වරට තමා දෙස බලාසිටි දූරියගේ මුහුණ වැඩිපුර මතක් වන්නට පටන්ගත්තේය. බඩගින්නට බඩ අල්ලාගෙන මිටිකාප්පයට බර වී සිටි දූරියගේ වැලපුම් හඬින් ඒ ඒ වැලපුම් හඬ වෙන් වී ඇසෙන්නට පටන්ගත්තේය. විශ්වවිද්‍යාලයේදී ඇසුණු, මහමගේදී ඇසුණු දහස්ගණනකගේ වැලපුම් හඬින් දූරියගේ හඬ වෙන්ව ඇසෙන්නට පටන්ගත්තේය. ක්‍රමයෙන් සාමණේරයන්ගේ ශරීරයේ මස්ගොබ මෙලෙක් වී පොලුපහර වැදුණු තැන් රිදෙන්නට පටන්ගත්තේය. මෙතෙක් සියලු වේදනාවන්ට හුරු වී තිබූ සාමණේරයන්ගේ ශරීරය තව දුරටත් ඒ පොලුපහරවල් දරාගැනීමට නොහැකි ලෙස වේදනා දෙන්නට පටන්ගත්තේය. බඩගින්නට හැඬූ දූරියට වඩා මහා ඉඩක් දුකට හඬන දූරිය වෙනුවෙන් තමන්ගේ පපු කුහරයේ වෙන් වෙමින් තිබෙන බවක් සාමණේරයන්ට දැනෙන්නට පටන්ගත්තේය.

සාමණේරයන්ගේ මස්ගොබ පුපුරුගැසුවේය. හන්දිපත් වේදනා දුන්නේය. දැස් වැලි දමා අතුල්ලන කලක මෙන් වූවේය. ශරීරයේ සියලු ඉන්ද්‍රිය මරණයේ සෙවණැලි දැක බිය ගත්තේය. කරුවල රාත්‍රියක අමු ලේ, අමු මස් කන යකුන් පොකුරු පිටින් පැමිණ තමාගේත් මිටිකාප්පයේ එල්ලී දුකට අඬන දූරියගේත් ඇඟමස් කඩාගෙන කන ආකාරය සිහිනෙන් දුටුවේය. උදයේද දහවලද එම අමු ලේ ගඳ, අමු මස් ගඳ සියලු බිත්ති බිඳගෙන තම නාස්පුඩු මතම තැවරෙන බව සාමණේරයන්ට දැනුණේය.

එම සිහිනයේදී තමා බේරාගන්නා ලෙස දූරිය කෑගසා ඇඬුවාය.. ඇගේ මරණ බිය සහිත වැලපුම් හඬද ඒ හඬටම එකතු වූයේය.

සාමණේරයන්ට මරණයේ වාරය උදා වූයේය.. කළු ලේන්සුවකින් දැස් බැඳ අත්පිටුපසට කොට බැඳ ට්‍රක් රථයට තරුණතරුණියන් පටවන පෝලිමේ එක් ස්ථානයක් සාමණේරයන්ටද හිමි වුණේය... සාමණේරයන් පෝලිමට එක් වෙද්දී දූරියගේ ඉකිබිඳුම මහා විලාපයක් ලෙසින් ඇසුණේය..

"අනේ එයා මරන්න එපා.. එයා මගේ යාළුවා..... අනේ එපා අනේ එපා..." යන හඬ සතර අතින් ඇසුණේය.... සාමණේරයෝ බිම බලාගෙන පෝලිමේ ගොස් ට්‍රක් රථයට ගොඩ වුණෝය..

ඝන කළුවර රාත්‍රියේ කොහි සිට කොහාට යන්නේදැයි නොදත්තද මේ යන්නේ අවසන් ගමන බව උන් වහන්සේ හොඳින්ම දැන සිටියෝය.

ට්‍රක්රථයේදී තම දැස් බැඳ තිබූ ලේන්සුවේ අග කටින් ඇද යාන්තම් ඇහැපාදාගත් සාමණේරයෝ කළුවර කපාගෙන යන ලොරියේ තමා සිටින්නේ ලොරියේ පිටුපසට වන්නට බව සාමණේරයෝ අවබෝධ කරගත්තෝය.

වංගු සහිත පාරේ මේ තරුණතරුණියන්ගේ ජීවිත භූමදානය කරන්නට සොහොන් පිටියක් සොයමින් ට්‍රක්රථය මන්දගාමී ගමනක යෙදුණේය. හමුදා භටයෝ මරණ බයෙන් දඟලන පිරිස දෙසට තුවක්කු අමෝරාගෙන සිටියෝය. ඇඟමස් කඩාගෙන කන යකුන්ට මැදි වූ දූරියගේ මරළතෝනිය සාමණේරයන්ගේ කන් අසල මහා විලාපයක් ලෙස ගිගුම් දුන්නේය...

"අනේ මාව බේරගන්න... අනේ මාව බේරගන්න..." යන හඬ සාමණේරයන්ට සතර අතින්ම ඇසුණේය.. සාමණේරයන්ගේ ශරීරයේ මෙතෙක් තිබූ සියලු වේදනා නැතිව ගියේය.. අත්දඬු ඉලිප්පී ආවේය. නහර පුරවාගෙන ලේ උණුසුමව ගලන්නට පටන්ගත්තේය.. සාමණේරයෝ තීරණයක් ගත්තේය. මරණය සඳහාම මේ යන ගමනේ ජීවිතය වෙනුවෙන් එක උත්සාහයක් හෝ කොට මැරෙමියි සාමණේරයෝ තීරණය කළෝය. ඊළඟ වංගුවේදී සාමණේරයෝ තමා ළඟ සිටි හමුදා සොල්දාදුවා පෙරළා දමා ට්‍රක්රථයෙන් බිමට පැන්නේය.. එකෙණෙහිම වෙඩි වරුසාවක් පතිත වූවේය.. කරුවලේ ආශිර්වාදයෙන්

එම කදවුරේ සිටි කිසිවකු බැලීමට හෝ බේරාගැනීමට දෙමව්පියෝ නාවෝය, නෑයෝ නාවෝය, මිතුරෝ නාවෝය, දුගී, මගී කිසිකෙනෙක් නාවෝය.. කළුවර, අමු ලේ ගඳ, අමු මස් ගඳ සහිත විශාල උස බිත්ති සහිත සිමෙන්ති පොලොවේ සීතලේ නිදන ඔවුහු මරණයේ වාරය එන තෙක් පමණක් බලා සිටියෝය.

දිනපතා පහර කෑමෙන් හෙම්බත් වූ සාමණේරයන්ට මිටිතාප්පයේ එල්ලී අවසන් වරට තමා දෙස බලාසිටි දැරියගේ මුහුණ වැඩිපුර මතක් වන්නට පටන්ගත්තේය. බඩගින්නට බඩ අල්ලාගෙන මිටිතාප්පයට බර වී සිටි දැරියගේ වැලපුම් හඬින් ඒ ඒ වැලපුම් හඬ වෙන් වී ඇසෙන්නට පටන්ගත්තේය. විශ්වවිද්‍යාලයේදී ඇසුණු, මහමගේදී ඇසුණු දහස්ගණනකගේ වැලපුම් හඬින් දැරියගේ හඬ වෙන්ව ඇසෙන්නට පටන්ගත්තේය. ක්‍රමයෙන් සාමණේරයන්ගේ ශරීරයේ මස්ගොබ මෙලෙක් වී පොලුපහර වැදුණු තැන් රිදෙන්නට පටන්ගත්තේය. මෙතෙක් සියලු වේදනාවන්ට හුරු වී තිබූ සාමණේරයන්ගේ ශරීරය තව දුරටත් ඒ පොලුපහරවල් දරාගැනීමට නොහැකි ලෙස වේදනා දෙන්නට පටන්ගත්තේය. බඩගින්නට හැඬූ දැරියට වඩා මහා ඉඩක් දුකට හඬන දැරිය වෙනුවෙන් තමන්ගේ පපු කුහරයේ වෙන් වෙමින් තිබෙන බවක් සාමණේරයන්ට දැනෙන්නට පටන්ගත්තේය.

සාමණේරයන්ගේ මස්ගොබ පුපුරුගැසුවේය. හන්දිපත් වේදනා දුන්නේය. දැස් වැලි දමා අතුල්ලන කලක මෙන් වූවේය. ශරීරයේ සියලු ඉන්ද්‍රිය මරණයේ සෙවණැලි දැක බිය ගත්තේය. කරුවල රාත්‍රියක අමු ලේ, අමු මස් කන යකුන් පොකුරු පිටින් පැමිණ තමාගේත් මිටිතාප්පයේ එල්ලී දුකට අඬන දැරියගේත් ඇඟමස් කඩාගෙන කන ආකාරය සිහිනෙන් දුටුවේය. උදයේද දහවලද එම අමු ලේ ගඳ, අමු මස් ගඳ සියලු බිත්ති බිඳගෙන තම නාස්පුඩු මතම තැවරෙන බව සාමණෙරයන්ට දැනුණේය.

එම සිහිනයේදී තමා බේරාගන්නා ලෙස දැරිය කෑගසා ඇඬුවාය.. ඇගේ මරණ බිය සහිත වැලපුම් හඬද ඒ හඬටම එකතු වූයේය.

සාමණේරයන්ට මරණයේ වාරය උදා වූයේය.. කළු ලේන්සුවකින් දැස් බැඳ අත්පිටුපසට කොට බැඳ ට්‍රක් රථයට තරුණතරුණියන් පටවන පෝලිමේ එක් ස්ථානයක් සාමණේරයන්ටද හිමි වුණේය... සාමණේරයන් පෝලිමට එක් වෙද්දී දැරියගේ ඉකිබිඳුම මහා විලාපයක් ලෙසින් ඇසුණේය...

"අනේ එයා මරන්න එපා.. එයා මගේ යාළුවා..... අනේ එපා අනේ එපා..." යන හඬ සතර අතින් ඇසුණේය.... සාමණේරයෝ බිම බලාගෙන පෝලිමේ ගොස් ට්‍රක් රථයට ගොඩ වුණෝය..

සන කළුවර රාත්‍රියේ කොහි සිට කොහාට යන්නේදැයි නොදත්තද මේ යන්නේ අවසන් ගමන බව උන් වහන්සේ හොඳින්ම දැන සිටියෝය.

ට්‍රක්රථයේදී තම දැස් බැඳ තිබූ ලේන්සුවේ අග කටින් ඇද යාන්තම් ඇහැපාදාගත් සාමණේරයෝ කළුවර කපාගෙන යන ලොරියේ තමා සිටින්නේ ලොරියේ පිටුපසට වන්නට බව සාමණේරයෝ අවබෝධ කරගත්තෝය.

වංගු සහිත පාරේ මේ තරුණතරුණියන්ගේ ජීවිත භූමදානය කරන්නට සොහොන් පිටියක් සොයමින් ට්‍රක්රථය මන්දගාමී ගමනක යෙදුණේය. හමුදා භටයෝ මරණ බියෙන් දඟලන පිරිස දෙසට තුවක්කු අමෝරාගෙන සිටියෝය. ඇඟමස් කඩාගෙන කන යකුන්ට මැදි වූ දැරියගේ මරළතෝනිය සාමණේරයන්ගේ කන් අසල මහා විලාපයක් ලෙස ගිගුම් දුන්නේය...

"අනේ මාව බේරගන්න... අනේ මාව බේරගන්න..." යන හඬ සාමණේරයන්ට සතර අතින්ම ඇසුණේය.. සාමණේරයන්ගේ ශරීරයේ මෙතෙක් තිබූ සියලු වේදනා නැතිව ගියේය.. අත්දඬු ඉලිප්පී ආවේය. නහර පුරවාගෙන ලේ උණුසුමව ගලන්නට පටන්ගත්තේය.. සාමණේරයෝ තිරණයක් ගත්තේය. මරණය සඳහාම මේ යන ගමනේ ජීවිතය වෙනුවෙන් එක උත්සාහයක් හෝ කොට මැරෙමියි සාමණේරයෝ තීරණය කළෝය. ඊළඟ වංගුවේදී සාමණේරයෝ තමා ළඟ සිටි හමුදා සොල්දාදුවා පෙරළා දමා ට්‍රක්රථයෙන් බිමට පැන්නේය.. එකෙණෙහිම වෙඩි වරුසාවක් පතිත වූවේය.. කරුවලේ ආශිර්වාදයෙන්

සාමණේරයෝ පාරේ වම්පස බෑවුමට පෙරළුණේය.. පෙරළි පෙරළී පහළටම ගියෝය. වෙඩිහඬ කන් අසලින් ඈතට යන තුරු බඩගාමින් තවතවත් ඈතට ගිය සාමණේරයෝ ගල්පතුරක අතුල්ලා අත් දෙක ලිහාගෙන අනතුරුව ඇස් දෙකද ලිහාගෙන ජීවිතය බේරාගත්තේය.

පාන්දර වන තුරු කැලෑවේ සැඟවී සිටි සාමණේරයෝ පසුදින මරණය හෝ ජීවිතය යන හැඟීමෙන් කැලෑපාරකින් ගමකට සේන්දු වුණේය. තැන්තැන්වල ගිනිගනිමින් තිබෙන සිරුරු රාශියක් සාමණේරයෝ දුටුවෝය.. පාළු පිට්ටනියක මුණින්අතට වැතිරී මියගොස් සිටි සොහොයුරුසොහොයුරියන් රාශියකගේ සිරුරු දැකීමෙන් සාමණේරයෝ මහත් සේ කම්පා වූවෝය. ඔවුන්ගේ පිට පෙදෙස වෙඩිඋණ්ඩවලින් පසාරු වී තිබුණේය. ඔවුන්ට තැබූ වෙඩිපහරවල්වලට සාක්කි සපයන පතරොම් කොපු ඒ සිරුරු අසල තිබුණේය. එක් සොහොයුරකුගේ සිරුරක් උඩුබැලි අතට වැටී තිබුණේය. එහි පසාරු වී තිබුණේ පපුවයි... ඒ අසල පතරොම් කොපුවක් වැටී තිබුණේය... එය ඒ සොහොයුරාගේ පපුව සිදුරු කළ උණ්ඩයේ පතරොම් කොපුව විය හැකි බව සාමණේරයෝ අනුමාන කළෝය. සාමණේරයෝ එය අහුලාගත්තෝය.. සාමණේරයන් වහන්සේ මේ සියලු ඛේදවාචකයන් මැද ආරක්ෂා කරගත් දැරිය දැන් පැන්සල් කැබැල්ලේ අගට එම පතරොම් කොපුව සවි කරගත්තෝය. ඒ දෙස මොහොතක් බලා සිටි සාමණේරයෝ.... තම මියගිය සගයන් දෙස කඳුළු පිරි දෙනෙතින් බලා සිටියෝය.

ජීවිතය ගලවාගත් සාමණේරයෝ මොනරාගල තම හිතවත් වැඩිහිටි හිමිනමකගේ පන්සලකට ගියෝය. එහිදී සාමණේරයෝ පන්සලේ වැඩ කරමින්, දායකකාරකාදීන්ගේ වැඩ කර දෙමින් ආරාමික ජීවිතයකට හුරු වූවෝය. එම ගමේ ජීවත් වූ පළමු විප්ලවයේ අත්දැකීම් ලත් වයෝවෘද්ධ වැඩිහිටියන්ගේ ඇසුරෙන් ටිකින් ටික වෙනස් චින්තනයක් ඇති කරගත්තෝය.. ජීවිත පරිණතියෙන් වයෝවෘද්ධ වූ ඒ පුරාණ විප්ලවවාදියෝ සාමණේරයන් වහන්සේ ධාර්මික පොතපත කියවන්නට පෙලඹවූවෝය.

"අපි හිතූ හැටි වැරදි නෑ හාමුදුරුවනේ, ඔබ වහන්සෙ හිතපු විදියත් වැරදි නෑ... ඒත් අපි ජීවිතයේ පරිණතිය ලබන කොට නැත් නම් අපි වයෝවෘද්ධ වෙන කොට අපට ජීවිතේ ගැන වෙනත් විදියකට පේන්න පටන්ගන්නවා... ඒක අපේ අක්මුල් පැතිරී ගිය මේ මහා සංස්කෘතිය නිසා වෙන දෙයක් කියලයි මට හිතෙන්නෙ. ඒ මහා සංස්කෘතිය නියෝජනය කරන ආගම, භාෂාව, කලාව, සාහිත්‍යය... මේ හැම දේම අපගේ පරිණතිය එක්ක අපේ අත්දැකීම්වලට නිර්වචන සපයා දෙනවා. සමහර විට හොඳ විප්ලවවාදියෙකුට කොතරම් නාකි වුණත් එහෙම නොදැනෙන්න පුළුවන්. ඒ ඔහු හිතන විදියට බලපාපු සංස්කෘතිය අනුව වෙන්න ඇති. ඒත් අපි ලබන අත්දැකීම් නිතරම අපට කියා දෙන්නෙ ඊට එහා ගිය පාඩම්... ඉස්සර අපේ මොළය හදවතට අණ කළා. දැන් හදවත මොළයට අණ කරනවා.. හදවත අපි හදාගෙන තියෙන්නෙ මේ සිංහල මහා සංස්කෘතිය ඇතුළෙ... ඒක බොහොම අහිංසාවාදී එකක්.. ඒ නිසා හදවතේ අණට මොළය පරාජය වෙලා. ඒකට අපි දැන් කැමතියි... අපේ වයෝවෘද්ධභාවයත් එක්ක අපට හැදෙන ලෙඩදුක් වයස්ගත වීමේ දුක, ජරාජීරණත්වය මේ සියල්ල එක්ක අපි හදවත කරන අණදීම්වලට අවනත වෙනවා වැඩියි. ඒ නිසා අපි ආගමට දහමට සම්බන්ධ වෙනවා වැඩි ඇති. ඒක ආත්මාර්ථකාමී සිතිවිල්ලක් විදියට කෙනෙකුට පේන එක සාධාරණයි. ඒත් ඒ මහා සංස්කෘතිය තුළ අපට වෙන කරන්න දෙයක් නෑ... අපි අපේ විමුක්තිය හොයනවා හැරෙන්න." සාමණේරයන්ට වෘද්ධයන්ගේ අදහස් ජීවිතයේ දෙවන අදියර කෙරෙහි බෙහෙවින්ම බලපෑවේය.

මේ වැඩිහිටි ඇසුර නිසා සාමණේරයන්ට තම පැන්සල් කැබැල්ලට ගැසූ පතරොම් කොපුව ගලවා දමන්නට හිතුණු වාර බොහෝය. ඒ පතරොම් කොපුව දකින හැම විටකම තමාගේ සිත තරුණ මදයෙන් සහ කෝපයෙන් ඉලිප්පී, ළතෝනිය සමග එකතු වී නින්නාද දෙන විට ශරීරයේ මස්පිඬු තෙරපී ලේ රත් වී ජීවිතය කැකෑරෙනවාට දැන් සාමණේරයන් තුළ කැමැත්තක් නැත්තේය.

සාමණේරයන් තුළ දැන් ඇසෙන්නේ දැරියගේ දුක්බර හඬ පමණක්ය.. ඒ ශෝකී රාවයද තම මතකයෙන් ඈත් වී යන්නේ නම් මැනැවයි වරෙක සිතෙන්නේය. තම අම්මා, තාත්තා හෝ මල්ලී, නැනා ආදී තම ඥාතීන් බැලීමට යන්නට සාමණේරයන්ට විටෙක සිතෙන්නේය.. එහෙත් ගමට ගිය හොත් තමන් නැවතත් පොලීසියට කොටු වෙතැයි යන බිය ඒ ගමන වළකා දැමුවේය.

දැරියගේ ශෝකී හඬ ජීවිතයම පාළුව කාන්සිය මුසු කළ ශෝකී ගී රාවයක් ලෙසින් තුන්තිස් පැයේම ඇසෙන්නට වූයේය. පතරොම් කොපුවෙන් පැන්සල ගලවන්න වත් පැන්සල් කොටයෙන් පතරොම් කොපුව ගලවන්න වත් බැරි ලෙස ඒ දෙක එකට හා වී තිබුණේය.. එය ගලවාදමන්නට සාමණේරයෝ උත්සාහ ගත්තද එය පැන්සල් කැබැල්ලට තදින් හිර වී තිබුණේය.

පතරොම් කොපුව දෙස නොබලා පැන්සල් කැබැල්ල දෙස බලන්නට පමණක් සාමණේරයෝ වරෙක උත්සාහ කළෝය. තවත් වරෙක මේ දෙකම අවශ්‍ය නැතැයි සිතුවෝය.. මේ සියලු උත්සාහයන් තමා ගන්නේ ආත්ම වංචාකාරයෙකු ලෙස නොවේදැයි වරෙක සාමණේරයන්ගේ සිත දෙස් තැබුවේය.

සාමණේරයන්ගේ සිත තෝන්තුවාවෙන් පිරී පැවතියේය.. තම සිතත් ගතත් දෙකම අක්‍රිය වෙමින් නිද්‍රෝපගත ජීවිතයකට තමා කවුරුන් හෝ විසින් ඇදගෙන යන බවක් සාමණේරයන්ට දැනෙන්නට පටන්ගත්තේය... වරෙක එම නිද්‍රාව වඩා හොඳයැයි සිතුවෝය. තවත් වරෙක එය හොඳ නැතැයි සිතුවෝය. මේ දෙකින්ම පීඩා විඳි සාමණේරයෝ සමහර දිනක දවසේම ඇඳ මත වැතිර නිදාගත්තෝය.. තවත් දවසක උදැල්ල ගෙන වත්ත උදලු ගෑවෝය; මිදුල් අතුගෑවෝය; මල් කැඩුවෝය; දායකකාරකාදීන්ගේ ඕනෑ එපාකම්වලට කැමැත්තෙන් ගියෝය.

එහෙත් දිනෙන් දින සාමණේරයන්ගේ සිත විවිධ පාළු සිතිවිලිවලින්ම පිරී යන්නට පටන්ගත්තේය... දැරියගේ ශෝකී හඬට සවන් දීම මහ මුළාවක් විකාරයක්යැයි සිතෙන්නට පටන්ගත්තේය.. එහෙත් එය සෑම මොහොතකම එසේ නොපැවතියේය.. වරෙක පැන්සල් කැබැල්ල අතහැර පතරොම් කොපුව දෙස බැලුවෝය. වරෙක පතරොම් කොපුව අතහැර පැන්සල් කැබැල්ල දෙස බැලුවෝය. විටෙක ඒ දෙකම දෙස බැලුවෝය. වරෙක තමා මහා බොළඳයෙකු නොවන්නේදැයි තමන්ගෙන්ම ප්‍රශ්න කළෝය.. කණ්ණාඩිය දෙස බලාගෙන තම ප්‍රතිබිම්බයට ඇති වන තුරු හිනා වුණෝය.. තවත් සමහර විටක ඒ ප්‍රතිබිම්බයට කෙළගැසුවෝය... මේ ක්‍රියාවන් නිරීක්ෂණය කළ වැඩිහිටි හිමියෝ සාමණේරයන්ගේ සිත හැදීමට හොඳම තැනක් ගැන සොයා බැලුවේය. ඒ අනුව සාමණේරයන්ට වනවාසී හිමිනමකගේ ආරාමයකට යන්නට අවස්ථාව උදා වූයේය.. තම සිත මහා බරකින් පිරී තිබෙන බවත්, ඒ බරින් කෙසේ හෝ නිදහස් විය යුතු බවත් සිතූ සාමණේරයෝ ඉතා කැමැත්තෙන් මේ ගමන ගියෝය..

ඒ සමූහලතෝනියද සමූහයෙන් වෙන්ව ඇසෙන ශෝකී ඉකිබිඳීමද යන සියල්ල අමතක කරදැමීමට සාමණේරයන්ට අවශ්‍ය වුණේය... නැති නම් ඒ හඬ නොඅසා සිටින්නට සාමණේරයන්ට දැඩිව වුවමනා වුණේය. එහෙත් ඒ හඬ නිතර නිතර ඇසුණේය. එයින්ම තම හිත විපිළිසර වී ඇති බව වනවාසී භික්ෂුවට සාමණේරයෝ පැහැදිලි කළේය... සියල්ල ඇසූ උන් වහන්සේ සාමණේරයන්ට කමටහන් දී භාවනා වඩන්නට හුරු කළෝය..

වනවාසී ජීවිතය තුළ අලුත් අත්දැකීම් සාමණේරයන්ගේ ජීවිතයට එකතු වුණේය.. ගහකොළ සතාසීපාවා ඇළදොළ ඇසුරේ හුදෙකලාව ගත කරන ජීවිතයකට සාමණේරයෝ ක්‍රමයෙන් හුරු වූවෝය. වනවාසී හාමුදුරුවන්ගේ උපදෙස් පිළිපදිමින් සාමණේරයෝ ලෝකය අමතක කර ගස්කොළත් ඇළ දොළ සතාසිව්පාවා ගැන පමණක් සිතමින් භාවනා වඩන්නට පටන්ගත්තෝය.. මේ වනවාසී ජීවිතය තුළ සාමණේරයෝ වැඩිපුර දහම් පොතපත කියෙව්වෝය. ත්‍රිපිටකයද අටුවා පොත්ද කියෙව්වෝය. එසේ කියවද්දී සාමණේරයන්ගේ සිත ධර්මයේ ගැඹුර සොයන්නට වෙහෙසුණේය.. එහෙත් විටින් විටම දැරියගේ ශෝකී හඬ ඇසුණේය.. තම සිත බැලුමක් දිය යට සඟවා තබාගෙන සිටිද්දී මෙන් භාවනා කරන වේලේදී පමණක් පාළුවෙන් මිදී වෙනස් වුණේය.. එහෙත් නින්දේදීත් වෙනත් කටයුතුවලදීත් මේ දුක්බර හඬ ඇසුණේය..

සාමණේරයෝ වනවාසි භික්ෂුවකගේ ඇසුරෙන් උපසම්පදාව ලබාගත්තෝය. ඒ අනුව සාමණේරයෝ භික්ෂුව යන ශාසන සාමාජිකත්වය ලබාගත්තෝය; වනවාසි හිමියන් සෙවණේ පස් වසක් වසමින් භාවනාව තවතවත් හුරු කළෝය... එහෙත් ඒ කන් පතුල් මත තැවරෙන ශෝකී ගී රාවය නම් උන් වහන්සේට විටින් විටම ඇසුණේය.. පපුව මැද ඉතිරි වූ හිස් අවකාශයක ඒ හඬ තැන්පත් වී ඇති බව භික්ෂුවට දැනුණේය. ඒ හඬත් සමග තම සිත වේදනාවට පත් වීම හෝ සිත හිරිවට්ටන පාළුව යෝනිසෝ මනසිකාරයෙන් සිටිමින් අමතක කරදැමීමට නිතර දහමම ඇසුරු කළෝය... එහෙත් තමන්ගේ අවශ්‍යතාව මේ දහමින් ඉටු නොවන්නේ කාගේ වරදක් නිසාදැයි භික්ෂුව නිතර සිතන්නට පටන්ගත්තෝය... මෙය තමා ලබාගන්නා කමටහන්වල වරදක්ද? නැති නම් තමාගේ වරදක්දැයි භික්ෂුවට අවබෝධ නොවුණේය.. සිතේ විවිධ තර්ක ගොඩනැගෙමින් තිබුණේය.. තමා ආගම තුළ අතරමං වී ඇති බවක් වරෙක භික්ෂුවට දැනුණේය. එහි අර්ථයත් වසාගත් මහා මිථ්‍යාවක් මගින් ආගම පාලනය කරමින් සිටින බව විටෙක දැනෙන්නට පටන් ගත්තේය.. තම ආත්මයේ නිදහස් වීම සඳහා මේ හඬ නොඅසා සිටීම සඳහා ආගම භාවිත කරන විදියක් භික්ෂුවට පැහැදිලි නොවුණේය. වනවාසීන්ගේ ගුරුහරුකම්ද ග්‍රාමවාසීන්ගේ ගුරුහරුකම්ද නගරවාසීන්ගේ ගුරුහරුකම්ද සියල්ල කෙරෙහි භික්ෂුව සැක ඉපදුවේය. පොතපත කෙරෙහිද සැක ඉපදුවේය.... භික්ෂුවගේ වන්දනාව මේ පසුබිම යටතේ සිදු වුණේය.

8.

ක්‍රමයෙන් සිහි ලබන භික්ෂුව දෙස ගුප්ත බලා සිටියේය. උදායි හිමියන්ගේ ඔවදන ගුප්තට නැවත සිහිපත් වූයේය.

"අපි තවම මෙතනද? ඉක්මනින් යමං ගුප්ත..'' භික්ෂුව සිහින් ස්වරයෙන් කීවේය.

"ඔබවහන්සේට කුසගිනියිද?'' ගුප්ත සෙමෙන් ඇසුවේය.

"මට ඇති බඩගින්නක් නෑ. මෙතනින් ඉක්මනට යමං.''

භික්ෂුව නොරිස්සුම සහගත ලෙස කීවේය. ගුප්ත නැවත අශ්වයා දක්කුවේය. අශ්වයා කම්මැළි ගමනින් කරත්තය ඇද්දේය....

පැය කීපයක් යද්දී අශ්වයාගේ ගමන තවත් බාල වූවේය. ගුප්ත කීපවතාවක් අශ්වයාට වතුර දුන්නේය. තණකොළ දුන්නේය. ඌ වතුර බිව්වා මිස තණකොළ නොබුදියේය. අශ්වයා කරත්තය අදින්නේ කම්මැළිකමින් නොව, යම් රෝගයකින් පෙළෙමින්යැයි ගුප්ත අනුමාන කළේය. අශ්වයා විටින් විට කට දෙකොනින් අමු තණපත් සහිතව සෙම වැගිරුවේය. එම සෙම පෙණ සහිත ගුළි ලෙසින් අශ්වයාගේ මුව දෙකොනින් පහළට බේරුණේය. ගුප්ත අශ්වයාගේ වෘෂණ පයින් මඩිමින් කිතිකවද්දී අශ්වයා එයින් වත් ගමන ඉක්මන් නොකළේය. එහෙත් අශ්වයා ගමනේ යෙදුණේය.....

භික්ෂුව නින්දත් නොනින්දත් අතර පසු වූවේය.. තම ශරීරය අප්‍රාණිකව ගොස් ඇති බවක් භික්ෂුවට දැනුණේය. තමා යෝනිසෝ මනසිකාරයෙන් සිට අමතක කරන්නට උත්සාහ දරන සිතාරයක හඬ සමග එන දූරියගේ ශෝකී ගී රාවය අම්බපාලියගේ අඹ වනය මුණගැසෙද්දී නැවත නැවත ඇසෙන්නට වූ බව භික්ෂුවට මතකය. ඒ හඬ සවන් මතින් සියලු ඉන්ද්‍රියන් ස්පර්ශ

කරමින් දෙනෙත් කුහර තුළින් එළියට එන්නේ මිරිකාප්පයට බර වී පාසලේදී තමා දෙස බලා සිටි දූරිය වෙනුවට නන්ද කුමරුන්ගේ කතාවේදී තමා මනසින් දුටු ජනපද කල්‍යාණියගේ රූපය ලෙසින්ය.

"කුමරුනි. ආපසු එන්න. මා ඔබ එන තුරු බලා සිටිනවා" යැයි නන්ද කුමරු පාත්‍රයත් රැගෙන බුදුරදුන් පිටුපසින් ගමන් කරද්දී ජනපද කල්‍යාණිය නන්ද කුමරුන් ආමන්ත්‍රණය කර කී කතාව හික්මුවට ඇසෙන්නේය.

හික්මුවට හිසේ සිට පාදාන්තය දක්වා පැතිරී ගිය ශාරීරික දූවිල්ලක් දැනුණේය. එය තමන්ට හැදුණු ක්ලාන්තයෙන් පසුව හටගත් එකක් බව හික්මුවට වැටහෙන්නේය. ශරීරයේ බර ගතියක් ඒ සමගම දැනෙයි. තමා තරුණකාලයේ පොලිස් බැටන් ප්‍රහාරවලට ලක් වීමෙන් ලත් ශරීර වේදනාවලට සමාන වේදනාවක් නැවත තම ශරීරයේ හටගනිමින් ඇතැයි හික්මුවට දැනෙන්නේය.

හික්මුව තම ගමන් මල්ලෙන් නැවතත් කරඬුව එළියට ගත්තේය. එම කරඬුව තවදුරටත් ගමන්මල්ලේ දමාගෙන සිටිය නොහැකි තරම් බර වැඩි වී ඇත. පිටත කැටයම් ලියවැල් සියල්ල එකිනෙක පැටලී කරඬුවේ බඳ විශාල වී ගිය බවක් හික්මුවට දැනෙන්නේය.

"දෙයියනේ.... මේක දේවදත්ත හාමුදුරුවන්ගෙ වැඩක්ම වෙන්න ඕන.... මගේ ශරීරයටත් මොනවා හරි කරනවා වගෙයි..." හික්මුව විස්සෝප සිතින් කරඬුව අතගෑවේය.

කොණ්ඩඤ්ඤ හිමියන් තමාගෙන් කළ ඉල්ලීම ඉටු කිරීමට තමාට බැරි වෙතැයි යන බිය හික්මුව තුළ හටගෙන ඇත. මේ කරඬුවේ බර විසින් තමාගේ සිතත් කයත් දෙකම පෙළමින් සිටින බවක් හික්මුවට දැනෙන්නේය.

"ඔය කරඬුව දළදාමැඳුරෙ තැන්පත් කරන්නට පෙර කළ යුතු විශේෂ කාර්යයක් තිබෙනවා..." ඒ දේවදත්ත හිමියන්ගේ හඬ බව හික්මුව වහා අවබෝධ කරගත්තේය.

"ඒ කුමක්ද?" හික්මුව යම් කීකරු බවක් පෙන්නමින් ඇසුවේය..

දේවදත්ත හිමියෝ හික්මුව ළඟින්ම වාඩි වූවෝය.

"ඔබ ඔය කරඬුවේ ඇතුළත දුටුවාද?" දේවදත්ත හිමියෝ ඇසූහ.

"නෑ. එහි සියුම් සිදුර මට සොයාගැනීමට නොහැකි වූවා."

"එම සියුම් සිදුර පාදාගත හැකියි.... බිය නම් ඔබ අතම කරඬුව තබාගන්න. මම පෙන්නනම්" හික්මුව දේවදත්ත හිමියන්ට කරඬුව පෑවේය.... කරඬුවේ අළු තැවරී, අවපැහැගැන්වී තිබූ තැනක දේවදත්ත හිමියෝ තම දබරැඟිල්ල තබා එතැන හික්මුවටද ඇඟිල්ල තබා බලන ලෙස කීවෝය. හික්මුවද එම අවපැහැ ගැන්වී තිබූ තැන ඇඟිල්ල තැබුවේය... එහි ලෝහ මෙළෙක් වී ඇති බවක් හික්මුවගේ ඇඟිලි තුඩට දැනෙන්නේය.

"ඒ හරිය දිරල නේද?" හික්මුව සැකයෙන් ඇසුවේය. දේවදත්ත හිමියෝ එම අවපැහැ වූ තැනට ඇඟිලිතුඩ තබා තෙරපුවේය... එහි සිදුරක් සැදුණේය....

"දැන් ඇතුළත බලන්න" දේවදත්ත හිමියෝ කීවෝය. හික්මුව ඇස තබා එම සිදුරෙන් ඇතුළත බැලුවේය... එහි එක රන්පතක් වෙනුවට රන්පත් සිය දහස් ගණනක් තිබුණේය. සියල්ල එකගොඩක ගොඩගසා තිබුණේය.

"කෝ ඒ කොණ්ඩඤ්ඤ හාමුදුරුවො කියාපු රන්පත?" හික්මුව ප්‍රශ්න කළේය..

"ඒකත් ඔය ගොඩේම ඇති."

හික්මුව වහා තම දෑස ඉන් මෑත් කරගත්තේය.. හික්මුවගේ සිත සංවේගයෙන් පිරී ගියේය.

"දෙයියනේ! නිර්මල බුද්ධවචනය තිබ්බව රන්පත වැහිල- මං කොහොමද දැන් මගේ යුතුකම වගකීම ඉටු කරන්නෙ? කොහොමද මෙ තවලම් වෙච්ච රන්පත් ගොඩින් මං ඒක හොයාගන්නෙ...?" හික්මුව මැසිවිලි නැගුවේය...

"මෙ සිදුර තව විශාල කරල, ඒ රන්පත් එළියට අරගෙන, මට කොණ්ඩඤ්ඤ හාමුදුරුවො භාරදීපු රන්පත සොයා දෙන්න" භික්ෂුව ආයාචනා කළේය...

"මෙය තවත් සිදුරු කළ නොහැකියි.. එසේ වුවොත් කරඬුවට හානි වෙනවා... කෙසේ වෙතත් ඔබ මේක මේ කරඬුවෙන් වෙන් කරගෙන වෙනත් කරඬුවක තැන්පත් කළොත් කොහොමවත් ඒක කොණ්ඩඤ්ඤ හිමියන්ගෙන් ඔබට ලැබිච්ච රන්පතක් කියල කවුරුවත් විශ්වාස කරන්නෙ නෑ... කරඬුව නැති කිසිම තැනකදි ඒක ඔබට ඔප්පු කරන්න බෑ.."

"දැන් මා කුමක් කළ යුතුද? ඔබ වහන්සේ නේද මේ සියල්ල කළේ?"

"නැහැ. මා කිසි දෙයක් කළේ නෑ.. මා බලාසිටියේ මේ කරඬුවේ අයිතිය වෙනුවෙන්... ඒ අයිතිය පමණයි මට අවශ්‍ය. ඇතුළත තිබෙන දෙයට වඩා මට වැදගත් කරඬුව. දැන් ඔබ තීරණය කරන්න මෙය අපට දෙනවාද? නැති නම් කොණ්ඩඤ්ඤ හිමියන් ඔබට භාරදුන් කාර්යය කරනවාද?"

"ඔව්. මා එය කළ යුතුයි. මා උන් වහන්සේට පොරොන්දු වූවා මේ කරඬුව ආරක්ෂා කොට දළදා මාලිගාවේ තැන්පත් කරන බවට."

"ඔබට එය කරන්නට බැරි වී ඇත... ඔබ දැනුවත්ව හෝ නොදැනුවත්ව කරඬුව කිලිටි වී ඇත.... ඒ කිලිටි වූ කරඬුව මා දුන් කරඬුවක් බව කියා එහි තැන්පත් නොකරන්න" ඒ කොණ්ඩඤ්ඤ හිමියන්ගේ හඬ බව භික්ෂුවට පැහැදිලිය..

"මට සමා වෙන්න ස්වාමීනි, මා නොදැනුවත්වයි මේ සියල්ල සිදු වී තිබෙන්නේ" භික්ෂුව දෙඅත් එකතු කොට ආකාසය දෙසට වැන්දේය..

"දැන් වත් ඔය කරඬුව අපට භාර දෙන්න" දේවදත්ත හිමියෝ ඉල්ලූහ..

"ඔව්. එය ඔබ වහන්සේ රැගෙන යන්න. මා කැමතියි එය ඔබ වහන්සේගේ භාරයට පත් කරන්න" භික්ෂුව ඇඬුම්බරව කීවේය..

"හොදයි අපට ටික වේලාවක් දෙන්න පළමුවෙන්ම මෙහි සිදුර වසා කරඬුව නැවත රන් ආලේප කළ යුතුයි.. එය මා දැන් කරවන්නම්" යැයි කියූ දේවදත්ත හිමියෝ ක්ෂණයකින් ලෝකුරුවෙකු මැව්වේය. ඔහු දේවදත්ත හිමියන්ගේ අණින් කරඬුවේ සිදුර වසා රන් ආලේප කළේය. කරඬුව නැවත භික්ෂුව අතට භාර දුන් දේවදත්ත හිමියෝ ඉක්මනින්ම පැමිණෙන බව කියා අතුරුදන් වූවෝය.

තවත් මොහොතකින් චතුරංගිනී සේනාවත් සමග අජාසත්ත රජු පෙරටු කරගත් දේවදත්ත හිමියෝ අහසින් පැමිණියෝය. දේවදත්ත හිමියෝ දිලිසෙන රන් පැහැ සිවුරකින් සැරසී සිටියෝය. උන් වහන්සේගේ පිටුපස එවැනිම රන් පාට සිවුරු පෙරවාගත් විශාල පිරිසක් වූහ.. එම සිවුර රජගහ නුවරවාසීන් විසින් සැරියුත් හිමිට පූජා නොකොට දේවදත්ත හිමියන්ට පූජා කළ සිවුරම බව භික්ෂුව වහා හඳුනාගත්තේය..

"ඔව්. ඒ සිවුර තමයි...." දේවදත්ත හිමියෝ උජාරු ලෙස කීවෝය. භික්ෂුව සංවේගයෙන් ඔවුන් දෙස බලාසිටියෝය.

"මම කරඬුව ඔබ වහන්සේ අතට දැන් භාරදෙන්නද?"

"සුභ මුහුර්තයට තවත් මොහොතක් තිබෙනවා. බලන්න. මේ කරඬුව ඔබ මල්ලේ ඔබාගනිද්දී මෙවැනි පිරිසක් සිටියාද කියා... අර චතුරංගිනී සේනාව... අර මඟුල් බෙර වයන්නෝ... අර සක් පිඹින්නෝ... අර ස්තුති ගී ගයන්නෝ... අර මගේ අනුගාමිකයෝ" දේවදත්ත හිමියෝ ඒ මහා පිරිස භික්ෂුවට හඳුන්වා දුන්නෝය. භික්ෂුව කිසිවක් නොකියා ඔවුන් දෙස වරින් වර බැලුවේය. රජුගේ මිදි ගබඩාවෙන් මිදි ගෙන මිටිමිනිසුන් මත හෙළන්නට රජුට උපදෙස් දුන් තළලේ අළු තවරාගත් භික්ෂූහුද බමුණෝද එහි සිටියෝය. මිටිමිනිසුන්ගේ වැලපුම් හඬ ශුද්ධ ඕම්කාරයක් කරද්දී වාදන සැපයූවෝද නර්තන සැපයූවෝද එහි සිටියෝය. මිටිමිනිසුන් මැද සිට අහසට අත් පා මිදි යුෂ එකතු කරගත් උස මිනිස්සුද එහි සිටියෝය.

සුභ නැකත උදා වූ බව නැකැත්රාල කීවේය... ඒ සමගම මංගල භේරී නාදයෙන් සහ සක් හඬින් හාත්පස ගිගුම්

දුන්නේය... සියලු කලා ගුරුකුල නියෝජනය කරමින් තූර්යවාදන හඬද ගුවනට එකතු වූවේය. සැදූහැවතුන්ගේ සාධුකාර හඬ මැද භික්ෂුව කරඬුව දේවදත්ත හිමියන්ට භාර කළේය.... එම කරඬුව මහත් ගෞරවයෙන් පිළිගත් දේවදත්ත හිමියෝ සියතින්ම එය අජාසත්ත රජුගේ හිස මත තැන්පත් කළෝය... අජාසත්ත රජු එම කරඬුව හිසින් ගෙන හස්තියාගේ පිට මත තැංගේය... චාමර, සේසත්, මුතු ඡත්‍ර දරාගත්තෝ රජුත් හස්තියාත් වට කරගෙන සිටියෝය... ස්තුති ගීතිකා ගයන්නෝ ස්තුති ගී ගායනා කළෝය....

''ඔබ වහන්සේ පහු වෙලා හරි ගත්ත තීරණය ගැන අපි සන්තෝෂ වෙනවා..... අපට ඔය කරඬුව බලහත්කාරයෙන් ලබාගන්න තිබුණා.. එහෙත් එය එම කරඬුවේ ශුද්ධත්වයට කැළලක්.. අප දැන සිටියා ඔබ මේ තීරණය ගන්නා බව.... බලන්න මෙයින් පසු අප සමග එකතු වන පිරිස් කොතරම්ද කියා... මෙය බුදු දහමේ ජනප්‍රියම කාලය උදා කරන පරිත්‍යාගයක් බව මතක තබාගන්න.. මේක මල්ලේ දමාගෙන පරිස්සම් කිරීම සඳහා තිබෙන කරඬුවක් නෙමෙයි. මෙය මහජන ප්‍රදර්ශන පිණිස තිබෙන කරඬුවක්. මේ කරඬුව මහජනයාට ප්‍රදර්ශනය කළ යුතු ආකාරය පිළිබඳව රජුටත් මටත් පැහැදිලි සැලැස්මක් තිබෙනවා... ඔබ වහන්සෙත් අපට එකතු වන්න.....'' දේවදත්ත හිමියන්ගේ වචන භික්ෂුවට සන්තෝෂයක් නොගෙනාවේය. මෙය දේවදත්ත හිමියන් අතට පත් කිරීමෙන් තමා වරදක් කළේය යන හැඟීම භික්ෂුව තුළ ඉතිරි වුණේය.

චතුරංගිනී සේනාවේ ආරක්ෂාව මැද මහා පෙරහරකින් ඔවුහු කරඬුව වඩමාගෙන ගියෝය. රජුගේ පිටුපසින් සඳලුතලයේ සිට අදෝනා නගන මිනිසුන් මත සඳලුතලයේ සිට මිදියුෂ හැලූ රාජපුරුෂයෝද, වැලපුම් හඬ ශුද්ධ ඕම්කාරයක් කරන්නට වීණා වැයූ නළලේ අළු ගාගත් භික්ෂූහුද බමුණෝද මිදියුෂ දෝතින් ගෙන බොන උස මිනිස්සුද ඒ පෙරහරේ පෙරමුණ ගෙන සිටියෝය. කස හඬ පරදන බෙර හඬද බෙර හඬ පරදන දවුල් හඬද දවුල් හඬ පරදන නළා හඬද නළා හඬ පරදන සක් හඬද සක් හඬ පරදන සටන් පායද මේ පෙරහර තුළින් ඇසෙන්නට

පටන්ගත්තේය. ඒ සියලු හඬින් තුෂ්ණිම්භූත වූ මිටිමිනිස්සු මග දෙපස සිට දෝත් පාගෙන බිමින් යන රජුගෙන් යමක් ඉල්ලුවෝය. රජු දේවදත්ත හිමියන්ගේ මුහුණ බැලුවේය. දේවදත්ත හිමියෝ කරඬුව ඇල් දියෙන් දොවා උන් මත ඒ පැන් ඉස්සෝය. ඒ පැන් හිසේත් මුහුණේත් ගාගත් ඒ මිනිසුන්ගෙන් සමහරු ප්‍රබෝධ වී පෙරහරට ම එකතු වූවෝය... කරඬුව දෙවූ වතුරෙන් මුහුණ දොවා ප්‍රබෝධය ලැබූ ඒ මිටිමිනිසුන් අතට ඒක් රාජ පුරුෂයෙක් කස ලබා දුන්නේය. කස අතට ගත් ඒ මිටිමිනිස්සු පෙරහරට ඉඩ ගනිමින් කස ගසන්නට පටන්ගත්තෝය. උන්ගේ කස හඬ පෙරහැරේ සියලු හඬ යටපත් කරමින් නැගෙන්නට පටන්ගත්තේය. දේවදත්ත හිමියන්ගේ අණින් අනුගාමිකයෝ මහත් ශ්‍රද්ධා ඇති කරගෙන සාධුකාර නැගුවෝය. ඒ සාධුකාර හඬ අසා සිටින නරඹන්නෝද සාධුකාර නැගුවෝය. රජුගේ දෝත මත ඇති රන් කරඬුවේ රශ්මිය හාත්පස එළිය කළේය. ඒ රශ්මියෙන් දේවදත්ත හිමියන්ගේ රන්පාට සිවුර තව තවත් දිස්න දෙන්නට පටන්ගත්තේය. දේවදත්ත හිමියන්ගේ සිරුරින් රැස් විහිදෙතැයි සිතූ නළල් මත අළු තවරාගත් භික්ෂූන්ගේ මුහුණුද දීප්තියෙන් බබළන්නට වූයේය.. ඔවුහු සියලු දෙනා මහා හඬින් සාධුකාර දුන්නෝය. කසකාරයෝ තවතවත් කස ගසමින් මාර්ගය පිරිසිදු කළෝය.

කස හඬින් තැති ගත් තම ගම්බිම් නිවෙස් බලා යන පිරිස් ඒ මගින් ඉවත් වී වෙනත් අතුරු මාවත් දිගේ යන්නට පටන් ගත්තෝය. කසයේ දිග පළල නොදැන කස වැනීම නිසා මග දෙපස අයිනේ සිටි පිරිසටද කස පහර වැදුණේය. ඔවුහු අසරණව කසපහර කමින් යන එනමං නොදැන කානුවලට බැසගත්තෝය. පෙරහර නැරඹීම සඳහා පාර දෙපස සාදා තිබූ විශේෂ වේදිකා මත වාඩි වී සුව සේ තවත් පිරිසක් පෙරහර නැරඹුවෝය. ඔවුන්ට කනබොන දෑ විකුණමින් තවත් පිරිසක් මුදල් උපයාගත්තෝය. ඇතා පිට සිටින රජු මහ පිරිස් දැක උද්දාමයෙන් දෙපස බලමින් සිනාසුණේය. දේවදත්ත හිමියෝ අජාසත් රජු මිත්‍ර කරගැනීම සඳහා පෑ ප්‍රාතිහාර්යය නැවත නැවත පාමින් විටින් විට නරඹන්නෝ කුල්මත් කළෝය. එයින්

මත් වූ නරඹන්නෝ සාධුකාර දෙනවා වෙනුවට අත්පොළොසන් දුන්නෝය. දේවදත්ත හිමියෝ අහසට පැන නැගී නාග වෙසක් ගෙන එක් දළපුඩුවකින් ගින්දර පිට කරන්නට පටන්ගත්තෝය. අනික් දළපුඩුවෙන් ජලය පිට කරන්නට පටන්ගත්තේය. රජු තව තවත් උද්දාමයෙන් ප්‍රීති සිනා පෑවේය. දළපුඩුවෙන් නැගෙන ගින්නෙන් කස අගට ගිනි අවුලාගත් කසකාරයෝ ඒ ගින්නෙන් නරඹන්නන් තවතවත් මාවත දෙපසින් ඈතට තල්ලුකර හැරියෝය.

දේවදත්ත හිමියන්ට ආරංචි ගෙන එන්නෙක් දේවදත්ත හිමියන්ගේ කනට කර රහසක් කීවේය.

"ස්වාමිනි, අපට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් තවත් මෙවැනිම පෙරහරක් අප දෙසට ගමන් කරමින් තිබෙන බව සැලයි... ඔවුන් පැමිණෙන්නේ අපගේ කරඬුව පැහැරගෙන විනාශ කිරීමට බවත් සැලයි."

දේවදත්ත හිමියෝ වහා රජුට ඒ බව සැල කළෝය.. රජු තරමක් කල්පනාකාරී වූයේය... රජුගේ සුභාරංචිකරුවෝ වහා පෙරට ගියෝය. ඔවුහු සෑහෙන වේලාවකින් පසු නැවත පැමිණුණෝය.

"රජතුමනි, අප නැවතද රැගෙන ආවේ ඔබ වහන්සේට අසුභ වන ආරංචියක් නොවේ. ඔවුන්ද ශුද්ධවස්තුවක් රැගෙනයි අප දෙසට ගමන් කරන්නේ. ඔවුන් සතුරු සේනාවක් නොවෙයි. ඔවුන් ඔබගේ සහාය බලාපොරොත්තු වෙනවා.. ඔබ වහන්සේට ඒ මිත්‍රසමාගමය යහපතක්ම සලසාවි. ඔවුනටද කළ හැකි උදව්වක් කරන්න." සුභාරංචි සපයන්නා රජුගේ කනට කර කීවේය. රජු දේවදත්ත හිමියන්ට නොදන්වාම තම රාජපුරුෂයන් කිප දෙනෙකු වෙස් ගන්වා ඔවුන්ට උදව් පිණිස යැව්වේය.

සතුරු සේනාව පිළිබඳ ආරංචිය දේවදත්ත හිමියෝ අහසට පැන නැග, සියලු දෙනාට ඇසෙන සේ හඬනගා කීවෝය. ඉන් කුපිත වූ කසකරුවෝ රාජපුරුෂයන්ගෙන් කස ලබාගෙන නරඹන්නන් අතර සිටින මිටිමිනිසුන්ට ලබාදෙමින් ඔවුන්ද පෙරහැරේ පෙරමුණට කැඳෙව්වෝය.

බිමට බට රජුගෙන් තම දරුවන්ගේ කුස පුරවාගැනීමට මිදි යුෂ බිඳක් ලැබෙන තෙක් දෑත් පාගෙන සිටි පිරිසද දේවදත්ත හිමියන්ගේ ආරංචියෙන් බිය ගෙන සතුරන් පළවා හැරීමට පෙරමුණට ආවෝය. තළලේ අලු තවරාගත් භික්ෂූහුද කරඬුව සතුරු සේනාවෙන් බේරා දෙන ලෙස රජුට කන්නලව් කළෝය. "ඔබ වහන්සේ පිතෘඝාතක ආනන්තරීය පාපකර්මයෙන් මුදවා ලන්නට අප කළ සියලු පිං අනුමෝදන් කරන්නම් අපට කරඬුව රැකගැනීමට උදව් කරන්න" යැයි මිටිමිනිස්සු රජුට ආයාචනා කළෝය. රජු සිනාමුසු මුහුණින් සියලු දෙනාට සවන් දෙන බව අඟවා දේවදත්ත හිමියන් තමා සමීපයට කැඳෙව්වේය.

"මේ කරඬුව මා අත තබාගෙන පෙරහරේ යමින් මට මීට රැකවරණය සැලසිය නොහැකියි. ඔබ වහන්සේලා මෙය වඩමන්න. මා කඩුව අතට ගත යුතුයි." රජු කියා සිටියේය. දේවදත්ත හිමියෝ රජුගෙන් කරඬුව ලබාගෙන එය ඇතා පිට මණ්ඩපයක් බැඳ ඒ තුළ තැන්පත් කළේය.

"පෙරහර ඉදිරියටම යන්න. පෙරහැර ඉදිරියටම යන්න. සතුරන්ට බිය වන්න එපා. අප එකාපිට එකා මැරී වැටෙමින් හරි මේ කරඬුව සතුරන්ගෙන් ආරක්ෂා කළ යුතුයි. ඒ සඳහා රජුගේ සහාය අපට ලැබෙනවා" දේවදත්ත හිමියෝ නැවතත් අහසට පැනනැගී කියා සිටියෝය.

අජාසත්ත රජු නැවතත් රාජමාලිගාවේ උඩුමහල්තලාවේ සිට දෙපසින් එන පෙරහර නැරඹුවේය. රජු රාජපුරුෂයන් ලවා දෙපසේම පිරිස සතුටු වන සුභාරංචි දෙපසම පිරිස් වෙත යැව්වේය. දෙපසේම පිරිස් රජුට ස්තුති ගී ගයමින් පෙරටම පැමිණියෝය.

"අපට මිදි යුෂ එපා. අපේ දරුවන් කුසගින්නේ මැරුණාවේ. අපට කරඬුව රැක දෙන්න" යැයි බොහෝ පිරිස් කියන්නට පටන්ගත්තෝය.

මේ දෙපිරිසේ සම්මුඛ වීමට තව යොදුන් ගනණක දුරක් තිබියදී භික්ෂුව ඒ පෙරහරින් දෑස් ඉවතට ගත්තේය. තමන්ට කොණ්ඩඤ්ඤ හිමියන්ගෙන් ලැබුණ කරඬුව මෙය නොවන බව

සිතූ භික්ෂුව ඒ කරඬුව කෙරෙහි තිබූ ආශාව අතහැර දැම්මේය. එහෙත් තමන්ට කොණ්ඩඤ්ඤ හිමියන් පැවරූ රාජකාරිය හරිහැටි කරගැනීමට නොහැකි වීමේ ශෝකයෙන් ළය පුරවා ගත් භික්ෂුව කරඬුවේ බරින් හිස්ව ගිය තම ගමන් මල්ල හකුළා ඔඩොක්කුවේ තබාගත්තේය..

භික්ෂුවට නැවතත් අඹ ගස් එකට ඇතිල්ලෙන හඬ ඇසෙන්නට වූයේය. එය අම්බපාලියගේ අඹ වනයේදී ඇසූ හඬට වෙනස් ශෝකී හඬකි.... භික්ෂුව එය අමතක කරන්නට ධර්මය මෙනෙහි කළේය...

9.

"හාමුදුරුවනේ, අපි කුසිනාරාවට ආවා....." යි ගුප්ත කීවේය. ලෙඩ වූ අශ්වයා සමග කුසිනාරාවට එන්න ලැබෙතැයි භික්ෂුව විශ්වාස නොකළේය... එහෙත් ඒ සැබවින්ම කුසිනාරාව වූයේය.

හාත්පස සල්ගස්වලින් ගැවසී ගත්තේය. ඒ සල්ගස්වල පිපී තිබූ මල් බිමට නැඹුරුව, පෙති අඩක් හැකිළී ගොස් තිබුණි. ගුප්ත පිරිනිවන් මංචකයට යන පාර අසල කරත්තය නතර කළේය. අශ්වයා විඩාබරව කට දෙකොනින් සෙම පෙරුවේය. අශ්වයා කරත්තයෙන් මුදාගත් ගුප්ත උගේ හිස අතගාමින් ඌ සැනසුවේය...

"ගුප්ත, උඹත් යමන් මා එක්ක. මට ටිකක් මහන්සියි" භික්ෂුව ගුප්තට කතා කළේය... අශ්වයාට තිදැල්ලේ යන්නට ඉඩහළ ගුප්ත කරත්තය පාරෙන් ඉවතට තල්ලු කර හැරියේය....

"මේ අපේ ගමනාන්තයද ගුප්ත?" ගුප්ත කිසිවක් නොකීවේය... ගුප්තගේ ඉතා පැහැදිලි වූත් ගැඹුරු වූත් නෙත් සඟළ දෙස භික්ෂුව මොහොතක් බලා සිටියේය..

"අපි යමු...."

ගුප්ත භික්ෂුව වත්තන් කරගෙන පිරිනිවන් මංචකය දක්වා ගමන් කළේය.... අසූවයස් පිරුණු බුද්ධකාය හතලිස්පස් වසක සේවයේ විශ්‍රාමය සංකේතවත් කරන මහාසාධකය බව භික්ෂුවට දැනෙයි... භික්ෂුව මහත් ශ්‍රද්ධාවකින් පිරිනිවන් මංචකය ළඟ දෙදණ ඔබා පසඟ පිහිටුවා වැන්දේය...... බොහෝ පිරිස් පැමිණ බුද්ධකාය චීවරවලින් වැසුවෝය... මලසුන මත මල් තැබුවෝය. බුද්ධ චරිතය මුල සිට අග දක්වා මෙනෙහි කරන බොහෝ පිරිස් පරිනිර්වාණ මංචකය නරඹමින් දෙනෙත් කඳුළින් පුරවාගනිති..

ඒ පිරිස අතර එක් මැදිවිය ඉක්මවූ මෙහෙණියක් අසූවයස් පිරුණු බුද්ධකාය රන්වන් සිවුරකින් වැසුවාය.... භික්ෂුව ඒ සිවුරුපූජාවට ශ්‍රද්ධා සිතින් අනගැසුවේය..... දකුණු පස සිටි එම මෙහෙණිය වම් පස සිටි භික්ෂුව දෙස බලා සිටියාය.....

''ඔබ වහන්සෙ ලංකාවෙද?''

''ඔව්. මම ලංකාවෙ..... මෑණියො?''

''මමත් ලංකාවෙ......''

''කොයි පළාතෙද?''

''දනට ජීවත් වෙන්නෙ නම් කුරුණෑගල ආරාමෙක.. ඒත් ගම කළුතර.''

''කළුතර...... කළුතර කොයිහරියෙද?''

''පලාතොට....''

''පලාතොට කාගෙ කවුද?''

''පීටර් කියන්නෙ අපේ තාත්තා.''

''පී...පීටර් මාමගෙ දුව...... න......ර්මදාද?''

''එහෙමයි......... ඔ...ඔබ වහන්සේ....?''

''ම......මම සයිමන්ගෙ ලොකු පුතා....... ගුණපාල.''

''ගු....ගුණ..පාල!''

ආනන්ද හාමුදුරුවන්ගේ වැලපුම් හඬ...... දූරියගේ විලාපය සමග මුසු වී භික්ෂුවගේ දෙසවන් අතර නින්නාද දෙන්නට විය... පංචසිඛගේ හේරුණ්ඩ වීණාව සූරියවච්චසා පිළිබඳ වූ ගීතය සමග මුසුව තවත් පසෙකින් ඇසෙන්නට වූයේය. ජනපද කල්‍යාණිය නන්ද කුමරුන්ට කළ ආමන්ත්‍රණය තවත් පසෙකින් ඇසෙන්නට වූයේය. පැන්කළය උකුළේ හලා ගිය රොඩී කෙල්ලගේ පාසිළඹු හඬ තවත් පැත්තකින් ඇසෙන්නට වූයේය. ස්වාමියා එන තෙක් මගබලා සිටි යසෝදරා කුමරියගේ රුව තවත් පසෙකින් පෙනෙන්නට වූයේය. පිය සෙනෙහස ඉල්ලා හඬා වැටුණු රාහුල කුමාරයාගේ හඬ තවත් පැත්තකින් ඇසෙන්නට

වූයේය. ඔවුනොවුන්ගේ දෙනෙත් පන්සාලිස් වසකට පසුව එකට මුණගැසීමෙන් ලත් ප්‍රීතියද දුකද කුතුහලයද එකම මොහොතක ඇසිපිය නොසලා භික්ෂුවත් මෙහෙණියත් විඳගත්තෝය.

නොදන්නා ඉසව්වක සිට හමා ආ මහා සුළඟකින් ඔවුන්ගේ සිවුරු තෙමෙන්නට වූයේය. තම සිවුරු ඒ සුළගේ ගසා යා නොදී ඔවුහු සිවුරු කොන් දැතට තද කොටගෙන සිටියෝය. ඒ සුළඟ ජීවිත නටබුන් රාශියක් ඔවුන් වෙත රැගෙන ආවේය. ඒ නටබුන් ඔවුන්ගේ පාමුල අතහැර දමූ ඒ සුළඟ ඒ නටබුන් මත තැන්පත්ව තිබූ කුණු දූවිලි පමණක් රැගෙන යන්නට ගියේය. කුණු දූවිලි ඉවත්වූ ඒ නටබුන් දීප්තියෙන් බබළන්නට පටන්ගත්තේය. ඒ දීප්තිය ඔවුන් දෙදෙනාගේ උඩුසම සිඳ යටිසමට ඇතුළු වූයේය. යටිසම සිඳ මසට ඇතුළු වූයේය. මස සිඳ ඇටවලට ඇතුළු වූයේය. ඇට සිඳ ඇටමිදුළුවලට ඇතුළු වූයේය. ඇටමිදුළු සිඳගෙන දෙනෙත් කෙවෙනි මත තැන්පත් වූයේය... දෙනෙත් කෙවෙනිවලට නුහුරු වූ ඒ දීප්තිය ඔවුන්ගේ දෙනෙත් තෙත් කරන්නට පටන්ගත්තේය.. තෙත් වූ දෙනෙත් ඉවුරු සහිත ඔවුහු තවත් වේලාවක් එකිනෙකා දෙස බලා සිටියෝය.

භික්ෂුව තම ගමන් මල්ලට අත ඔබා පැන්සල් කැබැල්ල අතට ගත්තේය...

''මතකද?'' භික්ෂුව ඇසුවේය.. මෙහෙණියද තම ගමන් මල්ල අතගා පැන්සල් කැබැල්ල අතට ගත්තාය..

''මතකයි'' මෙහෙණිය පැන්සල් කොටය භික්ෂුවට පෙන්නුවාය.

එම පැන්සල් කොට දෙක ඔවුහු එකිනෙක යා කළෝය.. එහෙත් භික්ෂුවගේ පැන්සල් කැබැල්ලට විල්ලක් ලෙස ගසා තිබූ පතරොම් කොපුව නිසා එය එකට යා කළ නොහැකි වුණේය. භික්ෂුව එම, පතරොම් කොපුව, ගැලවීමට උත්සාහ කළේය.. එහෙත් එය පැන්සල් කැබැල්ල සමග තදටම බද්ධ වී තිබුණේය.

''කමක් නෑ.. ඒක මේ පැන්සලේ ඉතිරි කෑල්ල බව මම හොඳින්ම දන්නවා'' මෙහෙණිය ඉතා පහත් ස්වරයෙන් කීවාය.

''එදා පාසලෙන් අස් වී යන මොහොතේ පන්ති කාමරයේ මිටිතාප්පය බදාගෙන විලාප තැබූ ඔබ කවදාවත් මෙසේ මුණගැසෙතැයි මම නොසිතුවෙමි.....''

''මමද කිසි දිනක ඔබ මෙසේ මුණගැසෙතැයි නොසිතුවෙමි... ඔබ සමග ළඳුකැලෑවේ අඹ ඇහිලූ මොහොත අප කළ ලොකුම වරද බව සිතූ අපේ වැඩිහිටියෝ එදා අප රිදවූ තරම් කොපමණදැයි අප කෙසේ කියන්න ද? ඒ සියලු මතකයන් ජීවිතයෙන් අමතක කරගත නොහැකිව බොහෝ කලක් දුක් වින්දෙමි..... ඔබ නොමැති පාළුවේ දොංකාරය මගේ සිත ගත දවාලතැයි මම නොසිතුවෙමි. එහෙත් එය එසේම විය...''

''එහෙත් ඒ බාලිකාව ඔබයැයි මා කෙසේ විශ්වාස කරන්නද?''

''ඔව්. ඔබත් ඒ බාලකයායැයි මා කෙසේ විශ්වාස කරන්නද?''

''ඔබ විපරිණාමයේ අග දක්වා පැමිණ තිබේ.''

''ඔබද විපරිණාමයේ අග දක්වා පැමිණ තිබේ.''

''මට ඔබෙන් මා පැතූ ඒ බාලිකාව දැකිය නොහැකිය.''

''මටද මා ඔබෙන් පැතූ බාලකයා දැකිය නොහැකිය.''

''මට මෙතෙක් මා නොපෙනුණි. ඔබ පමණක් පෙනුණි.''

''මටද මෙතෙක් කලක් මා නොපෙනුණි. ඔබ පමණක් පෙනුණි.''

''එහෙත් දැන් මට ඔබෙන් මා පෙනේ.''

''මටද ඔබෙන් මා පෙනේ.''

''අප දෙදෙනාම දැන් දිරායෑමේ අවසානයට ළං වූ කරත්ත වැනි ශරීර ඇත්තෝ වෙමු.''

ඔවුහු අනුපදිශේෂ පරිනිර්වාණධාතුවෙන් පරිනිර්වාණයට පත් අසූවයස්ව දිරා ගිය බුදු සිරුර දෙස බොහෝ වේලා නිහඬව බලා සිටියෝය. අනතුරුව වම්පස සිටි භික්ෂුව දකුණු පසටත් දකුණු පස සිටි මෙහෙණිය වම් පසටත් ගමන් කොට

පරිනිර්වාණ විහාරයේ උළුවස්ස පාමුලදී නැවත සම්මුඛ වූවෝය. පන්සාලිස් වසක් පුරා මග බලාසිටීමෙන්ම වෙහෙස වී දුර්වර්ණව ගිය, ඇකිළී ගිය ඇස්වලට දෙදෙනාම හිමිකම් කියූවෝය. තවත් ස්වල්ප මොහොතක් ඒ සම්මුඛ වූ දෙනෙත්වලට එකිනෙකාගේ ශරීරස්වභාවයන් හඳුනාගන්නට ඉඩ හළ ඔවුහු තුෂ්ණිම්භාවයෙන්ම පිරිනිවන් මංචකය පසු කොට මගට පිළිපන්නෝය.

ගුප්ත අශ්වයා නොසෙව්වේය. කරත්තයද නොසෙව්වේය. ඔවුහු සතර අතට විහිදී තිබූ මාවත් අතරින් එක මාවතකට පිළිපන්නෝය. එය කකුත්ථා නදිය දක්වා වැටී තිබූ මාවතයි.... ඒ මාවතේ ඔවුහු කතාවකින් තොරව ගමන් කළෝය... භික්ෂුව මෙහෙණියට දකුණු පසින් ඇයට සමීපව ගමන් කළේය. ගුප්ත ඔවුන්ගේ පිටුපසින් ගමන් කළේය.......

දැන් ඔවුන්ට කකුත්ථා නදිය හොඳින් දර්ශනය වේ.. ඒ නදිය රෞද්‍ර රළ නගමින් වේගයෙන් බැසගෙන ගියේය. කිඹුල්, මෝර ආදි නපුරු ජලජ ජීවීන්ගෙන් ඒ නදිය පිරී තිබුණි... ඒ ජලජ ජීවීහු ගඟ මත වැටෙන ආහාරයක් බලාපොරොත්තුවෙන් සිටියෝය.. ගඟ තරණයට ගොස් විනාශ වී ගිය ඔරුපාරුවල ශේෂ කොටස් ගඟේ තැන තැන දක්නට තිබුණි. මෙහා ඉවුර දිගට තොටුපළවල් රාශියක් තිබුණේය. ඒ සෑම තොටකම විවිධ මාදිලියේ ඔරු තබාගත් ග්‍රාමවාසි වූ හෝ නගරවාසි වූ හෝ වනවාසි වූ හෝ තොටියෝ සිටියෝය.. ගඟෙන් එතෙර ඉවුර නිල් අහස සිපගත් හිස් සුදුවැලිතලාවකි. ගඟ තරණය කොට එහා ඉවුරට යෑමට බලාපොරොත්තුවෙන් විශාල පිරිස් ඇදී ආවෝය. ඒ සියල්ලෝ කින්නරකින්නරියන්ගේම වෙස් ගත්තෝය... ඒ සියල්ලන්ගේම ළය හී පහරින් සිදුරුව තිබුණේය. මේ කිඳුරුකිඳුරියන් මේ ව්‍යසනයෙන්ම තමාට කීප අවස්ථාවක මුණගැසුණු බව භික්ෂුවට සිහිපත් වන්නේය. ඒ කිඳුරුකිඳුරියන් තුළද ඇත්තේ මහත් වෙහෙසකාරී ගමන් විඩාවක් බව භික්ෂුවට දැනෙන්නේය.

මේ පිරිස් කුමන තොටකින් බැස, කුමන ඔරුවකින් යා යුතුදැයි කල්පනා කරමින් ගං ඉවුරේ ළතවූවෝය. තම තොටුපළ ගැනත් ඔරු ගැනත් විස්තර කරමින් තම ඔරුවට මගීන් එකතු

කරගැනීමේ වෑයමක ඒ සෑම තොටියෙක්ම නිරත වූවෝය. එක් එක් තොටියා පරයමින් කරන විස්තර කථනයත් ඝෝෂාකාරී ලෙස හාත්පස නින්නාද දෙන්නේය. ඒ ඒ විස්තරයන්ගෙන් සෑහෙන බොහෝ පිරිස් ඒ ඒ තොටුපළවල් කරා යන්නෝය.

ඒ ඝෝෂාකාරී තොටුපළවල් පසු කරමින් ගං ඉවුර දිගේ ඇවිද ගිය ඔවුහු පාළු ගං ඉවුරේ එක් තැනක නතර වූවෝය. භික්ෂුව මෙහෙණියගේ නෙත් දෙස බලා සිටියේය.... මෙහෙණිය භික්ෂුවගේ නෙත් දෙස බලා සිටියාය... ගුප්ත ඒ දෙදෙනා දෙස බලා සිටියේය.. ගුප්තට මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේත් භද්‍රාකාපිලානි රහත් තෙරණියගේත් ගිහි කල අවසන් හමු වීම දර්ශනය වන්නේය. ඒ දර්ශනය තුළ පිප්ඵලි කුමාරයාගේත් භද්‍රකාපිලානියගේත් අවසන් සංවාදය ගුප්තට ඇසෙන්නේය.

"පිප්ඵලි කුමාරයිනි, කල්ප ගණනක් මේ සංසාරයේ මම ඔබ සමග ලෙන්ගතු සිත් ඇතිව එකට පැමිණියෙමි... ඔබට උවටැන් කළෙමි. ඔබ සමග දුක සැප බෙදාගතිමි... සමහර ආත්මයක අපි සමහර තැනකදී වෙන්ව ගියත් නැවත මුණගැසුණෙමු... ඒ සංසාර ගමන්මගේ අපට අප අතහැරුණේ ඉතා කලාතුරකිනි.... මේ සංසාරයේ මට ඔබ පිහිට වූවෙහිය. ඔබට මම පිහිට වූවෙමි. අපි එකිනෙකා එකම ලෙයින්, එකම මසින්, එකම නහරවැලින් බැඳී එකට ආවෙමු. එහෙත් අදින් පසු අප අතර නැවත සංසාරයේ කවරම දාකවත් යළි මුණගැසීමක් නම් නැත්තේය. මේ අපේ අවසන් මුණගැසීමයි.. මේ අපේ අවසන් දර්ශයනයයි... අපට මින් මතු එකිනෙකා දැකගැනීමට නොලැබේ. මම ඔබ දෙපා සංසාරයේ සිය දහස්වාරයක් සිපගත්තට ඇත.. එහෙත් යළි කවරදාවත් මම එසේ නොකරමි.... මට අවසන් වරට ඔබ පැදකුණු කරන්නට ඉඩ දෙන්න.. ඔබ දෙපා අවසන් වරට සිපගන්න ඉඩ දෙන්න...."

"කුමරියනි, සැබෑය.. අපි අපේ සෑම බැඳීමක්ම මෙයින් නිමාවට පත් කරමු... අවසන් කරමු... මා අතින් ඔබට සංසාරයේ යම් ආත්මයක හිත් රිදවීමක් වුණි නම් ඒ සියලු වරදට මටද කමා කළ මැනවි.... මම ඔබේ දෙනෙත් දෙස බලා සිටින අවසන් අවස්ථාවයි." ගුප්තගේ දෙකන් අතර නින්නාද දුන් සංවාදය අවසන්ව තිබුණේය.

භික්ෂුවත් මෙහෙණියත් පන්සාලිස් වසක් පුරා පරිස්සම් කරගත් එකම සිහිවටනය වූ එක පැන්සලෙන් දෙකට වෙන්ව ගිය කැබලි දෙක නැවතත් අතට ගත්තෝය.. එම පැන්සල් කැබලි දෙස දෙදෙනාම බලාසිටියෝය.. අනතුරුව ඉවුරෙන් එපිට පෙනෙන ගුවනත් පොළොවත් එකට යා වී ගිය නිදහස් ක්ෂේම භූමිය ඔවුන්ට පෙනුණේය.

"අපි සියල්ල අතහැරදමමු.... සියල්ල අමතක කරමු...." මෙහෙණිය කීවාය.. භික්ෂුවද එය අනුමත කරමින් හිස සැලුවේය..

මෙහෙණිය තම පැන්සල් කැබැල්ල ගුප්ත අත තැබුවාය... භික්ෂුවද පතරොම් කොප්පුව සමග බද්ධ වූ පැන්සල් කැබැල්ල ගුප්ත අතට දුන්නේය.. මෙතෙක් ගතත් හිතත් වෙහෙසට පත් කළ ඔවුන්ගේ ගමන් මලුද ඔවුහු ගුප්ත අත තැබුවෝය. අනතුරුව භික්ෂුවත් මෙහෙණියත් තවත් ස්වල්ප මොහොතක් ඒ නෙත් ඉවුරු බිඳදමා නිහඬව එකිනෙකා දෙස බලා සිටියෝය.

ගං ඉවුර සිසාරා සිහින් සිසිල් සුළඟක් හමා ගියේය... ගුප්ත භික්ෂුව දෙසත් මෙහෙණිය දෙසත් බලා නුදුරෙන් තිබෙන පාළු වී ගිය තොටුපළ පෙන්නුවේය....

භික්ෂුව සිනා පහළ කළේය... මෙහෙණියද සිනා පහළ කළාය... ඔවුහු ඒ පාළු තොටුපළ වෙත යද්දී ප්‍රථම සංගායනාවට සහභාගී නොවූ පුරාණ හිමියෝ ඒ තොටුපළේ සිටියෝය.

"එතකොට ගුප්ත නුඹ....?"

"මම මගේ ගමන්මලු අතහැර දැමුවා. එහෙත් ඔබ දෙපළගේ ගමන්මලු මට භාරදී ඇති නිසා මට ආපසු යන්නට සිදු ව තිබේ..

"එපා ගුප්ත, ඔබ සතු ගමන්මලු ඔබ අතහැර ඇති නම් අන් සතු ගමන්මලු පරිස්සම් කිරීමට ඔබ වෙහෙස විය යුතු නැහැ. අපගේ සිහිවටන සහ ඔය ගමන්මලු විසි කරන්න මේ මෝරුන් කිඹුලන් සිටින ගඟට" මෙහෙණිය ඉතා ගැඹුරු වූ හඬින් කීවාය... භික්ෂුවද එය අනුමත කරමින් හිස සැලුවේය... ගුප්ත ඒ ගමන්මලු පළමුව ගඟට විසි කළේය.. එකෙණෙහිම ඒ ගමන් මලු ගඟේ සිටින විශාල මාළුවෝ ඩැහැගත්තෝය. අනතුරුව දෙකඩ

වී ගිය පැන්සල් කැබලි දෙක ගඟ මත හෙළුවේය... එම පැන්සල් කැබලි ගඟ මත කාගේ වත් උවදුරකින් තොරව පා වෙන්නට පටන්ගත්තේය..

"ගුප්ත, මට දැන් ඉවුරු දෙස නොබලා ගඟ දෙස බැලිය හැකියි..."

"මටත් පුළුවනි..." මෙහෙණියද කීවාය...

ඔවුහු ඉවුරු අතහැර ගඟ දෙස බලද්දී පැන්සල් කැබලි දෙක උඩුගං බලා යන අයුරු පෙනුණේය. අනතුරුව ඔවුහු එම තොටුපලින් ක්ෂේම භූමිය සොයා නැව් නැංගෝය..

රන්කාරිඩොව

බටුවන්ගල රාහුල හිමි



ඔවුහු රජු සඳලුතලයට කැඳවාගෙන ගොස් පහළ අඳෝනා නගන්නන් පෙන්නමින් පිළිවෙත් කීවෝය. ඒ නිමිත්ත පාඨකයන්ගේද පුරෝහිතයන්ගේද පණ්ඩිතයන්ගේද බමුණන්ගේද උපදෙසින් රජු රාජ ගබඩාවේ මිදි ගබඩාව විවෘතකොට දුන්නේය. රාජපුරුෂයෝ වයින් රිසි සේ මිදි ගෙන යුෂ සෑදුවෝය. හදන හදන යුෂ බඳුනේ දිය නොමුසු නොයිඳුල් කොටස රජුටම වෙන් වුණේය. තවත් කොටසක්.රාජපුරුෂයන්ටද බමුණන්ටද පුරෝහිතයන්ටද නිමිත්ත පාඨකයන්ටද වෙන් කරගත්තෝය. ඉතිරිය දිය සමග මුසුකොට ඉහළමාලයේ සඳලුතලයේ කවුළුදොර එළිපත්තේ සිට පහළ අඳෝනා නගන්නන්ගේ කටවල් මත හෙළුවෝය. අත් දිග උන් කකුල් දිග උන් ඉහළට දෝත් පා ඒ මිදියුෂ අහසේදීම අත්පත් කරගත්තෝය.!.

COVER DESIGNER | SAUMYA SANDARUWAN LIYANAGE

මිල රු. 300/-

ISBN 978-955-661-665-1

9789556616651

ප්‍රකාශනය හා බෙදාහැරීම

ප්‍රකාශකයෝ

t: (+94 11) 2686114 f: (+94 11) 2678044 e: info@sadeepa.com

ape pusthakalaya telegram group aka wenuweni https://t.me/apepusthakalaya